අලුත් වූ

දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ නවම් අව සතවක ලත් කිව් දින | කාණ්ඩය 112 | පත්‍රය 68 | පිටු 32 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 මාර්තු 05 සිකුරාදා

මාර්තු 8 දා සිට

සෑම දිනකම
විශේෂ සාහිත්‍යමය,
රසාස්වාදන අතිරේකයක්

විනිමය අනුපාත

කොටස් වෙළඳපොළ
තොරතුරු

පොල්,රබර් මිල දර්ශකය

දවසේ සුබසෙත
ලග්න පලාපල ඇතුළු
දිනයේ වැදගත්
ජ්‍යොතිෂමය තොරතුරු

මැනිං වෙළඳපොළ
එළවළු හා පලතුරු
මිල ගණන්

3 වැනි හා 4 වැනි
හරස් වීදියේ
තොග මිල ගණන්

බැංකුවල ණය හා
පොලී අනුපාත

චිත්‍රපට ප්‍රදර්ශන

කැබිනට් මණ්ඩල තීරණ

LAKE HOUSE
ලේක්හවුස් ප්‍රකාශනයක්

ඉරණතිව් දූපතේ විරෝධතාවට උතුරේ තවත් සංවිධාන එක් වෙයි

උතුරු පළාත් විශේෂ-
රසුල දිල්හාර ගමගේ

කිලිනොච්චිය ඉරණතිව් දූපතට කොරෝනා මළ සිරුරු රැගෙන විත් මිහිදන් කිරීමට එරෙහිව දූපත් වැසියන් විසින් ආරම්භ කොට ඇති විරෝධයට උතුරේ තවත් ස්වේච්ඡා සංවිධාන ගණනාවක් පෙරේදා(03) එකතු වී තිබේ. උතුරේ එක්සත් ධීවර සංගමය තරුණ සංගමය ධීවර සහයෝගීතා ව්‍යාපාරය කාන්තා ධීවර සංගමය ඇතුළු සංගම් 20කට වඩා වැඩි ප්‍රමාණයම් ඉරණතිව් දූපතේ වැසියන්ට සහාය පළ කොට ඇති අතර ඔවුන්ගේ නියෝජිතයන් දූපත වෙත ගොස් තිබේ.

ඉරණතිව් දූපතේ වැසියන් පළාතේ ආගමික නායකයන් සමඟ දූපතට පිවිසෙන ඉරණමාතා නගර් හන්දිය අසල විශාල විරෝධතාවක් පවත්වා රජයේ මේ තීරණය වහාම ඉවත් කර ගන්නා ලෙස ඉල්ලීමක් කොට තිබුණි.

කොරෝනා මළ සිරුරු ඉරණතිව් දූපතේ මිහිදන් කිරීම නිසා වැසියන්ට සෞඛ්‍ය ආර්ථික හා සමාජීය මෙන්ම සංස්කෘතික වශයෙන්ද විශාල ගැටලුවක් පැන නගින නිසා ඔවුන් ඒ පිළිබඳ මේ වන විට කිලිනොච්චිය මානව හිමිකම් කාර්යාලයට පැමිණිල්ලක්ද ඉදිරිපත් කොට තිබේ.

කිලිනොච්චියේ මවක් දරුවනුත් අරන් ළිඳට පැනලා

දරුවන් තිදෙනාම මරුට

උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ

කිලිනොච්චියේ වට්ටකච්චි ප්‍රදේශයේ මවක් පෙරේදා (03) සවස සිය දරුවන් තිදෙනා සමඟ ළිඳට පැන ඇති අතර එහිදී දරුවන් තිදෙනාම මිය ගොස් තිබේ.

පවුල් ආරවුලක් මත කිලිනොච්චියේ වට්ටකච්චි මානික්කපිල්ලයාර් කෝවිල අසල ළිඳට පැන්න කාන්තාව නාවික හමුදාව හා ප්‍රදේශවාසීන් බේරාගෙන කිලිනොච්චිය රෝහලට ඇතුළත් කොට තිබේ.

කාන්තාව දරුවන් තිදෙනා සමඟ ළිඳට පනින ශබ්දය ඇසී ප්‍රදේශවාසීන් කෑකෝ ගසා ඇති අතර ඒ අවස්ථාවේම ළිඳට බසින ලද පිරිසක් කාන්තාව හා එක් දරුවකු බේරාගෙන රෝහල ගත කොට ඇතත් වයස අවුරුදු දෙකක ඒ දරුවා රෝහලේදී මියගොස් තිබේ. අනෙක් දරුවන් දෙදෙනා බේරා ගැනීමට ගත් සියලු උත්සාහය අසාර්ථක වී ඇති අතර පොලීසිය නාවික හමුදාව යුද හමුදාව හා ප්‍රදේශවාසීන් එක්ව දරුවන් දෙදෙනාගේ මළ සිරුරු ළිඳෙන් සොයාගෙන ඇත්තේ රාත්‍රී කාලයේය. මෙසේ මියගොස් ඇත්තේ එස්. කාර්තිකා (8),එස්.ආත්සයා (5) හා නෙරන්ජන් (2) දරුවන් තිදෙනාය.මව අසාධ්‍ය තත්ත්වයෙන් කිලිනොච්චිය රෝහලේ ප්‍රතිකාර ලබයි.

කිලිනොච්චිය පොලීසිය හා ධර්මපුරම් පොලීසිය සිද්ධිය පිළිබඳ පරීක්ෂණ පවත්වයි.

පොලිසියේ 30,000කට කොවිෂීල්ඩ් එන්නත දීලා

පොලිස් මාධ්‍ය ප්‍රකාශක

රක්ෂණ ශ්‍රියන්ත

මේ වන විට කොවිෂීල්ඩ් එන්නත ශ්‍රී ලංකා පොලීසියේ 30000කට ලබා දී තිබේ.

මුල් වටයේ පොලිස් රෝහල්වල කාර්ය මණ්ඩලයට ලබාදීමෙන් අනතුරුව ක්ෂේත්‍රයේ කටයුතු කරන අනෙකුත් පොලිස් නිලධාරීන්ට එන්නත ලබාදීමට මේ වන විට පියවර ගෙන ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති, නීතිඥ අජිත් රෝහණ මහතා පැවසීය. කොළඹ පොලිස් ක්ෂේත්‍ර බළකා මූලස්ථානයේදී මේ වන විට එන්නත ලබාදීම සිදුකරන අතර මේ වන විට ක්ෂේත්‍රයේ කටයුතු කරන නිලධාරීන්ට එන්නත්කරණය සිදුකරන අතර ඉන් පසු අනෙකුත් නිලධාරීන්ටද එන්නත ලබාදීම සිදුකරන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පැවසීය.

'සුනිල සර පරිසර අභිනන්දන' මෙහෙවර ඇගයීමේ උත්සවය අද

ප්‍රවීණ ගීත රචකයකු, පරිසරවේදියකු, මෙන්ම ආයතන රැසක ප්‍රධාන තනතුරු දරමින් කටයුතු කළ සුනිල් සරත් පෙරේරා මහතා, මෙරට පාරිසරික සංවර්ධනය උදෙසා කළ මෙහෙවර ඇගයීමට පරිසර අමාත්‍යාංශය විසින් කටයුතු යොදා ඇත.

"සුනිල සර පරිසර අභිනන්දන" ලෙස නම් කර ඇති මේ මෙහෙවර ඇගයීමේ උත්සවය අද (05) පෙරවරු 9.30ට පරිසර අමාත්‍යංශ ශ්‍රවණාගාරයේ දී ඇමැති මහින්ද අමරවීර මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

මැද කොළඹ එන්නත්කරණ වැඩසටහනින්

මැද කොළඹ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය මගින් පවත්වන ජනතා එන්නත්කරණ වැඩසටහනේ තවත් සායනයක් ඊයේ (04) කොළඹ මිහිඳු මාවතේ මිහිඳු විදුහලේ දී ඊයේ (04) පැවැත්වූ අවස්ථාව.

ඡායාරූප - දුෂ්මන්ත මායාදුන්න

අද නැත්ත

ජනපති "ගම සමඟ යයි පිළිසදර"	සොයා
විසඳුම් ලබාදෙයි හැකි ලෙස සුදුසු	නියා
විපක්ෂයේ නායකයා නොමඟ	නොයා
හරියට බැලන්ස් කරමින් ජංගමට	ගියා
සජිත් රටට පෙන්වන නව	රංගනය
හරි ලස්සනයි ජංගම	සංදර්ශනය
දැන් හරි දුකයි අපහට ඇති	අසහනය
යහපාලනේ ඔහු නොසිටිය එක	ගැනය

-රටේමුල්ලේ මුදන්නායක

ශ්‍රීකාන්තගේ ශ්‍රීදූජන

- *බන්න බං, මිනී වළලන එකටයි පුළුවන එකටයි මරාගැනිල්ල අපි නැති කළා !*
- *මොන පිස්සුද සර්, අන්න වළලන තැන කොතනද කියල ආයෙත් මරා ගන්නව !*

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ප්‍රසම්පාදන දැන්වීමයි

VTA

ආරක්ෂක සේවා සැපයීමට අදාළව මිල ගණන් කැඳවීම

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පහත සඳහන් දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හා ජාතික වෘත්තීය පුහුණු ආයතන සඳහා ආරක්ෂක සේවා කටයුතු සැපයීමට අදළව සුදුසුකම්ලත් ආරක්ෂක සේවා සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

දිස්ත්‍රික් මධ්‍යස්ථානය	අවශ්‍ය ආරක්ෂක නිලධාරීන් ප්‍රමාණය
බදුල්ල	5
මොනරාගල	4
ගාල්ල	14
වව්නියාව	2
කොළඹ	23
අම්පාර	10
අනුරාධපුරය	3
නුවරඑළිය	4
මහනුවර	5
මාතලේ	3
යාපනය	5
කුරුණෑගල	3

දිස්ත්‍රික් මධ්‍යස්ථානය	අවශ්‍ය ආරක්ෂක නිලධාරීන් ප්‍රමාණය
මඩකලපුව	7
පොළොන්නරුව	2
මාතර	4
ත්‍රිකුණාමලය	4
හම්බන්තොට	5
කෑගල්ල	2
පුත්තලම	1
මුලතිව්	4
කළුතර	4
කිලිනොච්චිය	3
රත්නපුර	2
ගම්පහ	4

01. රු. 5,000/= ක ආපසු නොගෙවන මුදලක් ගෙවීමෙන් අනතුරුව ප්‍රසම්පාදන කොන්දේසි, පොදු කොන්දේසි සහ සැපයුම් අයදුම්පත් ඇතුළත් ප්‍රසම්පාදන ලිපිලේඛන 2021.03.05 දින සිට 2021.03.25 දක්වා රාජකාරි දිනයන්හි පෙ.ව. 9.00 ත් ප.ව. 3.00 ත් අතර, ලිඛිත අයදුම්පතක් **සභාපති, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය** තමට ඉදිරිපත් කිරීමෙන් ප්‍රසම්පාදන ඒකකය වෙතින් ලබා ගත හැක.

02. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ආරක්ෂක සේවා සැපයීමට අදළව මිල ගණන් කැඳවීම" යනුවෙන් සඳහන් කර සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන 2021.03.30 දින පෙ.ව. 10.30 ට පෙර ප්‍රසම්පාදන ඒකකයට ලැබෙන සේ **සභාපති, ප්‍රසම්පාදන කමිටුව ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය "නිපුණතා පියස", 4 වන මහළ, 354/2, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අධිකාරියේ ප්‍රසම්පාදන ඒකකයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට (Tender Box) බහාලිය හැක.

03. ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ආරක්ෂක සේවාව සපයන අනුමත ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි වී තිබිය යුතු අතර, එසේ නොවන්නේ නම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. සියලු ලංසුකරුවන් රු. 50,000.00 ක් වටිනා අනුමත වාණිජ බැංකුවකින් ලබාගත් ලංසු ඇපකරයක් අනිවාර්යයෙන්ම **සභාපති, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, "නිපුණතා පියස", 4 වන මහළ, 354/2, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05** යන නමට ඉදිරිපත් කළ යුතුයි. එසේ නොවන ලංසු ඇපකරයන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. 2021.03.30 දින පෙ.ව.10.30 ට ලංසු භාරගැනීම අවසන් කරනු ලබන අතර, ඉන් අනතුරුව වහාම ලංසු විවෘත කිරීම අදළ ලංසුකරුවන් හෝ ඔවුන් විසින් නම් කරනු ලබන බලයලත් නියෝජිතයන් ඉදිරිපිටදී සිදු කරනු ලැබේ. අසම්පූර්ණව ඉදිරිපත් කරන සහ පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ලංසු භාරගැනීම අවසන් වීමට ප්‍රථම අදළ ලංසු ලියවිලි සම්බන්ධයෙන් වැඩි විස්තර අවශ්‍ය නම් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ප්‍රසම්පාදන ඒකකයෙන් ලබා ගත හැක.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
"නිපුණතා පියස",
4 වන මහළ, 354/2, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන /ෆැක්ස් අංකය - 011-2596516/011-2352150

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ප්‍රසම්පාදන දැන්වීමයි

VTA

සනීපාරක්ෂක සේවා සැපයීමට අදාළව මිල ගණන් කැඳවීම

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පහත සඳහන් දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන, ජාතික වෘත්තීය පුහුණු ආයතන සඳහා සනීපාරක්ෂක සේවා කටයුතු සැපයීමට අදළව සුදුසුකම්ලත් සනීපාරක්ෂක සේවා සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

දිස්ත්‍රික්කය	මධ්‍යස්ථානය	සනීපාරක්ෂක සේවකයින් සංඛ්‍යාව
කොළඹ	ජාතික වෘත්තීය පුහුණු ආයතනය – නාරාහේන්පිට	05
කොළඹ	නිපුණතා පියස 4 – 5 මහල, ප්‍රධාන කාර්යාල, නාරාහේන්පිට	04
කොළඹ	දිස්ත්‍රික් වෘ. පු. ම. මහරගම	01
කොළඹ	වෘ. පු. මධ්‍යස්ථානය රත්මලාන	03
කොළඹ	කොරියානු වෘ. පු. මධ්‍යස්ථානය – ඔරුගොඩවත්ත	07
ගම්පහ	නැඳුත්ගොල්ල – කාර්යය මණ්ඩල පුහුණු විද්‍යුස්ථානය	01
මඩකලපුව	දිස්ත්‍රික් වෘ. පු. ම. වන්තාරමුල්ල	02
කෑගල්ල	දිස්ත්‍රික් වෘ. පු. ම. බල්ලපාන	01
මුලතිව්	දිස්ත්‍රික් වෘ. පු. ම. මුලතිවු	01
අම්පාර	දිස්ත්‍රික් වෘ.පු. ම. සමිත්තුරෙයි	01
	වෘ. පු. ම. උහන	01
මාතර	තලල්ල ජාතික වෘ. පු. ආයතනය	01
කළුතර	වෘ. පු. මධ්‍යස්ථානය කළුතර	01
ත්‍රිකුණාමලය	වෘ. පු. මධ්‍යස්ථානය කුච්චවේලි	02
ගාල්ල	වෘ. පු. මධ්‍යස්ථානය අහංගම හෝටල් පාසල සහ හෝටලය	05
ගාල්ල	වෘ. පු. මධ්‍යස්ථානය හික්කඩුව	01
ගාල්ල	දිස්ත්‍රික් වෘ. පු. ම. ගාල්ල	01
යාපනය	කරෙයිනගර් වෘ. පු. මධ්‍යස්ථානය	01

01. රු. 3,500/= ක ආපසු නොගෙවන මුදලක් ගෙවීමෙන් අනතුරුව ප්‍රසම්පාදන කොන්දේසි, පොදු කොන්දේසි සහ සැපයුම් අයදුම්පත් ඇතුළත් ප්‍රසම්පාදන ලිපිලේඛන 2021.03.05 දින සිට 2021.03.25 දක්වා රාජකාරි දිනයන්හි පෙ.ව. 9.00 ත් ප.ව. 3.00 ත් අතර, ලිඛිත අයදුම්පතක් සභාපති, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය තමට ඉදිරිපත් කිරීමෙන් ප්‍රසම්පාදන ඒකකය වෙතින් ලබා ගත හැක.

02. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"සනීපාරක්ෂක සේවා සැපයීමට අදළව මිල ගණන් කැඳවීම"** යනුවෙන් සඳහන් කර සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන 2021.03.30 දින පෙ.ව. 10.30 ට පෙර ප්‍රසම්පාදන ඒකකයට ලැබෙන සේ **සභාපති, ප්‍රසම්පාදන කමිටුව ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය "නිපුණතා පියස", 4 වන මහළ, 354/2, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අධිකාරියේ ප්‍රසම්පාදන ඒකකයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට (Tender Box) බහාලිය හැක.

03. සියලු ලංසුකරුවන් රු. 50,000.00 ක් වටිනා අනුමත වාණිජ බැංකුවකින් ලබාගත් ලංසු ඇපකරයක් අනිවාර්යයෙන්ම **සභාපති, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, "නිපුණතා පියස", 4 වන මහළ, 354/2, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05** යන නමට ඉදිරිපත් කළ යුතුය. එසේ නොවන ලංසු ඇපකරයන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. 2021.03.30 දින පෙ.ව.10.30 ට ලංසු භාර ගැනීම අවසන් කරනු ලබන අතර, ඉන් අනතුරුව වහාම ලංසු විවෘත කිරීම අදළ ලංසුකරුවන් හෝ ඔවුන් විසින් නම් කරනු ලබන බලයලත් නියෝජිතයන් ඉදිරිපිටදී සිදු කරනු ලැබේ. අසම්පූර්ණව ඉදිරිපත් කරන සහ පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ලංසු භාර ගැනීම අවසන් වීමට ප්‍රථම අදළ ලංසු ලියවිලි සම්බන්ධයෙන් වැඩි විස්තර අවශ්‍ය නම් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ප්‍රසම්පාදන ඒකකයෙන් ලබා ගත හැක.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
"නිපුණතා පියස",
4 වන මහළ, 354/2, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05
දුරකථන /ෆැක්ස් අංකය - 011-2596516/011-2352150

දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ නවම් අව සතවක ලත් කිව් දින | කාණ්ඩය 112 | පත්‍රය 68 | පිටු 32 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 මාර්තු 05 සිකුරාදා

කොවිඩ් ව්‍යාප්තිය



දේශයේ පාලන මාවත
ලංකාදීප
අද පත්‍රය සමග

නඩුව කල් දමා ගැනීමට පාඨලී උත්සාහ කරනවා

වින්දිත සන්දීප් රෝදපුටුවෙන් උසාවියට

නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස්

රෝෂන් තුෂාර

අපරීක්ෂාකාරිව හා අධික වේගයෙන් රිය පදවා තරුණයකුට බරපතළ තුවාල කර පලා ගියේ යැයි චෝදනා ලද හිටපු ඇමැති පාර්ලිමේන්තු මන්ත්‍රී පාඨලී චම්පික රණවක විත්තිකරුට අධි චෝදනා කියවා දීම කොළඹ මහාධිකරණයේදී ඊයේ (04) සිදු කළේය. පිට 04

විගි නෙළුම් මලෙන් එයි

උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ

උතුරු නැගෙනහිර, කඳුකරය හා වතුකරය නියෝජනය වන පරිදි වෙනම දෙමළ සන්ධානයක් බිහි කිරීමට උතුරු පළාත් හිටපු ප්‍රධාන ඇමැති සී. වී. විග්නේශ්වරන් මහතා කටයුතු කරගෙන යයි.

උතුරේ සෙසු දෙමළ දේශපාලන පක්ෂ වවුනියාවට රස් වී දෙමළ ජනතා සභාවක් පිහිටුවීමේ වැඩසටහනට විග්නේශ්වරන් හිටපු ප්‍රධාන ඇමැතිවරයා සහභාගි නොවීමට මූලික හේතුව ඔහු මේ නව දෙමළ සන්ධානය පිහිටුවීමේ අපේක්ෂාව බව වාර්තා වේ. පිට 04

මාස දෙකකදී 14කට අල්ලස් චෝදනා

පිට 04

පාස්කු කොමිසමේ වාර්තාව අසම්පූර්ණයි

පහන් විජේසේකර

පාස්කු ප්‍රහාරය පිළිබඳ විමර්ශනය කළ කොමිසමේ අවසන් වාර්තාව අසම්පූර්ණ වාර්තාවක් බව පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල මහතා පැවසීය.

ආණ්ඩුව හිතාමතාම එහි තොරතුරු වසන් කිරීමට උත්සාහ කරන බැවින් එම වාර්තාව පිළිබඳ සැකයක් මතු වන බවද මන්ත්‍රීවරයා සඳහන් කළේය. පිට 04

බැවලේ වාර්තාව ගැන බ්‍රිතාන්‍යය කළ ප්‍රකාශය පුදුමයි!

නෙස්බි සාමිවරයා කියයි

මහින්ද අලුත්ගෙදර

ජගත් මානව හිමිකම් කවුන්සිලයේදී ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් රාජධානිය කළ ප්‍රකාශය සම්බන්ධයෙන් මවිතය පළ කරන බව බ්‍රිතාන්‍යයේ නෙස්බි සාමිවරයා ප්‍රකාශ කරයි.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් අදහස් දක්වමින් දකුණු ආසියානු සහ පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය ඇමැති තාරික් අහමඩ් බාරෝන් පසුගිය 25දා ප්‍රකාශයක් කළ අතර ජගත් මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරියගේ වාර්තාව පිළිගැනීමට හැකි වන්නේ කෙසේ දැයි සාමිවරයා ප්‍රශ්න කරයි. පිට 04

මහා ශිව රාත්‍රිය උත්කර්ෂවත්ව සැමරීමට අවශ්‍ය පියවර ගන්න

අගමැතිගෙන් උපදෙස්

මහින්ද අලුත්ගෙදර

මාර්තු 11 දිනට යෙදෙන මහා ශිව රාත්‍රි දින උත්සවය උත්කර්ෂවත්ව සැමරීමට අවශ්‍ය පියවර ගන්නැයි බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු ඇමැතිවරයා ලෙස අගමැති මහින්ද රාජපක්ෂ මහතා හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට උපදෙස්දී තිබේ. පිට 04

ස්පුට්නික්-V හදිසි භාවිතයට අනුමැතිය

සන්ධ්‍යා කරුණාරත්න

කොවිඩ් - 19 වයිරසය මර්දනයට රුසියාවේ නිෂ්පාදිත 'ස්පුටනික් ෆයිව්' එන්නත මෙරට හදිසි භාවිතය සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය හිමිව ඇති බව ඖෂධ නිෂ්පාදන, සැපයීම හා නියාමන රාජ්‍ය ඇමැති මහාචාර්ය චන්න ජයසුමන මහතා දිනමිණට ඊයේ (04) පැවසුවේය. පිට 04

පාර්ලිමේන්තු ඒම ගැන තාම තීරණයක් නෑ

ශිරෝමි අබයසිංහ

එක්සත් ජාතික පක්ෂයට හිමි ජාතික ලැයිස්තු පාර්ලිමේන්තු අසුන සඳහා පත්ව යන්නේද පිළිබඳ තමන් තීරණයකට එළඹ නැතැයි එම පක්ෂයේ නායක හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සඳහන් කරයි. පිට 04

රටටම කුඩු බෙදන්නේ මිදිගමින්

පිට 4

පෙබරවාරියේ සංචාරක පැමිණීම දෙගුණ වෙලා

පිට 4

කුරුවිට තරුණියගේ හිස සොයා කැලණි ගඟේ සෝදිසි මෙහෙයුම්

රක්ෂණ ශ්‍රීයන්ත

පිටකොටුව වෙල්ලවීදියෙන් සොයා ගැනුණු කාන්තා මළ සිරුරේ හිස සොයා කැලණි ගඟේ සෝදිසි මෙහෙයුමක් දියත් කිරීමට පොලිසිය පියවර ගෙන තිබේ.

එම ඝාතනයට සම්බන්ධ උප පොලිස් පරීක්ෂකවරයා විසින් කරේ දමාගෙන සිටි බෑගයේ ඇගේ හිස ඇති බවට වන සැකය මත මේ සෝදිසි මෙහෙයුම ක්‍රියාත්මක කර ඇති අතර ඊයේ (04) සවස 4ට පමණ මෙහෙයුම ආරම්භ කර තිබේ. පිට 04

පාස්කු ප්‍රහාර සෙවූ කොමිෂන් වාර්තාව 10 වැනිදා විවාදයට

ස්වර්ණා විජේකෝන්

පාස්කු දින එල්ල වූ ත්‍රාස්ත ප්‍රහාරය පිළිබඳ සොයා බැලූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව පිළිබඳ විවාදය මේ මස 10 වැනිදා ආරම්භ කිරීමට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී ඊයේ (04) තීරණය කර ඇත. පිට 04

රාජ සභා මණ්ඩපය ඩෝසර් කිරීම කුරුණෑගල නගරාධිපති ඇතුළු පිරිසකට නොතිසි

නෙල්කා මැදගෙදර

දැවැනි බුවනෙකබාහු රජු භාවිත කළ බව කියන කුරුණෑගල නගර මධ්‍යයේ ඇති රාජ සභා මණ්ඩපය ඩෝසර් කිරීමේ සිද්ධියට සම්බන්ධ කුරුණෑගල නගරාධිපති තුෂාර සංජීව ඇතුළු වගඋත්තරකරුවන් පිරිසකට ලබන 18 වැනිදා අධිකරණය හමුවේ පෙනී සිටින ලෙස දන්වමින් අභියාචනාධිකරණය ඊයේ (4) නොතිසි නිකුත් කළේය.

සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ ජාතික සංවිධායක නාමල් කරුණාරත්න මහතා විසින් මේ පෙත්සම ගොනු කර තිබෙන අතර තුෂාර සංජීව විතරණ වහාම අත්අඩංගුවට ගන්නා ලෙස පොලිස්පතිවරයාට මැන්ඩාමුස් ආඥාවක් නිකුත් කරන ලෙස පෙත්සමෙන් ඉල්ලා තිබේ. පිට 04

මියන්මාරයේ ගැටුම් දැඩි වෙයි

54කට වැඩි පිරිසක් මරුට

බුද්ධි කරුණාරත්න

මියන්මාරයේ හමුදා කුමන්ත්‍රණකරුවන්ගේ ආණ්ඩුවට එරෙහිව නැගෙන විශාල විරෝධතා දැඩි ලෙස මර්දනයට ලක් කරමින් ඇතැයි වාර්තා වේ. පිට 04

පියාගෙන් සල්ලි ගන්න බිලිඳාට පහර දීම වීඩියෝ කරලා

දෙදෙනෙක් අත්අඩංගුවට

උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ

යාපනය, මනියතෝට්ටම් ප්‍රදේශයේදී මවක විසින් සිය මාස 9ක් වයසැති දරුවාට අමානුෂිකව පහර දෙනු ලැබ ඇත්තේ එම අවස්ථා වීඩියෝ කර විදේශගතව සිටින දරුවාගේ පියාට යවා මුදල් ගැනීමට බවට පොලිසියට තොරතුරු හෙළි වී තිබේ. පිට 04

වෙළෙඳ හිඟය ඩො.කෝටි 200කින් අඩු වුණා

මහ බැංකු අධිපති

ජයසිරි මුණසිංහ

අපනයන ආදායම අඩු වීමට අවඩා ආනයන වියදම සැලකිය යුතු ලෙස අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස 2020 වසරේ වෙළෙඳ හිඟය එක්සත් ජනපද ඩොලර් කෝටි 200කින් අඩු වූ බව ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සම්මානිත මහාචාර්ය, දේශමාන්‍ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන් මහතා ප්‍රකාශ කළේය. කොළඹ මහ බැංකු මූලස්ථානයේ ඊයේ පැවති විශේෂ මාධ්‍ය හමුවට එක්වෙමින් අදහස් දැක්වූ අධිපතිවරයා රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග හේතුවෙන් මේ වසරේදීද (2021) වෙළෙඳ හිඟය අඩු මට්ටමක පවත්වාගෙන යෑමට හැකි වනු ඇතැයි අනාවැකි පළ කළේය. පිට 04

කුඹුරටම ඇවිත් වී මිල දී ගැනීම 8 දා සිට ඇරඹේ

පිට 04

පෙබරවාරියේ සංචාරකයන් පැමිණීම දෙගුණ වෙලා

මහින්ද අලුත්ගෙදර

මේ වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව පෙබරවාරි මාසයේදී විදෙස් සංචාරකයන්ගේ පැමිණීම දෙගුණයකින් පමණ ඉහළ ගොස් තිබේ.

ඒ අනුව මේ වසරේ ජනවාරි මාසයේදී විදෙස් සංචාරකයන් 1,682 දෙනකු ශ්‍රී ලංකාවට පැමිණ තිබෙන අතර ඊට සාපේක්ෂව මේ වසරේ පෙබරවාරි මාසයේදී විදෙස් සංචාරකයන් 3,366 දෙනකු ශ්‍රී ලංකාවට පැමිණ තිබෙන බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සඳහන් කරයි.

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් වසා දමා තිබූ ගුවන් තොටුපොළ විදෙස් සංචාරකයන් වෙනුවෙන් පසුගිය ජනවාරි මාසයේ 21දා ක්‍රියාත්මක වන පරිදි සම්පූර්ණයෙන්ම විවෘත කිරීමට රජය පියවර ගන්නා ලද අතර ඒ අනුව මේ වන විට විදෙස් සංචාරකයෝ වැඩි වශයෙන් ශ්‍රී ලංකාවට පැමිණෙමින් සිටිති.

කෙසේ වුවද පවතින වසංගත තත්ත්වය හේතුවෙන් පසුගිය වසරේ මාර්තු මස 18දා සිට ක්‍රියාත්මක වන පරිදි ගුවන් තොටුපොළ සම්පූර්ණයෙන්ම වසා දැමීමට රජය තීරණය කරන ලද අතර ඒ හේතුවෙන් විදෙස් සංචාරකයන්ගේ පැමිණීම ශීඝ්‍රයෙන් පහත වැටුණි.

කෙසේ වුවද පසුගිය 2020 වසරේ පෙබරවාරි මාසයේදී විදෙස් සංචාරකයන් 207,507 දෙනකු සංචාරය සඳහා ශ්‍රී ලංකාවට පැමිණ තිබෙන අතර එම වාර්තා සැලකිල්ලට ගැනීමේදී මේ වසරේ පෙබරවාරි මාසයේදී සංචාරක පැමිණීම සියයට 98.4කින් පහත වැටී තිබෙන බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය නිකුත් කළ නවතම වාර්තාවක් මඟින් පෙන්වා දෙයි.

කෙසේ වුවද මේ වසරේ ගෙවී ගිය ජනවාරි සහ පෙබරවාරි මාසයන්හි දී විදෙස් සංචාරකයන් 5,048 දෙනකු ශ්‍රී ලංකාවට පැමිණ තිබෙන අතර ඉදිරියේදී වැඩි වශයෙන් විදෙස් සංචාරකයන් ශ්‍රී ලංකාවට පැමිණෙනු ඇතැයි ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විශ්වාසය පළ කරයි.

මාස දෙකකදී 14කට අල්ලස් චෝදනා

රක්ෂණ ශ්‍රියන්ත සහ අනුර ප්‍රේමලාල්

අල්ලස් ගැනීමේ සිද්ධීන් සම්බන්ධයෙන් මේ වසරේ ගත වූ කාල සීමාව තුළදී පුද්ගලයන් 14 දෙනකු අල්ලස් කොමිසමේ විමර්ශන ඒකකය මඟින් කළ සාර්ථක වැටලීම්වලදී අත්අඩංගුවට ගෙන තිබේ.

කෙසේ වෙතත් පසුගිය වසරේ මේ කාල සීමාවේ කළ වැටලීම්වලදී අත්අඩංගුවට ගත් පිරිසට වඩා වැඩි සංඛ්‍යාවක් මේ වසරේදී අත්අඩංගුවට ගෙන ඇත.

අල්ලස් හෝ දූෂණයෙන් තොර රටක් නිර්මාණය කිරීම සඳහා තව දුරටත් පුළුල්ව මේ වැටලීම් ක්‍රියාත්මක කරන බවද අල්ලස් කොමිසමේ ප්‍රකාශකයකු දිනමිණට ඊයේ (04) පැවසීය.

මේ අතර පෙරේදා (03) දිනයේදී ද අල්ලස් ගැනීමේ සිද්ධියක් සම්බන්ධයෙන් පොලිස් සැරයන්වරයකු මහරගමදී අත්අඩංගුවට ගෙන තිබේ.

අපරාධ වරදක් සම්බන්ධයෙන් මහරගම පොලිසිය භාරයේ තිබූ මෝටර් රථයක් අධිකරණයට ඉදිරිපත් නොකර මුදා හැරීම සඳහා මේ සැරයන්වරයා රුපියල් 20,000ක මුදලක් ඉල්ලා ඇති අතර එය ගන්නා අවස්ථාවේදී කොමිසමේ නිලධාරීන් සැකකරු අත්අඩංගුවට ගෙන ඇති බව සඳහන්ය.

එමෙන්ම මහනුවර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ කම්කරු නිලධාරියකු රුපියල් 10,000ක අල්ලස් මුදලක් ගනිද්දී පෙරේදා (3) කඩුගන්නාවේදී අත්අඩංගුවට ගත් බව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ කාන්තා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි පද්මිනි වීරසූරිය මහත්මිය පැවසුවාය.

පැමිණිලිකාර ව්‍යාපාරිකයා අකුරණ ප්‍රදේශයේ ලී මෝලක් පවත්වා ගෙන යන අතර එහි සේවකයන්ට අර්ථසාධක අරමුදල් නොගෙවීම සම්බන්ධව නීති මඟින් කටයුතු නොකර සිටීම සඳහා සැකකාර කම්කරු නිලධාරිවරයා රුපියල් 30,000ක මුදලක් ඉල්ලා තිබේ. ව්‍යාපාරිකයා විසින් එම මුදල කම්කරු නිලධාරියා සමඟ කතා කර ඔහු ඉල්ලන මුදල රුපියල් රු.15000 දක්වා අඩු කර ගෙන තිබූ අතර සැකකරු එම මුදලින් රුපියල් 5,000ක් අත්තිකාරම් වශයෙන් ගෙන ඉතිරි රුපියල් 10,000 ගනිද්දී අත්අඩංගුවට ගෙන තිබේ.

අල්ලස් ගෙන අත්අඩංගුවට ගත් කම්කරු නිලධාරියාගේ වාර්තා කැඳවා අනිවාර්යෙන් වැඩ තහනම් කරන බව කම්කරු කොමසාරිස් ජෙනරාල් නීතිඥ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා ප්‍රකාශ කළේය.

කුඹුරටම ඇවිත් වී මිල දී ගැනීම 8 දා සිට ඇරඹේ

නදී මාණික්කගේ

ගොවි බිම් වෙත ගොස් වී මිල දී ගැනීමේ ජාතික ක්‍රියාන්විතය මේ මස 8 වැනිදා සිට අප්‍රේල් 07 වැනිදා දක්වා කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශය සැලසුම් කර තිබේ.

රජයට වී සංචිතයක් පවත්වා ගෙන යෑම සහ තරගකාරී මිලට වී මිලදී ගැනීමේ අරමුණින් මේ වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

ඒ අනුව 2021 මාර්තු 08 වැනිදා සිට 2021 අප්‍රේල් 7 වැනිදා දක්වා කාලය තුළ වී මෙට්‍රික් ටොන් ලක්ෂ දෙකක් ගොවිබිම් වෙත ගොස් මිලදී ගන්නා ලෙස කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතා බලධාරීන්ට උපදෙස් දී තිබේ.

අනුරාධපුරය, මඩකලපුව, අම්පාර, පොළොන්නරුව, හම්බන්තොට සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක 6 සඳහා එම වැඩසටහන යටතේ ප්‍රමුඛත්වය දීමට නියමිතය.

හෙට සිට වියළි කාලගුණයේ වෙනසක්

උපාලි කරුණාරත්න

හෙට (06) දින සිට පවතින වියළි කාලගුණ තත්ත්වයේ වෙනසක් බලාපොරොත්තු වන බවත් දිවයිනේ බොහෝ ප්‍රදේශවල සවස් කාලයේ වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවීමේ වැඩි හැකියාවක් පවතින බවත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කාලගුණ අනාවැකියක් නිකුත් කරමින් කියා සිටී.

අද (05) දිවයිනේ නැඟෙනහිර වෙරළබඩ ප්‍රදේශවල සිහින් වැසි ඇති වේ.

1 පිටුවෙන් ...

නඩුව කල් දමා ගැනීමට ...

පාඨලී චම්පික රණවක මහතා අධිකරණයේ පෙනී සිටීමෙන් අනතුරුව මහාධිකරණ විනිසුරු නාමල් බලල්ලේ මහතා ඉදිරියේ අධි චෝදනා කියවා දුන්නේය.

2016 පෙබරවාරි 28 වැනි දින රාජගිරිය ප්‍රදේශයේදී අපරික්ෂාකාරීව අධික වේගයෙන්, පාරේ ගමන් ගන්නා සෙසු පුද්ගලයන් පිළිබඳ සැලකිල්ලකින් තොරව රියැදුරා තරුණයකුට බරපතළ තුවාල කිරීම, රියෙහි ගැටුණු තරුණයා රෝහලකට ගෙන යෑමකින් තොරව පලා යෑම, රිය අනතුර පිළිබඳ පොලිස් ස්ථානයකට වාර්තා නොකිරීම, 1951මොටර් රථ අඥාපනතේ 17 වගන්තිය ප්‍රකාරව දඬුවම් ලැබිය යුතු වැරදි සිදු කිරීම, දණ්ඩ නීති සංග්‍රහයේ 329 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදවල් කිරීම ඇතුළු අධි චෝදනා හතරක් විවෘත අධිකරණයේ කියවීය. අධි චෝදනා කියවීමෙන් අනතුරුව අදාළ චෝදනාවලට විත්තිකරු වරදකරුද? නිවැරදිකරුද යන්න අධිකරණයෙන් විමසීමට පෙර පාඨලි චම්පික රණවක මහතා වෙනුවෙන් පෙනී සිටි නීනිඥ ඉෂාන් ගම්පොළ මහතා අධි චෝදනාවලට එරෙහිව විත්තිය මගින් මූලික විරෝධතාවක් මතු කරන බවට කරුණු ඉදිරිපත් කළේය.

මූලික විරෝධතාව ඉදිරිපත් කිරීම නීත්‍යනුකූල නොවන බවට ප්‍රකාශ කළ පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතා මූලික විරෝධතා සදාචාරාත්මක නොවන බවද, නඩුව කල් දමා ගැනීමට යම් ප්‍රයත්නයක් ඇති බවද අධිකරණයට කරුණු ඉදිරිපත් කරමින් පැවසීය.

විත්තියේ නීතිඥ ඉෂාක් ගම්පොළ මහතා, - අධි චෝදනාවලට විත්තිය මඟින් මූලික විරෝධතාවක් ඉදිරිපත් කරන බව ජනාධිපති නීතිඥ අනුජ ප්‍රේමරත්න මහතා සඳහන් කළා. ඒ මහතා අද කොවිඩ් එන්නත ගන්නා බැවින් විරෝධතා ඉදිරිපත් කිරීමට දිනයක් දෙන ලෙස ඉල්ලා සිටිනවා.

නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතා, - ස්වාමිනි මේ මූලික විරෝධතාවට සම්පූර්ණයෙන් විරුද්ධයි. මේ විත්තිකරුට මේ වන විට අධි චෝදනා බාරදී තිබෙනවා. ඒ මීට මාස ගණනාවකට පෙරයි. එසේ අධි චෝදනා බාරගෙන ඊට ඇප ගෙන, ඇප තැන්පත් කළාටත් පසු මෙසේ මූලික විරෝධතාවක් ඉදිරිපත් කිරීම සදාචාර විරෝධියි. අද මේ නඩුව විභාගයටයි කැඳවා තිබෙන්නේ. චෝදනාවල වැරැද්දක් තිබුණා නම් කලින් කියන්න තිබුණා. අගතියට පත් තරුණයා රෝද පුටුවකින් අධිකරණ ශාලාවේ පෙනී සිටිනවා. සාක්කිකාරයෝ සිතාසි පිට ඇවිල්ලා ඉන්නවා. විත්තියට අද කනිෂ්ඨ නීතිඥවරයකු පෙනී සිටින නිසා මම ඔහුව අපහසුතාවට පත් කරන්නේ නැහැ. විත්තියේ නීතිඥවරයා තමන්ගේ පුද්ගලික සෞඛ්‍ය හේතුවක් නිසා නොපැමිණි බැවින් ඊට හබකරන්න යන්නේ නැහැ. නමුත් ස්වාමිනි මේ ක්‍රියාදාමයට මා තරයේ විරුද්ධ වෙනවා. අඩුම තරමේ මේ කාරණාව මීට පෙර පැමිණිල්ලට හෝ දැනුම් දෙන්න තිබුණා. මේ ක්‍රියාපටිපාටිය වහාම නැවැත්විය යුතුයි.

දිලීප පීරිස් මහතා වැඩි දුරටත් කරුණු ඉදිරිපත් කරමින් විත්තිකාර පාඨලි චම්පික රණවක මහතා විදුලි බල ඇමැතිව සිටියදී මේ රිය අනතුර සිදු වූ බවත්, හිටපු ඇමැතිවරයා පැදවූ රජයේ දේපළක් වන ජීප් රථය දැනට මුදල් අමාත්‍යාංශය සතු බවත් එම රථය නඩු භාණ්ඩයක් බැවින් අධිකරණයට ඉදිරිපත් කිරීමට මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාට දැනුම් දෙන ලෙසද, අනතුරට පත් සන්දීප් සම්පත් ගුණවර්ධන තරුණයා පැදවූ යතුරුපැදිය අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට නියෝග කරන ලෙසත් ඉල්ලා සිටියේය.

දෙපාර්ශවයේ කුරුණු සලකා බැලූ මහාධිකරණ විනිසුරුවරයා අදාළ නියෝග කරමින් යතුරුපැදිය දැන්වූ පසු අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට අගතියට පත් පාර්ශවයට නියෝග කළේය.

විත්තියේ මූලික විරෝධතාව පිළිබඳ විමසීම අප්‍රේල් 27 දිනට නියම කළ අතර සාක්ෂිකරුවන්ට සිතාසි ලද පසු අධිකරණයේ පෙනී සිටින ලෙස දන්වා සිටියේය.

වෙළෙඳ හිඟය ...

විදේශ අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සමීපව අධීක්ෂණය කරමින් කටයුතු කරන බව පැහැදිලි කළ අධිපතිවරයා විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ 2020 වසරේ මැද භාගයේ සිට අඛණ්ඩව ඉහළ යමින් සියයට 5.8ක වාර්ෂික වර්ධනයක් වාර්තා කළ අතර 2021 ජනවාරි මාසයේදී පෙර වසරට සාපේක්ෂව සියයට 16.3කින් තවදුරටත් වර්ධනය වූ බවද අධිපතිවරයා කීය.

දේශීය හා ගෝලීය කොවිඩ් 19 එන්නත්කරණයත් සමඟ සංචාරක අංශය මේ වසරේදී ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. විනිමය අනුපාතිකය වරින් වර විචලනයක් වාර්තා කළ අතර විදේශීය විනිමය වෙළෙඳපොළ තුළ එවැනි විචලනයක් ඇතිවීම සඳහා හේතු වූ අහිතකර සමපේක්ෂණයන් පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පියවර ගෙන ඇත. එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය 2020 වසරේදී සියයට 2.6කින් අවප්‍රමාණය වීමෙන් අනතුරුව 2021 වසරේ මේ දක්වා කාලය තුළදී සියයට 4.5කින් අවප්‍රමාණය වී ඇත.

වසර 2021 ජනවාරි වන විට දළ නිල සංචිත ප්‍රමාණය මාස 3.7න ආනයන ආවරණයක් සහිතව එක්සත් ජනපද ඩොලර් බිලියන 4.8ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. විදේශ මූල්‍යකරණය සුරක්ෂිත කිරීමේ සාකච්ඡා අඛණ්ඩව ක්‍රියාත්මක වේ. තවද රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වාදුන් ක්‍රියාමාර්ගයන්හි සහාය ලබමින් ණය නොවන විදේශ විනිමය ගලාඒම් ඉහළ යෑමක් අපේක්ෂා කෙරේ. අහිතකර සමපේක්ෂණයන් මධ්‍යයේ වුවද 2021 වසරේ මේ දක්වා කාලය තුළදී රජයේ සියලුම ණය සේවාකරණ වගකීම් නිසි පරිදි සපුරා ඇති අතර ඉදිරියේදී ද ණය සේවාකරණයේ නොකැළැල් වාර්තාව පවත්වා ගැනීම සඳහා රජය කැප වී සිටින බවද අධිපතිවරයා කීය.

බැචලේ වාර්තාව ගැන ...

එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන් හේතුවෙන් නිවෙස් අහිමි වූ සහ අවතැන්වූ දෙමළ සහ මුස්ලිම් ජනතාවගේ යථිතල පහසුකම් යථා තත්ත්වයට පත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ගෙන තිබෙන දැවැන්ත උත්සාහය මුළුමනින්ම නොසලකා හරින ලද ජගත් මානව හිමිකම් කවුසලයේ මහ කොමසාරිස්වරියගේ වාර්තාව මුළුමනින්ම සනාථ නොකළ චෝදනා හා ප්‍රකාශවලින් පිරී තිබෙන බවට චෝදනා කරන නෙස්බි සාමිවරයා පළපුරුදු හා විනයගරුක හමුදාවක් ලෙස ශ්‍රී ලංකා රජයේ හමුදා සෑම මට්ටමකින්ම ක්‍රියා කර තිබෙන බවද මිනිස් පලිහක් ලෙස රඳවාගෙන සිටි දෙමළ සිවිල් වැසියන්ට කිසිදු හානියක් නොවන ලෙස දැඩි උත්සාහයක් දරමින් ඔවුන් මුදා ගැනීමට පියවර ගෙන තිබෙන බවද පෙන්වා දෙයි.

බ්‍රිතාන්‍ය ප්‍රමුඛ රටවල් කිහිපයක් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමට නියමිත යෝජනාව එක්සත් ජාතීන්ගේ ස්ථාවරයට මුළුමනින්ම හානි කර බව පෙන්වා දී තිබෙන සාමිවරයා ළමා සොල්දාදුවන් 5,000කට අධික සංඛ්‍යාවක් බඳවා ගනිමින්, පුහුණු කරමින් හා ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වල යෙදවීම සම්බන්ධයෙන් එල්.ටී.ටී.ඊ. ත්‍රස්ත සංවිධානයේ නායකයන් වගකිව යුතු බවද එක්සත් රාජධානියේ වෙසෙන එල්.ටී.ටී.ඊ. නායකයන්ට එරෙහිව මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු බවද පෙන්වා දී ඇත.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදෙස් අනුව කොවිඩ් 19 මරණ භූමදානය සඳහා මේ වන විට ශ්‍රී ලංකාව අවසර දී තිබෙන අතර මිලියන 66ක් වෙසෙන බ්‍රිතාන්‍යයේ මේ වන විට පුද්ගලයන් 120,000කට වැඩි පිරිසක් මියගොස් තිබෙන නමුත් මිලියන 22ක ජනගහනයක් වෙසෙන ශ්‍රී ලංකාවේ මියගොස් තිබෙන්නේ පුද්ගලයන් 400 දෙනකු බවද සඳහන් කර තිබේ. ඒ අනුව ශ්‍රී ලංකාව ජනතාවගේ ජීවිත බේරා ගැනීම වෙනුවෙන් විශාල උත්සාහයක් ගෙන තිබෙන බවද පෙන්වා දී ඇත.

ජගත් මානව හිමිකම් මහ කොමසාරිස් මිෂෙල් බැචලේගේ ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තාවෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානය විරත්වයට පත් කිරීමට උත්සාහ දරා ඇති බවට බ්‍රිතාන්‍යයේ නෙස්බි සාමිවරයා චෝදනා නඟන අතර එම වාර්තාව පදනම් කර ගනිමින් බ්‍රිතාන්‍යය ඇතුළු මානව හිමිකම් මණ්ඩලයේ ශ්‍රී ලංකාව පිළිබඳ මූලික සත්කාරක කණ්ඩායම විසින් යෝජනාවක්ද ජිනීවා මානව හිමිකම් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිත බව කියා සිටී.

මානව හිමිකම් කොමසාරිස්වරියගේ වාර්තාවෙන් එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන්ගේ ක්‍රෑරත්වය අමතක කර ඇති බව සඳහන් කර තිබෙන ඒ මහතා කුරිරු ත්‍රස්ත සංවිධානයක් වන එල්.ටී.ටී.ඊත සංවිධානය මධ්‍යස්ථ මතධාරි දෙමළ නායකයන් මෙන්ම, හිටපු ජනාධිපති ආර්. ප්‍රේමදාස සහ ඉන්දීය අග්‍රාමාත්‍ය රජීව් ගාන්ධි ද ඝාතනය කර ශ්‍රී ලංකාවේ වෙනම රාජ්‍යයක් පිහිටුවීමට උත්සාහ කළ බව ප්‍රකාශ කර තිබේ.

රටටම කුඩු බෙදන්නේ මිදිගමින්

පොලිස් මාධ්‍ය ප්‍රකාශක

රක්ෂණ ශ්‍රියන්ත

වැලිගම දිස්ත්‍රික්කයේ මිදිගම ප්‍රදේශය ශ්‍රී ලංකාව පුරා හෙරොයින් සහ කෘත්‍රිම මත්ද්‍රව්‍ය බෙදාහැරීමේ කේන්ද්‍රස්ථානයක් බවට හඳුනාගෙන ඇතැයි පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා ඊයේ (04) පැවසීය. මේ නිසා මේ ප්‍රදේශය තුළ අඛණ්ඩව වැටලීම් කිරීමට පියවර ගෙන ඇතැයිද හෙතෙම කීවේය. ඒ අනුව වැලිගම ප්‍රදේශයේදී පෙරේදා (03) දිනයේද හෙරොයින් ග්‍රෑම් 145ක් සමඟ 38 හැවිරිදි කාන්තාවක් අත්අඩංගුවට ගැනීමට පොලිස් විශේෂ කාර්ය බළකා නිලධාරීන් සමත් වී ඇත.

දරණාගම කුසලධම්ම හිමිට පුණ්‍යානුමෝදනා කෙරෙන සත්බුදු වන්දනා පින්කම 7දා

තෙවසරකට පෙර අපවත් වී වදාළ දරණාගම කුසලධම්ම හිමියන්ට පුණ්‍යානුමෝදනා කර පැවැත්වෙන මහානුභාව සම්පන්න සත්බුදු වන්දනා පින්කම මේ මස 07වැනිදා පස්වරු 6.00ට අවිස්සාවේල්ල කොස්ගම, මානකඩ ශ්‍රී නන්දනාරාම විහාරස්ථානයේ දී පැවැත්වීමට කටයුතු යොදා තිබේ.

සල්ගල ආරණ්‍යවාසී කුඹුක්කඩවිල සුධීර හිමියන්ගේ අනුශාසනා පරිදි පැවැත්වෙන මේ පින්කමට ජනාධිපති පෞද්ගලික ලේකම් සුගීෂ්වර බණ්ඩාර මහතා ඇතුළු පිරිසක් සහභාගි වීමට නියමිතය.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් අජන්ත කරුණාරත්න අභාවප්‍රාප්ත වෙයි

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් කැලණිය විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා විශේෂ උපාධිධාරී ජනප්‍රිය හා ප්‍රවීණ නිවේදක දේශප්‍රේමී ජාතික ව්‍යාපාරයේ ඉදිරි පෙළ ක්‍රියාකාරික අජන්ත කරුණාරත්න මහතා අභාවප්‍රාප්ත විය. ගම්පහ ජා ඇළ පාරේ කිරිඳිවිට නිවෙසේ දේහය තැන්පත් කර තිබෙන අතර අවසන් කටයුතු අද (05) ගම්පහ කසගහවත්ත නාගරික පොදු සුසාන භූමියේදී සිදු කිරීමට නියමිතය.

1 පිටුවෙන් ...

කුරුණෑගල නගරාධිපති...

මේ සිද්ධිය සම්බන්ධයෙන් සොයා බැලීමට අගමැති මහින්ද රාජපක්ෂ මහතා පත් කළ පංච පුද්ගල කමිටුවේ අතුරු වාර්තාව මඟින් මේ අපරාධයට වගකිව යුතු නගරාධිපති ඇතුළු පිරිසට එරෙහිව නීතිමය පියවර ගන්නා ලෙස නිර්දේශ කර තිබෙන නමුත් එම නිර්දේශ ද මෙතෙක් ක්‍රියාත්මක කර නැති බවට පෙත්සම මඟින් පැමිණිලි කර ඇත.

විගී ...

මෑතකදී ඉන්දියාවේ භාරතීය ජනතා පක්ෂය ශ්‍රී ලංකාවේ පිහිටුවීමට මූලික සැලසුමක් ක්‍රියාත්මක වූ අවස්ථාවේදී ඔහු ඊට දැඩි ලෙස විරෝධය පළ කළේය. අලුතින් විග්නේශ්වරන් මහතා විසින් පිහිටුවීමට යන නව සන්ධානයේ ලාංඡනය නෙලුම් මල විය හැකි බවට ඔහු අදහස් දක්වා තිබේ. උතුරු නැඟෙනහිර පළාත්වලට අමතරව කඳුකරයේ හා වතුකරයේ සහාය නව සන්ධානය වෙනුවෙන් ගැනීමට අපේක්ෂාවෙන් ඔහු ඉන්දීය භාරතීය ජනතා පක්ෂයම නොවූවත් ඊට සමාන නව දෙමළ දේශපාලන සන්ධානයක් බිහි කිරීම ඔහුගේ අරමුණ බව උතුරේ දෙමළ දේශපාලනඥයෝ පවසති. කෙසේ වෙතත් මේ වන විට විග්නේශ්වරන් මන්ත්‍රීවරයා දෙමළ ජාතික සන්ධානයෙන් ඉවත් වීමෙන් පසු අවස්ථා තුනකදීම වරින් වර නව දෙමළ සන්ධාන බිහිකොට එම සන්ධානවල නායකයා වී තිබේ. තමිල් මක්කල් තේසීය කූට්ටනි (TMTK) සන්ධානය අලුතින්ම පිහිටුවා ඒ ඔස්සේ පසුගිය මහ මැතිවරණයට ඔහු යාපනයෙන් තරග කොට දැනට මන්ත්‍රීවරයකු වශයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරයි.

මියන්මාරයේ ...

පෙබරවාරි 1 වැනිදා හමුදා කුමන්ත්‍රණයෙන් පසුව, රඳවාගෙන සිටින තේරී පත් වූ නායකයන් නිදහස් කරන ලෙස ඉල්ලා මියන්මාරය විරෝධතා උත්සන්න වී තිබේ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කාර්යාලයට අනුව, විරෝධතා ආරම්භ වූ දා සිට මේ දක්වා පුද්ගලයන් 54කට වැඩි පිරිසක් මියගොස් තිබේ. මීට දිනකට පෙර මියන්මාරයේ කුමන්ත්‍රණ විරෝධී උද්ඝෝෂණ අතරතුර වෙඩි තබා ඝාතනය කළ 19 හැවිරිදි කාන්තාවකගේ අවමංගල්‍ය උත්සවය සඳහා ඊයේ (04) මැන්ඩලේහි විශාල පිරිසක් රැස්ව සිට තිබේ. ඇය මිය යන විට 'සියල්ල හොඳින් සිදුවනු ඇත' යන වාක්‍ය ඛණ්ඩය සහිත ටී ෂර්ට් එකක් ඇඳ සිටි බව පැවසේ. බොහෝ දෙනකු ඇයව 'වීරවරියක්' ලෙස හැඳින්වීමත් සමඟ සමාජ මාධ්‍යවල උපහාර පිදී ඇත. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් මිෂෙල් බැචලේට ආරක්ෂක හමුදාවන්ගෙන් ඉල්ලා සිටියේ සාමකාමී විරෝධතාකරුවන්ට එරෙහි දරුණු මර්දනය නතර කරන ලෙසයි.

19 හැවිරිදි ඇන්ජල්ගේ අවමංගල්‍යයට ජනතාව විශාල වශයෙන් සහභාගි වී ඇත. බ්‍රහස්පතින්දා මැන්ඩලේහිදී, ඒන්ජල්ගේ අවමංගල පෙරහරේ ගමන් ගත් ජනතාව පෙළ ගැසී ඇත. ශෝකවන්නෝ විප්ලවීය ගීත ගායනා කළ අතර කුමන්ත්‍රණ විරෝධී සටන් පාඨ කිය වූ බව රොයිටර් පුවත් ඒජන්සිය වාර්තා කරයි. විරෝධතාවයේදී මේ යුවතිය ඇඳගෙන සිටි 'සියල්ල හොඳින් වනු ඇත' ටී ෂර්ට් එක පැලඳ සිටි ඡායාරූප සමාජ මාධ්‍යවල පැතිරී ගොස් තිබේ. උද්ඝෝෂණවලට සහභාගි වීමේ අන්තරායන් පිළිබඳ දැන සිටි ඇය සිය රුධිර ගණය පිළිබඳ තොරතුරු ෆේස්බුක්හි ලියා ඇති අතර ඇය මිය ගිය විට ඇගේ ශරීර අවයව පරිත්‍යාග කරන ලෙස ඉල්ලා තිබේ.

බදාදා පැවති විරෝධතාවයේදී ඇය සමඟ සිටි මියාත් තූ කියා සිටියේ විරෝධතාකරුවන්ට ඔවුන්ගේ ඇස්වලින් කඳුළු ගෑස් සේදීමට හැකි වන පරිදි ජල නළයක් විවෘත කළ බවයි. පොලිසිය වෙඩි තැබීමත් සමඟ ඇය ඔහුට උදව් කිරීමට උත්සාහ කර තිබේ. "ඇය මට කිව්වා 'ඉඳගන්න! උණ්ඩ ඔබට වදියි'' කියා ඔහු රොයිටර් පුවත් සේවයට පැවසීය. "ඇය අන් අයව රැක බලා ගත්තා" යැයි මියාත් වැඩි දුරටත් කීවේය.

කුරුවිට තරුණියගේ ...

එම යුවළ නැවතී සිටි නවාතැන්පොළ හංවැල්ල - කොළඹ මාර්ගයේ කැලණි ගඟ ආසන්න ප්‍රදේශයක පිහිටා ඇති බැවින් යම් හෙයකින් ඝාතකයා විසින් කාන්තාවගේ හිස බැගයේ දමා කැලණි ගඟට විසි කරන්නට ඇතැයි පොලිස් විමර්ශන කණ්ඩායම් සැක පළ කර ඇති බවත් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා මාධ්‍යයට ඊයේ (04) පැවසීය.

මේ මෙහෙයුම යටතේ කැලණි ගඟ මුහුදට සම්බන්ධ වන මෝදර ප්‍රදේශයේ සිට හංවැල්ල දක්වා අදාළ සෝදිසි කිරීම් කිරීමට නියමිතය.

කාන්තා මළ සිරුරේ අනන්‍යතාව නිශ්චිත ලෙසම හඳුනා ගැනීමට ඇයගේ සහ ඥාතීන්ගේ ඩී.එන්.ඒ. පරීක්ෂා කිරීමට පෙරේදා (03) කටයුතු කර තිබිණි.

අදාළ කාන්තාවගේ හිස නොමැති හෙයින් ඥාතීන්ගේ ඩී.එන්.ඒ. පරීක්ෂණ කිරීමෙන් අනතුරුව පශ්චාත් මරණ පරීක්ෂණය කිරීමට නියමිත බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා වැඩි දුරටත් පැවසීය.

මේ සම්බන්ධයෙන් වැඩි දුර විමර්ශන වේල්ලවීදිය පොලිසිය සහ බඩල්කුඹුර පොලිසිය කරයි.

1 පිටුවෙන් ...

පාස්කු ප්‍රහාර සෙවූ ...

කතානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව ඊයේ (4) රැස්වූ අතර එහිදී මේ තීරණය ගෙන තිබේ.

ඒ අනුව ජනාධිපති කොමිෂන් සභා වාර්තාව, රජය විසින් ගෙන එනු ලබන සභාව කල් තැබීමේ යෝජනාවක් ලෙස විවාදයට ගැනීමට එම රැස්වීමේදී තීරණය කළ බව පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා සඳහන් කළේය.

ආණ්ඩු පක්ෂය විසින් ඉදිරිපත් කරනු ලබන සභාව කල් තැබීමේ යෝජනාවක් ලෙස පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය පිළිබඳ සොයා බැලූ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව පිළිබඳ විවාදය පෙරවරු 11.00 සිට පස්වරු 5.30 දක්වා පැවැත්වීමට තීරණය කළ බවද මහ ලේකම්වරයා පැවසීය.

මාර්තු 9 වැනිදා පෙරවරු 10. 00ට පාර්ලිමේන්තුව ආරම්භ කරන අතර පෙරවරු 10.00 සිට පෙරවරු 11.00 දක්වා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න සඳහා කාලය වෙන් කෙරෙනු ඇත.

ඉන් පසු පසුගිය පාර්ලිමේන්තු වාරයේදී කල් තබන ලද මැණික් හා ස්වර්ණාභරණ පනත යටතේ ගෙන එනු ලබන රෙගුලාසි පිළිබඳ විවාදය, විදේශ විනිමය පනත යටතේ වන රෙගුලාසියක් සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝග 2ක් පිළිබඳ විවාදයද පෙ. ව. 11.00 සිට ප. ව. 03.30 දක්වා පැවැත්වීමට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී පක්ෂ නායකයන් තීරණය කළ බව ධම්මික දසනායක මහතා සඳහන් කළේය.

මෙරට කාන්තාවන්ට වූ වෙනස්කම් සහ කාන්තාව

බන්ධනාගාර නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම හා වැඩි කිරීම් ගැන සාකච්ඡාවක්

බුද්ධිකා ඉඹුලාන

බන්ධනාගාර නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම හා වැටුප් වැඩිකිරීම පිළිබඳ සාකච්ඡාවක් ඊයේ (04) අධිකරණ ඇමැති අලි සබ්රි මහතාගේ ප්‍රධානත්වයෙන් අධිකරණ අමාත්‍යාංශයේදී පැවැත්විණි. බන්ධනාගාර නිලධාරින් කලක් තිස්සේ සිදු කරන මේ වැටුප් වැඩි කිරීමේ ඉල්ලීම පිළිබඳ වැටුප් හා සේවක කොමිෂන් සභාව වෙත මෙයට පෙර ද දැනුම් දී තිබිණි.

එහිදී බන්ධනාගාර දෙපාර්තමේන්තුව පෙන්වා දී තිබුණේ බන්ධනාගාර නිලධාරියා ඉටු කරන දුෂ්කර මෙන්ම සුවිශේෂී සේවාව සලකා බලා පොලිස් නිලධාරින්ට දුන් වැටුපෙන් 40% ක දීමනාව තමන්ටද ලබා දෙන ලෙසයි.

විශේෂයෙන්ම බන්ධනාගාරයේ සිටින දරුණු ගණයේ අපරාධකරුවන් සිරකරුවන් රඳවා තැබීම ,ආරක්ෂා කිරීම.පුනරුත්ථාපනය කිරීම ආදී කටයුතුවලදී බන්ධනාගාර නිලධාරියා සුවිශේෂී කාර්යභාරයක් සිදු කරන බවත් එමෙන්ම බන්ධනාගාර නිලධාරි හිඟය මත අවිවේකීව එක දිගටම රාජකාරි කටයුතුවල නිරත වීමට ඔවුන්ට සිදු වන බවත් මේ අභියෝග හමුවේ සේවා කටයුතු කරන බන්ධනාගාර නිලධාරියාට වැටුප් වැඩි කිරීමක් සිදු කළයුතු බවත් එම දෙපාර්තමේන්තුව පෙන්වා දී තිබිණි. වැටුප් හා සේවක කොමිෂන් සභාව වෙත මෙහි අත්‍යවශ්‍යතාව දැනුම් දී එහි නිර්දේශ කඩිනමින් ලබාගෙන, බන්ධනාගාර නිලධාරීන් කලක් තිස්සේ බලාපොරොත්තු වන වැටුප් වැඩිකිරීමේ ක්‍රියාවලිය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට ගත හැකි සියලුම ක්‍රියාමාර්ග ගැනීමට අධිකරණ ඇමැති අලි සබ්රි මහතා මෙහිදී එකඟතාව පළ කර තිබේ.බන්ධනාගාර කළමනාකාර හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය ඇමැති ලොහාන් රත්වත්තේ මහතා මෙහිදී ප්‍රකාශ කර ඇත්තේ බන්ධනාගාර නිලධාරීන්ට වූ වැටුප් වැඩිකිරීමේ ක්‍රියාවලිය හැකි ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට තමා කටයුතු කරන බවයි.

අධිකරණ අමාත්‍යාංශ ලේකම් එම්.එම්.පී.කේ. මයාදුන්න, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය, බන්ධනාගාර කොමසාරිස් තුසිත ඉන්දජිත් උඩුවර, බන්ධනාගාර කොමසාරිස් (පාලන) හා බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක චන්දන ඒකනායක මහත්වරුන් ඇතුළු රාජ්‍ය නිලධාරිහු රැසක්ද මේ අවස්ථාවට සහභාගි වූහ.

මොන සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළත් ප්‍රමුඛ අරමුණ ජනතා අවශ්‍යතාව විය යුතුයි

අගමැති මහින්ද රාජපක්ෂ

කවර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළද සෑම ව්‍යාපෘතියකම ප්‍රමුඛ අරමුණ විය යුත්තේ ජනතාවගේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා පවසයි.

රාගම සිට කොළඹ කොටුව හරහා කිරුලපන දක්වා ද, මොරටුව, පිළියන්දල, නාරාහේන්පිට හරහා කැලණිය දක්වා ද, කොට්ටාව, පන්නිපිටිය, තලවතුගොඩ හරහා හුනුපිටිය දක්වා ද ඉදි කිරීමට යෝජිත මේ ව්‍යාපෘතියට වඩාත් ජනාකීර්ණ නගරයක් වන මහරගම නගරයද ඇතුළත් කිරීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇති බවද අගමැතිවරයා සඳහන් කළේය.

මහරගම නගරය වෙත පිට පළාත්වලින් විශාල පිරිසක් පැමිණෙන බව පෙන්වා දුන් අගමැතිවරයා දැනට පවතින නගරයේ දැඩි රථ වාහන තදබදයට ද මේ ව්‍යාපෘතිය විසඳුම් ලැබෙනු ඇති බවද සඳහන් කළේය.

සංවර්ධනය සිදුවිය යුත්තේ ජනතා අවශ්‍යතා වෙනුවෙන් බවත් එසේ නොවන සංවර්ධන ව්‍යාපෘති රටට අනවශ්‍ය බවද පැවසිය.

අගමැති මහින්ද රාජපක්ෂ මහතා මේ බව සඳහන් කළේ කොළඹ නගරයේ රථ වාහන තදබදය අවම කිරීමේ අරමුණෙන් යෝජිත දුම්රිය ව්‍යාපෘතියේ පළමු අදියර පිළිබඳ මුදල් අමාත්‍යාංශයේ දී පැවැති සාකච්ඡාවකට එක්වෙමිනි.

මේ ව්‍යාපෘතියේ මුල් අදියර යටතේ කොළඹ සහ තදාසන්න ප්‍රදේශ ආවරණය වන පරිදි ඉදි කිරීමට දුම්රිය මාර්ග තුනක් හඳුනාගෙන තිබේ. රාගම සිට කොළඹ කොටුව හරහා කිරුලපන දක්වා ද, මොරටුව, පිළියන්දල, නාරාහේන්පිට හරහා කැලණිය දක්වා ද, කොට්ටාව, පන්නිපිටිය, තලවතුගොඩ හරහා හුනුපිටිය දක්වා ද ඉදි කිරීමට යෝජිත බව නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරිහු අගමැතිවරයාට ප්‍රකාශ කළහ.

ඒ අනුව කිලෝමීටර් 21.5ක දුරකින් සමන්විත යෝජිත කොට්ටාව, හුනුපිටිය දුම්රිය මාර්ගය සඳහා මහරගම නගරය ඇතුළත් කළ හැකි බව නාගරික සංවර්ධන අධිකාරි නිලධාරිහු අගමැතිවරයාට හමුවේ කියා සිටියහ.

මාර්ග තදබදය හේතුවෙන් 2019 වසරේදී ශ්‍රී ලංකාවට සිදු වූ දෛනික ආර්ථික අලාභය රුපියල් මිලියන 1000ක් ලෙස ගණන් බලා තිබේ. ඊට එක් විසඳුමක් ලෙස වත්මන් රජය මගින් පසුගියදා ආරම්භ කළ සිටි බස් ව්‍යාපෘතිය මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. සිය පෞද්ගලික වාහනවලින් කොළඹ නගරයට පැමිණෙන ජනතාව සිටි බස් ව්‍යාපෘතිය ඔස්සේ මේ දුම්රිය මාර්ග පද්ධතියට සම්බන්ධ කිරීම මේ ව්‍යාපෘතියේ අරමුණ වේ . වසර හතරකින් වැඩ අවසන් කිරීමට අපේක්ෂිත රාජ්‍ය සහ පෞද්ගලික සහයෝගීතා ව්‍යාපෘතියක් (Public Private Partnership) ලෙස ක්‍රියාත්මක මේ සඳහා අමෙරිකානු ඩොලර් මිලියන 5000ක සෘජු විදේශ ආයෝජනයක් වේ . සියයට හයක රජයේ දායකත්වක් ද මේ ව්‍යාපෘතිය සඳහා ලබාදීමට යෝජිත වේ. මේ දුම්රිය ව්‍යාපෘතිය මගින් පමණක් දෛනිකව රුපියල් මිලියන 550ක පමණ ඉතිරියක් අපේක්ෂා කෙරේ.

මේ ව්‍යාපෘතියට විදේශ ආයෝජකයන් සම්බන්ධ කර ගැනීමේ දී ඔවුන්ගේ ඉල්ලීම් සියල්ල හොඳින් සලකා බලන ලෙස උපදෙස් දුන් අගමැති මහින්ද රාජපක්ෂ මහතා කියා සිටියේ එම වගකීම නාගරික සංවර්ධන අධිකාරියේ බලධාරින් සතු වන බවයි.

මුදල් රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල්, භාණ්ඩාගාර ලේකම් එස්. ආර්. ආටිගල ඇතුළු පිරිසක් ද මේ අවස්ථාවට එක් වූහ.

වෙළෙඳපොළේ මිලට වඩා අඩුවෙන් පාසල් දරුවන්ට මේ මාසයේ සිට සතොසෙන් අභ්‍යාස පොත් සහ සපත්තු

වෙළෙඳ ඇමැති ආචාර්ය, බන්දුල ගුණවර්ධන

ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා ඇතුළු පිරිස මාධ්‍ය හමුවට සහභාගි වී සිටි අයුරු.

අනුර ප්‍රේමලාල්

පාසල් ළමයින්ට වෙළෙඳපොළේ පවතින මිලට වඩා අඩුමුදලකට අභ්‍යාස පොත් සහ රුපියල් 300ක් අඩුවෙන් සපත්තු යුගලක් මේ මාසයේ සිට සතොසෙන් මිලදී ගැනීමට පාරිභෝගික ජනතාවට හැකි වන බව වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා ඊයේ (04) ප්‍රකාශ කළේය.

රජය මිල අඩු කළ භාණ්ඩ 27 ක වාසිය පෞද්ගලික වෙළෙඳසල් ඔස්සේ ද ජනතාවට ලබාදෙන්නැයි පෞද්ගලික වෙළෙඳුන්ගෙන් ඉල්ලීමක් ද කළේය.

ඉදිරියේදී "මෙගා සතොස" නමින් විශාල පරිමාණයේ සතොස අලෙවිසල් දිවයින පුරා ආරම්භ කරන බව පැවැසූ ඇමැතිවරයා, රාජ්‍ය ආයතනවල සේවය එකම වහලක් යටතේ ලබා ගැනීමේ "රජවාස" මධ්‍යස්ථාන වව්නියාව, මඩකලපුව, හම්බන්තොට ආදි ප්‍රදේශවලද ආරම්භ කිරීමට මේ වසරේ කටයුතු සැලසුම් කර ඇති බව හෙතෙම කියා සිටියේය.

ඒ මහතා මේ බව සඳහන් කළේ ඊයේ (04) වෙළෙඳ අමාත්‍යාංශයේ පැවැති මාධ්‍ය හමුවකට එක්වෙමිනි. එහිදී වැඩිදුරටත් මෙසේද කීය.

පෙබරවාරි මාසයේ සිට අත්‍යාවශ්‍ය භාණ්ඩ 27ක මිළ ස්ථාවර කිරීම දැන් හොඳින් ක්‍රියාත්මක වෙනවා. "සහල් කිලෝවක් රු100කට අඩුවෙන්ද සීනි කිලෝවක් රු99කටද, තිරිඟුපිටි කිලෝවක් රු84කට, පරිප්පු කිලෝවක් රු150කටද, කිරිපිටි ග්‍රෑම් 400 පැකට්ටුවක් රු 355කටද, කුකුල් මස් කිලෝවක් රු 400කටද, සතොස හා සමුපකාර වෙළෙඳසල් හරහා පෙබරවාරි මාසයේ සිට අලෙවි කළ අතර මාර්තු, අප්‍රේල් මාස දෙක සඳහා ද මේ ස්ථාවර මිල යටතේ අලෙවි කෙරෙනවා.

සෘජු ආනයනකරුවන් හා දේශීය නිෂ්පාදකයන්ගේ භාණ්ඩ ස්ථාවර මිල ගණන් යටතේ රජය මිලදී ගෙන පාරිභෝගිකයා වෙත ලබාදීමෙන් සතොස ජනවාරි මාසයට වඩා 55%ක ඉහළ ආදායමක් ලබා ගැනීමට හැකි වී තිබෙනවා.

රාජ්‍ය ඇමැති ලසන්ත අලගියවන්න, වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම් හඳානි ජයවර්ධන, ලංකා සතොස සභාපති විශ්‍රාමික රියාද් අද්මිරාල් ආනන්ද පිරිස්, සතොස ප්‍රධාන විධායක නිලධාරි ඇතුළු මහත්ම මහත්මීහු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

ඡායාරූපය- ගයාන් පුෂ්පික

පල්ලේගම ශ්‍රී ජිනරතන නාහිමියන් සම්බුදු සසුනේ චිරස්ථිතියටත් ප්‍රදේශවාසීන්ගේ ජන ජීවිතය නැංවීමටත් කළ සේවය අපමණයි

ශෝක පණිවිඩයෙන් අගමැති කියයි

සම්බුදු සසුනේ චිරස්ථිතිය වෙනුවෙන් පමණක් නොව තම ප්‍රදේශවාසීන්ගේ ජනජීවිතය නගාසිටුවීමට ද ගිරුවාගම් දොළොස්දහස් රට ප්‍රධාන සංඝනායක පල්ලේගම ශ්‍රී ජිනරතන නායක හිමියන් අපමණ සේවාවක් සිදු කර තිබෙන බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා ප්‍රකාශ කරයි.

අපවත් වී වදාළ පල්ලේගම ශ්‍රී ජිනරතන නායක හිමියන් වෙනුවෙන් ශෝක පණිවිඩයක් නිකුත් කරමින් අගමැති මහින්ද රාජපක්ෂ මහතා මේ බව සඳහන් කරයි. එහි මෙසේද දැක්වේ:

හාතාගල රජමහා විහාරය ඇතුළු විහාරයන්හි අධිපති, ශ්‍රී සුමංගල විද්‍යායතන පිරිවෙනේ කෘත්‍යාධිකාරි නිල්වලා ආනන්ද විද්‍යාලයේ කළමනාකාර, රුහුණු මාගම්පත්තුව ඇතුළු ගිරුවාගම් දොළොස්දහස් රට ප්‍රධාන සංඝනායක, ගෞරවාර්හ පල්ලේගම ශ්‍රී ජිනරතන නායක හිමියන් අපවත් වූ පුවත ඇසීමෙන්, මම බලවත් සංවේගයට පත් වීමි.

වසර 67ක තම ජීවන ගමන්මගේ වසර 54ක් සම්බුදු සසුනේ උතුම් භික්ෂුවක ලෙස ගතකළ ජීවිතය අනුස්මරණය කිරීමට කැමැත්තෙමි. හක්මන ලාල්පේ ශ්‍රී ගුණානන්ද පිරිවෙනින් භික්ෂුවකට අවශ්‍ය ත්‍රිපිටක ධර්මය හා විවිධ භාෂා උගත් අතර, පසුව උන්වහන්සේ තම ප්‍රාදේශවාසීන්ගේ ජනජීවිතය නගාසිටුවීම ට අපමණ සේවාවක් සිදු කළහ.

ශ්‍රී සුමංගල විද්‍යායතන පිරිවෙන ආරම්භ කිරීමේ දී මහත් කැපවීමෙන් කටයුතු කළ අතර, එය අද ප්‍රදේශයේ ගිහි පැවිදි ශිෂ්‍ය පිරිසට අධ්‍යාපනය දෙන ප්‍රමුඛ ආයතනයක් බවට පත්ව තිබීම සතුටට කරුණකි.

නිල්වලා ආනන්ද විද්‍යාලය රජයේ ආධාර ලබන පාසලක් බවට පත්කළ අතර, එයින් සමාජයට විශාල ශිෂ්‍ය ප්‍රජාවක් බිහි කිරීමට හැකිවිය. ප්‍රදේශයේ ජනතාව අතර, පවතින ප්‍රධාන ගැටලු අතර කෘෂිකර්මයට අවශ්‍ය වැව් අමුණු රජය සමඟ ඒකාබද්ධව සංවර්ධනය කිරීම, ජල විදුලිය නොමැති දිළිඳු ජනතාවට හා ගම්වලට අවශ්‍ය පහසුකම් ලබාදීම, මංමාවත් පිළිසකර කොට සංවර්ධනය කිරීම වැනි කාර්යයන් සඳහා ප්‍රමුඛවූයේ උන්වහන්සේය. නායක හිමිගේ අපවත්වීම දකුණු පළාතට පමණක් නොව මුළු රටටම සිදුවූ බලවත් පාඩුවකි. පුරා වසර 67 ක් ආයුවළඳා අපවත් වී වදාළ ගෞරවාර්හ පල්ලේගම ශ්‍රී ජිනරතන නායක ස්වාමීන් වහන්සේට උතුම් නිවන්සුව අත්වේවායි ප්‍රාර්ථනා කරන අතර, උන්වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයා ගෞරවාර්හ පල්ලේගම වංගීස ස්වාමීන් වහන්සේ ඇතුළු ශිෂ්‍ය හා සහෝදර පිරිසටත්, විහාරස්ථ දායක සභාවටත්, ප්‍රදේශවාසි සැමටත්, සියලු ඥාතීන් ඇතුළු පවුලේ සැමටත් මගේ බලවත් සංවේගය පිරිනමමි.

ඉන්දීය ගුවන් හමුදා ප්‍රධානී යුද සහ නාවික හමුදාපතිවරුන් හමු වෙයි

සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණි ඉන්දීය ගුවන් හමුදා ප්‍රධානී එයාර් චීෆ් මාර්ෂල් රාකේෂ් කුමාර් සිං භාධූරියා මහතා සිය සංචාරය අතරතුර ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා සහ නාවික හමුදාපති වයිස් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න මහත්වරුන් හමු විය. එහිදී දෙරටේ හමුදා ප්‍රධානීන් සමරු තිළිණ හුවමාරු කරගත් අයුරු. *ඡායාරූප - රුක්මාල් ගමගේ*

කොළඹ නගරයේ වායු දූෂණය වළක්වා ඔක්සිජන් ප්‍රතිශතය නැංවීමේ වැඩපිළිවෙළක්

බුද්ධිකා ඉඹුලාන

කොළඹ නගරයේ වායු දූෂණය වළක්වා ඔක්සිජන් ප්‍රතිශතය නැංවීමට පරිසර අමාත්‍යාංශය හා කොළඹ මහ නගර සභාව ඒකාබද්ධව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර ඇත.

මේ සම්බන්ධන්යෙන් වූ සාකච්ඡාවක් පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා හා කොළඹ නගාරාධිපතිනි රෝසි සේනානායක මහත්මියගේ ප්‍රධානත්වයෙන්, පරිසර අමාත්‍යංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා ඇතුළු නිලධාරින්ගේ සහභාගිත්වයෙන් පෙරේදා (03) පැවැත්විණි.

කොළඹ නගරයේ ඔක්සිජන් ප්‍රතිශතය ඉහළ නැංවීමට කොළඹ නගරයට ගැළපෙන රුක් රෝපණය කිරීමේ අරමුණින් කොළඹ මහ නගර සභාව විසින් ආරම්භ කර තිබෙන 'කොළඹට ගසක් ඉතුරු කර ගනිමු 'වැඩපිළිවෙළ හා පරිසර අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කර තිබෙන 'හුස්ම දෙනතුරු' රුක් රෝපණ වැඩ සටහන ඒකාබද්ධව කොළඹ නගරයේ ඉඩකඩ පවතින සෑම ස්ථානයකම රුක් රෝපණය කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කිරීමට මෙහිදී තීරණය කරනු ලැබීය.

කොළඹ මහ නගර සභාව සකස් කර තිබෙන කොළඹට ගසක් ඉතුරු කර ගනිමු වැඩපිළිවෙළ පිළිබඳ වාර්තාවක් මෙහිදී කොළඹ නගරාධිපතිනි රෝසි සේනානායක මහත්මිය විසින් පරිසර ඇමැති මහින්ද අමරවීර මහතාට හා ලේකම් වෛද්‍ය අනිල් ජාසිංහ මහතාට බාරදෙනු ලැබුවාය. කොළඹ නගරයේ ඔක්සිජන්ප්‍රතිශතය දිනපතා මැනීමේ වැඩ සටහනක් ආරම්භ කරන බවත්,එමෙන්ම කොළඹ නගර සභා බල ප්‍රදේශය තුළ පරිසර සංරක්ෂණය සඳහා අවශ්‍ය විශේෂඥ හා තාක්ෂණික සහාය ලබාදෙන ලෙසත් නාගරාධිපතිනි රෝසි සේනානනායක මහත්මිය මෙහිදී ඉල්ලීමක් කළාය.

කොළඹ නගරයේ වායුගෝලයේ ඔක්සිජන් ප්‍රතිශතය ජනගහනයට අනුපාතිකව ක්‍රම ක්‍රමයෙන් පහළ යමින් පවතින බව සිදු කරන ලද විද්‍යාත්මක සමීක්ෂණ මගින් තහවුරු වී තිබේ. එසේ වුවද එම ගැටලුව තවමත් මිනිසුන්ට ගැටලුවක් වශයෙන් නොදැනෙන්නේ කොළඹ නගරය මුහුදට සමීපව පිහිටීම නිසා සාගරයේ ජලවාෂ්ප මගින් නිකුත් කරන ඔක්සිජන් ගොඩබිමට ඉක්මනින් ළඟාවීම නිසා කොළඹ මහනගර සභාවේ නිලධාරින් මෙහිදී පෙන්වා දුන්නේය. එහෙත් ඉදිරි කාලයේ කොළඹ නගරයේ වාසය කරන ජනතාවට ඔක්සිජන් හිඟවීමේ ගැටලුවට පවා මුහුණ දීමට සිදුවන බව ඔවුහු පැවැසූහ.

මෙහිදී පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා අවධාරණය කළේ කොළඹ නගරයේ ශබ්ද දූෂණය, වායු දූෂණය ඇතුළු සමස්ත පරිසර දූෂණය වැළැක්වීමට පරිසර අමාත්‍යාංශය වශයෙන් දිය හැකි සියලු සහයෝගය දෙන බවයි.

2021ට අතරමැදි ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කිරීම පෙබ:28දිනෙන් අවසන්

අධ්‍යාපන අමාත්‍යාංශය

සිතාරා සේනානි

දිවයිනේ ජාතික පාසල්වල 2021 වසරට අතරමැදි ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කිරීම පෙබරවාරි 28 වැනි දිනෙන් අවසන් කර ඇති බව අධ්‍යාපන අමාත්‍යාංශය පවසයි.

එබැවින් කිසිදු ඇතුළත් කිරීමකට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ඉදිරිපත් කිරීම, පැමිණීම හෝ බාහිර පුද්ගලයන් මගින් බලපෑම් කිරීම නොකළ යුතු බව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මහතා දැනුම් දෙයි.

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2021 මාර්තු 05 සිකුරාදා

අසම්මත ප්‍රේමයක - නොහික්මුණු අවසානය

අසම්මත ප්‍රේමයක් හැමවිටම අවසන් වී ඇත්තේ බේද-වාචකයක් සටහන් කරමින්ය. ජනමාධ්‍ය විසින් පෙරේදා වාර්තා කරන ලද අසම්මත ප්‍රේම වෘත්තාන්තය ද ඉහත කරුණ සනාථ කරයි. පෙම්වතාගේ වයස අවුරුදු පනස් දෙකකි. ඔහු වැඩිහිටියෙකි. පෙම්වතියගේ වයස අවුරුදු තිහකි. ඇය අවිවාහක තරුණියකි. පෙම්වතා දරු තිදෙනකුගේ පියකු බව ද පොලිස් නිලධරයකු බව ද සඳහන්ය. පෙම්වතිය තරමක් හිතුවක්කාර බව ද තම සිතැඟි අනුව ක්‍රියාකරන බව ද වටින් - ගොඩින් අසන්නට ලැබේ. මේ දෙදෙනාගේ පෙම් පලහිලව්ව කොතැනකින් ආරම්භ වූයේදැ'යි අපි නොදනිමු. එහෙත් එහි අවසානය සටහන් වී ඇත්තේ මරණ දෙකකින් පමණක් බව අපි දන්නෙමු.

පෙම්වතාගේ පාර්ශ්වයට එබී බැලුවහොත් ඔහු හැසිරී ඇත්තේ වගකීම් විරහිත අකාරුණික පුද්ගලයකු හැටියටය. පොලිස් නිලධරයකු වශයෙන් ඔහු වඩාත් නීතිගරුක විය යුතුය. මෙබඳු පෙම් පටලැවිලි නිරාකරණය කොට පවුල් අතර සාමය හා සමාදානය ඇති කිරීමට පොලිස් නිලධාරීන් උත්සුක විය යුතුය. එය ඔහුගේ රාජකාරියේ කොටසකි. හොඳ පොලිස් නිලධරයා හැමවිටම ආදර්ශවත්ය. ඉහත පුද්ගලයා පොලිස් සේවයට ද කළු පැල්ලමක් එකතු කරමින් දිවි නසාගෙන තිබේ. ඊට පෙර තම පෙම්වතියගේ ගෙල සිඳ කඳ කොටස ගමන් බෑගයක අසුරා එය තැනින් - තැනට ගෙන ගොස් තිබේ. පොලිස් සේවයට පමණක් නොව, මනුෂ්‍යත්වයට ද නිගා කරන මෙබඳු පුද්ගලයන් බිහි වන සමාජ පසුබිම කෙරෙහි අපගේ අවධානය යොමු විය යුතුය.

ශ්‍රී ලංකාවේ දික්කසාද ප්‍රමාණය ශීඝ්‍රයෙන් ඉහළ යන බව එක්තරා වාර්තාවකින් හෙළිදරවු කර තිබේ. පවුල් අවුල් වැඩි වී ඇති බව ද අයථා සම්බන්ධතා ඉහළ ගොස් ඇති බව ද බැලූ බැල්මටම දැකගත හැකිය. පවුල හා දරුවන් කෙරෙහි පෙර පැවැති බරසාර වගකීම පාර්ශ්ව දෙක වෙතින්ම ගිලිහී යන්නට පටන්ගෙන තිබේ. දරුවන් අතරමං කර වෙනත් ස්ත්‍රීන් කැටුව යන පුරුෂයෝ සිටිති. දරුවන් අතරමං කර වෙනත් පුරුෂයන් කැටුව යන ස්ත්‍රීහු ද සිටිති. ස්ත්‍රී - පුරුෂ සබඳතා හුදෙක් ලිංගිකත්වයට සීමා වී ඇති බවක් පෙනෙන්නට තිබේ. මානුෂීය බැඳීම් අඩුය. එකිනෙකා වටහා ගැනීමට හා ඔවුනොවුන්ගේ අවශ්‍යතා හඳුනාගැනීමට දරන වෑයම් අඩුය. අද ආදරය වෙනුවට ඇත්තේ ලිංගික ආකර්ෂණයකි.

ශ්‍රී ලංකාව යනු දිගුකාලීන ශිෂ්ටාචාරයකට උරුමකම් කියන ඓතිහාසික රාජ්‍යයෙකි. සමාජ ප්‍රගමනයට හේතු - සාධක වන බරසාර සංස්කෘතියක් අපට තිබිණි. එහි සිරිත් - විරිත් අතර මංගල චාරිත්‍රවලට මුල් තැනක් ලැබේ. විවාහය හා ආවාහය යන දෙකටම අවශ්‍ය පසුබිම හා තෝරාගැනීම වැඩිහිටියන් විසින් ඉටු කරනු ලැබේ. සුදුසු කාලයේ දී සුදුසු සහකරුවකු, සුදුසු සහකාරියක සොයා දීම මවුපියන්ගේ වගකීමකි. යුතුකමකි. දරුවන් විවාහය තෙක්ම මවුපියන්ගේ රැකවරණය හා උපදේශනය යටතේ සිටිය යුතු බව අපේ නියමයකි. එහෙත් අද එය සිදු වන්නේ කලාතුරෙකින් තැනෙකය. තරුණයෝ කිසිදු විමසීමකින් තොරව තම සහකාරිය සොයා ගනිති. තරුණියෝ ද කිසිදු විමසීමකින් තොරව තම සහකරුවා සොයා ගනිති. අද සමාජයේ හැටියට මව්පියෝ - දරුවන්ට යටත් වෙති. මෙය සුබදායක නැත.

ඉහත බේදවාචකයට මුහුණ දුන් තරුණිය පසුවන්නේ විවාහයක් කරගත යුතු වයසේය. වයස අවුරුදු තිහක් යනු ඊට සුදුසුම කාලයයි. වැඩිහිටියන් ඇගේ අනාගතය ගැන කල්පනා කළේ නම්, ඇයට සුදුසු සහකරුවකු සොයා දිය යුතුව තිබිණි. එම වැඩිහිටියන් සිය දියණිය පිළිබඳ ප්‍රමාණවත් සොයා බැලීමක් සිදුකර නැත. එය වැරැද්දකි. පසුගිය පෙබරවාරි 27 දා ඇය තනිවම ගෙදරින් නික්ම යන්නේ සිරිපාදේ වන්දනාවක යන බව හඟවමිනය. ඇගේ ගමන ගැන සොයා බැලීමක් ද වැඩිහිටියන් සිදුකර නැත. තරුණියගේ වැඩිහිටියන් සිය දියණිය පිළිබඳ බේදවාචකය දැනගන්නේ පොලීසිය වෙතින්ය. මෙය අවාසනාවන්ත තත්ත්වයකි. පවුල යනු සාමූහික වගකීම් සහිත සන්ධානයකි. එම වගකීම් සෑම පාර්ශ්වයක් වෙතින්ම ගිලිහී යන්නට පටන්ගෙන තිබේ.

පොලිස් වාර්තාවලට අනුව රටේ සිදුවන අපරාධවල වර්ධනයක් දකින්නට නැත. එහෙත් ඉදහිට සිදුවන සාහසික අපරාධයකින් මුළු රටම කැලඹීමකට පත් වී අපරාධ ගැන සංවාද කරන්නට පටන් ගනිති. ඉහත සිද්ධිය ද සාහසික අපරාධයක් සේ සැලකිය හැකිය. තරුණියගේ ගෙල සිඳ හිස කොටස සඟවා ඇත. කඳ කොටස ගමන් බෑගයක අසුරා ඇත. අපරාධකරු ගමන් බෑගය හා තියුණු ආයුධය මිලට ගන්නා ආකාරය ද අපරාධයෙන් පසුව සිරුරේ කොටස් සහිත ගමන් බෑගය ප්‍රවාහනය කරන ආකාරය ද සී.සී.ටී.වී. කැමරා ඔස්සේ හෙළිදරවු කරගෙන තිබේ. නූතන තාක්ෂණය අපරාධ හෙළිදරවු කර ගැනීමට හොඳින් යොදා ගැනෙයි. එය සතුටුදායක තත්ත්වයකි. අපරාධයක් සිදු කර එය සඟවා තබාගැනීමේ හැකියාවක් අද නැත.

ශ්‍රී ලංකාව යනු නිරන්තරයෙන්ම බණ ඇසෙන හා බණ කියන රාජ්‍යයකි. මේ හැරෙන්නට ජීවිතයට උපදේශන සපයන ආයතන රාශියක් රට තුළ පවතී. පවුල් උපදේශන වෙනම පවතී. නීති උපදේශන වෙනම පවතී. මානසික උපදේශන සේවා වෙනම පවතී. එහෙත් දිවි නසා ගන්නා ප්‍රමාණය අඩු වී නැත. කැඩී - විසිරි යන පවුල්වල ප්‍රමාණය අඩු වී නැත. අයථා සම්බන්ධතා නිසා ඇති වන ගැටුම් අඩු වී නැත. ආගමික ස්ථානවලට මෙන්ම ආගමික නායකයන්ට ද සමාජයේ යහපැවැත්ම පිළිබඳ වගවීමක් පැවරෙයි. එය ඉටු වන්නේ නැතැ'යි කිව නොහැකි'මුත් ප්‍රතිඵලය ගැන සතුටු විය නොහැකිය. මිනිසුන්ගේ චින්තනය හා පැවැත්ම වෙනස් කළ හැකි ශක්තිමත් වැඩසටහනක අවශ්‍යතාව අප ඉදිරියෙහි පවතී. එක සිද්ධියකින් සියල්ල තීන්දු කළ නොහැකි වුව මෙබඳු සිදුවීම්වලට අත වනන සමාජ පරිසරයක් අපට තිබේ. එය වෙනස් කළ යුතුය.

අකාලයේ ජීවිතය විනාශ කරගත් දෙදෙනාම විනාශය කරා ගමන් කර ඇත්තේ අනවබෝධය නිසා යැයි කිව හැකිය. මිනිසා හැඟීමට නොව, බුද්ධියට මුල් තැන දී ක්‍රියා කරන්නට උගත යුතුය. බුද්ධියට මුල් තැන දෙන සමාජයක් ශිෂ්ටත්වය අතින් පිරිහෙන්නේ නැත. ඉහත සිදුවීම සමාජයේ කාටත් හොඳ පාඩමක් ලෙස පවතී.

දිල්රුගෙ සීවලි

මව් පියන් ඉක්මවයි සීමා තමන් හැදු දරුවන්ට තළු — තළු
දෙන්නගෙ දබරෙන් කැපෙනවා පොඩි එවුන්ගෙන් — වළු
රැවුම් ගෙරවුම් දුක මිසක් සැනසීම නෑ කාගෙවත් — ඇස්වල
මේව ඔක්කොම මනස් ඇතුළේ පැහෙන පීඩාවන්ගෙ — ප්‍රතිඵල

රට දිනවීමට කාන්තාවන් දිනවමු

අද අතීතයේ සිටම ශ්‍රී ලාංකේය සමාජයේ පුරුෂයා සහ ස්ත්‍රිය සම මට්ටමින් නොසලකා ඇත. එකල තිබූ පුරුෂ මූලික සමාජ ක්‍රමය, පුරුෂයා නිවසේ ආර්ථිකය ශක්තිමත් කිරීමටත්, ස්ත්‍රිය කුටුම්බය ආරක්ෂා කර ගිනිමින්, දරුවන් රැක බලා ගැනීමටත් කැප වී සිටියහ. එහෙත් වත්මන වන විට එම සමාජ ක්‍රමය හාත්පසින්ම වෙනස් වී තිබේ. නූතනයේ පුරුෂයා සහ ස්ත්‍රිය යන දෙදෙනාම රැකියා කරමින් තම ආර්ථිකය වර්ධනය කර ගැනීමට කැපවී සිටී. රැකියා ස්ථානවල, විශ්වවිද්‍යාලවල, අධ්‍යාපන ආයතනවල ඇතුළු රජයේ සහ පෞද්ගලික සෑම ආයතනයකම පුරුෂයන්ට වඩා ස්ත්‍රීන් වැඩි වශයෙන් සිටී. බොහෝ ඉහළ වෘත්තීන්හි කටයුතු කිරීමට ද ස්ත්‍රීන්ට අවස්ථාව උදා වී ඇත. සමස්තයක් ලෙස ගත් කල වත්මන් ස්ත්‍රිය අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් සහ වෘත්තීමය ක්ෂේත්‍රයෙන් පුරුෂයන්ට සාපේක්ෂව ඉතා ඉහළ මට්ටමකට පැමිණ ඇත. ශ්‍රී ලංකාවේ සංවර්ධනය සහ කාන්තා සේවා නියුක්තිය පිළිබඳ අවධානය යොමු කිරීම කාලීන අවශ්‍යතාවයකි.

ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථිකයේ ස්වරූපය පුළුල් වපසරියක විහිදී ඇති අතර, පසුගිය වසර හය හතක කාලය දෙස බලන විට, ශ්‍රී ලංකාවේ ආර්ථිකය එතරම් සුබදායී නොවුණු ආකාරයක් දක්නට ලැබුණි. 2013ට පසු කාලය ලංකාවේ ආර්ථිකය දිගින් දිගටම පහළ බැස තිබුණු ආකාරයක් දක්නට ලැබුණි. 2013 වර්ෂයේ 3.4% වන ආර්ථික වර්ධන වේගය, 2015 වන විට 4.5%ක සීමිත වර්ධනයක් පෙන්නුම් කෙරිණි. 2019 වන විට එම ආර්ථික වර්ධන වේගය 2.3% දක්වා පහළ ගොස් 2020 වන විට 1.9% දක්වා තවත් පහළට ගමන් කරන්නට විය. සමස්ත ආර්ථිකයේ ක්‍රියාකාරීත්වය දෙස බලන විට 2019ට පෙර අපේ රටේ පැවති දේශපාලන අස්ථාවරත්වය සහ ආර්ථික කළමනාකරණය තුළ තිබුණු ගැටලු නිසා ශ්‍රී ලංකාවේ ආර්ථිකය දිගින් දිගටම පහළ වැටුණි. 2020 වර්ෂය ආරම්භ කරන විට ශ්‍රී ලංකාවේ ආර්ථිකය පමණක් නොව, කොවිඩ් - 19 වංසගතය නිසා ලෝක ආර්ථිකයම දැඩි අර්බුදයකට පත් විය.

සාර්ව ආර්ථිකය

කොවිඩ් - 19 වසංගත තත්ත්වයට මුහුණ දීමට සිදු වීමෙන් රටේ සමස්ත ආර්ථික ක්‍රියාකාරීත්වය පෙන්නුම් කරන දර්ශකවල පසුගාමීත්වයක් පෙන්වන්නට විය. රටේ දේශීය සහ විදේශීය ණය බර ඉතා ඉහළ මට්ටමක පවතින අතර එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස මේ වන විට 86%ක ඉහළ යෑමක් දක්නට ලැබේ. සාර්ව ආර්ථික අස්ථායිතාවය හේතුවෙන් අන්තර්ජාතික වර්ගීකරණයන් සඳහා භාවිතා කරන මිනුම්වලින් ශ්‍රී ලංකාව දිනෙන් දින පහළ මට්ටමකට වැටුණි. රට තුළ උද්ධමනය, සේවා වියුක්තිය වැනි විචල්‍යවල ඒ තරම් සුබදායී තත්ත්වයක් පෙන්නුම් නොකිරිණි. එමෙන් ම ආනයන අපනයන වෙළෙඳාම තුළින් ද අපට සුබදායී තත්ත්වයකට පැමිණීමට නොහැකි විය. විශේෂයෙන්ම අපේක්ෂිත ආකාරයට අපනයන වර්ධනය වීමක් දක්නට නොලැබුණි. ආනයන දිගින් දිගටම පාලනය කිරීමට හැකියාවක් නොලැබුණි. කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් විදේශ සේවා නියුක්තිකයින්ගෙන් ලැබුණු ප්‍රේෂණ විශාල වශයෙන් පහළ යෑමක් දක්නට ලැබුණි. රටට පැමිණෙන සංචාරකයින් පහළ යෑම සහ නැවතීම හේතුවෙන් රටට පැමිණෙන විදේශ ආදායම් ලෙස ලැබුණු මූලාශ්‍රයන් අහිමි වී ඇත. රජයේ වියදම් ඉහළ යාම සහ ආදායම් පහළ යාම යන කාරණා නිසා අය-වැය හිඟයේ දැඩි අසමතුලිතතාවක් දක්නට ලැබුණි. විදේශ රටවලින් ලැබෙන මුදල් ප්‍රමාණය පහළ යාම සහ වෙනත් රටවල් වෙනුවෙන් දරණු ලබන වියදම් ප්‍රමාණය වැඩි වීම වැනි හේතු නිසා විදේශ විනිමය අනුපාතය දිගින් දිගටම පිරිහී තිබේ. මෙවැනි කාරණා පදනම් කරගෙන ආර්ථික අවධානය තවදුරටත් වර්ධනය විය. මෙවැනි පසුබිමක ශ්‍රී ලංකාවේ කාන්තා සේවා නියුක්තියේ පවත්නා උපනතීන්, කාන්තා සේවා නියුක්තියේ ස්වරූපය සහ කාන්තා සේවා නියුක්තිය තුළ කාන්තා ව්‍යවසායකයින් බිහි කර ගැනීම වැනි කාරණා පිළිබඳ අවබෝධයෙන් බැලිය යුතු ය.

ශ්‍රී ලංකාවේ කාන්තා ව්‍යවසායකත්වය නඟාසිටුවීමේ ක්‍රමවේදය පිළිබඳ වැඩිදුර අවධානය යොමු කළ යුතු සේම, ඊට ප්‍රථමයෙන් මේ වන විට ශ්‍රී ලංකාවේ කාන්තා සේවා නියුක්තිය පවතින ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම වැදගත් ය. ලෝකයේ අනෙකුත් රටවල් සමඟ සංසන්දනය කර බැලීමේදී ශ්‍රී ලංකාවේ කාන්තා සේවා නියුක්ති සහභාගිත්වය ඉතාමත් අඩු මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ කාන්තා සේවා නියුක්ති සහභාගිත්ව අනුපාතිකය 35%ක මට්ටමක පවතින අතර ශ්‍රී ලංකාවේ පිරිමි සේවා නියුක්ති සහභාගිත්ව අනුපාතිකය 73%ක මට්ටමක පවතී. මෙසේ බලන විට ශ්‍රී ලංකාවේ කාන්තා සහ පිරිමි දෙවර්ගයේම සේවා නියුක්ති සහභාගීත්වය 52%ක මට්ටමක පවතී. වෙනත් රටවල් හා සසඳා බැලීමේදී ශ්‍රී ලංකාවේ කාන්තා සේවා නියුක්ති සහභාගිත්ව අනුපාතිකය ඉතා අඩුය . මැලේසියාවේ 55%, තායිලන්තයේ 58%, ඔස්ට්‍රේලියාවේ 59%, ජපානයේ 52%, ඇමරිකාවේ 52%ක් වශයෙන් ලෝකයේ විවිධ රටවල කාන්තා සේවා නියුක්ති සහභාගීත්වයක් දක්නට ලැබේ. මේ පිළිබඳ විමසීමේදී ලෝකයේ විවිධ රටවල කාන්තා සේවා නියුක්ති සහභාගිත්වය 50%කට වඩා ඉහළ මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ පවතින 35% වන කාන්තා සේවා නියුක්තිය ඒ තරම් සුබදායී තත්ත්වයක් නොවේ.

මහාචාර්ය
වසන්ත අතුකෝරාල
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ
ආර්ථික විද්‍යා හා
සංඛ්‍යාන අධ්‍යයන අංශය

කාන්තා ව්‍යවසායකත්වය

ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථිකයම කෘෂිකාර්මික, කාර්මික සහ සේවා ත්‍රිත්වයේ එකතුවෙන් නිර්මාණය වී තිබේ. ලංකාවේ කෘෂිකර්මික අංශයේ කාන්තා සේවා නියුක්තියෙන් 28%ක් යෙදී සිටින්නේ කෘෂිකාර්මික අංශයෙනි. තව ද ශ්‍රී ලංකාවේ කාන්තා සේවා නියුක්තියෙන් 26%ක් කාර්මික අංශයෙහි ද, කාන්තා සේවා නියුක්තියෙන් 46%ක් සේවා අංශයෙහි නිරත වී සිටී. බොහොමයක් රටවල සේවා අංශය තුළ කාන්තා සේවා නියුක්තිය ඉහළ මට්ටමක පවතී. කෘෂිකාර්මික සහ කාර්මික අංශවල වැඩ අධිකභාවය සහ දැඩිභාවය හේතුවෙන් කාන්තා සේවා නියුක්තිය සීමිතව පවතී. නමුත් සේවා අංශය තුළ කාන්තා සේවා නියුක්තිය ඉහළ ගොස් තිබේ. ලංකාවේ පමණක් නොව ලෝකයේ අනෙකුත් රටවල සේවා අංශය වර්ධනය කළවිට කාන්තා සේවා නියුක්තිය ඉහළ නැංවිය හැකිය. ලංකාවේ සේවා වියුක්තිය දෙස බලන විට 5.7%ක මට්ටමක පවතී. එවැනි තත්ත්වයක කාන්තා සේවා වියුක්තිය 10% කට ආසන්නව පවතී. ලංකාවේ කාන්තාවන් අතර සේවා වියුක්තිය ඉහළ මට්ටමක පවතී. කාන්තා සේවා වියුක්තියෙන් 55% ක් පමණ සිටින්නේ 15- 29 වයසේ කාන්තාවන් ය. එය ඉතාමත් අවාසනාවන්ත තත්ත්වයකි. මොවුන් සක්‍රීය වශයෙන් ආර්ථිකයට දායක විය හැකි අවදියේදී සේවා වියුක්තිකව සිටී. ලංකාවේ කාන්තා සේවා වියුක්තිය අඩු කර කාන්තා සේවා නියුක්තිය වැඩි කිරීමේ ක්‍රමවේද සකස් කළ යුතු වේ. ඒ සඳහා ප්‍රතිපත්ති සකස් කළ යුතු වේ. එසේ ම අප රටේ කාන්තා ව්‍යවසායකත්වය නඟා සිටුවිය යුතුය.

පුරුෂ පාර්ශවයට සාපේක්ෂව අප රටේ පවත්නා ආර්ථික, සමාජීය, සංස්කෘතික සහ දේශපාලන කාරණා මත කාන්තාවගේ දායකත්වය සෑම අංශයකම, අඩු වීමක් දක්නට ලැබේ. රට තුළ පවතින මේ ක්‍රමවේදය වෙනස් විය යුතු අතර ඒ සඳහා කාන්තා සේවා නියුක්තිය වැඩි කළ යුතු ය. කාන්තාව තුළින් ව්‍යවසායකත්වය වර්ධනය කිරීම සඳහා ගෙවල් මත පදනම් වූ (Home Based Work) ව්‍යවසායකත්වයක් ක්‍රියාත්මක කළ යුතුය. එම ක්‍රමවේදය ශ්‍රී ලංකාව වැනි රටකට වඩාත් සුදුසුය. කාන්තා ව්‍යවසායකයින් නඟාසිටුවීමේ රාජ්‍ය යාන්ත්‍රණය පිළිබඳ අවධානයෙන් සිටිය යුතුය. කාන්තා ව්‍යවසායකයින් නඟාසිටුවීමේ ක්‍රමවේදයක් සකස් කරන විට, කාන්තා ව්‍යවසායකයින් බිහිවීම අවම වන කාරණා, කාන්තා ව්‍යවසායකයින්ට තිබෙන ගැටලු සහ එම ගැටලු මඟහරවා ගැනීමට කළ යුතු දෑ පිළිබඳ අවබෝධයෙන් සහ අවධානයෙන් බැලිය යුතුය. කාන්තාවන්ට තමන්ගේ දරු දැරියන්ගේ, පවුලේ සාමාජිකයින්ගේ වැඩපල කරන අතරතුර නිවසේ සිට යම් ව්‍යවසායකත්වයක් ආරම්භ කිරීමට උපකාර කළ යුතුය.

ග්‍රාමීය කාන්තාව

ශ්‍රී ලංකාව තුළ ග්‍රාමීය කාන්තාවන් බල ගැන්වීමේ ක්‍රියාවලි අවම මට්ටමක පවතී. එම තත්ත්වය මඟහරවා ගැනීමට ග්‍රාමීය කාන්තාව සක්‍රීය කර ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සම්බන්ධ කර ගත යුතුය. ග්‍රාමීය කාන්තාවන්ගේ දක්ෂතා ඔප්නැංවීම, (Skills Development) මෘදු ගුණාංග වර්ධනය කිරීම (Soft Skills), රටේ යටිතල පහසුකම් වර්ධනය කිරීම, රටේ ග්‍රාමීය මට්ටමේ ස්වං රැකියා ක්‍රමයක් ක්‍රමයෙන් වර්ධනය කිරීම, නිවසේ සිට වැඩ කරන ව්‍යවසායකයින් බිහි කිරීමේ සංකල්පය ක්‍රියාත්මක කිරීම යන දෑ තුළින් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කාන්තාවන් සක්‍රිය කර රටේ ආර්ථිකය දියුණු කිරීමට උපයෝගී කර ගත හැකි ය. තව ද කර්මාන්ත ගමට ගෙන යාමේ සංකල්පය ද ග්‍රාමීය කාන්තාවන් සක්‍රීය කිරීමේදී වඩාත් වැදගත් වේ. විශාල කර්මාන්ත නොව කුඩා පරිමාණයේ කර්මාන්ත ඒ ඒ ගම්වල ව්‍යාප්ත කිරීම වඩාත් සුදුසු ය. උදාහරණයක් ලෙස අනුරාධපුරයේ සිටින කාන්තාවන් පිරිසක්, කොළඹට පැමිණ රැකියාවක් කරන විට එම කාන්තාවන්, විශාල වැටුපක් ඉල්ලා සිටී. එවැන්නක් සිදුවනුයේ ගම්වල සිට කොළඹට පැමිණ ජීවත්වීමේදී එම කාන්තාවන්ට තම එදිනෙදා ජීවිතය පවත්වා ගැනීම සඳහා ඔවුන්ට ගමේ ජීවිත් විමට යන වියදමට වඩා වැඩි මුදලක් (සැලකිය යුතු මුදලක්) වැය වීම ය. එම නිසා ග්‍රාමීය කාන්තාවන්ට තමන්ගේ ගමේ සිට ගෙන යාමට හැකි රැකියා අවස්ථා උත්පාදනය කළ යුතු ය. උදාහරණ වශයෙන් නිවසේ සිට ඇඳුම් මසා විකිණීම, නිවසේ සිට පලතුරු වගා කර විකිණීම පෙන්වා දිය හැකි ය. වර්තමානයේ බොහෝ ග්‍රාමීය කාන්තාවන් තමන්ගේ දක්ෂතාවන් නිසි පරිදි හඳුනා නොගෙන නිකරුණේ නිවෙස්වලට වී කාලය ගත කරනු ලබයි. ඒ හේතුවෙන් මැහුම් ගෙතුම්, විවිධ නිර්මාණ වැනි දෑ තුළින් වෙළෙඳපළ ජය ගැනීමට කාන්තාවන් පොලඹවාලිය යුතුය. සෑම ග්‍රාමීය කාන්තාවක්ම තමන්ගේ දක්ෂතා උපයෝගී කර ගනිමින් ඒ තුළින් වෙළඳපළට භාණ්ඩයක් ඉදිරිපත් කිරීමට හුරු විය යුතුය. රජය විසින් නිවසේ සිට ස්වයං රැකියා පවත්වාගෙන යන කාන්තාවන්ට තමන්ගේ භාණ්ඩ ගැටලුවකින් තොරව අලෙවි කර ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය. රජයේ සහ පෞද්ගලික අංශයේ කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් නිසි ක්‍රමවේදයකට අනුව සෑම දිස්ත්‍රික්කයකටම ව්‍යාප්ත වන පරිදි සම්පාදනය කළ යුතුය. ග්‍රාමීය කාන්තාවන් උදෙසා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කාලීන අවශ්‍යතාවයකි.

සැමියා හෝ දරුවන් යම් කිසි ආබාධයකට ගොදුරු වූ භාර්යාවන්ට සහ සැමියා මිය ගොස් තනිවම පවුල නඩත්තු කරන භාර්යාවන්ට තම ශක්තියෙන් ජීවිතය ගොඩනඟා ගැනීමට අවශ්‍ය උපදෙස් රජයෙන් ලබා දීමට පියවර ගත යුතුය. එවැනි කාන්තාවන්ට ගැටලුවකින් තොරව ස්වයං රැකියා ආරම්භ කිරීමට පසුබිම සකස් කර දිය යුතුය. ශ්‍රී ලංකාවේ සෑම කාන්තාවකටම තනියෙන් ජීවිතය ගොඩනඟා ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශ, නීතිමය උපදෙස් මෙන්ම මනෝවිද්‍යාත්මක උපදේශ ලබාදීම වඩාත් යහපත් ය. එවැනි දෑ තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීමට කාන්තාවන්ගෙන් ලැබෙන සහයෝගය වැඩි කර ගත හැක. තවද එමගින් ශ්‍රී ලාංකේය කාන්තාවන්ගේ පෞරුෂය ගොඩනඟා ගනිමින් මුළු ලෝකයට ශ්‍රී ලාංකේය කාන්තාවගේ සාඩම්බරත්වය කියා පෑමට පුළුවන.

මදාරා මුදලිගේ



නිර්මාණශීලි දරුවකු පාසලෙන් බිහි කළ යුතුයි

සාර්ථක හා සමබර ජීවිතයක් ගත කිරීමට නම් යම් පුද්ගලයකුගේ බුද්ධි-ඵලය අඩු වුවත්, චිත්තවේගඵලය හොඳ නම් ඔහුගේ හෝ ඇයගේ ඉදිරි ගමන ස්ථිර බවත්, ඉහළ බුද්ධි ඵලයක් තිබුණද චිත්තවේග-ඵලය නොමැති නම් ඔහුට හෝ ඇයට ඉදිරි ගමනක් හඹා යෑමට අපහසු බවත් පවසන, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමා-ත්‍යාංශයේ ලේකම් ආචාර්ය උපාලි සේදර මහතා සමඟ කළ සාකච්ඡාවකි මේ.

ආචාර්ය **උපාලි සේදර**
අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්

● අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය කියන්නේ, වත්මන් රජය විසින් බිහි කළ නව සංකල්පයක්. එහි ක්‍රියාත්මක කිරීමට අදහස් කරන ප්‍රධාන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මොනවා ද?

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයක් පිහිටුවන්න ප්‍රධාන හේතුවක් වුණේ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණයකට විශේෂ තැනක් දීපු නිසා සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් යන්න ජනතාව නිරන්තරයෙන්ම බලාපොරොත්තු වූ නිසයි. දකුණු ආසියාතික කලාපයේ අනෙක් රටවල් සමඟ බලන විට ශ්‍රී ලංකාවේ අධ්‍යා-පනය බොහෝ කාලයක් ඉතා සාර්ථකව කරගෙන ඇවිත් තියෙ-නවා. ලංකාවේ අධ්‍යාපනයට තියෙන්නෙ හොඳ පිළිගැනීමක් වගේම ස්ථාවරත්වයක්. නමුත් අපි දන්නවා අපේ රටේ අධ්‍යා-පනය අවුරුදු පහළොවක, විස්සක කාලයක් පුරා එක තැනකට කොටුවෙලා තියෙන වග. ඒ නිසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණය-කට යා යුතුයි කියලා අපි හැමෝටම වැටහිලා තියෙනවා.

● මේ වැඩපිළිවෙළ වත්මන් ජනපතිවරයා, ජනාධිපතිවරණයට පෙර සිටම වියත්මඟ සංවිධානය මඟින් යෝජනා කළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ද?

ජනාධිපතිතුමා ජනපතිවරණයට එන්නට බොහෝ කාලයකට පෙර අධ්‍යාපන විශේෂඥයින්ගෙන් සමන්විත කමිටුවක් මඟින් මේ පිළිබඳ නිරීක්ෂණය කරලා, අධ්‍යයන කරලා මෙහි මූලික පියවරට පැමිණියා. එය සෞභාග්‍යයේ දැක්ම තුළ විධිමත්ව අන්තර්ගත කරලත් තියෙනවා. පෙර පාසලේ සිට විශ්වවිද්‍යාලය දක්වා නව ප්‍රතිසංස්කරණයකට යා යුතු යැයි එහිදී නිරීක්ෂ-ණය වෙලත් තියෙනවා. ඒත් මේ රාජ්‍ය අමාත්‍යාංශයට පැවරිලා තියෙන්නෙ එක වසර සිට දහතුන වසර (1 -13) දක්වා ළමුන්ගේ සාමාන්‍ය අධ්‍යාපනය පමණයි (General Education). මෙය සාමාන්‍ය අධ්‍යාපනයක් කියලා මම කියන්නේ, වෘත්තීය හැකියා-වන් පිළිබඳ වෙනම රාජ්‍ය අමාත්‍යාංශයක් තියෙන නිසයි.

● අධ්‍යාපන පරිපාලනය ක්‍රමවත්ව, විධිමත්ව, කාර්ය-ක්ෂමව තිබීම මෙහිදී වැදගත් වෙනවා ද?

අප කවුරුත් දන්නා පරිදි අධ්‍යාපන පරිපාලන ක්‍රමය 13 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව මූලික වශ-යෙන් වෙනස් වෙනවා. විමධ්‍යගත අධ්‍යාපනයක් ලෙස අධ්‍යාපනයේ මූලික වගකීම් දරන්නෙ පළාත් සභාවයි. ප්‍රතිපත්ති සැකසීම සහ ඒවාට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන දීම කරන්නෙ මධ්‍යම අරමුදලෙන්.

නමුත් අධ්‍යාපන පරිපාලන ක්‍රමවේදය තුළ අපිට පේන දුර්වලතා බොහොමයක් තියෙනවා. ඒ නිසා අධ්‍යාපන පරිපාලනයේ යම් වෙනසක් කරල අධ්‍යාපන පරිපාලනය රාජ්‍ය සේවය තුළ කාර්යක්ෂමතාවයෙන් ඉහළ නංවන්නයි බලාපොරොත්තුව. මෙය එක දිනකින් කරන්න බැහැ. ඉදිරි වසර තුන හතර තුළ අපි මේ ක්‍රියාදාමය පූර්ණ වශයෙන් අවසන් කරන්න උත්සාහ කරනවා.

● පාසල් විෂය මාලාවට හඳුන්වා දෙන ප්‍රධාන විෂය-මාලා ප්‍රතිසංස්කරණය වන්නේ කොහොම ද?

පාසල්වල පළමු වසරට ළමයි තුන් ලක්ෂ පනස්දාහක් ඇතුළත් වෙනවා. එම ඇතුළත් වන තුන් ලක්ෂ පන-ස්දාහෙන් තුන් ලක්ෂ දහ දාහක් හෝ විසිදාහක් පමණ සාමාන්‍ය පෙළ දක්වා ඉගෙනීම කරගෙන යනවා. මේ සියලු දෙනාම පිට වෙන්නේ එකම සුදුසුකමක් ඇතිවයි. එකම විෂය මාලාව අධ්‍යයනය කරනවා, විවිධත්වයක් නැහැ. ළමයාගේ හැකියාවට, හැදියාවට, කුසලතාවයට, දක්ෂතාවයට අවශ්‍ය විදිහට විධිමත් අධ්‍යාපනයක් නැහැ. ඒ නිසා සිදුවන්නේ රැකියා වෙළඳපොළේ ඇති විවිධ විෂයයන්ට අදාළ පරිදි ගැලපෙන අධ්‍යාපනයක් ලබා නොතිබීමයි.

ඒ නිසා මේ ප්‍රතිසංස්කරණය තුළ කොහොමද විවිධාංගීක-රණය කරන්නේ කියලා අපි බලනවා. හැම දෙයක්ම විභාගය-කින් කෙළවර වෙනවා. මේ තත්ත්වය දරුවන්ටත්, මව්පියන්ටත් විශාල ආතතියක්. ළමයා බලන්නේ කෙසේ හෝ කට පාඩම් කිරීම මත විභාගය සමත් වීමටයි. ළමයින් තුළ දැනුම බොහො-මයක් තිබුණත්, මූලික කුසලතාවයන් නැහැ. නිර්මාණශීලීත්වය අහිමි වෙලා. විසි එක්වන සියවසට අත්‍යාවශ්‍ය කුසලතා රාශියක් වත්මන් වැඩ ලෝකයේ හඳුනාගෙන තියෙනවා. වැඩ ලෝකයට ඇතුළත්වන ඕනෑම දරුවකුට තිබිය යුතු ප්‍රධානම කුසලතාවය වන්නේ මෘදු කුසලතාවයයි. (soft skills) මූලික වශයෙන් ළම-යකුට ලියන්න, කියන්න, කතා කරන්න, නිර්මාණශීලීව සිතීමේ හැකියාව වගේම ඕනෑම ප්‍රශ්නයක් දෙස විචක්ෂණ බුද්ධියකින් විචාරාත්මකව බැලීමේ හැකියාව තිබිය යුතුයි. කට පාඩම් කරන ළමයා තුළ තියෙන්නෙ ගුරුවරු කියපු දේම තෝරා කට පාඩම් කර උත්තර ලියන එකයි.

අනෙක් කාරණය තමයි සාමූහිකත්වය. යම් පුද්ගලයකුගේ ජීවිතය සාර්ථක වෙන්න අත්‍යවශ්‍යම දෙය තමයි සාමූහිකත්වය. විභාගයට සූදානම් කරන ළමයි තුළ මේක ඇත්තටම නැති වෙලා ගිහින්. උසස් පෙළ විභාගයේ දී z-score වල එක දශම-යෙන් තමන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශය ඇහිරෙනවා. සියලු දරුවෝ ආත්මාර්ථකාමී වෙලා, සාමූහිකත්වය ගිලිහිලා. එනිසා සාමූහික-ත්වය ඇති කිරීම ප්‍රධාන ඉලක්කවලින් එකක්.

විසි එක්වන සියවසේ දී බුද්ධි ආර්ථිකය තුළ නිර්මාණාත්මක වැඩ කරන්නට ඕනෑය කියන එක තවත් කාරණයක්. ලංකාව තුළ පළමු වසරේ සිට අවසාන වසර දක්වා නිර්මාණාත්මකව දරුවෝ බිහි වෙනවා අඩුයි. වත්මන් අධ්‍යාපන ක්‍රමය තුළින් ගුරුවරයාට හෝ මව්පියන්ට ඕනෑ කරන දරුවන් බිහි වෙනවා. මේ ක්‍රමය වෙනස් කරන්නේ කොහොම ද? ජීවිතයට අදාළ කර ගන්නේ කොහොම ද? කියන එක ගැන අධ්‍යයනය කරනවා.

අපි මෙයට සුපත්ත්‍ය අධ්‍යාපනය කියලා කියනවා. මෙහිදී සිදු වන්නේ තමන්ගේ ජීවිතයට, වැඩ ලෝකයට අදාළ වන ආකා-රයේ අධ්‍යාපනයක් ප්‍රායෝගිකව ලබා දෙන්න උත්සාහ කරන එකයි. මේ ක්‍රමය තුළ තියෙන මූලික වැදගත් න්‍යාය තමයි ළමයා දන්න දේ අපි දෙනවා. එය දරුවාට ඉතා පහසුවෙන් කරන්නෙ ඔහු හෝ ඇය තුළ තියෙන ආශාව සහ ඕනෑකම නිසයි. ඒ නිසා පැය දහයක මොඩියුලයක් හදනවා, මේ මොඩියුලය සති දහයක්, දාහතරක් දරුවන් ඉගෙනුම ලබනවා. මේ ක්‍රමය තුළින් දරුවාට Credit ලබාදීමක් ලෙස, වාරයකට Credit 20 ක් එකතු කරගන්න හැකියාව තියෙනවා. වසරකට ක්‍රෙඩිට් හැටක් ලබා ගත හැකියි. විෂයමාලාව කොටස් තුනකට බෙදා තියෙනවා. ළමයෙක් මූලික වශයෙන් දැනගත යුතු ගණිත හැකියාව, භාෂාව, පුරවැසි අධ්‍යාපනය, ඉතිහාසය, සෞඛ්‍ය විද්‍යාත්මක දේ දැනගත යුතුයි. මේවා 50% ක් විෂයමාලාවේ ඇතුළත්. ඉතිරි 50% තුළ වෛකල්පිත විෂයන් තියෙනවා. ඒ කියන්නේ තමන් කැමති මොඩියුලයක් ඉගෙන ගන්න හැකියාව තියෙනවා. ඒ විෂය කෙරේ ඉදිරියටත් ඉගෙන ගැනීමට කැමති නම් තවදුරටත් ඉදිරියට යා හැකියි. උදාහරණයක් වශයෙන් ධීවර කර්මාන්ත-යට කැමති නම් ඒ මොඩියුලය හදාරන්න පුළුවන්. තේ, මැටි හෝ රටේ තිබෙන විවිධ කර්මාන්තවලට කැමැත්තක් තියෙනවා නම්, ඒ මොඩියුල දිගටම හදාරන්න පුළුවන්. එසේ ම, ළමයා තුළ හොඳ සෞඛ්‍ය පුරුදු ඇති කිරීමත්, සෞඛ්‍ය පිළිබඳ ගත යුතු ක්‍රියාමාර්ග මොනවාද යන්නත් පිළිබඳ වැඩි අවධානයක් යොමු කරනවා.

මේ තුළ අසමත් බවක් දක්නට නොලැබෙන අතර උසස් මනසක් (Best Brain) ගොඩනඟන්න උත්සාහ කරනවා. ළමයා නිර්මාණාත්මකව වැඩකරන්න පුළුවන් කෙනෙක් කිරීම සහ අසාර්ථක වෙන්නේ නැහැයි කියන මානසිකත්වය ලබා දෙමින් සාර්ථක දරුවෙක් රටට දායද කරන්න පුළුවන්. ගුරුවරයාට විශාල කැප කිරීමක් කරන්නත් සිදුවෙනවා. පාසල්වලට විෂය මාලාව ගේන්න පෙර පුහුණුව සඳහා ගුරුවරු යොමු කරන්න අපි උත්සාහ කරනවා.

● මේ ක්‍රමවේදය තුළ ඉගෙනුම් ක්‍රියාවලිය සකස් වන්නේ කොහොම ද?

අධ්‍යාපන පරිපාලනයේ දුර්වලතා තියෙනවා

ළමයාගේ කුසලතාවයට හැකියාවට ගැලපෙන අධ්‍යාපනයක් ඕනෑ

අධ්‍යාපන කලාප 123කට එක ජාතික පාසලක්වත් නැහැ

ළමයාට පාසලක් නැහැයි කියන එක අද ඊයේ ප්‍රශ්නයක් නෙවෙයි

මූලික ක්‍රමය වන්නේ කඩදාසිය සහ පැන්සල වෙනුවට ළම-යාට මොකක්ද කරන්න පුළුවන් කියලා පරීක්ෂා කරන එකයි. දැනුමට සීමා වුණ දේ කුසලතාවයට පෙරළා ගැනීම තමයි මෙහිදී සිදුවෙන්නේ. මෙයට කියන්නෙ කරණ පරීක්ෂණය (Performance test) කියලයි. දරුවා න්‍යායාත්මකව දන්නා දේ කරන්න පුළුවන්ද කියන එක පරීක්ෂා කිරීමෙන් සිදුවෙනවා. අපි පාසල සහ ළමයා වෙනසකට ලක් කරනවා. ළමයි දින 210ක් පාසල් යනවා වගේම, වැඩකරන දවස් 42ක්, වාරයකට සති දාහතර (14) ගානේ වාර තුනකට කඩලා එම එක් වාරයකට සරි-ලන ලෙස පාසල සංවිධානය කරනවා. එක වාරයකට පමණක් අවශ්‍ය වන පෙළපොත් සහ ක්‍රියාකාරකම් සකස් කළාට පසු අවුරුද්ද පුරාම එකම පොත් මල්ල දරුවා ඔසවා ගෙන යා යුතු නැහැ . එක වාරයකට සකස් කරලා තියෙන පොත කටපා-ඩම් කරන පොතක් නෙවෙයි. එය workbook ලෙස සකස් කළ මොඩියුලයක්.

ගුරුවරයා අවශ්‍ය සියල්ල ළඟා කර මඟ පෙන්වමින් ළමයා තුළ තියෙන හැකියා, අදහස්, පිළිවෙළ එළියට ගන්න මෙයින් ළමයා විසින් දැනුම විචක්ෂණශීලීව ඉගෙනීමට යොමු වෙනවා. ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් කරන්නේ කොහොමද කියන එක බැලුවොත්, ඒක අවුරුදු හැටක් හැත්තෑවක් තිස්සේ පොත් තුළ පමණක් තිබූ දෙයක් ළමයාගේ සැඟවුණු දක්ෂතාවය එළි-යට ගැනීමක් සිදු වන අතර ළමයාට දැනුම ගොඩනඟා ගන්නට ඉඩ දෙනවා. ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය ශිෂ්‍ය කේන්ද්‍රීය වෙන්නෙ කොහොම ද කියන එක මෙහිදී සිදු වෙනවා. එය සුපත්ති ඉගෙනුම් ක්‍රියාවලියයි. ළමයාව වැඩ ලෝකයට අදාල වන පරිදි ජීවිතයට අදාළ වන පරිදි, අධ්‍යාපනය ප්‍රායෝගිකව ලබා දෙන එක සිදු වෙනවා. වැදගත් වෙන්නෙත් ඒකමයි. අපි බලමු ළමයෙක් බැක්ටීරියා පිළිබඳ සොයනවා, සාහිත්‍ය, ගීතය, කවිය, නවකතාව ඒ වගේම වෙනත් කර්මාන්ත පිළිබඳව හෝ විවිධ දේ පිළිබඳ විමසිලිමත් වෙනවා. ළමයි සොයන්න කැමති, අත්හදා බලන්න කැමති තමා ම හිතලා තමා ම විශ්ලේෂණය කරමින් සොයා බලමින් ඉගෙනීම තමයි මෙතැනදී වෙන්නේ.

● නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රමවේදය පාසල් සඳහා යොමු කිරීමට තව කොපමණ කාලයක් ගත වෙයි ද?

ඇත්තටම මෙය ලෙහෙසි පහසු කාර්යයක් නෙවෙයි. ජාතික අධ්‍යාපන ආයතනය තමයි මෙහි මූලිකත්වය දරන්නේ. අපි විශ්වාස කරනවා. 2022 පාසල් දෙසීයක් විතර යොදාගෙන මෙය අත්හදා බලන්න පුළුවන් වෙයි කියලා. මේ වගේ විශාල නව ක්‍රමයක් එකවරම පාසල් ඇතුළත් කරන්න බැහැ. 2023 දී ක්‍රමිකව එය කරන්න අපිට හැකියාව ලැබෙයි. මූලික වශයෙන් 2024 දී සාමාන්‍ය පෙළටත් 2025 වෙනකොට උසස් පෙළටත් සම්පූර්ණ වශයෙන් ඇතුළත් කරන්න සැලසුම් කරලා තියෙ-නවා.

● ඔබ පවසන ක්‍රම-යට ගුරුවරයාට විශාල වගකීමක් පැවරෙනවා. මේ ක්‍රමයට ගුරුවරු සූදා-නම් කරන්නේ කොහොම ද?

අතීතයේ ඔය එක පොතක්වත් තිබුණේ නැහැ. අපේ ගුරුවරු අපිට ඉගැන්නුවේ විවිධ පොත්පත් වලින්. ඊට පස්සේ තමයි ගුරුවරයාට සහ ළමයාට පහසු වන පරිදි එක් එක් විෂයට එක පොතක් ගෙනාවේ. ඒත් මේ ක්‍රමයෙන් සාර්ථක ප්‍රතිඵල අත්පත් කරගන්න බැහැ කියලා පර්යේෂණවලදී ඔප්පු වෙලා තියෙනවා. එම නිසා හැම කලාපීය මට්ටමකටම වෘත්තීය දියුණුව සඳහා ගුරු සංවිධානයක් ඇති කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ගුරු තත්ත්ව කව ලෙස (teachers forum). මූලික වටයේදී ගුරුවරයාට පැවරෙන්නේ, නව ක්‍රමයන් අවබෝධ කරගන්නෙ කොහොමද කියලයි. ගුරුවරයෙක් ලෙස කොහොමද සුපත්තිය ඉගෙනුම් ක්‍රමය කරන්නෙ කියලා ගුරුව-රයා තුළ මානසික වෙනසක් ඇති කරනවා.

මෙතැනදී ඉගෙන ගන්න එක සාමාන්‍යකරණය කරන්න අවශ්‍යයි. එසේම දැනුම කුසලතාවයට කොහොමද හරවන්නේ කියන කාරණය පිළිබඳ ගුරුවරයාට අදාළ පහසුකම් සමඟ අව-බෝධ කරගන්න අවකාශය ලබා දෙනවා. මේ කවයන්වලදී නව සංකල්පයට ගුරුවරයාට පුහුණුවීමක් ලබා දෙනවා. එහිදී ගුරු-වරයා විසි එක්වන සියවස සඳහා සුදුසු වැඩ ලෝකයට දරුවා සූදානම් කරන්නෙ කොහොමද කියලා පුහුණුව ලබා ගන්නවා.

අතීතයේ ගුරු පුහුණුව සිදු කළේ කොටස් වශයෙන්. එය සාර්ථක ක්‍රමයක් නෙවෙයි කියලා අපිට පෙනිලා තියෙනවා. ඒ නිසා සියලුම දෙනා එකම විදිහට උගන්වන්න ඕනෑ. විදුහල්ප-තිවරුන්ගේ කාර්යයත් වැදගත්. අලුත් විෂය මාලාවේ ක්‍රියා-මාර්ග තේරුම් නොගතහොත් වැඩ කරන්න අපහසුයි. සුපත්ති ඉගෙනීම් ක්‍රමයේ නිවැරදි උත්තරය සහ වැරදි උත්තරේ කියලා දෙයක් නැහැ.

දරුවා දෙන උත්තර විවිධ ආකාරයෙන්, නිර්මාණශීලි ලෙස නිවැරදි වන ආකාරයට ලකුණු දෙනවා. දරුවා නිවැරදි වනතුරු මේ කාර්යය නැවත නැවත කරන්න පුළුවන්. ලෝකයේ වැඩිම ජේටින් බලපත්‍ර (1067) තියෙන තෝමස් අල්වා එඩිසන් දුර්වල ළමයෙක්. මෙයා වැඩක් නැති ළමයෙක් කියලා පාසලෙන් නෙර-පලා දැම්මා. ඒත් එය අවස්ථාවක් කරගත් ඔහුගේ මව තෝමස්ට කිව්වේ "පුතේ ඔයාට උගන්වන්න පුළුවන් තරමේ ගුරුවරයෙක් ඒ පාසලේ නැහැ" කියලයි. ඒ අම්මා දරුවව නිරන්තරවම පුස්ත-කාලය වෙත යොමු කළා. එවිට එම දරුවා ඔහුට අනුව ඉගෙන ගත්තා. ඔහු ඉගෙන ගත්තෙ අම්මගෙන්. අපේත් මැලිබන්, සිද්ධාලේප, නවලෝක මුදලාලිලා තමන්ට අනුව ඉගෙනගත් ඉතා වටිනා පුරවැසියන්. මාර්වින් වික්‍රමසිංහ මහත්තයා අපේ විශ්වවිද්‍යාලවල සහ ඊටත් එහාට සාහිත්‍ය හදාරන්නෙ එතුමාගේ පොත්වලින්. ලෝකය තනන්න හැකියාව තියෙන්නෙ නිර්මා-ණාත්මක පුරවැසියෙක්ට මිස කට පාඩම් කරලා විභාග ජය-ගන්න අයෙක්ට නෙවෙයි. අසාර්ථකයි නොකියා විවිධ දක්ෂතා නිර්මාණාත්මකව ගොඩනැංවීමෙන් ඔවුන් ජය ගත්තා.

● සෑම මව්පියකුටම සහ අධ්‍යාපන පරිපාලන ක්ෂේත්‍රයටත් බලපාල තිබෙන ප්‍රධාන ගැටලුව ළමයාට හොඳ පාසලක් කියන එක. මේ සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවා ද?

ළමයාට පාසලක් නැහැ කියලා කියන ප්‍රශ්නය අද ඊයේ ගැටලුවක් නෙවෙයි. දැනට ජාතික පාසල් 373ක් තියෙනවා. ලංකාවේ තියෙන අධ්‍යාපන කොට්ඨාස 312න් 123කට එක ජාතික පාසලක්වත් නැහැ. එනිසා අවම වශයෙන් එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක ජාතික පාසලක්වත් ඇති කරන්න අපි විශ්ලේෂණය කළා. ඒ අනුව ජාතික පාසල් 1169ක් කඩි-නමින් ඇති කරන්න බලාපොරොත්තු වෙනවා. දැනට ජාතික පාසල්වල ඉගෙනුම ලබන්නෙ 20% දරුවන් ප්‍රමාණයක්. බොහෝ දෙමාපියන් මේ පාසල්වලට තරගයක් ඇති කරගෙන තියෙනවා. 2025 වන විට ජාතික පාසල් 1169 ගොඩනැඟීමෙන් පසු 70% කට පමණ හොඳ පාසලක් තියෙනවා. මේ පිළිබඳ සොයා බලද්දී ජාතික පාසල්වල යහපත් පැතිකඩක් නැහැ කියල පෙනුණා. සමහර ජාතික පාසල්වල බෝඩ් ලැල්ල විතරයි. දෙමාපියන්ගේ සහ දරුවන්ගේ සිහින පාසල ලෙස ජාතික පාසල් තුළ දිය හැකි උපරිම පහසුකම් හදලා දෙන්න කටයුතු කරනවා.

● පාසල් සඳහා අවශ්‍ය ගුරුවරු අවශ්‍ය පරිදි නොමැති බව නිතර එල්ල වන චෝදනාවක්?

ගුරුවරු බෙදා දැක්වීම පිළිබඳ තියෙන්නෙ අසතුටුදායක තත්ත්වයක්. උදාහරණයක් ගතහොත් පාසල් 23ක් එක ළමයට එක ගුරුවරයා ගානේ ඉන්නවා. ළමයි 4කට හෝ 5කට එක ගුරුවරයා ගානේ ඉන්න තවත් පාසල් බොහෝමයක් තියෙනවා. ඒත් සිටිය යුත්තේ ළමයි 17 දෙනෙකුට එක ගුරුවරයෙක්. බොහෝ ජනප්‍රිය පාසල්වල ගුරුවරු 1ට 21ක් හෝ 22ක් වශයෙන් සිටින අවස්ථාත් තියෙනවා. විද්‍යාව, සෞන්දර්යය, ඉංග්‍රීසි, ක්‍රීඩා වැනි විෂයයන්ට ගුරුවරු අඩුයි. එනිසා විශේෂඥ දැනුමක් නැති විෂයයන් උග-න්වන්න ගුරුවරුන්ට සිදුවෙලා.

● මව්පියන්ගේ අවශ්‍යතාවක් වන්නේ තම දරුවා විශ්වවිද්‍යාලය සඳහා ඇතුළත් කරන එකයි. ඒ ගැන ඔබේ අදහස මොකක් ද?

බොහෝ මව්පියන්ගේ ඉහළම බලාපොරොත්තුව තමයි තම දරුවා විශ්වවිද්‍යාලයට යවන එක. ඒත් සියලු දරුවන් එකම විෂය ධාරාවක් ඔස්සේ විශ්වවිද්‍යාලයට යනවා. වෙනත් මාර්ග ඔස්සේ හෝ ඉදිරියට ඉගෙන ගන්නවා. දරුවා කොතනටද යන්නෙ කියලා මාපියන්ගේ හෝ ගුරුවරයාගේ අවශ්‍යතාවට අනුව තීර-ණය කරනවා. ඒත් එහි ප්‍රායෝගික බවක් නැහැ. දරුවන්ට ඉගෙ-නගන්න බොහෝ පැතිකඩ තියෙනවා. වෘත්තීය කුසලතාවයක් අරගෙනයි දරුවා පාසලෙන් සහ විශ්වවිද්‍යාලයෙන් පිටවිය යුතුයි. ඉහළ බුද්ධි කුසලතාවක් ලබාගෙන තමන්ගෙ ජීවිතයේ ඉහළ මට්ටමකට යන්න පුළුවන් කියන මානසිකත්වය දරුවා තුළ ඇති කරන එක අධ්‍යාපනයේ වගකීමක්.

● මේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේදී කවර ආකාරයේ දරුවකු සමාජගත කරන්න හැකිදැයි කියන්න පුළුවන් ද?

අවසාන බලාපොරොත්තුව තමන්ටත්, ලෝකයටත් වැඩදායී ශ්‍රම බළකායක් ඇති කරන එක. අපි හයේ (06) පන්තියේ සිට මොඩියුල මගින් ඒ කුලසතා පූර්ණ නිර්මාණශීලි, දක්ෂතාවය අනුව ඒ පැත්තට යන්න අධ්‍යාපනය දෙනවා. ඒ සමගම ක්‍රීඩාව අනිවාර්යයෙන්ම ඕනෑ. ඒ තුළින් ළමයා ක්‍රියාකාරී වී කායිකව මෙන්ම චිත්තවේග සංවර්ධනය කරගන්නවා. බුද්ධි ඵලය ඉහළ වූ පමණින් පුද්ගල ජීවිතයක් සාර්ථක වෙන්නෙ නැහැ කියලා පර්යේෂණවලින් ඔප්පු කරල තියෙනවා. කෙනෙක්ගෙ ජීවිතය සාර්ථක වෙන්න නම් 70% චිත්තවේග ඵලය තිබෙන්නට ඕනෑ.

සාර්ථක හා සමබර ජීවිතයක් ගත කිරීමට කෙනෙක්ගෙ බුද්ධිඵලය අඩු වුවත්, චිත්තවේගඵලය හොඳ නම් ඔහුගේ ඉදිරි ගමන ස්ථිරයි. ඉහළ බුද්ධි ඵලයක් තිබුණත් චිත්තවේග ඵලය නැත්නම් ඔහුට ඉදිරි ගමනක් යන්න අපහසුයි. ඉවසීම ප්‍රගුණ කරලා චිත්තවේග පාලනය කරගන්න හැකියාව ඇති මානු-ෂික ගුණ දහම් සපිරි පුද්ගලයෙක්ව යහපත් පුරවැසියෙක් ලෙස සමාජ ගත කරන්නට හැකි දරුවෙක් බිහි කරන එක අපේ ප්‍රධාන අපේක්ෂාවක්. ඒකට කළ හැකි සෑම කැපවීමක්ම, උත්සාහයක්ම ගන්නවා. අපට අවශ්‍ය ලෝකය දිනන යහපත් පුරවැසියෙක් ගොඩනඟන්නයි.

නාමලී මාකලන්දාව
(රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව)

අලුත් වූ

දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

මාර්තු 8දා සිට

සෑම දිනකම විශේෂ සාහිත්‍යමය, රසාස්වාදන අතිරේකයක්

සඳුදා
දිවා
LOADING
කාලතුයේ ඩිජිටල් දොරටුව

අඟහරුවාදා
බද්දරමල්ල
සතියේ 'තුනපහ' මඩිස්සලේ

බදාදා
සාර භූමියේ හරිතානන්දය
පැලැස්ස

බ්‍රහස්පතින්දා
ස්වර්ණ භූමියේ අතීතාවලෝකනය
නිධානය

සිකුරාදා
දේශවංශය
දේශයේ පාලන මාවත

සෙනසුරාදා
යොවුන් ජනතා

LAKE HOUSE
ලේක්හවුස් ප්‍රකාශනයක්

ග්‍රාමීය ජන ජීවිතය හා බැඳුණු කර්මාන්ත ආරක්ෂා කර ගැනීම අත්‍යවශ්‍යයි:

පන්සල-පල්ලිය-කෝවිල පවතින තාක් මැටි පහනට ඇති ඉල්ලුම නැතිවෙන්නේ නෑ

ඇමැති විමල් වීරවංශ

රක්ෂණ ශ්‍රියන්ත

කර්මාන්ත ක්ෂේත්‍රයේ පුනරුදයකට මහා පරිමාණ කර්මාන්තවල දියුණුව මෙන්ම ග්‍රාමීය ජන ජීවිතය සමඟ තදින් බැඳුණු සාම්ප්‍රදායික කර්මාන්ත ආරක්ෂා කර ගැනීම ද අත්‍යවශ්‍ය බව කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතා පෙන්වා දෙයි.

පෙරේදා (03) කඩුවෙල රණාල මැටි ආශ්‍රිත කර්මාන්ත ගම්මානයේ නිරීක්ෂණ චාරිකාවකින් අනතුරුව එම ගම්මානයේ සාම්ප්‍රදායික කර්මාන්ත-කරුවන්ගේ සහභාගිත්වයෙන් රණාල මහින්දාරා-මයේ පැවති ජාතික ශිල්ප සභාව සංවිධාන කළ රැස්වීමේදී ඒ මහතා මෙසේ පෙන්වා දුන්නේය.

එහිදී වැඩිදුරටත් වීරවංශ ඇමැතිවරයා මෙසේද සඳහන් කළේය.

ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහ අග-මැති මහින්ද රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් යුත් අපේ ආණ්ඩුව මේ සාම්ප්‍රදායික කර්මාන්ත නගාසිටුවීම ගැන විශේෂ අවධානයක් යොමු කොට තිබෙනවා. එවැනි අවධානයක් යොමු කර ඇති නිසා අපට මේ ගම්මානයට පැමිණ, 'මේ මැටි ආශ්‍රිත කර්මාන්තය අනාගත පරපුරටත් උරුම කරදීමට කළ යුත්තේ කුමක්ද?' කියා සාකච්ඡා කිරීමට හැකිව තිබෙනවා.

මේ කර්මාන්තය ඉදිරියට ගෙන යා හැකි අන්දමින් අදාළ කටයුතුවලට මේ වසරේදී රුපියල් ලක්ෂ 200ක් යෙදවීමට අපි මේ වනවිට කටයුතු යොදා තිබෙනවා. කර්මාන්ත ක්ෂේත්‍රයේ දියුණුවක් බලාපොරොත්තු වන විට මහා පරිමාණ කර්මාන්තවල ප්‍රවර්ධනය මෙන්ම ග්‍රාමීය ජන ජීවිතය සමඟ තදින් බැඳුණු මෙවැනි සාම්ප්‍රදායික කර්මාන්ත ආරක්ෂා කිරීම ද අත්‍යවශ්‍ය වෙනවා. ලෝකයේ දියුණු රටවල් තාක්ෂ-ණය අතින් ඉතා ඉහළින් සිටියත් ඒ හා සමගාමීව තම රටේ සාම්ප්‍රදායික කර්මාන්ත ඉදිරියට ගෙන-යාම අද පවතින ප්‍රවණතාවක් බවට පත්ව ඇත්තේ ඒ නිසයි. සාම්ප්‍රදායික කර්මාන්තවලින් නිෂ්පාදනය කෙරෙන භාණ්ඩවලට තිබෙන වෙළෙඳපොළ අව-කාශය කිසිවිටෙක අහිමි වන්නේ නැහැ. නිදසුනක් ලෙස පන්සල, පල්ලිය, කෝවිල පවතින තෙක් මැටි පහනට තිබෙන ඉල්ලුම නැති වන්නේ නැහැ.

එවැනි වෙළෙඳපොළ අවකාශයක් සෑමවිටම සාම්ප්‍රදායික කර්මාන්තවලට පවතින නිසා ඒවා ප්‍රවර්ධනයට අපට ආණ්ඩුවක් ලෙස මැදිහත්වීම ඉතා ඵලදායක කටයුත්තක් වී තිබෙනවා. කඩුවෙල නගරාධිපතිතුමා මේ කර්මාන්ත ගම්මානය ආසන්න ස්ථානයක ඉදිරි පරපුරට මේ කර්මාන්තය ඉගෙන ගැනීමේ පහසුකම් ද සහිත නවීන තාක්ෂණයෙන් සමන්විත මධ්‍යස්ථානයක් ඉදිකිරීමට සුදුසු භූමිභා-ගයක් ලබාදීමට දැනටමත් එකඟ වී තිබෙනවා. ඒ අනුව අපි නුදුරේදී එම කටයුත්ත ආරම්භ කරනවා. එලෙස පොදු මධ්‍යස්ථානයක් ඉදි කිරීමෙන් ඔබ මුහුණ පා ඇති ගැටලු රැසකට පිළිතුරු ලැබෙනවා. ඔබට පෞද්ගලිකව මුහුණ පෑමට සිදුව ඇති ගැටලු ද මෙහිදී ඉදිරිපත් වුණා. ඒවාට ද හැකි පමණින් කඩිනමින් විසඳුම් ලබාදීමට අපි සූදානම්. අපිට මේ කර්මාන්තය ඉදිරි පරපුර වෙත දායාද කිරීමට හැකි වන්නේ අපේ දරුවන් මේ කර්මාන්තයේ දියුණුවක් දැක ඊට දායක වුවහොත් පමණයි. ඒ දියුණුව ඇති කිරීමට අපි වෙළෙඳපොළ අවකාශය දිනාගත යුතුයි. සාම්ප්‍රදායික කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදනවලට පවා ආනයනික විකල්ප නිෂ්පාදන විශාල වශයෙන් මෙරටට ගෙන ඒම ගැටලුවක්ව පැවතියා. නමුත් මේ වන විට ආනයනික භාණ්ඩ සඳහා පනවා ඇති සීමා හේතුවෙන් සාම්ප්‍රදායික දේශීය නිෂ්පාදනවලට වෙනදාට වඩා පුළුල් වෙළෙඳපොළක් නිර්මාණය වී තිබෙනවා. එම අවස්ථාවෙන් පල නෙළා ගැනීමට ඔබ සැම උත්සුක විය යුතුයි.

වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ප්‍රසන්න රණවීර, ජාතික ශිල්ප සභාවේ සභාපති සුදත් අබේසේකර, කඩුවෙල නගරාධිපති බුද්ධික ජයවිලාල්, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් ඇතුළු රාජ්‍ය නිලධාරීහු රැසක් ද මේ අවස්ථාවට එක්ව සිටියහ.

මුතුරාජවෙල ඇතුළු මේ රටේ පරිසරය ආරක්ෂා කර ගැනීමට උපරිමයෙන් මැදිහත් වෙනවා

මධ්‍යම පරිසර අධිකාරිය

පෞද්ගලික හෝ දේශපාලන අත පෙවීම්ව-ලට යටත් නොවී මුතුරාජවෙල ආශ්‍රිත පරිසරය ඇතුළු ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කර ගැනීමට උපරිමයෙන් මැදිහත්වන බව මධ්‍යම පරිසර අධිකාරිය නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී.

කොළඹ අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් ප්‍රකාශයට පත් කරන ලද මාධ්‍ය නිවේදනයේ සඳහන් කරුණු ප්‍රතික්ෂේප කරමින් ඊට පිළිතුරු වශයෙන් එම අධිකාරියේ සභාපති එස්. අමරසිංහ මහතා විසින් නිවේද-නයක් නිකුත් කරමින් පවසන්නේ මුතුරාජවෙල සංවර්ධන යෝජනා සම්බන්ධයෙන් මේ දක්වා කිසිම තාවකාලික හෝ ස්ථිර බලපත්‍ර ලබාදීමක් කර නොමැති බවයි. පරිසර ඇමැති මහින්ද අමරවීර හා රාජ්‍ය ඇමැති විමලවීර දිසානා-යක මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේ දී අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කළේ එදින සාකච්ඡාවට භාජනය කළ අතිරේක හා යෝජිත කමිටුව ක්‍රියාත්මක වී ඉදිරියේ දී අවශ්‍ය තීන්දු, තීරණ ගන්නා තෙක් තාවකාලික හෝ ස්ථිර බලපත්‍ර ලබා නොදෙන බවයැයි මේ නිවේදනයේ දැක්වේ. අවම වශයෙන් අයැදුම්প-තක් හෝ භාර ගැනීම මධ්‍යම පරිසර අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කර ඇතැයි ද එහි සභාපතිව-රයා නිකුත් කළ නිවේදනයේ සඳහන් වේ.

ඉදිරියේදීත් දැනට සාකච්ඡා වී ඇති පරිදි අන්තර් අමාත්‍යාංශ කමිටුව මගින් ගන්නා ලද තීරණයකට අනුව මිස වෙනත් කිසිම යෝජනා-වක් මත තනි ආයතනයක් ලෙස සිය අධිකාරිය කටයුතු නොකරන බවද හෙතෙම වැඩිදුරටත් සඳහන් කරයි.

බතික්-අත්යන්ත්‍ර රෙදි රාජ්‍ය අමාත්‍යාංශයේ

නව ලේකම් ධර්මකීර්ති වැඩ බාරගනී

බතික්,අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟ-ලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ නව ලේකම්වරයා ලෙස බී.එල්. ඒ.ජේ.ධර්මකීර්ති මහතා පසුගියදා අමාත්‍යාංශයේදී වැඩ භාරගත්තේය. මේ අවස්ථාවට අමාත්‍යාං-ශයේ විෂය භාර රාජ්‍ය ඇමැති දයාසිරි ජයසේකර මහතාද සහභාගි විය.

බී. එල්. ඒ. ජේ. ධර්මකීර්ති මහතා ප්‍රාදේ-ශීය ලේකම්වරයකු මෙන්ම අමාත්‍යාංශ කීපයකම අතිරේක ලේකම්වරයකු ලෙසද ආගමන විගමන දෙපාර්තමේන්තුවේ අති-රේක පාලකවරයා වශයෙන්ද කටයුතු කර ඇත. එමෙන්ම පරිපාලන සේවයේ අත්දැ-කීම් බහුල ඒ මහතා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකුද වේ.

මහනුවර සිල්වෙස්ටර් විද්‍යාලයේ ආදි සිසුවකු වන ඒ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී රාජ්‍ය පරිපා-ලනය පිළිබඳ (විශේෂ) උපාධිධාරියෙකි. එමෙන්ම කැලණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි ලාභියකුද වේ.

ඔන්ලයින් සම්මන්ත්‍රණ කරන්න තාක්ෂණික පහසුකම් හා පුහුණුව

තොරතුරු හා සන්නිවේදන නියෝජිතායතනයෙන්

මහින්ද අලුත්ගෙදර

අධ්‍යාපන කටයුතු සඳහා වීඩියෝ (online) සම්ම-න්ත්‍රණ යොදාගැනීමට තාක්ෂණික පහසුකම් හා පුහුණුව ලබාදීමට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය පියවර ගෙන තිබේ.

කොවිඩ් වසංගතය හමුවේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට අන්ත-ර්ජාල වීඩියෝ (online) සම්මන්ත්‍රණ වඩාත් ඵලදායි ලෙස භාවිතා කිරීමට අවශ්‍ය තාක්ෂණික පහසුකම් හා පුහුණුව ලබාදීමට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායත-නය (ICTA) වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරයි.

ඒ අනුව www.mytutor.edu.lk වෙබ් අඩවියේ ලියාපදිංචි උපකා-රක පන්ති ගුරුවරුන් සිය දෙනෙකු 100 මුල් අදියර යටතේ පුහුණු කෙරෙන අතර ඒ සඳහා ශ්‍රී ලංකා ඉවිස් (ewis) ආයතනය සහාය ලබාදෙයි.

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ දී සිදු-කෙරුණු අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සභාපති මහාචාර්ය ලලිත් ගමගේ සහ ඉවිස් ආයතනයේ සභාපති, ප්‍රධාන විධායක නිලධාරී සංජීව වික්‍රමනායක මහත්වරු මේ අවබෝධතා ගිවිසුමට අත්සන් කළහ.

මයික්‍රොසොෆ්ට් ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ තාක්ෂණික විකුණුම් කළමනාකරු හර්ෂ රන්දෙණිය, මයික්‍රොසොෆ්ට් ශ්‍රී ලංකාව සහ මාලදිවයින - කළමනාකරු හසිත අබේ-වර්ධන, ewis සාමාන්‍යා-ධිකාරී මනූජා සෝමරත්න, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායත-නයේ ප්‍රධාන ඩිජිටල් සේවා නිලධාරී ආචාර්ය රොහාන්ත රොඩ්රිගෝ මහත්ම මහත්මීහු ද මේ අවස්ථාවට සහභාගි වූහ.

ගෙවී ගිය වසරක කාලයේ අප කළ ලොකුම කාර්යය වුණේ උපාධිධාරීන්ට රජයේ රැකියා දීමයි

පළාත් පාලන ඇමැති ජනක බණ්ඩාර

ස්වර්ණා විජේකෝන්

වත්මන් රජය බලයට පත්වී ගෙවී ගිය වසරක කාලයේ විශාල කොටසක් අපි සිදුකර ඇති බවත් ඒ යටතේ සිදුකළ විශා-ලම කාර්යයක් ලෙස උපාධිධාරි තරුණ තරුණියන්ට රජයේ රැකියා ලබාදීම හඳුන්වා දිය හැකි බවද රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන ඇමැති ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා ප්‍රකාශ කළේය. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය යටතේ ජනතාවට දුන් පොරොන්දුවක් ලෙස මෙය ඉටුකළ බවත් රැකියා 50000ක් දෙන බවට පොරොන්දු වුවද මේ වනවිට උපාධිධාරීන් 58000කට රැකියා ලබාදුන් බව විෂය භාර ඇමැති-වරයා ලෙස සතුටින් ප්‍රකාශ කරන බවද ඇමැතිවරයා ප්‍රකාශ කළේය.

ඇමැතිවරයා මේ බව සඳහන් කළේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේදී පෙරේදා (03) පැවැති මාධ්‍ය සාකච්ඡාවකට සහ-භාගි වෙමිනි.

එහිදි වැඩිදුරටත් ඇමැතිවරයා මෙසේද පැවසීය.

අපි සද්භාවයෙන් මේ කරන කටයුතු-වල ගෞරවය දේශපාලනිකව අසාර්ථක වුණ ඇතැම් වෘත්තීය සමිති තමන්ගේ කරගන්න දරණ උත්සාහය ඉතා නින්දි-තයි". පසුගිය රජය විසින් බඳවා ගත් උපාධිධාරීන් 14283 ක් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ කටයුතු මේ දින-වල සිදුවෙනවා.මේ අය 2021 ජනවාරි 01 වැනිදා පෙර දාතම්න් තමයි අපි අන්තර් ග්‍රහණය කරන්නේ.මේ සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් පළාත් ලේකම්වරුන්ටත් අපි දන්වා යවා තිබෙනවා.ඒ වගේම සංවර්ධන නිලධාරි සේවය සඳහා වන සේවා ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම මේ වන විට අපේ අමාත්‍යාංශය සිදුකරමින් සිටිනවා. මම බලාපොරොත්තු වෙනවා මේ ව්‍යවස්ථාව නිර්මාණය වීමත් සමඟම මේ සේවාවේ සැමට බලපාන ප්‍රශ්නවලින් සියයට 80 ක ට පමණම විසඳුම් දෙන්න පුළුවන් වෙයි කියා.කොහොම වුණත් මේ රටේ උගත් සංවර්ධන නිලධාරීන්ගෙන් මම ඉල්ලන්නේ ඔබ ගැන සිතා තීන්දු තීරණ ගන්න වර්තමාන රජය ගන්නා මේ සාධනීය ක්‍රියාමාර්ග සමඟ මිස දේශපාල-නික අනාථයන්ගේ ගොදුරක් නොවෙන්න කියලයි.

මෙහිදී සංවර්ධන නිලධාරීන්ට රාජකාරි ලැයිස්තුවක් නොවීම සම්බන්ධයෙන් මාධ්‍යවේදියකු නැගූ ප්‍රශ්නයකට පිළිතුරු දුන් අමාත්‍යාංශ ලේකම් ජේ.ජේ.රත්නසිරි මහතා "උපාධිධාරීන් බඳවා ගැනීම පසු-ගිය කාලය පුරාම සිදුවුණා.2005 වසරේදී 35000, 2012 දී 42000ක්, 2019 දී 14500 වගේම 2020 දී 60000 විදියට මේ බඳවා ගැනීම් සිදුවුනා.මේ බඳවා ගැනීම කිසි-වක් තනතුරු ඇතිව කල බඳවා ගැනීම් නොවෙයි.රජය ගත් ප්‍රතිපත්තිමය තීන්දු මත කළ බඳවා ගැනීම්.මේ විදියට තන-තුරු නැතිව නිලධාරීන් බඳවා ගැනීමෙන් එකවර රාජකාරි ලැයිස්තුවක් ලබාදීම පහසු කටයුත්තක් නොවේ.

අමාත්‍යාංශ උපදේශක මහින්ද මඩිහ-හේවා මහතාද මේ අවස්ථාවට එක්විය.

උපදින සෑම දරුවෙකුටම රෝහලින් පිටව යාමට පෙර ශ්‍රවණ පරීක්ෂාවක්

කොළඹ ජාතික රෝහලේ ENT විශේෂඥ වෛද්‍ය චන්ද්‍රා ජයසූරිය

සන්ධ්‍යා කරුණාරත්න

උපදින සෑම දරුවෙක්ම රෝහලින් පිටව යාමට පෙර ශ්‍රවණ පරීක්ෂාවක් සිදු කිරීමේ නව වැඩපිළිවෙළක් රටපුරා රෝහල්වල ආරම්භ කරන බව කොළඹ ජාතික රෝහලේ උගුර, කණ, නාසය සම්බන්ධ විශේෂඥ වෛද්‍ය චන්ද්‍රා ජයසූරිය මහත්මිය පැවසු-වාය.

දරුවන්ගේ ශ්‍රවණ තත්ත්වයන් සම්බන්ධ-යෙන් මවුපියන් වැඩි අවධානයක් යොමු කළයුතු බවත් දරුවන්ගේ වෙනසක් තිබේ නම් ශ්‍රවණ පරීක්ෂා සඳහා ඔවුන් යොමු කළයුතු බවත් ඒ මහත්මිය ප්‍රකාශ කළාය.

කොළඹ ජාතික රෝහලේ පැවැති මාධ්‍ය හමුවකට සහභාගි වෙමින් ඒ මහත්මිය පෙරේදා (03) මේ බව පැවසුවාය. බිහිරි බව නිසා ජනතාවට සිදුවන අපහසුතා වළක්වා ගැනීමට ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් සෑම වසරකම මාර්තු මස 03 වැනිදා ලෝක ශ්‍රවණ දිනය ප්‍රකාශයට පත් කර තිබේ. ඒ නිමිත්තෙන් මේ මාධ්‍ය හමුව පැවැත්විණි. කනේ ඇති වන විවිධ ආසාදිත තත්ත්වය-න්හිදී ඒ සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතුයැයි ද ඇය පැවසුවාය. අධික ශබ්ද මගින් කනට ආබාධ ඇති විය හැකි අතර කර්මාන්ත ශාලා අසල ජීවත්වීම, උත්සව අවස්ථාවලදී යොදා ගන්නා සංගීත කණ්ඩායම්වලින් නිකුත් වන අධික ශබ්දය, ජංගම දුරකථන භාවිතයේදී හෙඩ් සෙට් යොදා ගැනීම යනාදිය නිසා කනේ විවිධ ආබාධ ඇති විය හැකි බව ද ඒ මහත්මිය ප්‍රකාශ කළාය.

ශ්‍රවණ උපකරණ භාවිත කරන්නේ නම් ඒවා වෛද්‍ය උපදෙස් මත භාවිත කිරීම අනි-වාර්යයැයි ද, කන පිරිසිදු කිරීමට කොටින් බටින්, කන් හැන්ද, යතුරු කටු, කොණ්ඩ කටු, යතුරු, කුරුලු පිහාටු, තුත්තිරි ගස්, අතේ ඇඟිලි භාවිතා කිරීම නුසුදුසුයැයි ද ඇය කීවාය.

කන පිරිසුදු කිරීමට විෂ කඩදාසි යොදා ගැනීම සුදුසු වන බවත් අනවශ්‍ය ද්‍රව්‍ය කනට ඇතුළු කිරීමෙන් කන් බෙරයට සහ කනට හානි වන බවත් ඇය කියා සිටියාය.

රාගම ශික්ෂණ රෝහලේ උගුර කන නාසය පිළිබඳ විශේෂඥ වෛද්‍ය යසස් වීර-ක්කොඩි මහතා ද මේ අවස්ථාවට සහභාගි විය.

දුරස්ථ අධ්‍යාපන පහසුකම් ඉහළ නැංවීමට සහායවීම කාලීන අවශ්‍යතාවක්

මයිලෝ ප්‍රවර්ධන වැඩසටහනේ ජයලැබුවන්ට ත්‍යාග ප්‍රදානය කරමින් අධ්‍යාපන ඇමැති කියයි

සීතාරා සේනානි

කොවිඩ් වසංගතය හමුවේ බොහෝ දරුවන් නිවෙසටම සීමා වී සිටින මෙවන් සමයක දුරස්ථ අධ්‍යාපන පහසුකම් ඉහළ නැංවීමට සහාය වීම කාලීන අවශ්‍යතාවක් බවත්, එය මැනවින් හඳුනා ගනිමින් ඒ සඳහා සහාය වීම අතිශයින් අගය කළයුතු බවත් අධ්‍යා-පන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා පැවසීය.

දරුවන්ගේ දුරස්ථ අධ්‍යාපන කටයුතුවලට සහාය වීමත්, ඔවුන්ගේ ශාරීරික ක්‍රියාශීලීභාවය වැඩි කිරී-මත් අරමුණු කර ගනිමින් මයිලෝ වෙතින් හඳුන්වා දෙන ලද ප්‍රවර්ධන වැඩසටහනේ ජයග්‍රාහක දරුවන්ට ලැප්ටොප්, ටැබ්, රිලෝඩ් පහසුකම් ඇතුළු ත්‍යාග ප්‍රදානය කිරීම වෙනුවෙන් අධ්‍යාපන ඇමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් අධ්‍යාපන අමාත්‍යංශයේ පැවති ඊයේ (03) පැවති විශේෂ උත්සවයේ දී ඇමැතිවරයා මේ බව සඳහන් කළේය.

සමාගමක අරමුණ ලාභ ලැබීම වුවත් ලැබෙන ලාභ-යෙන් සැලකිය යුතු කොටසක් සමාජයේ සුබ සිද්ධිය වෙනුවෙන් යොදා ගැනීමට දිගින් දිගටම කටයුතු කළ සමාගමක් ලෙස නෙස්ලේ සමාගම හඳුන්වා දිය හැකි බවද ඇමැතිවරයා මෙහිදී පැවසීය.

ජනාධිපතිගේ සෞභාග්‍යයේ දැක්ම විශ්ලේෂණය කරන විට එහි වැදගත්ම අංගයක් වන්නේ මෙරට මානව සම්පත් සංවර්ධනය කිරීම බවත්, එය අපට ඇති සහජ සම්පත හා ශක්තිය බවත් කීය. එසේම, දරුවන්ගේ අධ්‍යාපනය අවසානයේ දී ගත් දැනුමට සරිලන රැකියා අවස්ථා සම්පාදනයේදී පරිගණක තාක්ෂණය පිළිබඳ දැනුම අත්‍යවශ්‍ය වන බවද, එය යථාර්ථයක් බවට පත් කිරීමට නෙස්ලේ ලංකා සමාගම ඉදිරිපත්ව සිටීම කෘතවේදීව අගය කරන බවත් පැවසීය.

මේ ප්‍රවර්ධන වැඩසටහන මගින් මෙරට පාසල් දරුවන් දස දහසක් වෙත රුපියල් මිලියන 10ක් වටිනා ත්‍යාග ලෙස පිරිනැමේ. ඒ අනුව, ලැප්ටොප්, ටැබ්, රිලෝඩ් පහසුකම්, ස්කූටර්, බයිසිකල්, ස්කේට්බෝඩ්, පැසිපන්දු, පාපන්දු, skipping rope, headset හා පාසල් බෑග් ආදිය පිරිනමන අතර, කොවිඩ් සමයේ නිවෙසටම සීමා වී සිටින දරුවන්ට ඒ හරහා දුරස්ථ අධ්‍යාපන පහසුකම් ලබා ගැනීමටත්, ශාරීරිකව ක්‍රියාශීලී වීමටත් සහායවීම අපේක්ෂා කෙරේ. මේ වැඩසටහන යටතේ 2021 පෙබරවාරි 18 සිට අප්‍රේල් 18 දක්වා කාලයේ සෑම සතියකම කුසපත් ඇදීමෙන් දරුවන් දහසක් තෝරා ගනිමින් මේ ත්‍යාග පිරිනැමීමට මයිලෝ ආයතනය සූදානම්න් සිටී.

අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල පෙරේරා, නෙස්ලේ ලංකා සමාගමේ උප සභාපති බන්දුල එගො-ඩගොඩගේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් හේමන්ත ප්‍රේමතිලක, මාධ්‍ය ලේකම් බුද්ධික වික්‍රමාදර ඇතුළු මහත්වරු ද මේ අවස්ථාවට එක්වූහ.

ස්ත්‍රී-පුරුෂ සමබව ඇති කරන්න කාරක සභාවක් පත් කරන්න

පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය කථානායකට ලියයි

ස්වර්ණා විජේකෝන්

මෙරට කාන්තාවන්ගේ අයිතිවාසිකම් කඩ වීම හා කාන්තාවන්ට වන වෙනස්කම් සම්බන්ධයෙන් සොයා බලා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව තහවුරු කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරන ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය කථානායකවරයාගෙන් ලිඛිතව ඉල්ලීමක් කර ඇත.

කාන්තා මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සභාපතිනිය වන රාජ්‍ය ඇමැතිනි විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය ඇතුළු අනෙකුත් සියලු කාන්තා නියෝජිතවරියන්ගේ අත්සනින් යුතුව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා වෙත මේ ඉල්ලීම කර ඇත. ඒ අනුව එම යෝජනාව සඳහා කාන්තා මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සභාපතිනි, රාජ්‍ය ඇමැතිනි විශේෂඥ වෛද්‍ය සුදර්ශනී පුනාන්දුපුල්ලේ මහත්මිය, ඇමැතිනි පවිත්‍රා වන්නිආරච්චි, රාජ්‍ය ඇමැතිනි සීතා අරඹේපොල, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් වන ආචාර්ය හරිනි අමරසූරිය, රෝහිණි කුමාරි විජේරත්න, තලතා අතුකෝරළ, ගීතා සමන්මලී කුමාරසිංහ, කෝකිලා ගුණවර්ධන, මුදිතා ප්‍රභාන්ති, රාජිකා වික්‍රමසිංහ, මංජුලා දිසානායක, ඩයනා ගමගේ යන මහත්මීන්ද අත්සන් තබා තිබේ.

මේ කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකවරයා විසින් පත් කරනු ලැබිය යුතු බවත් යෝජිත කාරක සභාවේ සංයුතිය සාමාජිකයන් විසිපස් දෙනකුගෙන් සමන්විත විය යුතු බවටත් යෝජනා කර තිබේ.

මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මහ ලේකම් ධම්මික දිසානායක මහතා සඳහන් කළේ මේ යෝජනාව පාර්ලිමේන්තුවේ අංක 03 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකයටද ඇතුළත් කර ඇති බවයි.

සිය පළමු රැස්වීමේ දිනයේ සිට වසරක් ඇතුළත කාරක සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර, එය සභාගත කර සති 08ක් ඇතුළත ඒ සම්බන්ධයෙන් වන සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර විෂය භාර ඇමැතිවරයා පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතු බවටද පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් යෝජනා කරයි.

ස්ත්‍රී පුරුෂ සමතාව සහ සමානාත්මතාව ප්‍රවර්ධනය කරමින් එයට ගරු කරනු ලබන බව සහ ශ්‍රී ලංකාව තුළ සියලු කාන්තාවන් සහ දැරිවියන් සවිබල ගන්වනු ලබන බව සහතික කරමින්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව කරනු ලබන වෙනස්කොට සැලකීම්වලට ලක් වූ අයගේ නොවිසඳී ඇති ගැටලුවලට පිළියම් සෙවීම සඳහා ප්‍රධාන වශයෙන් මේ කාරක සභාව යෝජනා කර තිබේ.

රැකියා, උසස්වීම් අවස්ථා සහ සේවා ස්ථානයේදී වන හිංසන ඇතුළුව ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව කරනු ලබන සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් පිළිබඳ කාන්තාවන්ගේ දුක්ගැනවිලි විභාග කර බැලීම, සියලු අංශවලට සහ සියලු මට්ටම්වලට ප්‍රමාණවත් අභ්‍යන්තර සම්පත් වෙන් කර දීම සහ ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී - පුරුෂ සමතාව සහ සමානාත්මතාව වැඩි දියුණු කිරීම සඳහා ඇති ප්‍රවේශය සමාලෝචනය කිරීම සහ ඒ වෙනුවෙන් පෙනී සිටීම ඇතුළු යෝජනා දහයක් (10) කාරක සභාවෙන් ඉටු විය යුතු බවට මන්ත්‍රීවරියෝ යෝජනා කරති.

අවශේෂ වනාන්තර දිසා ලේකම්වරුන් යටතට

තීරණය අභියෝගයට ලක් කළ පෙත්සම 18 දා සලකා බලයි

නෙල්කා මැදගෙදර

රක්ෂිත නොවන අවශේෂ වනාන්තර දිස්ත්‍රික් ලේකම්වරුන් යටතට ගැනීමට අමාත්‍ය මණ්ඩලය ගත් තීරණය අභියෝගයට ලක් කරමින් ගොනු කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සමක් ලබන මැයි මස 18 වැනිදා සලකා බැලීමට ශ්‍රේෂ්ඨාධිකරණය ඊයේ (04) තීරණය කළේය.

ඉංජිනේරුවරයකු වන කපිල රේණුක පෙරේරා මහතා විසින් ගොනු කර තිබූ මේ පෙත්සම සිසිර ද ආබෑ, ජනක් ද සිල්වා, කුමුදුනී වික්‍රමසිංහ යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල හමුවේ කැඳවන ලදි.

එහිදී පෙත්සම වෙනත් දිනයක කැඳවීමට තීරණය විය.

මේ පෙත්සමෙහි වගඋත්තරකරුවන් ලෙස වනජීවී අමාත්‍යාංශයේ ලේකම් බන්දුල හරිශ්චන්ද්‍ර, ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් ආර්. ඒ. ඒ. රණවක ඇතුළු පිරිසක් නම් කරනු ලැබ සිටිති.

පසුගිය ඔක්තෝබර් 26 වැනිදා අමාත්‍ය මණ්ඩල තීරණයක් මඟින් රක්ෂිත නොවන අවශේෂ වනාන්තර දිස්ත්‍රික් ලේකම්වරුන් යටතට පත් කිරීම සඳහා තීරණය කෙරිණි.

මේ වෙනත් සුවිශේෂ වනාන්තර තුළ සුවිශේෂ පරිසර පද්ධති සහ දුර්ලභ සත්ත්ව විශේෂ රැසක් පවතින අතර මේ ක්‍රියාව අත්හිටුවූයේ නැත්නම් පරිසරයට පිරිමැසිය නොහැකි පාඩුවක් වනු ඇති බව පෙත්සමෙහි සඳහන් වේ. එබැවින් මේ චක්‍රලේඛය ක්‍රියාත්මක වීම අත්හිටුවන ලෙසද පෙත්සම විභාගයට ගැනීමට අවසර දෙන ලෙසද පෙත්සම්කරු අධිකරණයෙන් ඉල්ලා ඇත.

එසේම තම මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බවට ප්‍රකාශ කරන ලෙසද අදාළ ක්‍රියාව නවතාලන අතුරු නියෝගයක් නිකුත් කරන ලෙසද පෙත්සම්කරු සිය පෙත්සමින් ඉල්ලා ඇත. පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ දර්ශන වේරදූවගේ මහතා පෙනී සිටියේය.

නීතිපති වෙනුවෙන් රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ සහීඩා බාරි මහත්මිය පෙනී සිටියාය.

"ලංකාවේ කම්කරු නීතිය කාන්තාවන්ගේ ආර්ථිකයට හිතකාමීද?"

දේශනය අද ටාජ් සමුද්‍රා හෝටලයේදී

බුද්ධි කරුණාරත්න

ඇඩ්වොකාටා ආයතනය සංවිධාන කරන "ලංකාවේ කම්කරු නීතිය කාන්තාවන්ගේ ආර්ථිකයට හිතකාමීද?" යන මාතෘකාව යටතේ පැවැත්වෙන දේශනයක් අද (5) සවස 6.00ට ටාජ් සමුද්‍රා හෝටලයේදී පැවැත්වේ.

අධිකරණ ඇමැති මොහොමඩ් අලී සබ්‍රි, හිටපු කම්කරු කොමසාරිස් මාධවී ගුණවර්ධන, වෙරිටා ආයතනයේ නීති පර්යේෂණ නිලධාරිනී මල්සිරිනි ද සිල්වා, ෆොන්ටෙරා ශ්‍රී ලංකා ආයතනයේ මානව සම්පත් ව්‍යාපාර සහකරු කනිෂ්ක පැටර්නොට් යන දේශකවරු මේ අවස්ථාවට සහභාගි වෙති. මේ දේශනයට පැමිණ සහභාගී වීමට මෙන්ම මාර්ගගත ක්‍රමයට සහභාගි වීමටද හැකිය. සූම්, ෆේස්බුක් සහ යූ ටියුබ් නාලිකාවල එය සජීවීව විකාශය කෙරේ. ඒ හා සම්බන්ධ වීමට https://forms.gle/WGs44cNE5BLRJgxSA සබැඳිය හරහා සම්බන්ධ විය හැකිය.

ප්ලාස්ටික් ගැන පාරිසරික විගණන වාර්තාව 9 වැනිදා කෝප් කමිටුවට

ස්වර්ණා විජේකෝන්

ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් ආනයනය, භාවිතය සහ පසු භාවිතය කළමනාකරණය පිළිබඳ පාරිසරික විගණන වාර්තාව ලබන 9 වැනිදා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡාවට ලක් කිරීමට නියමිතව ඇත.

පාර්ලිමේන්තු මන්ත්‍රී චරිත හේරත් මහතාගේ සභාපතිත්වයෙන් යුත් කෝප් කමිටුව වෙත මාර්තු හා අප්‍රේල් මාසවලදී රාජ්‍ය ආයතන අටක් කැඳවීමට නියමිත වේ.

මාර් තු 23 වැනි දා ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් සමාගම කෝප් කමිටුව හමුවට කැඳවා ඇති අතර මාර්තු 24 වැනි දා නව අපනයන සැකසුම් කලාප පිහිටුවීමේ ක්‍රියාවලිය ඇගයීම පිළිබඳ කාර්ය සාධන වාර්තාව පිළිබඳ සාකච්ඡා කිරීමට නියමිතව තිබේ.

මාර්තු 26 වැනි දා විමර්ශනයට ලක් කිරීමට නියමිතව ඇත්තේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයයි.

අප්‍රේල් 06 වැනිදා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය කෝප් කමිටුවට කැඳවා ඇති අතර අප්‍රේල් 07 වැනි දා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව කැඳවීමට නියමිතය. අප්‍රේල් 20 වැනිදා කෝප් කමිටුව විසින් ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව තුළ පසුගිය කාලය තුළදී වී තිබෙන අක්‍රමිකතා විමර්ශනය කරනු ඇත.

එමෙන්ම අප්‍රේල් 21 මාර්තු සහ 23 යන දිනවලදී පිළිවෙළින් මහජන බැංකුව සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලය කෝප් කමිටුව හමුවට කැඳවීමට නියමිතව තිබේ.

ලිහිල් මුදල් ප්‍රතිපත්තිය ස්ථාවරව සහ අඛණ්ඩව

මහ බැංකුවේ මුදල් මණ්ඩලයෙන් තීරණයක්

ජයසිරි මුණසිංහ

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය පසුගිය 03වැනිදා රැස්වී තවදුරටත් ස්ථාවරව සහ අඛණ්ඩව ලිහිල් මුදල් ප්‍රතිපත්තිය පවත්වාගෙන යෑමට තීරණය කළ බව මහ බැංකුවේ අධිපති සම්මානිත මහාචාර්ය දේශමාන්‍ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහතා ප්‍රකාශ කළේය. කොළඹ කොටුව ශ්‍රී ලංකා මහ බැංකු මූලස්ථානයේ ඊයේ පැවැති මුදල් ප්‍රතිපත්ති විවරණ මාර්තු අංක 02 ඉදිරිපත් කරමින් අධිපතිවරයා මේ බව කියා සිටියේය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පිළිවෙළින් සියයට 4.50 සහ සියයට 5.50 දැනට පවතින මට්ටමේම පවත්වාගෙන යෑමට මුදල් මණ්ඩලය තීරණය කළ බවද අධිපතිවරයා කීය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මෙම තීන්දුව ගනු ලැබුවේ දේශීය සහ ගෝලීය වශයෙන් සාර්ව ආර්ථික තත්ත්වයන් සහ අපේක්ෂිත වර්ධනයන් පිළිබඳ මනාව සලකා බැලීමෙන් අනතුරුව බවද ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන් මහතා කියා සිටියේය.

මෑතකදී පෞද්ගලික අංශයට සපයන ලද ණය මන්දගාමී වීම සහ ආර්ථිකයේ ඵලදායි අංශවලට ණය ලබාදීම ප්‍රමාණවත් නොවීම මුදල් මණ්ඩලය නිරීක්ෂණය කොට ඇත. දේශීය නිෂ්පාදන මත පදනම් වූ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම සඳහා සහායවීමට මූල්‍ය පද්ධතිය මඟින් ඵලදායි අංශ සඳහා සක්‍රීයව ණය ලබාදීමේ අවශ්‍යතාවය මහ බැංකු අධිපතිවරයා මෙහිදී අවධාරණය කළේය.

කොවිඩ් 19 ගෝලීය වසංගතයෙන් මිදීම සඳහා රටපුරා එන්නත්කරණයෙන් ලැබෙන ශක්තිය තවදුරටත් ආර්ථික වර්ධනය ධනාත්මක ලෙස සලකා බැලීමට ඉවහල් වන බවද අධිපතිවරයා කීය.

ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාවේ කොළඹ කාර්යාලය ඇරඹීම අගමැති ප්‍රධානත්වයෙන් අද

උපාලි කරුණාරත්න

ලංකා ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාවේ කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයේ අලෙවි මධ්‍යස්ථානය නවීකරණය කර විවෘත කිරීමේ උත්සවය අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැඟිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ මහතාගේ සහභාගීත්වයෙන් අද (05) දින පෙ. ව. 08. 30ට කොළඹ 12, ශ්‍රී සංඝරාජ මාවතෙහි පිහිටි ලංකා ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථා පරිශ්‍රයේදී පැවැත්වේ.

මේ අලෙවි මධ්‍යස්ථානය විවෘත කිරීමට සමගාමීව ඊයේ (4) රාත්‍රී 9.00 සිට මහා සංඝරත්නයේ සහභාගීත්වයෙන් සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාවක් පැවැත් වූ අතර 1971 වසරේදී ආරම්භ කර ඇති ලංකා ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය වසර 50කට ආසන්න කාලයක සිට නවීකරණය කටයුතු කර නොමැත. විෂයභාර ඇමැතිවරයා ලෙස අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ උපදෙස් මත රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ මහතා විසින් මේ අලෙවි මධ්‍යස්ථානය නවීකරණ කටයුතු ආරම්භ කරන ලදි.

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සියලු ගොඩනැඟිලි ද්‍රව්‍ය එකම වහලක් යටින් ගැනීමට (Mini Super Concept) හැකි වන පරිදි මෙහි නවීකරණ කටයුතු කර ඇත.

T & D ආයතනයේ 20 වැනි සංවත්සර සැමරුම හෙට

ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ප්‍රධාන ආයතනයක් වන T & D ආයතනය සිය විසිවසරක අභිමානවත් සේවය සැමරීම හෙට (06) දිනට යෙදී ඇති අතර ඒ වෙනුවෙන් මේ මාසය පුරා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කෙරේ.

2001දී මාර්තු (06) ආරම්භ වූ මේ ආයතනය සිය පටන් ගැන්ම සිහිපත් කරමින් එම ආයතනයේ ප්‍රධාන කාර්යාලයේදී ආගමික වතාවත් සහ භික්ෂූන් වහන්සේලා විෂයෙහි දානමය පුණ්‍යකර්මයක් හෙට උදෑසන ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වේ. ප්‍රධාන සැමරුම් උත්සවය ගාල්ල ලයිට් හවුස් හෝටලයේදී එදිනම සවස 3.00ට පැවැත්වීමට කටයුතු යොදා තිබේ.

රුහුණෙන් බිහි වූ අති විශිෂ්ට ආයතයක් ඉහළට ගොඩනැඟුණු T & D ආයතනය වර්තමානයේදී රටේ ඉදිරියට පැමිණ සිටින ව්‍යාපාරික ආයතන සඳහා අත්‍යවශ්‍ය සේවා වන විගණන හා ගණකාධිකරණ සේවා, බදු උපදේශන, සමාගම් ලේකම් සේවා හා ව්‍යාපාර උපදේශන, මානව සම්පත් කළමනාකරණ සේවා සැපයීමෙන් විශ්වාසනීයභාවයක් හා විශිෂ්ට කීර්තියක් මේ ආයතනය ලබා ඇත.

ඇමැති නාමල්ගේ රට ගමන් තහනම 23 දා දක්වා ඉවතට

සුභාෂිණී සේනානායක

කොළඹ කොටුව ත්‍රිෂ් ට්‍රාන්ස්වර්ඩ් චතුරස්‍රයේ අක්කර 4.3ක් බදු දීමේදී වී ඇතැයි කියන මුදල් අක්‍රමිකතාව සම්බන්ධයෙන් ක්‍රීඩා සහ තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතාට එරෙහිව පවරා ඇති නඩුවට අදාළව පනවා ඇති විදේශ ගමන් තහනම අද සිට ලබන 23 දක්වා ඉවත් කරන ලෙස කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා ඊයේ 04 නියෝග කළේය.

නාමල් රාජපක්ෂ මහතා වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මඩුල්ල මෝසමක් ගොනු කරමින් විදේශගත වීමට අවශ්‍ය බවට කළ දැනුම් දීම සලකා බැලූ මහේස්ත්‍රාත්වරයා මේ නියෝගය කළේය.

ඇමැති නාමල් රාජපක්ෂ මහතා ඊයේ අධිකරණයේ පෙනී සිටියේය.

රුපියල් මිලියන 70ක පමණ මූල්‍ය අක්‍රමිකතාවක් සිදුව ඇති බවට දූෂණ විරෝධී හඬ සංවිධානය පොලිස්පතිවරයාට කළ පැමිණිල්ලකට අනුව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශන කර ඇති අතර එම කොට්ඨාසය පැමිණිල්ල වෙනුවෙන් ඉදිරිපත් වී

සුව නීති කඩන බස් සොයන්න වැටලීම් කණ්ඩායම්

සුභාෂිණී සේනානායක

රට තුළ පවතින කොවිඩ් ව්‍යාප්තිය හමුවේ මගී ප්‍රවාහන කාර්යයේදී සෞඛ්‍යරක්ෂිත ක්‍රමවේද භාවිත කරන්නේද යන්න සොයා බැලීමට වැටලීම් කණ්ඩායම් යොදවා ඇති බව බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති ඕ. ඩබ්. ප්‍රසන්න සංජීව මහතා පැවසීය.

මේ අනුව 2020 වසරේ නොවැම්බර් මස 17 වැනිදා සිට බස් රථ 10,270ක් පරීක්ෂා කර ඇති බවත් ඉකුත් පෙබරවාරි මස 28 වැනිදා වැඩිපුර මගීන් රැගෙන ගිය බස් රථ 165ක් හඳුනා ගත් බවත් සභාපතිවරයා කියා සිටියේය. එලෙස කළ වැටලීම්වලින් බස් රථ 5ක් සඳහා අවවාද කර ඇති බවත් එක් බස් රථයක ගමන් වාර අතිහිටුවූ බවත් ඒ මහතා කියා සිටියේය.

මෙහිදී බස් රථවල දිනක ගමන් වාර අත්හිටුවීම් 34ක් දින දෙකක ගමන් වාර අත්හිටුවීම් 117ක්, දින 04ක ගමන් වාර අත්හිටුවීම් 7ක් සහ දින 05ක ගමන් වාර අත්හිටුවීම් එකක් කර ඇති බවද ඒ මහතා කියා සිටියේය.

දෙහිවල අල්විස් පෙදෙසේ ගින්නක්

බොරලැස්ගමුව සමූහ සෙනවිරත්න කහටපිටිය

දෙහිවල අල්විස් පෙදෙස දෙමහල් නිවෙසක ඊයේ (4) ප. ව. 3.30ට පමණ ඇති වූ හදිසි ගින්නකින් එම නිවෙසේ උඩු මහලේ දේපළවලට දැඩි ලෙස හානි වී ඇතැයි දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ ගිනි නිවීම් ඒකකයේ අංශ භාර නිලධාරි එල්. සුනන්ද පෙරේරා මහතා කියා සිටී.

මේ ගින්න ඇති වූ සැණින් ගිනි නිවීම් ඒකකය වෙත ලද ප්‍රදේශවාසියකුගේ තොරතුරකට අනුව පැමිණ එහි සිටි මහලු කාන්තාවක හා මෙහෙකාරිය සමඟ සිටි කුඩා දරුවකුද නිරුපද්‍රිතව බේරා ගැනීමට හැකිවීමෙන් කිසිවකුටත් තුවාල වී නැති බවත් සුනන්ද මහතා පැවසීය.

හොර සිගරට් 11,400ක් සමඟ පුද්ගලයෙක් අත්අඩංගුවට

සුභාෂිණී සේනානායක

බේරුවල චීන කොටුව ප්‍රදේශයේ කළ වැටලීමකදී තීරු බදු රහිතව මෙරටට ආනයනය කරන ලද දුම්වැටි තොගයක් සමඟ පුද්ගලයකු අත්අඩංගුවට ගෙන තිබේ.

මේ පුද්ගලයා සන්තකයේ තිබී දුම්වැටි 11,400ක් පොලිසිය භාරයට ගෙන ඇත. පොලිස් විශේෂ බළකා හොරණ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් අනුව බේරුවල පොලිසිය හා ඒකාබද්ධව මේ වැටලීම කර ඇති අතර, අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32ක පුද්ගලයෙකි.

පොලිස් විශේෂ කාර්ය බළකා හොරණ කඳවුරේ නිලධාරින් සමඟ වැටලීම කරනු ලැබුවේ උප පොලිස් පරීක්ෂක චතුරංග හා පොලිස් සැරයන් ජගත් යන නිලධාරීන් විසිනි.

කරන්නාගොඩගේ රිට් පෙත්සම ගැන අධ්‍යයනය කරනවා

නීතිපති අභියාචනාධිකරණයට කියයි

නෙල්කා මැදගෙදර

හිටපු නාවික හමුදාපති අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ මහතා ගොනු කළ රිට් පෙත්සම සම්බන්ධයෙන් තව දුරටත් කරුණු අධ්‍යයනය කරමින් සිටින බව නීතිපතිවරයා ඊයේ (04) අභියාචනාධිකරණයට දැනුම් දුන්නේය.

නීතිපති වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටි අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය මේ බව අධිකරණයට දැනුම් දුන්නාය. ඒ අනුව පෙත්සම වෙනත් දිනයක කැඳවන ලෙස ඇය අධිකරණයෙන් ඉල්ලා සිටියාය.

තමාට එරෙහිව ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය හමුවේ පවරා ඇති නඩුව විභාග කිරීම අත්හිටුවන අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා හිටපු නාවික හමුදාපති අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ මහතා ගොනු කළ රිට් පෙත්සම අභියාචනාධිකරණය හමුවේ කැඳවූ අවස්ථාවේදී අතිරේක සොලිසිටර් ජනරාල්වරිය මේ ඉල්ලීම කළාය.

අභියාචනාධිකරණ සභාපති විනිසුරු අර්ජුන ඔබේසේකර සහ අභියාචනාධිකරණ විනිසුරු මායාදුන්නේ කොරයා යන මහත්වරුන් හමුවේ මේ පෙත්සම කැඳවිණි.

එහිදී අතිරේක සොලිසිටර් ජනරාල්වරිය කළ කරුණු දැක්වීම සලකා බැලූ අභියාචනාධිකරණ විනිසුරු මඩුල්ල හිටපු නාවික හමුදාපති ගොනු කළ රිට් පෙත්සමේ වැඩි දුර විභාගය මැයි 17 වැනිදා කැඳවීමට දින නියම කෙරිණි.

තරුණයන් 11 දෙනකු පැහැර ගෙන ගොස් අතුරුදන් කිරීම හා ඝාතනය කිරීම සම්බන්ධයෙන් තමන්ට එරෙහිව මහාධිකරණයේ පැවැත්වෙන එම නඩුව විභාගයට ගැනීම අත්හිටුවන අතුරු නියෝගයක් ඉල්ලා හිටපු නාවික හමුදාපතිවරයා ගොනු කළ මේ පෙත්සමේ වගඋත්තරකරු ලෙස නීතිපතිවරයා නම් කරනු ලැබ සිටී.

මේ රිට් පෙත්සමේ වගඋත්තරකරුවන්ට නොතිසි නිකුත් කරන ලෙසද අදාළ අධි චෝදනා නඩුව විභාගයට ගැනීම අත්හිටුවන අතුරු නියෝගයක් නිකුත් කරන ලෙසද පෙත්සම්කරු සිය පෙත්සමින් ඉල්ලා තිබිණි.

තරුණයන් 11 දෙනකු පැහැර ගෙන ගොස් අතුරුදන් කිරීම හා ඝාතනය කිරීම අත්හිටුවමින් අභියාචනාධිකරණය ඉකුත් වසරේ ජුනි 25 වැනිදා අතුරු නියෝගයක් නිකුත් කළේය.

එවකට සිටි අභියාචනාධිකරණ සභාපති විනිසුරු ඒ. එච්. එම්. ඩී. නවාස් සහ විනිසුරු සෝභිත රාජකරුණා යන මහත්වරුන් විසින් මේ අතුරු තහනම් නියෝගය නිකුත් කරන ලදි.

එම නඩු විභාගය අත්හිටුවන ලෙස ඉල්ලා වසන්ත කරන්නාගොඩ මහතා අභියාචනාධිකරණය හමුවේ ගොනු කළ රිට් පෙත්සම විභාගයට ගෙන අවසන් වන තෙක් මේ අතුරු නියෝගය බල පැවැත්වේ.

පෙත්සම්කාර හිටපු නාවික හමුදාපති වෙනුවෙන් ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා මහතා පෙනී සිටියේය.

නීතිපති වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් අයෝෂා ජිනසේන මෙණෙවිය පෙනී සිටියාය.

බෝ නොවන රෝගීන්ගේ සායනික ඖෂධ පැකට් ලක්ෂ 17ක් රෝගීන්ගේ නිවෙස්වලටම බෙදා හැරලා

ව්‍යසන සමයේ තැපෑලේ සේවය අගයමින් ජනමාධ්‍ය ඇමැති කියයි

රජයේ රෝහල් මගින් බෝ නොවන රෝගීන්ට නිකුත් කෙරෙන සායනික ඖෂධ පැකට් ලක්ෂ 17ක ප්‍රමාණයක් කොරෝනා ව්‍යසන සමයේ රෝගීන්ගේ නිවෙස් කරා බෙදා හැරීමට තැපැල් දෙපාර්තමේන්තුව කටයුතු යොදා තිබේ. මෙතරම් විශාල ඖෂධ පාර්සල් තොගයක් ජනතාව වෙත බෙදා හැරීමට කටයුතු කෙරුණ ද එම පාර්සල් මාරුවීම වැනි ඒ හා සම්බන්ධ කිසිම ගැටලුවක් හෝ පැමිණිල්ලක් ලැබී නැතැයි තැපැල් මූලස්ථානය පෙන්වා දෙයි.

ජනමාධ්‍ය ඇමැති, කැබිනට් ප්‍රකාශක ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතාගේ ප්‍රධානත්වයෙන් තැපැල් මූලස්ථානයේ දී පසුගියදා (02) පැවති සාකච්ඡාවක දී මේ කරුණු අනාවරණය විය. තැපැල් දෙපාර්තමේන්තුවට අයත් සියලු වෘත්තීය සමිති නියෝජිතයන් සමඟ මේ සාකච්ඡාව පැවැත්විණි.

කොරෝනා ව්‍යසනය හේතුවෙන් රෝහල් කරා ගොස් සායනික ඖෂධ ලබාගැනීම ජනතාවට අපහසු හෙයින් තැපැල් දෙපාර්තමේන්තුව මගින් එම ඖෂධ පාර්සල් රෝගීන්ගේ නිවෙස් කරාම ගොස් බෙදාහැරීම ආරම්භ කෙරුණු අතර ඒ අනුව 2වැනිදා වනවිට එවැනි පාසල් ලක්ෂ 17ක ප්‍රමාණයක් බෙදාහැරීමට හැකිවී ඇතැයි තැපැල්පති රෝහණ ආරියරත්න මහතා පෙන්වා දෙයි.

අවදානම් තත්ත්වය ද නොතකා පසුගිය වකවානුවේ තැපැල් සේවාවේ නියැළෙන්නන් ඉටුකළ සේවාව ඇගයීමට ලක්කරන බවත් මේ වනවිටත් අවදානම් තත්ත්වයෙන් පසුවන කණ්ඩායමක් වන හෙයින් ඔවුනට ප්‍රමුඛතාව දෙමින් කොරෝනා එන්නත ලබාදෙන ලෙස ඉල්ලා ඇතැයි ඇමැති රඹුක්වැල්ල මහතා මෙහිදී පැවසීය. තැපැල් සේවාවේ මෙතෙක් නොවිසඳුණු ගැටලු හා ප්‍රශ්න නිවැරදි යන්ත්‍රණයක් ඔස්සේ විසඳීමට හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම උපරිමයෙන් ගනු ලබන බව ඇමැතිවරයා මෙහිදී පෙන්වා දුන්නේය.

උප තැපැල් ස්ථානාධිපතිවරියන්ගේ ප්‍රසූත නිවාඩු රාජ්‍ය සේවාවේ අනෙකුත් අයට හිමි වන අයුරින්ම ලබාදීම කෙරෙහි අවධානය යොමු කරන බවද ඇමැති රඹුක්වැල්ල මහතා මෙහිදී පැවසීය. තැපැල් සේවාවේ කිසිවකුට අසාධාරණයක් නොවන අයුරින් බඳවාගැනීම්, වැටුප් විෂමතාවන් ඇතුළු ගැටලු සම්බන්ධයෙන් නිසි අවධානය යොමු කර කටයුතු කරන බවද හෙතෙම කීය.

මේ අතර රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙළ යටතේ රාජ්‍ය නිලධාරීන්ට භාෂා ප්‍රවීණතාව ලබාදීමේ වැඩසටහන ඔස්සේ තැපැල් දෙපාර්තමේන්තුවේ විසිදහසක් පමණ වන තැපැල් නිලධාරීන් හා සේවකයන්ට භාෂා ප්‍රවීණතාව ලබාදීම (02) ආරම්භ කෙරිණි. දිවයින පුරා විසිරි සිටින තැපැල් නිලධාරීන් හා තැපැල් සේවකයන්ට මේ යටතේ මව්බසට අමතරව තවත් භාෂාවක ප්‍රවීණතාව ලබාදීම සිදු කෙරේ. මේ භාෂා ප්‍රවීණතාව පැය දෙසීයක පාඨමාලාවකි.

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
මොරටුව

නීරෝද රථ කාර්මික ශිල්පී පාඨමාලාව

රට හදන සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්තිය අනුව නිපුණතාවයෙන් සපිරි ශ්‍රම බලකායක් බිහිකරීම සඳහා

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනීය දායකත්වය

අධ්‍යාපන සුදුසුකම්	:	පාසල් හැරගිය සිසුන් සඳහා
ස්ථානය	:	ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය බොරැල්ල කලාපීය මධ්‍යස්ථානය
පාඨමාලා කාලය	:	වසර 01 (සතියේ දිනවල)
පාඨමාලා ගාස්තු	:	අයකිරීමක් නොමැත

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2021 මාර්තු 26

(ආදර්ශ අයදුම්පත්‍රය www.cgtti.lk වෙබ් අඩවියෙන් බාගත කරගත හැක)

කලමනාකාර - පරිපාලන හා මානව සම්පත්
ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
582, ගාලුපාර, ගල්කිස්ස.

විමසීම් :
011-2605535 / 011-2605625
මයුරවංශ - 076-8901571

දේශීය ටින් මාළු කම්හල් වැඩිදියුණු කිරීමේ රජයේ වැඩපිළිවෙළ ඇරඹෙයි

බුද්ධිකා ඉඹුලාන

දේශීය ටින් මාළු කර්මාන්තය ඉහළ නංවා රටට අවශ්‍ය ටින් මාළු සියල්ල මෙරටම නිෂ්පාදනය කිරීමේ අරමුණ ඇතිව, ටින් මාළු කර්මාන්තශාලා වැඩිදියුණු කිරීමේ වැඩපිළිවෙළක් රජය අරඹා ඇත.

මේ යටතේ ධීවර රාජ්‍ය අමාත්‍යාංශය ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇති අතර ගාල්ල ධීවර වරාය පරිශ්‍රයේ පිහිටුවා ඇති ලංකා ධීවර සංස්ථාව සතු බදු පදනම මත "හැපී කුක්" සමාගම විසින් පවත්වාගෙන යන ටින් මාළු කර්මාන්ත ශාලාව පසුගියදා ධීවර රාජ්‍ය ඇමැති කංචන විජේසේකර මහතාගේ නිරීක්ෂණයට ලක්විය.

දෛනිකව ටින් 30,000ක් පමණ නිෂ්පාදනය කරන මේ දේශීය ටින් මාළු කර්මාන්තශාලාව මගින් රැකියා 150ක් පමණ උත්පාදනය කර ඇති අතර, පසුගිය මාස 5ක කාලයේ දේශීය ලින්නා මත්ස්‍ය විශේෂ යොදාගෙන නිෂ්පාදනය කර ඇති අතර ඉදිරි මාස 3දී මේ කර්මාන්තශාලාව නවීකරණය කර සහ පුළුල් කර නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීමට බලාපොරොත්තු වන බව රාජ්‍ය ඇමැතිවරයා පැවසීය.

ධන නිධානය නිල ප්‍රතිඵල

NLB NATIONAL LOTTERIES

දිනය - 2021/03/03

දිනුම් වාරය - 452

ඉංග්‍රීසි අක්ෂරය: J

ජයග්‍රාහී අංක: 09 29 57 66

දහස් වරම: 3886

	සංයෝග		තෑගි	ජයග්‍රාහකයන් ගණන
1 තෘතීය	අංක 04 ගැලපේ නම්	රු.	1,000,000.00	-
2 තෘතීය	අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැලපේ නම්	රු.	100,000.00	04
3 තෘතීය	අංක 3 ක් ගැලපේ නම්	රු.	3,000.00	89
4 තෘතීය	අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැලපේ නම්	රු.	1,000.00	213
5 තෘතීය	අංක 2 ක් ගැලපේ නම්	රු.	100.00	5,348
6 තෘතීය	අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැලපේ නම්	රු.	60.00	3,565
7 තෘතීය	අංක 1 ක් ගැලපේ නම්	රු.	20.00	89,815
8 තෘතීය	ඉංග්‍රීසි අකුර පමණක් ගැලපේ නම්	රු.	20.00	16,852

දිනා ඇති මුළු තෘතීය මුදල රු. 3,894,040.00
බිහිවූ මුළු ජයග්‍රාහකයන් ගණන 116,018

මීළඟ වාරයේ සුපිරි තෘතීය
රු.85,499,415.20

- රු. ලක්ෂ 5 වැඩි තෘතීය රජයේ බදු නීතිරීතිවලට යටත් වේ.
- තෘතීය මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාලසීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන 011 460 7000 011 232 4324

අපනයන කෘෂිකාර්මික භෝග මිල ගණන්
2021.03.02 දිනෙහි අවසන්වූ සතිය තුල පැවති සාමාන්‍යය මිල (කිලෝ ග්‍රෑම්යකට රුපියල්)

මිල්ලස්ක්කය / බෝගය		[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]
කුරුඳු	Alba					3,033	-	-	-	-	3,800	3,200	2,988	-	-
	C-5 Sp					2,716	-	-	-	-	2,590	2,625	2,632	-	-
	C-5					2,516	-	-	-	2,833	2,480	2,465	2,438	2,450	-
	C-4					2,250	-	-	-	1,700	2,265	2,335	2,342	2,375	-
	M-5					2,000	-	-	-	-	2,850	-	2,267	-	-
	M-4					2,000	-	-	-	-	1,980	-	2,250	-	-
	H-1					1,966	-	-	-	-	1,885	2,155	2,125	2,125	-
කරාබු	1 ශ්‍රේණිය	544	560	537	532	545	550	532	-	556	475	510	531	550	555
	2 ශ්‍රේණිය	-	-	-	-	-	500	-	-	-	-	-	-	-	-
සරවමු 1 ශ්‍රේණිය		852	900	903	833	828	766	833	-	840	800	770	824	850	825
කොට්ටු 1 ශ්‍රේණිය		843	900	845	832	738	787	823	-	880	745	725	720	740	775
[illegible] 1 ශ්‍රේණිය		375	400	-	384	-	360	320	-	-	-	-	-	-	390
[illegible]		-	-	-	-	-	-	10,500	-	-	-	-	-	-	-
[illegible] 1 ශ්‍රේණිය		775	675	625	536	-	600	750	-	-	-	775	-	-	-
[illegible] 1 ශ්‍රේණිය		2,760	2,775	2,750	2,833	-	-	2,800	-	-	-	2,200	-	-	-
[illegible] 1000ක්		-	-	-	-	-	-	6,000	-	3,500	-	-	-	-	-
[illegible]		601	575	600	616	618	575	616	-	640	645	610	625	620	525

නිෂ්පාදනය	[illegible]	[illegible]	[illegible]	[illegible]
කුරුඳු [illegible] (කි.ග්‍රෑ./රු.)	-	-	3,650	3,300
[illegible] (කි.ග්‍රෑ./රු.)	2,800	0	-	2,000

දැන්න සැපයුම් - අපනයන කෘෂිකාර්මික ආර්ථික පර්යේෂණ අංශය
අපනයන කෘෂිකාර්මික භෝග විමාතාර්ථ හා සහතික කිරීම් කිරීමේ සීමාවේ පාස්කුමික භෝගතුරු [illegible] අපනයන කෘෂිකාර්මික [illegible]
ස්ථානය - [illegible] දිනය - [illegible]
වේලාව -පෙ.ව. 8.30 සිට ප.ව. 4.15
වැඩි විස්තර සඳහා අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න - www.dea.gov.lk
තත්ත්වේදන අංශය, අපනයන කෘෂිකාර්මික දෙපාර්තමේන්තුව, [illegible], [illegible] පාර, පේරාදෙණිය
අපනයන කෘෂිකාර්මික දෙපාර්තමේන්තුව - අපෙන්ට කරු හෙව දීමනාව
011 2388651

2021-03-03 - ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකල මුළු තෘතීය ලාභීන් සංඛ්‍යාව 717,664
ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු තෘතීය මුදල 49,514,938.00

සුපිරි තෘතීය රු. 18,899,228.00 01 රු. 2,000,000.00 තෘතීය 01 රු. 1,000,000.00 තෘතීය 02 රු. 100,000.00 තෘතීය 32

www.nlb.lk

ගොවි සෙත නිල ප්‍රතිඵල

NLB NATIONAL LOTTERIES

දිනුම් වාරය 2710 | දිනුම් අදින ලද දිනය 2021 / 03 / 03

ඉංග්‍රීසි අක්ෂරය: Y | ජයග්‍රාහී අංක: 14 17 59 70

	සංයෝගය		තෑගි මුදල	ජයග්‍රාහකයන් ගණන
1 තෘතීය	අංක 4 ම නිවැරදි	රු.	1,000,000.00	01
2 තෘතීය	ඉංග්‍රීසි අකුර සමග අංක 3 ක් නිවැරදි	රු.	100,000.00	08
3 තෘතීය	අංක 3 ක් පමණක් නිවැරදි	රු.	2,000.00	177
4 තෘතීය	ඉංග්‍රීසි අකුර සමග අංක 2 ක් නිවැරදි	රු.	1,000.00	384
5 තෘතීය	අංක 2 ක් පමණක් නිවැරදි	රු.	100.00	10,036
6 තෘතීය	ඉංග්‍රීසි අකුර සමග අංක 1 ක් නිවැරදි	රු.	40.00	6,673
7 තෘතීය	අංක 1 ක් පමණක් නිවැරදි	රු.	20.00	166,441
8 තෘතීය	ඉංග්‍රීසි අකුර පමණක් නිවැරදි	රු.	20.00	30,389

මෙම දිනුම් වාරයේ බිහි වූ ජයග්‍රාහකයන් ගණන 214,109

මෙවර දිනා ඇති මුළු තෑගි මුදල
රු. 7,745,120.00

ලබන දිනුම් වාරයේ සුපිරි තෘතීය
රු. 69,721,568.80

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාල සීමාවකට පමණි. රුපියල් ලක්ෂ 05 ට වැඩි තෘතීය රජයේ බදු නීති වලට යටත්වේ. තෘතීය මුදල් ලබා ගැනීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යවේ.

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
නො. 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන : 0114 607 000, 0112 324 324
ෆැක්ස් : 0114 663 416 වෙබ් : www.nlb.lk

දිනුම් වාරය 780 නිල ප්‍රතිඵල

ලොව් ගේවුන් Mega POWER මෙගා පවර් මෙකා පවර්

දිනය: 2021.03.03

NLB NATIONAL LOTTERIES

ඉංග්‍රීසි අකුර: C | සුපිරි අංකය: 23 | ජයග්‍රාහී අංක: 04 42 53 73

	තෘතීය රටාව	තෘතීය මුදල රු.	ජයග්‍රාහකයන් සංඛ්‍යාව
1 වන තෘතීය	අංක 4 ක් පමණක් ගැළපේ නම්	1,000,000.00	-
2 වන තෘතීය	අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	100,000.00	05
3 වන තෘතීය	අංක 3 ක් පමණක් ගැළපේ නම්	1,000.00	88
4 වන තෘතීය	අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	500.00	233
5 වන තෘතීය	අංක 2 ක් පමණක් ගැළපේ නම්	100.00	5,585
6 වන තෘතීය	අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	40.00	3,679
7 වන තෘතීය	අංක 1 ක් පමණක් ගැළපේ නම්	20.00	91,322
8 වන තෘතීය	ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම්	20.00	16,798

ලොටරි ටිකලුම් සුපිරි තෘතීය පිරිනමනු ලබන්නේ.

මීළඟ මෙගා සුපිරි තෘතීය
රු. 120,185,324.40

මීළඟ පවර් සුපිරි තෘතීය
රු. 20,938,204.80

මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි තෘතීය
රු. 32,869,777.60

දිනා ඇති මුළු මුදල
රු. 3,572,560.00

- රු. ලක්ෂ 5 වැඩි තෘතීය රජයේ බදු නීති රීති වලට යටත් වේ.
- තෘතීය මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
නො. 32,එන්.ඩබ්.ජේ මුදලිගේ මාවත, කොළඹ 01
දුරකථන: 011-2 470 662, 011-4 607 000, 0112-458 585
ෆැක්ස්: 0112 433 631,
වෙබ් අඩවිය: www.nlb.lk

ජාතික ලොතරැයි සම්පත නිල ප්‍රතිඵල

NLB ජාතික ලොතරැයිය

දිනුම් වාරය 1101
දිනය 2021.03.03

ජයග්‍රාහී ලග්නය: ධනු

ජයග්‍රාහී අංක: 4 9 0 9 0 1

අග සිට මුලට තෘතීය රටාව

01 තෘතීය	4 9 0 9 0 1	රු: 1,000,000.00	තෘතීය 01
02 තෘතීය	9 0 9 0 1	රු: 100,000.00	තෘතීය 03
03 තෘතීය	0 9 0 1	රු: 10,000.00	තෘතීය 29
04 තෘතීය	9 0 1	රු: 1,000.00	තෘතීය 319
05 තෘතීය	0 1	රු: 100.00	තෘතීය 3,130
06 තෘතීය	1	රු: 20.00	තෘතීය 31,300

මුල සිට අගට තෘතීය රටාව

07 තෘතීය	4 9 0 9 0	රු: 10,000.00	තෘතීය 04
08 තෘතීය	4 9 0 9	රු: 1,000.00	තෘතීය 33
09 තෘතීය	4 9 0	රු: 200.00	තෘතීය 305
10 තෘතීය	4 9	රු: 100.00	තෘතීය 3,130
11 තෘතීය	ධනු	රු: 20.00	තෘතීය 26,135
12 තෘතීය	ජයග්‍රාහී අංක 6ම ඕනෑම පිළිවෙලට ගැළපීමෙන්	රු: 200.00	තෘතීය 54

මෙවර දිනා ඇති මුළු තෘතීය මුදල රු. 3,828,500.00

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස හයක කාලසීමාවකට පමණි. රුපියල් ලක්ෂ 5 ට වැඩි තෘතීය රජයේ බදු නීති රීති වලට යටත් වේ. තෘතීය මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

ලබන සෙනසුරාදා සුපිරි තෘතීය රු. 14,987,563.70

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන: 011 4607000, 011 2324324
ෆැක්ස්: 011 4669416
Web : www.nlb.lk

දිනුම් වාරය - 4415 නිල ප්‍රතිඵල

NLB

මහජන සම්පත

දිනය: 2021-03-03

ජයග්‍රාහී අක්ෂරය: H | ජයග්‍රාහී අංක: 1 0 8 9 5 8

තෘතීය රටාව - අග සිට මුලට

										ජයග්‍රාහකයන් ගණන
සුපිරි තෘතීය	H	1	0	8	9	5	8	රු.	18,899,228.00/=	01
1 වැනි තෘතීය		1	0	8	9	5	8	රු.	2,000,000/-	01
2 වැනි තෘතීය			0	8	9	5	8	රු.	100,000/-	12
3 වැනි තෘතීය				8	9	5	8	රු.	10,000/-	127
4 වැනි තෘතීය					9	5	8	රු.	1,000/-	1,277
5 වැනි තෘතීය						5	8	රු.	100/-	12,762
6 වැනි තෘතීය							8	රු.	20/-	126,556

තෘතීය රටාව - මුල සිට අගට

										ජයග්‍රාහකයන් ගණන
7 වැනි තෘතීය		1	0	8	9	5		රු.	10,000/-	12
8 වැනි තෘතීය		1	0	8	9			රු.	1,000/-	128
9 වැනි තෘතීය		1	0	8				රු.	100/-	1,286
10 වැනි තෘතීය		1	0					රු.	50/-	12,671
11 වැනි තෘතීය	H							රු.	20/-	50,551

දිනා ඇති මුළු තෘතීය මුදල - රු. 30,474,718.00

රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි තෘතීය රජයේ බදු නීති රීතිවලට යටත් වේ. තෘතීය මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් අදින දින සිටමාස 06ක කාල සීමාවකට පමණි.

මීළඟ දිනුම් වාරයේ සුපිරි තෘතීය රු. 10,000,000.00

NLB ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශීර්වාදය

ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය N. W. J. මුදලිගේ මාවත, කොළඹ - 01
දුරකථන: 011-4607000, 011-2324324. Fax: 011-4669416.
www.nlb.lk

කොවිඩ් මළ සිරුරු භූමදානයට ඉඩ දීම දේශපාලන තීන්දුවක් නොවෙයි

මන්ත්‍රී, විශ්‍රාමික මේජර් ප්‍රදීප් උඳුගොඩ

ක්‍රිසන්ති විතාරණ

කොවිඩ් මළ සිරුරු භූමදානය කිරීමට අවස්ථාව දීම දේශපාලන තීන්දුවක් නොවන බවත්, ඒ වෙනුවෙන් තෝරා ගෙන තිබෙන ප්‍රදේශය පිළිබඳ ඇති වී තිබෙන විරෝධතාවය හමුවේ එම භූමිය අත්හරින්ට සිදු වුව හොත් වෙනත් භූමියක එම කටයුතු කිරීමට අවස්ථාව දීමට කටයුතු කරන බවත් කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී විශ්‍රමික මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා පැවසීය.

ජනතාවගේ අයිතිවාසිකම් තහවුරු කරමින් රජයක් ලෙස ඒ සඳහා වැය වන වියදම දැරීමට සූදානම් බවද කිසිවකුත් නැති දූපතක හෝ මේ සඳහා ඉඩකඩ දෙන බව කොවිඩ් මර්දන ව්‍යාපාරය ප්‍රකාශ කර ඇති බව ද මන්ත්‍රීවරයා වැඩි දුරටත් කීය.

පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රදීප් උඳුගොඩ මහතා මේ බව පැවසුවේ ඊයේ (04) බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේ පැවැති පොදුජන පෙරමුණ මාධ්‍ය සාකච්ඡාවේදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක් වූ ප්‍රදීප් උඳුගොඩ මහතා මෙසේ ද කීය.

"ජිනීවා මානව හිමිකම් සමුළුවේ දී ඉදිරිපත් කළ යෝජනාවලිය ඉදිරිපත් කරන්නේ අමෙරිකා එක්සත් ජනපදය. ඔවුන් මානව හිමිකම් කවුන්සිලයේ නැහැ. නිරපරාදේ මේ රට දශක තුනක යුද්ධයෙන් බේරා ගත් වීරෝධාරණවිරුවන් පාවාලා දෙන්නට කටයුතු කළ ආණ්ඩුවක් තමයි යහපාලන ආණ්ඩුව. ඒ කාලසීමාවේදී රටට කළ අපකීර්තිය නැවත නිවැරදි කරන්න සිදු වෙලා තියෙනවා. මේ රට බේරා ගත් රණවිරුවන් ආරක්ෂා කරන ගමන් රටේ අනන්‍යතාව ආරක්ෂා කරමින් දෙමළ ජනතාවට අසාධාරණයක් සිදු වී තිබේ නම් ඒ අසාධාරණය වෙනුවෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ වගකිව යුතු රජයක් ලෙස අපි මෙම මානව හිමිකම් කොමිසම හමුවේ, ලෝකය හමුවේ තහවුරු කර තිබෙනවා මේ රටේ දශක තුනක යුද්ධය අවසන් කළේ කොහොමද කියන එක.

කොවිඩ් මරණ භූමදානය දීර්ඝ කාලයක් තිස්සේ මේ රටේ පැවතුන සංවාදාත්මක සාකච්ඡාවක්. කොවිඩ් මළ සිරුරු භූමදානය කිරීමේ තීන්දු ගත්තේ දේශපාලන නායකයෝ නෙවෙයි. මේ සඳහා සෞඛ්‍ය බලධාරීන්ගේ මැදිහත් වීමෙන් පත් කළ විද්වත් කමිටුවක නිර්දේශ මත ක්‍රියාත්මක කරමින් තමයි භූමදානය කිරීමේ අවස්ථාව දුන්නේ. ඒ සඳහා මේ වන විට තෝරා ගෙන තිබෙන ප්‍රදේශය පිළිබඳව යම් විරෝධයක් පළ කෙරෙමින් තිබෙන බව ඇත්ත. නමුත් ඒ තෝරා ගත් එක් භූමියක් පමණයි. සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා පැහැදිලිවම ප්‍රකාශ කළා ඒ විරෝධතා මත එම භූමිය අත්හරින්නට සිදු වුව හොත් වෙනත් භූමියක ඒ කටයුතු කිරීමට අවස්ථාව දීමට කටයුතු කරනවා කියලා.

පාස්කු ප්‍රහාරයේ වගකිව යුත්තන්ට දැඩි දඬුවම් දිය යුතුයි කියන මතයේ අපි ඉන්නවා. මෙය සියලු ජන කොටස් තරයේ ප්‍රතික්ෂේප කළ සිදුවීමක්. ප්‍රහාරය වන විට මේ රට පාලනය කළේ යහපාලන ආණ්ඩුව. ඔවුන් මේ ප්‍රහාරය සිදු වන බව දැන දැනත් ඒ නායකයෝ එය වළක්වාලන්නට කටයුතු නොකිරීම පිළිබඳව සුල මුල සොයන්නට කොමිසමක් පත් කළේ ඔවුන් විසින්මයි. නමුත් ඒ කොමිසම ඉදිරිපත් කරන ලද වාර්තාව අද ඒ පාර්ශ්වයන් විසින්ම වර්තමාන ආණ්ඩුවට ප්‍රහාර එල්ල කරන්නට අවියක් ලෙස භාවිතා කරනවා. කෙසේ නමුත් ඊට වගකිව යුතු අයට නීතිය ක්‍රියාත්මක කිරීමට අප රජයක් ලෙස කටයුතු කරනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් අප සමග සන්ධානගත වූ පක්ෂයක්. ඕනම පක්ෂයක සිටින නියෝජිකයන්ට තමන්ගේ මතවාද ප්‍රකාශ කරන්න පුළුවන්. පක්ෂයක් ලෙස ඔවුන් ගේ මතයත් අපේ මතයත් වෙනස් විය හැකියි.

බුද්ධික වික්‍රමාදර මහතා ද මෙම මාධ්‍ය හමුවේදී අදහස් පල කළේය.

වැටී තිබූ රට මේ තරමින් හරි ගොඩ එන්නේ ජනපති - අගමැති නිසයි

කුමාර උදයරත්න
යක්කලමුල්ල විශේෂ

වැටී තිබූ රට මේ තරමින් හෝ ගොඩ එමින් පවතින්නේ ජනාධිපතිවරයාගේ සහ අගමැතිවරයාගේ යහපත් කළමනාකරණය නිසා බවත් එය ජනතාවට අස්වැසිල්ලක් බවත් ආචාර්ය බද්දේගම දේවරක්ඛිත නාහිමියෝ පවසති.

අද මේ තරම් හරි රට ගොඩ එමින් පවතින්නේ ජනාධිපතිතුමාගේත් අගමැතිතුමාගේ යහපත් කළමනාකරණය නිසා.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා රට භාර ගැනීමෙන් පසු නොසිතූ අයුරින් කොවිඩ් වසංගතයට මුළු රටම ගොදුරු වුණා. වසරක පමණ කාලය තුළ රටේ ආර්ථිකය ද විශාල ලෙස පසුපසට ගියත් ජනතාවට දිය හැකි උපරිම සහන දීමට පියවර ගෙන ඇතැයි ගාලු කෝරළයේ ප්‍රධාන සංඝනායක ආචාර්ය බද්දේගම දේවරක්ඛිත නාහිමියෝ පැවසූහ.

පවතින දේශපාලන ආර්ථික සමාජයීය තත්ත්වය පිළිබඳව මාධ්‍යයට අදහස් දක්වමින් නාහිමියෝ එලෙස පැවසීය.

ආචාර්ය බද්දේගම දේවරක්ඛිත නාහිමියෝ මෙසේද පැවසූහ.

කොවිඩ් තත්ත්වය හමුවේ මාස තුනක් පමණ රට වසා තැබුවා. සංචාරක කර්මාන්තය මුළුමනින්ම කඩා වැටිලා ඇඟලුම් ඇතුළු අපනයන ක්ෂේත්‍රය අඩාළ වුණා. එම කාලය තුළ ජනතාව බඩගින්නේ තිබ්බේ නැහැ. රුපියල් පන්දහසක් දුන්නා.

රජය සේවක වැටුප්, විශ්‍රාම වැටුප් ඇතුළු සියලු පරිපාලන වියදම් එලෙසම දැරුවත් රජය ආ පස්සට ගියේ නැහැ. පොහොර සහනාධාරය මෙන්ම බිත්තර වී නොමිලේ දුන්නා. දේශීය ආර්ථිකය නංවාළීමට සෑම පියවරක්ම ගත්තා.

ඇතැමුන්ට අමතක වෙලා කොවිඩ් වසංගතය තිබුණ ද කියලත්. මුළු ලෝකෙම කොවිඩ් තත්ත්වයෙන් ආර්ථිකය වැටිලා. එහෙම තත්ත්වයක් තුළ කෙසේ හෝ රට යථා තත්ත්වයට ගෙන එමින් පවතිනවා. රජයට තුනෙන් දෙකක ජනවරමක් දුන්නේ ජනතාව ගෝඨාභය මහතා කෙරෙහි තැබූ විශ්වාසය නිසයි. රජයේ ඇතැමුන්ට එහි ඇමැතිකම් නොලැබීම අසතුටට හේතු වෙන්න ඇති. නමුත් බොහෝ නවක මන්ත්‍රීවරුන් ද පාර්ලිමේන්තුවේ සිටිනවා. ඒ සියලු දෙනාගේම දක්ෂතාවලින් රටට වැඩක් ගත යුතුයි. නැවත මේ රටට ගෝඨාභය කෙනෙක් බිහි වන්නේ නැහැ. රටක් ජාතියක් වෙනුවෙන් මේ ලැබී ඇති අවසන් අවස්ථාවෙන් ශ්‍රී ලාංකිකයන් වන අප සියලු දෙනා ප්‍රයෝජන ගැනීමට ඉවසීමෙන් ක්‍රියා කළ යුතුයි.

කොවිඩ් මෘත දේහ භූමදානය කිරීමේ උපදෙස් සැකසීමේදී පාරිසරික කරුණු අමතක කරලා

පාරිභෝගිකයන් සුරැකීමේ සංවිධානය

සුභාෂිණී සේනානායක

කොවිඩ් 19 අසාදිතව මිය යන පුද්ගලයන්ගේ මළ සිරුරු භූමදානය කිරීම සම්බන්ධයෙන් මාර්ග උපදේශයන් සෞඛ්‍ය අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් එළිදක්වා ඒ සම්බන්ධයෙන් වන ගැසට් පත්‍රයක් ද නිකුත් කොට ඇතත් එකී මාර්ග උපදේශයන් සකස් කර ඇත්තේ සෞඛ්‍ය කරුණු මත පමණක් වන අතර එම මාර්ග උපදේශයන් සඳහා පාරිසරික කරුණු සලකා බලා නැති බව පාරිභෝගිකයන් සුරැකීමේ සංවිධානය පවසයි.

උපද්‍රවකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා වන බාසල් සම්මුතියට ශ්‍රී ලංකාව 1992.08.28 දින අත්සන් තබා ඇති අතර එකී ගිවිසුමට අදාළ නීති රීති 1980 අංක 47 දරන පරිසර පනතට ඇතුළත් කර ඇති බව පෙන්වා දෙන එම සංවිධානයේ සභාපති රන්ජිත් විතානගේ මහතා කොවිඩ් 19 ආසාදිතව මිය යන පුද්ගලයන්ගේ සිරුරු උපද්‍රවකාරී අපද්‍රව්‍යයක් වන බැවින් එම අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා වන පරිසර ආරක්ෂණ නීති අනුගමනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මැදිහත් වන ලෙස මධ්‍යම පරිසර අධිකාරියෙන් ඉල්ලා සිටියි.

මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලිඛිතව දැනුම් දෙමින් මේ ඉල්ලීම සිදු කර ඇති ඒ මහතා එසේ කිරීමට අපොහොසත් වුවහොත් මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව නීතිමය පියවර ගන්නා බවද එම ලිපිය මඟින් දැනුම් දී ඇත.

විශේෂයෙන්ම කොවිඩ් 19 ආසාදිතව මිය යන පුද්ගලයන්ගේ මළ සිරුරු භූමදානය කරන ස්ථානය සම්බන්ධයෙන් පාරිසරික ශක්‍යතා වාර්තාවක් ගැනීමේ අවශ්‍යතාව ද මෙම අවස්ථාවේ අවධාරණය කරන එම සංවිධානය ඒ සඳහා වන 2008. 02. 01 දින නිකුත් කරන ලද අංක 1534/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය කෙරෙහි ද අවධානය යොමු කරන බව එම ලිපිය මඟින් දන්වා ඇත.

යහපාලනයේ හොඳයි කියන ව්‍යාපෘති ආණ්ඩුව බදා ගන්නවා

එජාප මහලේකම් පාලිත රංගේ බණ්ඩාර

ආරියරත්න ගනේගොඩ - මැදකොළඹ සමූහ

යහපාලන ආණ්ඩුවේ හොඳයි කියන ව්‍යාපෘති සියල්ලම වත්මන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු රජය බදා ගන්නවා. නරකයි කියැවෙන ව්‍යාපෘති යහපාලනයට තල්ලු කරනවා යැයි එක්සත් ජාතික පක්ෂයේ මහලේකම් හිටපු අමාත්‍ය පාලිත රංගේ බණ්ඩාර මහතා පිටකෝට්ටේ සිරිකොත මන්දිරයේ පැවැති මාධ්‍ය හමුවේදී පැවසීය.

ඒ අනුව යහපාලන ආණ්ඩු කාලයේ ඇති කළ හොරණ ටයර් කම්හල, මන්නාරමේ සුළං විදුලි බලාගාරය, කොළොන්නාව කසළ ව්‍යාපෘතිය, කෙරවළපිටිය විදුලිබලාගාරය භාර ගෙන ඇතැයි ද නරකයි කියන ඒවා පමණක් යහපාලන ආණ්ඩුවේ ලේබලය අලවන බවත් ඒ මහතා මාධ්‍යවේදියකුගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් පැවසීය. මේ දෙබිඩි පිළිවෙත කුමක්දැයි ඒ මහතා ප්‍රශ්න කර සිටියේය.

මාධ්‍යවේදීන් විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් එජාප මහලේකම්වරයා මෙසේද කීය.

පාස්කු බෝම්බ සිද්ධිය විමර්ශනය කිරීමට හිටපු ජනාධිපතිවරයා විසින් පත් කරන ලද කොමිසම සඳහා රජයේ මුදල් අති විශාල ප්‍රමාණයක් වැය කරලා තිබෙනවා. කොමිසම පවත්වාගෙන යද්දී අන්තර්කාලීන වාර්තා දෙකක්ම ජනාධිපතිවරයාට භාර දී තිබෙනවා. ඊට අමතරව ජනාධිපති කොමිසමේ පරීක්ෂණ කාලය දිගු කිරීමටත් අවසර දුන්නා.

එලෙස පත් කරන ලද කොමිසමේ වාර්තාව අවසන් එකක් යැයි මාධ්‍යවේදියකුගේ පැනයකට පිළිතුරු දෙමින් එජාප මහලේකම් පාලිත රංගේ බණ්ඩාර මහතා කීය.

තවත් මාධ්‍යවේදියකුගේ ප්‍රශ්නයකට පිළිතුරු දුන් එජාප මහලේකම්වරයා කියා සිටියේ, එම කොමිසම් වාර්තාව අසම්පූර්ණ බව අපගේ පක්ෂය විසින් ප්‍රථමයෙන්ම පෙන්වා දුන්නා. සහරාන්ගේ පිරිසකගේ අත්වලට ආරක්ෂක අංශයට අයත් ආයුධ ලැබුණේ කෙසේද? එල්ටීටීඊ යුද්ධය අවසානයේදී ඔවුන් සතු අවි ආයුධ ආරක්ෂක අංශය වෙත භාර ගනු ලබද්දී එම ආයුධ පැවැති විවිධ සම්බන්ධකම් තුළින් සහරාන්ලා අතට පත්වූ බවට සැකයක් මතු වෙනවා.

සහරාන් ඇතුළු පිරිසක් රජයේ බුද්ධි අංශය සමඟ කලක් කටයුතු කළ බවක් පැවසෙනවා. ඔවුන් බුද්ධි අංශය සමඟ සිදු කළ කාර්යභාරය කුමක්ද? එලෙස කටයුතු කිරීමට සහරාන්ගේ පිරිසට කිසියම් ගෙවීමක් කර තිබෙනවාද? එවැනි ගෙවීමක් සිදු කර තිබෙනවා නම් ඒ පිළිබඳ කොමිසම් වාර්තාවේ කිසිම සඳහනක් හෝ අවධානය යොමු වී නැති බව වාර්තා වෙනවා.

කොරෝනා මළ සිරුරු උතුරේ දූපත්වල මිහිදන් කිරීම අනුමත කරන්න බැහැ

හිටපු මන්ත්‍රී ආනන්ද සංගරී

රසුල දිල්හාර ගමගේ
උතුරු පළාත් විශේෂ

කොරෝනා මළ සිරුරු උතුරේ දූපත්වල මිහිදන් කිරීම තමන්ට ද අනුමත කළ නොහැකි නිසා රජය මේ සම්බන්ධයෙන් ඉතා සාධනීය පියවරක් අනුගමනය කළ යුතු බව ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ නායක ආනන්ද සංගරී හිටපු මන්ත්‍රීවරයා විසින් පෙරේදා (3) නිකුත් කළ නිවේදනයක සඳහන් වෙයි.

ඔහු පවසන්නේ මේ දූපතේ මිනිසුන් ඉතා සාමකාමීව කාලාන්තරයක් තිස්සේ ධීවර රැකියාවෙන් ජීවත් වන බවත් යුද්ධය නිසා ඔවුන් දූපත හැර ගොස් යළි පදිංචියට පැමිණ ඇත්තේ මීට වසර 3 ක් වැනි කාලයකට ඉහතදී බවයි.

ආර්ථික වශයෙන් ඉතා පහළ ජීවන තත්ත්වයක සිටින ඔවුන්ට දූපත තුළ කොරෝනා මරණ මිහිදන් කිරීම තුළින් ධීවර නිෂ්පාදන මිලට ගැනීම සඳහා පිට පළාත් වල ව්‍යාපාරිකයන් නොපැමිණීම නිසා ඔවුන් අසරණ වන බවද සිය නිවේදනයේ සඳහන් කොට තිබේ.

රජය විසින් මෑතකදී මෙම ඉරණතිව් දූපතේ මුහුදු ප්‍රදේශය එහි වෙසෙන ජනතාවට අක්කරය බැගින් බෙදා දී මුහුදු කුඩැල්ලන් ඇතුළු මුහුදු ආහාර අපනයනය කිරීමේ ගම්මානයක් පිහිටු වන ලද බවත් ඊට සහාය දක්වා ඇත්තේ විදේශීය සමාගම් බවත් පෙන්වා දෙන සංගරී මහතා කොරෝනා මළ සිරුරු මිහිදන් කිරීම සඳහා මෙම දූපත යොදා ගැනීම නිසා ධීවර නිෂ්පාදන කටයුතුවල නිරත පිරිස සමාජය විසින් වෙන් කිරීමට ඉඩ ඇති බව ද පෙන්වා දෙයි.

කොරෝනා විෂ බීජ සම්බන්ධයෙන් විවිධ මත පල වී ඇති නිසා ඉරණතිව් දූපතේ මුහුදු ආහාර අපනයනය කිරීමේදී විශාල ගැටලුවක් පැන නගින බවත් ඔවුන්ගේ නිෂ්පාදන දේශීය වෙළෙඳපොළේ පවා ප්‍රතික්ෂේප විය හැකි බවත් ආනන්ද සංගරී මහතාගේ අදහස වී තිබේ.

මේ අවස්ථාවේදී රජය සමග විරුද්ධ වීමට කිසිදු හේතුවක් නොමැති නමුත් කොරෝනා මළ සිරුරු ඉරණතිව් දූපතේ මිහිදන් කිරීම සම්බන්ධයෙන් තමන් විරුද්ධ වන බව ඔහු විසින් යාපනයේ සිට නිකුත් කරන ලද නිවේදනයේ සඳහන් වෙයි.

දැවෙන ප්‍රශ්න යට ගසා නව ප්‍රශ්න ඇති කිරීම පාලකයන්ගේත් නිලධාරීන්ගේත් ක්‍රමයයි

නව ජාතික පෙරමුණේ නායක ජේ. කණ්ඩම්බි

දැවෙන ප්‍රශ්න යට ගසා නව ප්‍රශ්න ඇති කිරීම පාලකයන්ගේත් නිලධාරීන්ගේත් ක්‍රමය බව නව ජාතික පෙරමුණ පවසයි.

ඔවුන් ජනතාව හප කරමින් සමාජයට මානසික රෝග වපුරන අතර ප්‍රධාන පක්ෂවල පහළ ක්‍රියාකාරීන් යටපත් කර ඥාතී මිතුරන් කරළියට ගෙන ඒම අසාධාරණ බව ද නව ජාතික පෙරමුණේ නායක ජේ. කණ්ඩම්බි මහතා පෙන්වදෙයි.

1988 වසරේ දී ජනතා විමුක්ති පෙරමුණ තහනම් කිරීමේ විපාක අද විඳින බව පෙන්වා දෙන ජේ. කණ්ඩම්බි මහතා එල්.ටී.ටී.ඊ ය තවදුරටත් යටපත් කිරීමෙන් අන්තර්ජාතික ප්‍රශ්න ඇති වූ බව ද මුස්ලිම් තරුණයන්ට නව අදහස් ක්‍රියාත්මක කිරීමට ඉඩ නොදීමෙන් සහරාන්ලා බිහි වූ බව ද කියා සිටී. කැරලි 4ක් තුළින් පාඩම් නොගත් අප පස්වැනි කැරැල්ලකට සාමාන්‍ය ජනතාව තල්ලු කරනු බවක් පෙනෙන බව ද ජනමතය යටපත් කරන විට අවි බලය ඉස්මතු වන බව ද එහි සඳහන් කර ඇත.

පක්ෂ ව්‍යුහය ව්‍යවස්ථාවෙන් මකා දමා ප්‍රජාතන්ත්‍රවාදයට අකුල් හෙළා තිබෙන අතර ජනතාවගේ සැබෑ මතය ඉදිරිපත් කිරීමට ඉඩ නොමැති බැවින් ප්‍රධාන පක්ෂවල ගොදුරු බවට පත්ව තිබෙන බව ද පිරිහී ඇති ආණ්ඩුව වෙනුවට ගිලිහුණු විපක්ෂය වටා ජනතාව පෙළ නොගැසීම අති විශේෂ දැක්මක් බව ද නව ජාතික පෙරමුණේ නායක ජේ. කණ්ඩම්බි මහතා පෙන්වා දෙයි.

දේශපාලන පළි ගැනීම් පිළිබඳ කොමිසම ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දුන් තීන්දු පවා වෙනස් කිරීමට නිර්දේශ දීලා

අධිනීතිඥ, මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල

අසේල කුරුළුවංශ

දේශපාලන පළිගැනීම් පිළිබඳ කොමිසම අධිකරණ බලය පැහැර ගනිමින් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දුන් මිනීමැරුම් නඩු තීන්දු පවා වෙනස් කිරීමට නිර්දේශ දී ඇතැයි විපක්ෂයේ ප්‍රධාන සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී අධිනීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා පවසයි.

විපක්ෂනායක කාර්යාලයේදී ඊයේ (04) පැවති මාධ්‍ය හමුවකදී ඒ මහතා මේ බව ප්‍රකාශ කළේය. ජනාධිපති පරීක්ෂණ කොමිසමක් යනු අධිකරණයක් නොව තොරතුරු සෙවීම සඳහා පත් කළ එකක් පමණක් බවත් නඩු තීන්දු දීමේ හැකියාවක් මෙයට නොමැති බවත් හෙතෙම පැවසුවේය. තොරතුරු සොයා බල එය නීතිපතිවරයාට යැවීම පමණක් කොමිසමට කළ හැකි බවත් එම තොරතුරු පදනම් කරගෙන නෛතික කටයුතු කළ හැකි ද යන්න නීතිපතිවරයා තීරණය කරන බවත් මන්ත්‍රීවරයා ප්‍රකාශ කළේය.

ශ්‍රේෂ්ඨාධිකරණය, මහාධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය දුන් නඩු තීන්දු හා ඒවාහි පවතින නඩු පිළිබඳ මෙම කොමිසම නිර්දේශ නිකුත් කර තිබෙන බවත් එය සම්පූර්ණයෙන්ම අධිකරණයේ බලය උදුරා ගැනීමක් බව ඉතාම පැහැදිලි බවත් කිරිඇල්ල මහතා පැවසුවේය.

අධිකරණයක තීන්දුවක් වෙනස් කළ හැකි වන්නේ අධිකරණයකට පමණක් බවත් එවැන්නක් කිරීමේ හැකියාවක් කොමිසන් සභාවකට නොමැති බවත් කී ඒ මහතා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දුන් මිනීමැරුම් පිළිබඳ නඩුවලට පවා මේ අය යම් යම් වෙනස් කිරීම් කරන්න නිර්දේශ කර ඇතැයි ද අවධාරණය කළේය.

ආණ්ඩුවේ හිතවතුන්ට විරුද්ධව තිබෙන නඩු ඉවත් කර ඇතැම් නඩුවල පැමිණිලිකාරයා විත්තිකාරයා කර තිබෙන බවත් පසුගියදා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 40 දෙනකු අත්සන් කර අගවිනිසුරුතුමාට පෙත්සමක් භාර දුන් බවත් විපක්ෂයේ සංවිධායකවරයා පැවසීය.

ජනතාවගේ අධිකරණ බලය උසාවිවලට ලබා දෙන්නේ පාර්ලිමේන්තුව බවත් මෙම කොමිසම මගින් පාර්ලිමේන්තුව මගින් අධිකරණයට දුන් බලය පැහැර ගෙන තිබෙන බවත් කී මන්ත්‍රීවරයා මේ නිසා ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන ලෙස මන්ත්‍රීවරු අගවිනිසුරුවරයාගෙන් ඉල්ලීමක් කළ බව ද අවධාරණය කළේය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම

2021 මාර්තු 09 වැනි දින රුපියල් මිලියන 45,000 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ වෙන්දේසිය

භාණ්ඩාගාර බිල්පත් නිකුතුව පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

පරිණත කාලය	දින 91	දින 182	දින 364	එකතුව
සු.හ.ජා. අංකය (ISIN)*	LKA09121F119	LKA18221I102	LKA36422C115***	
වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ මුදල (රු.මිලි.)	10,000	10,000	25,000	45,000
පිළිගනු ලබන උපරිම ඵලදා අනුපාතිකය (%) **			5.10	

වෙන්දේසි කරන දිනය	: 2021 මාර්තු 09 වැනි දින
ගෙවීම් කළ යුතු දිනය	: 2021 මාර්තු 12 වැනි දින
නිකුතුවේ දිනය	: 2021 මාර්තු 12 වැනි දින
ලංසු භාරගන්නා අවසාන දිනය හා වේලාව	: 2021 මාර්තු 09 වැනි **අඟහරුවාදා** පෙ.ව. 11.00
ලංසුවක් සඳහා අවම මුදල	: රුපියල් මිලියන පහක් (5,000,000/-) සහ ඉන් අනතුරුව රුපියල් මිලියනයේ (1,000,000/-) ගුණිතයන්ගෙනි.

රජයේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ. ලංසු ඉදිරිපත් කළ යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලැබ ඇති විද්‍යුත් ලංසු ඉදිරිපත් කිරීමේ පහසුකම මගින් පමණකි. වෙළෙඳපොල තත්ත්වයන් මත, මෙම වෙන්දේසියට ඉදිරිපත් කරන ලද සම්පූර්ණ ප්‍රමාණය ඉක්මවා නොයන පරිදි, එක් එක් පරිණත කාලයන්ට අදාළව ඉදිරිපත් කරන ලද ප්‍රමාණයන්ට වඩා අඩු හෝ වැඩි ප්‍රමාණයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගනු ලැබිය හැකි ය.

පහත සඳහන් ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් හෝ අනෙකුත් බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගන්නා ලෙස මහජනතාවට දැනුම් දෙනු ලැබේ.

ඇක්සියුට් සෙකියුරිටීස් ලිමිටඩ්	2206297	මහජන බැංකුව	2206783
ලංකා බැංකුව	2541938	සම්පත් බැන්ක් පී.එල්.සී.	2305842
කැපිටල් එලයන්ස් ලිමිටඩ්	2317777	සෙලාන් බැන්ක් පී.එල්.සී	2456340
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.	2332319	වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ්	2675096
එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්	2425010	ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පී.එල්.සී.	2639883

* සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකය
** වෙන්දේසියේදී දින 91 සහ දින 182 පරිණත කාලයන් සඳහා තීරණය වනු ලබන ඵලදා අනුපාතිකයන්, දින 364 පරිණත කාලයට අනුරූපව පවත්වා ගනු ඇත.
*** නිවාඩු දිනයන්හිදී සිදුවන භාණ්ඩාගාර බිල්පත් පරිණතයන් සඳහා අදාල නව ක්‍රමවේදයට යටත් වේ. ඒ අනුව. 2022 වසරේ සිට කිසියම්, භාණ්ඩාගාර බිල්පතක් පරිණත වන දිනය බැංකු නිවාඩු දිනයක් වුවහොත් එම පරිණතයට අදාල ගෙවීම් ඵලඹෙන පළමු රාජකාරි දිනයේදී සිදු කරනු ලැබේ.

නිකුත් කරන කාර්යාලය
රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
30, ජනාධිපති මාවත
කොළඹ 01.
දුරකථන :+94 11 2477011 ෆැක්ස් :+94 11 2477687
www.cbsl.gov.lk

එම්. ඉසෙඩ්. එම්. ආසිම්
රාජ්‍ය ණය අධිකාරි/ලේඛකාධිකාරි

ටෙන්ඩර් දැන්වීම

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

ශ්‍රී ලංකා මහ බැංකුවේ ගබඩා කර ඇති කල් ඉකුත් වූ, භාවිතා කළ, සේවාකරණය කළ නොහැකි සහ අතිරික්ත භාණ්ඩ මිලදී ගෙන ඉවත් කර ගැනීම සඳහා මිල කැඳවීම

ටෙන්ඩරයේ නම සහ අංකය	භාණ්ඩ සමීක්ෂණය – 2020 09/04/003/0003/020
ටෙන්ඩරයේ විස්තරය	**ශ්‍රී ලංකා මහ බැංකුවේ ගබඩා කර ඇති කල් ඉකුත් වූ, භාවිතා කළ, සේවාකරණය කළ නොහැකි සහ අතිරික්ත භාණ්ඩ මිලදී ගෙන ඉවත් කර ගැනීම සඳහා මිල කැඳවීම.** ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත. කොළඹ 01 සහ බැංකු අධ්‍යයන කේන්ද්‍රය, අංක 58, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.
ඇතුළත් භාණ්ඩ	කාර්යාලීය දැව භාණ්ඩ, වානේ කබඩ්, ඡායා පිටපත් යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, මුදල් ගණිත යන්ත්‍ර, UPS, ගිනි නිවන උපකරණ, ඇලුමිනියම් උපාංග, Forklifts, අබලි යකඩ, වායු සමීකරණ යන්ත්‍ර ඇතුළු තවත් බොහෝ දේ.
ටෙන්ඩර් ලේඛන ලබා ගැනීම	2021 මාර්තු මස 05 දින සිට 2021 මාර්තු මස 17 දින දක්වා පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා රාජකාරි දිනයන් හිදී. තැපැල් කාමරය, බිම් මහල, ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල, ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.
තොග පරීක්ෂා කිරීම	2021 මාර්තු මස 09, 10, 16 සහ 17 යන දිනයන් හි පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා
ලංසු වැසීම සහ විවෘත කිරීම	දිනය : 2021 මාර්තු මස 18 වේලාව : පෙ.ව. 10.00 ස්ථානය : බිම් මහල, ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල, ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.

■ මෙම ටෙන්ඩරය සඳහා ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට ඉදිරිපත් විය නොහැක.

වැඩි විස්තර සඳහා අමතන්න - 011-2477549 හෝ 011-2477646

දිනමිණ දිසත
දස අත ම එක තැන

සිසිල ගුණතිලක - ගම්පහ දිස්ත්‍රික් විශේෂ සහ ගම්පහ මධ්‍යම සමූහ - ඔලිවර් පෙරේරා

යක්කලටත් කොරෝනා එන්නත...

ගම්පහ මහ නගර සභා බල ප්‍රදේශයේ යක්කල උතුර සහ කෙසෙල්වතුගොඩ දකුණ යන ග්‍රාම නිලධාරී වසම් තුළ වෙසෙන ජනතාවට කොරෝනා මර්ධනය සඳහා වන ඇස්ට්‍රා සෙනිකා එන්නත ලබා දීම ඉකුත් 02 වෙනිදා සහ 03 වෙනිදා ගම්පහ මහ නගර සභාවට අනුබද්ධ යක්කල උප කාර්යාලයේ දී ගම්පහ පුරපති එරංග සේනානායක මහතාගේ සහභාගීත්වයෙන් සිදු කෙරිණි.

එහිදී වයස අවුරුදු 30ට වැඩි පුද්ගලයන්ට කොවිඩ් එන්නත ලබා දුන් අයුරු ඡායාරූපයේ දැක්වේ.

ගම්පහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී සුභාෂ් සුබසිංහ මහතාගේ උපදෙස් පරිදි මෙම එන්නත් දීමේ වැඩසටහන ක්‍රියාත්මක විය.

දමන සමූහ කේ.ඒ.මෛත්‍රීපාල

භික්ෂු නේවාසිකාගාරය විවෘත කරයි

ඓතිහාසික දිගාමඩුලු පුරවරයේ දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හිඟුරාණ උත්තර ජයමහා විහාරස්ථානයට අනුබද්ධිත අම්/සිරිධම්ම රතන මහ පිරිවෙනට මහත් අඩුපාඩුවක්ව තිබූ සාමණේර ස්වාමීන් වහන්සේලා උදෙසා භික්ෂු නේවාසිකාගාරයක් ඉදිකර සඟ සතු කොට පුජා කිරීමේ පිංකමක් 03දින හිඟුරාන උත්තර ජයමහා විහාරාධිපති හිඟුරාණේ සිරිධම්ම නායක හිමියන්ගේ අවවාද අනුශාසනා මත මූල්‍ය ධන පරිත්‍යාගය ලබා දුන් විශ්‍රාමලත් පාඨශාලාචාරණී පී.ඩී.එම්. කුසුමා විජේගුණවර්ධන මහත්මියගේ සුරතින් විවෘත කිරීම සිදු කෙරිණි. අම්/සිරිධම්මරතන මහ පිරිවෙනේ සාමණේර ස්වාමීන් වහන්සේලා උදෙසා අභිනවයෙන් ඉදිකරන ලද මෙම දෙමහල් භික්ෂු නේවාසිකාගාරය මාලඹේ. තලාහේන. පදිංචි විශ්‍රාමලත් පාඨශාලාචාරණී පී.ඩී.එම්. කුසුමා විජේගුණවර්ධන මහත්මිය සහ දරුවන්ගේ මූල්‍ය ධන පරිත්‍යාගයෙන් හා විහාරවාසී භික්ෂූන් වහන්සේලා. ශ්‍රී ලංකා යුධ හමුදාව. හිඟුරාණ සිවිල් ආරක්ෂක බළකාය. ගල්ඔය වැවිලි සමාගම. හා හිඟුරාණ උත්තර ජයමහා විහාරස්ථ සතර පේරුවේ දායක පිංවතුන් ඇතුළු සියලු දෙනාගේ ශ්‍රමදායකත්වයෙන් මෙම දෙමහල් ගොඩනැගිල්ල ඉදි කෙරුණි.

වයඹ පළාත් සංචාරක

පන්නල ප්‍රා.ලේකම් කොට්ඨාසයේ

ගම්මාන රැසක පරිසර හානි

නීති විරෝධී ලෙස වැලි හා මැටි කැපීමට උපයෝගී කරගත් ටිපර් රථ බෝට්ටු බැකෝ යන්ත්‍ර ඇතුළු ආම්පන්න තොගයක් පොලිස් විශේෂ කාර්ය බළකාය මගින් අත්අඩංගුවට ගෙන පන්නල පොලිසියට ගෙනගොස් තිබූ අයුරු.

කටුගම්පල ආසනයට අයත් පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එළිවිච්චිය, පල්ලේගම, මැල්ලවලාන සහ බලවල මාහොලව වැනි ප්‍රදේශවල ජීවත්වන ජනතාව පාරිසරික ගැටලු කීපයකට මැදිව දැඩි පීඩනයකින් ජීවත් වෙති. මෙම ප්‍රදේශවල සිදු කරන නීති විරෝධී පරිසර විනාශයන් රැසක් දිගින් දිගටම සිදුවීම මේ වන විට බරපතල ගැටලුවක් බවට පත්වී ඇත. ප්‍රධානතම පරිසර ගැටලු අතර කලුගල් කැඩීම, පස් සේදීම, බොරළු කැපීම, මාඔයේ වැලි ගොඩදැමීම, මැටි කැපීම හැඳින්විය හැකිය.

මීට වසර ගණනාවකට පෙර මෙම ප්‍රදේශවල ජනතාව ස්වයංරැකියාවක් ලෙස කළුගල් කඩා ජීවත්වූහ. ඉතා සුළුවෙන් ඩයිනමයිට් දමා අතින් බෝර සකස් කර කලුගල් කැඩීම සිදු කළ අතර ඉන් පරිසරයට මෙන්ම සතාසීපාවුන්ටද විශාල හානියක් සිදුවූයේ නැත. එහෙත් දැන් වසර පහක පමණ කාලයක සිට මහගලකන්ද, කිතුල්කැලේ, මාළිගාකන්ද වැනි විශාල ගල් පර්වත කොම්ප්‍රෙෂර් යොදා විදුලි බලයෙන් මහා පරිමාණයෙන් ඩයිනමයිට් භාවිතා කර කලුගල් කැඩීම සිදු කරයි. මේ දැවැන්ත පිපිරීම් සමඟ මුළු ප්‍රදේශයම දෙදරුම් කන අතර නිවාස ඇතුළු ගොඩනැගිලිද පුපුරාගොස් ඇති අයුරු දැකිය හැකිය. එසේම අධිවේගී මාර්ග වලට යැයි කියමින් කළුගල් කුඩු යොදා කාපට් මිශ්‍ර කිරීමේ අංගන කීපයක්ද මැල්ලවලාන, පල්ලේගම, බලවල වැනි ප්‍රදේශවල පිහිටුවා ඇත. මෙම අංගන තුළ දවසේ පැය 10කටත් වඩා වැඩි කාලයක් කාපට් හා කළුගල් කඩන යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මකව පවතින අතර ඉන් අධික ශබ්දයක් සේම කළුගල් කුඩු මිශ්‍ර දූවිලි මුළු ප්‍රදේශය පුරා සුළඟට විසිරී යයි. එම කළුගල් මිශ්‍ර දූවිලි කොටස් මිනිසුන්ගේ ශරීරයට මෙන්ම බීමට ජලය ගන්නා ළිංවලට, නිවාසවලට මෙන්ම ගස්වැල්වලට ද පතිත වෙයි. එය බරපතළ සෞඛ්‍ය ගැටලුවකි. ස්වශන ආබාධ ඇතිවීමත් පානීය ජලය දූෂණය වීමත් එම ජලය පානය කිරීමෙන් වකුගඩු ආසාදන ඇතුළු රෝගාබාධ රැසකට ගොදුරුවීමද නොවැළැක්විය හැකිය.

එසේම මහා පරිමාණයෙන් බොරළු කැපීමද මෙම ප්‍රදේශවල දැකිය හැකිය. දැවැන්ත බොරළු කඳු බැකෝ යන්ත්‍ර දෙක තුනක් යොදාගෙන කපා විකිණීමේ ජාවාරමද ජයටම කෙරිගෙන යයි. පිහිටි ඉඩම්වල බොරළු කඳු කැපීමෙන් විශාල පරිසර හානියක් සිදුවන අතර මේ වන විට ඉහත සඳහන් කළ ප්‍රදේශවල දැඩි පානීය ජල හිඟයක් පවතී. ළිං වල ජල මට්ටම ඉතා ශීඝ්‍රයෙන් පහත ගොස් ඇත. මීට අමතරව පල්ලේගම බෝගහජනපදය ආසන්නයේ වැලි සේදීමේ ජාවාරමක්ද දැන් කලක සිට සිදු කරමින් පවතී. ඉඩම්වලින් කපාගන්නා වතුවැලි මෙම ස්ථානයට ගෙනවිත් යන්ත්‍රානුසාරයෙන් සෝදනු ලබයි. මාඔයේ වැලි හිඟවීම හේතුවෙන් මේ ආකාරයට වතුවැලි කපා සේදීම සිදු කරන අතර ඉන් වතුවැලි සහිත ඉඩම් දැඩි පරිසර හානියකට ගොදුරු වෙයි. එම ජාවාරමෙනුත් සිදුවනු ලබන්නේ ජල උල්පත් සිඳීයාමය.

සරුසාර පොල් ඉඩම් කැබලි කර විකිණීම හා පොල් ගස් කැපීම ද යහමින් පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සිදුවන තවත් දරුණු පරිසර විනාශයකි. පොල් ත්‍රිකෝණයට අයත් ප්‍රදේශයක් වුවද මේ ප්‍රදේශවලද පොල් ගෙඩියක මිල රුපියල් 80ත් 100ත් අතර වෙයි. තව වසර පහක් යන විට කටුගම්පල ආසනය තුළ පමණක් සරුසාර පොල් ඉඩම්වලින් 60% පමණ සම්පූර්ණයෙන්ම පොල් වගාව විනාශ වී යනු ඇත. පොල් ලී ලබාගැනීම සඳහා ද පොල් ගස් කපා දමන අතර පොල් හිඟයට මෙයද සෘජු ලෙස බලපානු ලබයි.

අනවසරයෙන් කොස්, තේක්ක, බුරුත, කුඹුක්, හල්මිල්ල, නැදුන්, කොහොඹ,දෙල් වැනි වටිනාකමින් වැඩි ගස් කැපීමේ ජාවාරමද මෙම ප්‍රදේශවල බහුලව සිදුවෙයි. ඇතැම් පොලිස් නිලධාරීන්ගේද අනුදැනුම මත මෙම දැව ජාවාරම සිදුවන බව ප්‍රදේශවාසීහු සඳහන් කරති. අනවසරයෙන් මා ඔය දෙපස මැටි කැපීම හා වැලිගොඩදැමීම තවත් ජාවාරම් දෙකකි. මා ඔයේ ඉවුරු බාදනයට මෙන්ම මා ඔය අවට ජල උල්පත් සිඳීයාමටද මෙම මැටි කැපීම හා වැලිගොඩදැමීම සෘජුව බලපා ඇත. මත්තේගම, බලවල, කොහොඹපොළ, පන්නල, මාකඳුර, නාලවලාන, සඳලංකාව වැනි ප්‍රදේශවල මෙම ජාවාරම් නොකඩවා සිදු කරනු ලබයි. ඉවක් බවක් නැතිව නීති විරෝධීව සිදු කරන මෙම පරිසර විනාශයන් නැවැත්වීමට අදාළ බලධාරීන් කටයුතු නොකිරීම පිළිබඳව මෙම ආසනය තුළ පරිසරයට ආදරය කරන ජනතාව සිටින්නේ බලවත් කළකිරීමකිනි. ජනාධිපතිතුමන් මෙන්ම අගමැතිතුමාගේද කඩිනම් අවධානය මේ කෙරෙහි යොමු කර කටුගම්පළ ආසනය තුළ සිදුවන මේ දැවැන්ත පරිසර විනාශය නතර කිරීමට ස්ථිරසාර විසඳුමක් ලබාදෙනු ඇතැයි මෙහි ජනතාව දැඩි බලාපොරොත්තුවකින් සිටිති.

ජායාරූප ගිරිදල්ල සමූහ

මතුගම මධ්‍යම නිමල් වීරසේන

බෝම්බුවල තරුණ කැළ බුද්ධ ප්‍රතිමාවක් ඉදිකරයි

කළුතර බෝම්බුවල ගම්වාසී පොදු එක්සත් තරුණ කැළකගේ සිතුවිල්ලක් මත තම පුද්ගලික ධන පරිත්‍යාගයෙන් යුතුව බෝම්බුවල ශ්‍රී සුබෝධිරාජාරාමමූල මහා විහාර භූමියේ ප්‍රධාන නගරය ආශ්‍රිතව අලංකාර සමාධි බුද්ධ ප්‍රතිමාවක් ඉදිකොට පසුගිය නවම් පුර පසළොස්වක පොහොය දින විවෘත කරන්නට යෙදිණි.

බෝම්බුවල ශ්‍රී සුබෝධිරාජරාමමූල මහා විහාරයේ විහාරාධිපති පරිවේනාධිපති කළුතර රත්නපුරය දෙපළාතේ ප්‍රධාන සංඝනායක ශාස්ත්‍රපති හල්වතුරේ අස්සජි නායක හිමිපාණන් වහන්සේගේ අවසර අනුශාසනා මත මෙම බුද්ධ ප්‍රතිමාව ඉදිකිරීමට කටයුතු සිදු කෙරිණ.

බුද්ධ ප්‍රතිමාවේ නිර්මාණ දායකත්වයට අතහිත දුන් විහාරස්ථ විහාරාධිකාරී කළුතර ධර්මපාල මහා විද්‍යාලයේ ආචාර්ය ගවරගිරියේ ඉන්දසුමන හිමියන් විසින්ම විහාරස්ථාන නේවාසික සෙසු ස්වාමීන් වහන්සේලා හා දායක දායිකාවන් රැසකගේ සහභාගීත්වයෙන් එදින එය විවෘත කරන්නට යෙදුණු අවස්ථාව ඡායාරූපයෙන් දැක්වේ.

උකුවෙල සංචාරක - ප්‍රියන්ත සුමනසේන

යටවත්ත අස්ගිරි විවිධ සේවා සමූපාකාර සමිතියේ වංචා දූෂණ පිළිබඳව පරීක්ෂණයක් ඕනෑ

යටවත්ත අස්ගිරි විවිධ සේවා සමූපාකාර සමිතියේ වංචා දූෂණ පිළිබඳව සහ ඉන්ධන හල වසා තැබීම රුපියල් ලක්ෂ 25ක මුදලක් සාවධ්‍ය ලෙස පරිහරණය කිරීම පිළිබඳව යටවත්ත ප්‍රාදේශීය සභාවේ සභාපති එච්.ඩී ලාල් අත්තනායක මහතා විසින් විධිමත් පරීක්ෂණයක් සිදු කරන ලෙසට ඉල්ලා සමුපකාර සේවා ඇමැති ලසන්ත අලගියවන්න මහතා සහ පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ජනක බංඩාර තෙන්නකෝන් , මධ්‍යම පළාත් ආණ්ඩුකාර, ,දිස්ත්‍රික් ලේකම් , මාතලේ පාර්ලිමේන්තු මන්ත්‍රී නාලක කොට්ටේගොඩ මහතා ,මධ්‍යම පළාත් සමුපකාර කොමසාරිස් ඇතුළු සියලු දෙනාගෙන් වහාම පරීක්ෂණයක් සිදු කරන ලෙසට දන්වා ඇත .

යටවත්ත ප්‍රදේශවාසින් විසින් සමුපකාර සමිතිය වෙත තැන්පත් කළ මුදල් , ඉන්ධන හල සතු ඉඩම් කොටස් කර විකිණීම , ඉන්ධන හලෙන් රුපියල් ලක්ෂ 12 ක මුදලක් වංචා කිරීම , රුපියල් ලක්ෂ 25ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලය සහ පවුලේ අය අතර බෙදා ගැනීම , ඉන්ධන හලේ IOC නාම පුවරුව ගලවාගෙන යාම , ගොඩ නැගිලි කඩා ඉවත්කර රැගෙන යාම , සමුපකාර දෙපාර්තමේන්තුව පරීක්ෂණ නැතිව බලා ඉඳීම , යටවත්ත ජනතාවගේ පොදු දේපොළ විනාශවීම , ඇතුළු මෙම වංචා දූෂණ පිළිබඳව පරීක්ෂණයක් සිදු කරන ලෙසටද ඉල්ලීමක් කර ඇත .

වැල්ලවාය විශේෂ - ජී.අයි.ආර්. ගරුසිංහ

පුරාවස්තු සහිත පෞරාණික ස්ථානයක ගල්කොරියක් ඇරඹීමට පිඹුරුපත් සකසලා

සෙල් ලිපි සහිත නටඹුන් වූ චෛත්‍යයක් ඇතුළු පුරාවස්තු සහිත පෞරාණික ස්ථානයක් ආශ්‍රිතව ගල් කොරියක් ආරම්භ කිරීමට පිඹුරුපත් සකස්කරගෙන යමින් ඇතැයි තණමල්විල කිවුල්ආර පුරාණ නාලාගිරිපබ්බත ආරන්‍ය සේනාසනාධිපති හිමි දෙනගම රතනසාර ස්වාමීන් වහන් සේ පවසති.

පුරාවිද්‍යා නිලධාරීන් තණමල්විල බෞද්ධ කටයුතු සමායෝජක මහතා , ප්‍රෙදශවාසින් ස්වෙච්ඡා සමිති නියෝජිතයන් ඇතුළු රජයේ නිලධාරීන් පිරිසක් එම ස්ථානයේ නිරීක්ෂණයකට පසුගිය දා එක්වූ අතර එහිදී දැක බලාගැනීමට හැකිවූයේ එම ස්ථානයේ ගල් කඩා මහත් විනාශයක් සිදුකර ඇති බවයි .

එහිදී අදහස් දක්වමින් ආරන්‍ය සේනාසනාධිපති හිමියෝ මෙසේ කියා සිටියහ.

නීතිය අවනීතිය බවට පත්කරගෙන නොයෙක් ආකාරයේ පුද්ගලයන් මේ පුරාවස්තු සහිත ස්ථාන විනාශ කරන්න ගල් කඩන්න දෙවැනි වතාවටත් පිඹුරුපත් සකස්කරගෙන තියෙනවා. ඒ බව දැනගත් වහම තමයි අපි බෞද්ධ කටයුතු සමායෝජක මහත්වරු පුරාවිද්‍යා නිලධාරීන් එක්ක මේවා බලන්න ආවේ .

මේ ස්ථානය පෞරානික ස්ථානයක් .කඳු පංතියේම තියෙන සෙල්ලිපි තියෙන නටඹුන් තියෙන ගරාවැටුණු කටාරම් සහිත ලෙන් තියෙන ගල් පොකුණු තියෙන චෛත්‍ය තියෙන පුජනීය වූ පෞරාණික දේවල් පිරුණු තැනක් .වර්තමානයේ මේවා ගැන සොයන්නේ බලන්නේ නැතිව ගල් කඩන්න සුදානම් වෙලා තියෙනවා.

ඔබතුමාලට මේවා පෙන්නන්නේ. මේවා අනාගත පරපුරට දැක බලාගන්න ආරක්ෂාකරලා දෙන්න ඕනේ . කැළෑවට යන්නට නොදී ස්වාමීන්වහන්සේලාට මේවා ආරක්ෂාකරගන්න ශක්තියක් ලබාදිය යුතුයි ඒ වගේම ඔබතුමන්ලාගේ අධීක්ෂණය යටතේ පුජනිය ස්ථාන බවට මේවා නගාසිටුවීම කළයුතුයි . මුතුන් මිත්තන්ගෙන් පැවතඑන දේවල් අනාගත පරපුරට දායාද කරලා ඔවුන්ට බලලා හිත සනසාගන්න කටයුතු කළයුතුයි.

මනුසත් දිරිය සංවිධානයේ සභාපති සඳුන් පුෂ්පකුමාර මහතා-

මේ ස්ථානය ආශ්‍රිතව මීට පෙර ත් ගල් බොර දාලා ගල්කොරියක් දාන්න සුදානම් වුණා .එය ප්‍රදේශවාසින්ගේ බලවත් විරෝධය නිසා නතරවුණා . දැන් නැවත වතාවක් ආරම්භකරන්න සුදානම් වෙනවා . මේ සම්බන්දයෙන් අපි රාජ්‍ය අමාත්‍ය ශෂෙන්ද්‍ර රාජපක්ෂ මහතා ඇතුළු දිස්ත්‍රික් දේශපාන නායකයන් වගේම රජ්‍ය නිලධාරීන් සියලු දෙනාට ලිඛිතව දැනුම් දිලා තියෙනවා .මේ පරිසර හානිය වගේම පෞරානික ස්ථානය විනාශ කිරීම නැවැත්වීමට වහාම පිවයර ගන්න කියලා .

ඒස්.ජී.විජේරත්න-කටුගස්තොට සමූහ

සියයට සියයක් වෛරස් පෙරීමේ හා නැසීමේ හැකියාව පවතින මුව ආවරණය හඳුන්වා දෙයි

සියයට සියයක්ම වෛරස් වලින් ආරක්ෂා විය හැකි වන අයුරින් නිපදවා ඇති Respirone nano av 99 මුව ආවරණය හඳුන්වාදීමේ වැඩසටහනක් වෙළෙඳ අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගිය 03 වැනිදා ගැටඹේ පිහිටි ඔක්රේ සංචාරක නිකේතනයේදී පැවැත්විණි.

වසරක පමණ කාලයක් තිස්සේ සිදුකළ පර්යේෂණ වලින් පසුව මෙම මුවආවරණය නිර්මාණය කළ බවත් මේ තුළින් පස් ආකාරයකට වෛරසය විනාශ කිරීමේ හැකියාවක් පවතින බවත් ස්ථර තුනකින් සමන්විතව නිපදවා ඇති නිසා සීයයට සියයකින් පෙරීමේ හැකියාව මෙන්ම සියයට සියයක් වෛරසය නැසීමේ හැකියාව පවතින බවත් මෙම මුව ආවරණයේ නිර්මාතෘ පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණි රාජපක්ෂ මහතා පැවැසීය.

මාතලේ දිස්ත්‍රික් සමූහ

ගලේවෙල සිට පුවක්පිටිය හරහා නාවුල දක්වා මාර්ගය අබලන්

ඒ6 සහ ඒ9 මාර්ග යාකෙරෙන ගලේවෙල සිට පුවක්පිටිය හරහා නාවුල දක්වා විහිදී ඇති සැතපුම් දහයක් පමණ වන මාර්ගයෙහි නිකවැහැර සිට සැතපුම් හයක පමණ කොටස මේවනවිට සම්පූර්ණයෙන්ම අබලන්වී ඇති බැවින් මෙහි වාහන ධාවනය ඇනහිට ඇති අතර මෙම මාර්ගයේ ධාවනය කළ එකම බස්රථයද දැනට සති කීපයක සිට නතර කරදමා ඇත. මෙම තත්ත්වය නිසා පෙදෙසේ ගම්මාන රැසක ජනතාවට මුහුණපෑමට සිදුවී ඇත්තේ ඉමහත් ගමනාගමන දුෂ්කරතාවකටය.

මෙදිනයන්හි පවතින මෙම ප්‍රවාහන අපහසුතාවන් නිසා විශේෂයෙන් මෙම පෙදෙසේ අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයට ඉදිරිපත්වී සිටින සිසුසිසුවියනට නියමිත වේලාවට විභාග මධ්‍යස්ථාන වෙත පැමිණීමටද අපහසුවී ඇත.

මේ සම්බන්ධයෙන් පෙදෙස්වාසින් පවසන්නේ උද්ගතව පවත්නා මෙම ප්‍රවාහන අපහසුතාවයන් නිසා සිය කෘෂි නිෂ්පාදනයන් වෙළෙඳපොළට ගෙනයාමටද මහත් වියදමක් දැරීමට සිදුවී ඇති බවය. මෙම අවස්ථාවෙන් ප්‍රයෝජනය ගන්නා කුඨ වෙළෙඳුන් ගම්මානවෙත පැමිණ ඉතා අඩු මිලට සිය කෘෂි නිෂ්පාදනයනක් මිලට ගැනීමට පෙළඹී ඇති බැවින් තමන්ට මහත් පාඩුවක් සිදුවන බවද මොවිහු පවසති.

එස්. දියගහගේ - දකුණු පළාත් සංචාරක

රූමස්සල භූමිය හරහා ඉදිවෙන අඩි විස්සේ පාරට කචල් ගොඩයි

දිනමිණ දස අත ම එක තැන

තල්ලේ අරිය ජෝති හිමි

උණවටුන හෝටල් හිමියන්ගේ සංගමයේ සභාපති නිමල් ගිගනගේ

උණවටුන සුළු හා මධ්‍ය පරිමාණ සංචාරක ව්‍යවසායක සංගමයේ කැඳවුම්කරු නීතිඥ රූපසේන කොස්වත්ත

අරලිය හෝටලයේ හිමිකරු ඩඩ්ලි සිරිසේන

උණවටුන රූමස්සල භූමිය හරහා වාහන ගමන් කිරීමට හැකි අඩි 20ක පුළුල් මාර්ගයක් තැනීමට තීරණය කිරීමත් සමඟ මේ දිනවල ඒ පිළිබඳ වාද විවාද පටන් ගෙන තිබේ. මෙහිදී පිරිසක් චෝදනා කර සිටියේ උණවටුනේ ඉදි කර ඇති එක්තරා තරු පන්තියේ විශාල හෝටලයක් සඳහා මේ මාර්ගය ඉදි කරනා බවයි. උණවටුන සුළු හා මධ්‍ය පරිමාණ සංචාරක ව්‍යවසායක සංගමයේ කැඳවුම්කරු හෝටල් හිමියන්ගේ සංගමයේ හිටපු සභාපති නීතිඥ රූපසේන කොස්වත්ත මහතා අදහස් දක්වමින් කියා සිටියේ,

"වසර පනහක කාලයක් තිස්සේ උණවටුන ජනතාව සංචාරක කර්මාන්තයේ යෙදිල ඉන්නවා. උණවටුනේ මිනිස්සු පළමුවෙන්ම තම නිවෙසේ කොටසක් හදාගෙන පුළුවන් විදියට සංචාරක ව්‍යාපාරය පවත්වාගෙන ගියා. පසුව නවසිය හැට ගණන්වල ආතර් සී. ක්ලාක් මහතා උණවටුනේ පදිංචියට ආවට පස්සේ ලෝකප්‍රසිද්ධ වුණේ. දැන් උණවටුන වැල්ල දේවාලය ආශ්‍රිත යද්දෙහිමුල්ල ග්‍රාම සේවා වසමේ ඇති සංචාරක හෝටල් සහිත ප්‍රදේශයේ සිට රූමස්සල පීල්ල හන්දිය දක්වා මේ වන විට ඇති මාර්ගයේ ගල්හේන සිට පීල්ල හන්දිය අතර කොටස පවතින්නේ අඩි පාරක් ලෙසටයි. මේ මීටර එකසිය අසූවක් දිග අඩිපාර යන්නේ පාරිසරික සංවේදී කලාපයක් හරහායි. ඒ පාර තමයි දැන් අඩි විස්සක් පළලට හදන්න යන්නේ. පරිසරයට බලපෑමක් වුණොත් සංචාරක ව්‍යාපාරයට බලපෑමක් වෙනවා. ඒ නිසා සංචාරක ව්‍යාපාරය රැක ගත යුතුයි. සංවර්ධනය කියලා වරක් දිය කඩනයක් ඉදි කිරීම නිසා සිදු වූ හානිය විශාලයි. එයින් සංචාරක ව්‍යාපාරය පසුබෑමට ලක් වුණා. එක්දහස් නවසිය තිස්එකේ පිඹුරුපත්වල ඔය පාර තිබෙනවා කිව්වට භෞතිකව නෑ. උණවටුන ජනාවාස වීමත් සමඟ වෙන වෙන පාරවල් නිර්මාණය කළා. කුළුණු කන්ද පාර, බොනවිස්ටා පාර, වැල්ලදේවාල පාර භෞතික පාරවල්. දැන් ඒ පාරවල් වෙනස් වෙලා කාපට් කරලා. හබරාදුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තියෙන උණවටුන සිතියමේ ඔය කියන පාර නෑ. පරිසරයයි සංවර්ධනයයි දෙකම එකට යන්න බෑ. කළ යුත්තේ විශාල වාහන ගෙන යෑමට පාරවල් හැදීම නොව පරිසරය සංරක්ෂණය කිරීමයි."

උණවටුන හෝටල් හිමියන්ගේ සංගමයේ සභාපති නිමල් ගිගනගේ මහතා,

"මේ පාර එක්දහස් නවසිය තිස්එකේ ගැසට් කරපු එකක්. මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහතික කරපු සැලැස්ම තියෙනවා. මේ පාර ඉදි කිරීමෙන් සිදු වන්නේ රූමස්සල කන්දේ දෙපැත්ත එකට යාකිරීමයි. පාර හැදුවොත් රූමස්සලත් සංචාරක ව්‍යාපාරය දියුණු වෙනවා. පරිසරය රකින්න නම් පාර තියෙන්න ඕනෑ. ඒ වගේම සංචාරකයෝ එන්නේ පරිසරයට නම් එතකොට පරිසරයත් ආරක්ෂා වෙනවා. මේ පාරේ හැදෙන්න තියෙන්නේ මීටර එකසියතිහයි. වැල්ලදේවාලෙ උත්සව කාලෙට වාහන තදබදයටත් මේ පාර පිළියමක් වෙනවා. ඒ වගේ තදබදයක් තියෙන වෙලාවට හදිසි ලෙඩෙක් ගෙනියන්න පාරක් කෝ. එහෙම වෙලාවටත් මේ පාර පිළියමක්. මේ කියන පාර සමහර විදේශිකයොත් අල්ලගෙන ඉන්නවා. එක විදේශිකයෙක් වර්ගමීටර අටසිය හැත්තෑනවයක් අල්ලගෙන ඉන්නවා. මේක දෙදහස් දහය වසරේ හදන්න තිබුණු පාරක්. රූමස්සල ගම් වැසියෙක් හැටියටත් සංචාරක හෝටල් හිමියන්ගේ සංගමයේ සභාපති හැටියටත් උණවටුන සහ රූමස්සල සම්බන්ධවන මේ පාර හදන්න ඉඩ දෙන්න කියල ඉල්ලා සිටිනවා. පාර හදන්නේ හබරාදුව ප්‍රාදේශීය සභාවෙනුයි. ඒ නිසා මේකට ඩඩ්ලි සිරිසේන මහතා පටලවා ගන්න එපා. හැබැයි අඩි විස්සට වැඩිය පළල් පාරක් හදනව නම් අපිත් විරුද්ධයි."

මේ මාර්ගය ඉදි කරන්නේ උණවටුනේ ඉදි කර ඇති තරු පන්තියේ විශාල හෝටලයක් වන අරලිය හෝටලයට බව සමහරු පවසන නිසා එම අරලිය හෝටලයේ හිමිකාර ඩඩ්ලි සිරිසේන මහතාගෙන්ද ඒ පිළිබඳ විමසුවෙමු.

"ඔය කියන පාර හදන්න අපි ඉල්ලුවේ නෑ. අපට ඔය පාර ඇතත් එකයි නැතත් එකයි. අපේ හෝටලයට එන්න කොළඹ මාතර පාරේ යද්දෙහිමුල්ල හන්දියේ සිට ඉතා හොඳ මාර්ගයක් තිබෙනවා. ඒ පාර මගේ පෞද්ගලික වියදමින් රුපියල් කෝටි පහක් වැය කරලා හැදුවා. පාර හදන්න මට හැම කෙනෙක්ම උදව් කලා. පර්චස් දෙක තියෙන අයත් පාර හදන්න ඉඩ දුන්නා. නමුත් ඒ පාරේ විශාල වාහන ගේන්නෙ නෑ. සංචාරකයන් එන බස් රථ ගාල්ල මාතර පාරේ රථ ගාලේ නවතා එතැන් සිට කුඩා වෑන් රථවලින් හෝටලයට රැගෙන එනවා. එයට අමතරව අපේ හෝටලයට සංචාරකයන් රැගෙන ඒම සඳහා මිල්ටන් හෝටලය ළඟ සිට බෝට්ටු සේවාවක් ආරම්භ කිරීමටද බලාපොරොත්තු වෙනවා. මේ හෝටලය හදන්න කැබිනට් පත්‍රිකා දෙකක් අනුමත වෙලා තියෙනවා. හෝටලය නිසා උණවටුනට විදුලි උප පොළක් ලැබුණා. එ නිසා මීට පස්සේ උණවටුන ජනතාවට විදුලිය පිළිබඳ ප්‍රශ්නයක් නෑ."

ඩබ්. ඒ. පියතිලක - මැදිරිගිරිය සමූහ

මින්නේරියේ ආයුර්වේද මැදුරක ගණිකා ජාවාරමක්

පොලොන්නරුව මින්නේරිය ප්‍රදේශයේ කලක පටන් ව්‍යාජ ආයුර්වේද මධස්ථානයක් ලෙස පවත්වාගෙන ගිය ගණිකා නිවාසයක් පසුගියදා (28) පස්වරුවේ වටලා කාන්තාවන් හයක් සහ පිරිමි පුද්ගලයන් දෙදෙනකු අත්අඩංගුවට ගත් බව පොලොන්නරුව කොට්ඨාස අපරාධ විමර්ශන අංශය ප්‍රකාශ කළේය. මෙසේ අත්අඩංගුවට පත් කාන්තාවන් ජා - ඇළ, ත්‍රිකුණාමලය, පාදුක්ක, කුණ්ඩසාලය, අනුරාධපුර අරලගංවිල සිරිපුර ප්‍රදේශවල පදිංචි අය වන අතර වයස අවුරුදු 22 සිට 35 දක්වා වයස් මට්ටම්වල අයයි. සිරිපුර ප්‍රදේශයේ කාන්තාව එහි කළමනාකරු ලෙස සේවය කර තිබේ. පිරිමි පුද්ගලයන් පොලොන්නරුව සහ පුලස්තිපුර පදිංචිකරුවෝ වෙති.

ඒ. ටී. කහඳුගොඩ - වීරකැටිය සමූහ

මත්කුඩු සන්තකයේ තිබී පුද්ගලයෙක් අත්අඩංගුවට

මත්කුඩු ග්‍රෑම් 2යි මිලිග්‍රෑම් 110ක් සන්තකයේ තබාගෙන සිටි අයකු වාඳුරුප්ප සුසානභූමිය අසලදී අත්අඩංගුවට ගැනීමට අම්බලන්තොට පොලිසිය සමත් වී තිබේ. අත්අඩංගුවට පත් වාඳුරුප්පේ පදිංචි විසිහය හැවිරිදි සැකකරු හම්බන්තොට මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට පොලිසිය මඟින් කටයුතු යොදා තිබිණි. අම්බලන්තොට පොලිසියේ උප පොලිස් පරීක්ෂක ධර්මරත්න මහතා ඇතුළු නිලධාරීහු සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

ඒ. පී. දයාචන්ද්‍ර - ඌරුබොක්ක විශේෂ

පරිභෝජනයට නුසුදුසු වල් ඌරු මස් විකුණන්න යද්දී මාට්ටු

බලපත්‍ර නැතිව මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු වල් ඌරු මස් විකිණීම සඳහා යතුරුපැදියකින් රැගෙන යමින් සිටි පුද්ගලයකු වල් ඌරු මස් කිලෝ 07ක් සමඟ ඌරුබොක්ක අමංගිලිය වත්ත මාර්ගයේදී ඌරුබොක්ක පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇත. මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ රොටුඹ දෙන්කන්දලිය කුඩුම්රියන්කන්ද ප්‍රදේශයේ පදිංචි 50 හැවිරිදි පුද්ගලයෙකි. කොට්ඨාස බුද්ධි අංශ නිලධාරි පො.සැ සේනාරත්න නිලධාරිවරයාට ලැබුණු තොරතුරකට අනුව පසුගියදා (28) දින සවස ඌරුබොක්ක අලකොලදෙණිය අමංගිලිය වත්ත පාරේ සිදු කළ වැටලීමකදී යතුරුපැදියක පිටුපස අයිස් පෙට්ටියක් ගැට ගසා ගෙන ජංගම මාළු වෙළෙඳාම සිදු කරමින් ගිය යතුරුපැදිකරුවකු නතර කර පිටුපස ගැට ගසා තිබූ අයිස් පෙට්ටිය විවෘත කර බැලීමේදී ඒ තුළ ෂොපින් බෑග්වල දමා තිබූ වල් ඌරු මස් කිලෝ 07ක් සොයා ගැනීමට හැකි වී තිබේ.

බී. එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

මිහින්තලය බස් නැවතුමේ අනවසර කඩ කාමර ඉවත් කිරීමට නියෝග

රජයේ ඉඩම් බලධාරියා වන ප්‍රාදේශීය ලේකම්වරයාගේ කිසිදු අවසරක් නැතිව බලහත්කාරයෙන් මිහින්තලය බස් නැවතුම්පොළ භූමියේ ඉදි කර තිබෙනා අනවසර වෙළෙඳ සංකීර්ණයේ පිහිටි කඩ කාමර අංක හය වහාම කඩා ඉවත් කරනා ලෙස අනුරාධපුර අතිරේක මහෙස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු හේමන්ත පුෂ්පකුමාර මහතා නියෝග කළේය. උතුරු මැද පළාත් ආණ්ඩුකාර මහීපාල හේරත්, අනුරාධපුර මහ දිසාපති නීතිඥ ආර්. එම්. වන්නිනායක යන මහත්වරුන්ගේ උපදෙස් මත මිහින්තලය ප්‍රාදේශීය ලේකම් සිරිමෙවන් ධර්මසේන මහතාගේ මෙහෙයවීමෙන් ඉඩම් අංශය මඟින් මේ නඩුව අධිකරණය හමුවේ ගොනුකර තිබිණි. මිහින්තලය ප්‍රාදේශීය සභාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ කිසිදු එකඟතාවක් ඇතිකර නොගනිමින් අදාළ භූමිය ඔවුන්ගේ හිතුමතයට හිතවතුන්ට වෙළෙඳසල් ඉදිකර ගැනීමට අයතා අන්දමින් ලබාදී ඇති අතර ඒ සම්බන්ධයෙන් ආණ්ඩුකාර මහීපාල හේරත් මහතාට අවස්ථා කිහිපයකදී ජනතා පෙත්සම් යොමුවීම සම්බන්ධයෙන් අවධානය යොමු කර ප්‍රාදේශීය ලේකම්වරයාට නීතිමය පියවර ගන්නා ලෙසත් එහි ප්‍රගතිය මාසිකව ලබා දෙන ලෙසත් දන්වා තිබේ.

නවරත්න සමරතුංග - දමන විශේෂ

දමන ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලයේ නිලවරණය

දමන ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලයේ නිලවරණය පසුගියදා (24) දමන ප්‍රාදේශීය ලේකම් උදාර නානායක්කාර මහතාගේ ප්‍රධානත්වයෙන් එහි ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. දමන දකුණු ඉවුරේ විහාරස්ථානවල විහාරාධිපතිවරුන් සහ දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන් මේ අවස්ථාවට සහභාගි වී සිටියහ. එහිදී ඉදිර වසර තුනක් සඳහා නව නිලධාරී මණ්ඩලයක් තෝරා පත්කර ගත් අතර හිටපු ලේඛකාධිකාරි ශාස්ත්‍රපති ඇතිමලේ ආනන්ද හිමියෝ නිතරගයෙන් නැවතත් ලේඛකාධිකාරි ධුරයේ හොබවනු ලැබීම විශේෂ සිද්ධියක් විය. සභාපති ධුරය සඳහා නැඟෙනහිර පළාත් සංඝනායක තලාගංගොඩ ධම්මරතන හිමියෝ පත් වූහ.

සුනිල් ප්‍රනාන්දුපුල්ලේ - වෙන්නප්පුව විශේෂ

මැනෙජර් ගුරුලේත්තුවෙන් ගහලා

කටුනේරිය ලංසිගම ප්‍රදේශයේ පවත්වාගෙන යන මූල්‍ය සමාගමක සේවයේ නියුතු කාර්යාල මිතුරන් අතර හුවමාරු වුණු ජංගම දුරකතන විවේචනයක් නොරිස්සූ එහි කළමනාකාරිනියක් එක් නිලධාරිනියකට වතුර පිරි ගුරුලේත්තුවකින් හිසට පහරදීම හේතුවෙන් ඇය සිහි නැතිව පසුගියදා මාරවිල රෝහලට ඇතුළත් කර ඇතැයි මාරවිල පොලිසිය ප්‍රකාශ කළේය. මේ පහරදීමෙන් තුවාල ලබා මාරවිල රෝහලට අතුළත් කර ඇත්තේ ලංසිගම පදිංචි කාවින්දි චමෝදි මහේෂිකා නමැත්තියකි. පොලිසියට ඇය කර ඇති පැමිණිල්ලේ සඳහන් වන්නේ මේ පහරදීමෙන් පසු තවත් තරුණියන් දෙදෙනකු තමන්ට පහරදීම කළ බව හා තරුණියන් 04 දෙනෙක් නැවත තමාට පහරදීමට පැමිණෙනු දැක තමන් පහත මාලයේ පිහිටි රෙදි වෙළෙඳසලකට දිවගොස් සැඟවී සිටි බවත්ය. එම රෙදි වෙළෙඳසලේ ඇති සී.සී. ටී.වී. කැමරා මඟින් මේ පහරදීම මනාව සනාථ වන බව ද මාරවිල පොලිසිය ප්‍රකාශ කළේය. අදාළ කළමනාකාරිනිය තමන්ට පහරදීමෙන් පසු "මං කෑගල්ලේ එකෙක්. මා ගැන ඒ පැත්තට ගිහින් අහගනින්" කියා තමාට ඇය තර්ජනය කළ බව ද පොලිස් පැමිණිල්ලේ සඳහන්ව ඇත. මේ පහරදීම සම්බන්ධව අදාළ මූල්‍ය ආයතන බලධාරීන් මෙතෙක් විධිමත් පරීක්ෂණයක් කර නොතිබීම පුදුමයට හේතුවක් බව පහරකෑ අයගේ මවුපියෝ කියා සිටිති.

බී. එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

රබෙට්ටුකුලම බෝධිමළු විහාරාධිපතිගේ හදිසි අපවත්වීම සැකයක්

ගල්ගමුව රබෙට්ටුකුලම බෝධිමළු විහාරස්ථානයේ විහාරාධිකාරි හිමිපාණන්ගේ හදිසි අපවත් වීම පිළිබඳව දැඩි සැකයක් පවතිනා බවට උන්වහන්සේගේ ගෝල හිමිවරු මව්පියන් හා ඥාතීන් අනුරාධපුර නාගරික හදිසි මරණ පරීක්ෂකවරයා හමුවේ පැවසීමත් සමඟ දේහය ආදාහනය කිරීම වහාම වළක්වා දේහය විහාර මළුවේ භූමදානය කරනා ලෙස නාගරික හදිසි මරණ පරීක්ෂක ජේ. එම්. ජයතිලක මහතා පසුගියදා (28) සවස නියෝග කළේය. ගල්ගමුව රබෙට්ටුකුලම බෝධිමළු විහාරස්ථානයේ විහාරාධිකාරි ගල්ගමුව ශාසනාරක්ෂක බල මණ්ඩලයේ නියෝජ්‍ය ලේඛකාධිකාරි තඹුත්තේගම සුමනරතන (38) හිමියන්ගේ හදිසි අපවත්වීම පිළිබඳව දැඩි සැකයක් පවතිනා බව පවසමින් දිවුරුම් ප්‍රකාශ කිහිපයක් නාගරික හදිසි මරණ පරීක්ෂකවරයාට යොමුවීමත් සමඟ ආදාහනය වැළැක්වීමට ඒ මහතා පියවර ගනු ලැබීය.

අපවත්වූ හිමිපාණන් පසුගියදා (25) හදිසියේ වමනය ඇති වීම හේතුවෙන් ගල්ගමුව රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව වහාම වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර ශික්ෂණ රෝහලට ගිලන් රථ මඟින් එවීමට ගල්මුව රෝහල් බලධාරීන් පියවර ගෙන තිබිණි. උන්වහන්සේ දින

දෙකකට වැඩි කාලයක් රෝහල් දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටියදී හදිසියේම අපවත්විය. අධිරුධිර පීඩනය හේතුවෙන් මොලයේ නහරයක් පිපිරීම නිසා මරණය සිදුව ඇති බවට අනුරාධපුර ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍ය එච්. ඒ. කරුණාතිලක මහතා පැවැත්වූ පශ්චාත් මරණ පරීක්ෂණයෙන් අනාවරණය කර තිබිණි.

එක් පාර්ශ්වයක් උන්වහන්සේගේ අපවත් වීම පිළිබඳව කිසිදු සැකයක් නැති බව කියමින් හදිස්සියෙන් දේහය ගල්ගමුවට රැගෙන යෑමට කටයුතු කර දෙන ලෙස ඉල්ලා සිටි අතර අපවත්වූ හිමියන්ගේ ගෝලයන්වූ ඥාති ස්වාමීන්වහන්සේලා කිහිප නමක් ඊට විරෝධය පළ කරමින් දේහය ආදාහනය වළකනා ලෙස ඉල්ලා නියෝගයක් නිකුත් කරනා ලෙස නාගරික හදිසි මරණ පරීක්ෂකවරයාගෙන් ඉල්ලා සිටියහ.

දික්වැල්ලේ තිලකරත්න - ගාල්ල උතුර සමූහ

පෙට්ටිගලවත්තේ සමෘද්ධිලාභීන්ට මාස හතරකින් දීමනා නෑ

ගාල්ල පෙට්ටිගලවත්ත සමෘද්ධි බැංකුවෙන් සමෘද්ධිලාභීන්ට මාස හතරක කාලයක් තිස්සේ සමෘද්ධි දීමනා දී නැති බවට සමෘද්ධිලාභීහු මැසිවිලි නගති. මේ බැංකුවෙන් දීමනා ලබාගන්නා පිරිස 2,153කි. මෙසේ දීමනා පමාවීමට හේතුව බැංකුවේ කටයුතු පරිගණකගත කිරීම බව නිලධාරීහු පවසන බව සමෘද්ධිලාභීහු කියති.

සමෘද්ධිලාභීන් 2,153කගේ නම් පරිගණකගත කිරීමට මාස හතරක කාලයක් ගතවීම පුදුමසහගත බව සමෘද්ධිලාභීහු පවසති. මේ පිළිබඳව ගාල්ල දිස්ත්‍රික් සමෘද්ධි කොමසාරිස් දිස්නා විතානගේ මහත්මියගෙන් කළ විමසීමකදී ඇය කියා සිටියේ මේ පිළිබඳව සොයා බලා නිසි පියවර ගන්නා බවයි. පෙට්ටිගලවත්ත සමෘද්ධි බැංකුවේ කළමනාකරු වසන්ත ප්‍රේමලාල් මහතා පැවසුවේ ජනවාරි පෙබරවාරි මාසවල දීමනා දීමේදී ප්‍රමාදයක් සිදු වූ බවත් මේ වන විට දීමනා ගෙවීමට කටයුතු යොදා ඇති බවයි.

ගයාන් සංජය

ව්‍යාජ අංක තහඩු 12ක් එක්ක වාහන 02ක් අත්අඩංගුවට

යක්කල අලුත්ගම බෝගමුව ප්‍රදේශයේ පවත්වාගෙන ගිය ලැගුම්හලක තිබි ව්‍යාජ අංක තහඩු තොගයක් සමඟ කාරයක් හා යුද හමුදා වෙන්දේසියකින් ලබා ගත් බවට සැක කරනා ජීප් රථයක් අත්අඩංගුවට ගැනීමට ගම්පහ මූලස්ථාන පොලිසියේ නිලධාරීන් පසුගියදා (01) සමත් වී තිබේ.

අත්අඩංගුවට ගන්නා ලද කාර් රථය කොටස් එකලස් කර සදා ඇති බවට පරීක්ෂණවලදී අනාවරණය වී ඇති අතර අත්අඩංගුවට ගත් සැකකරු පනස්හය හැවිරිදි පුද්ගලයෙකි. මෙලෙස ව්‍යාජ අංක තහඩු යොදා ගනිමින් කිසියම් ජාවාරමක නිරත වී ඇති බවට සැක කරනා අතර වැඩිදුර පරීක්ෂණ ගම්පහ පොලිසිය මඟින් සිදු කරයි. මෙහිදී වාහන 07කට අදාළ ව්‍යාජ අංක තහඩු අත්අඩංගුවට ගෙන ඇති අතර එම අංක සමාජයේ අවධානය නොගැටෙනා පරණ අංක යොදා ගනිමින් සාදා තිබේ.

ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඉන්දික ද සිල්වා මහතාගේ උපදෙස් මත සහකාර පොලිස් අධිකාරි i තුසිත කුමාර, ගම්පහ මූලස්ථාන ප්‍රා.පො.ප. සමන් ජයසිංහ යන මහත්වරුන්ගේ මෙහෙයවීමෙන් බස්නාහිර පළාත් බුද්ධි අංශයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක කරුණාරත්න, දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති බිනුර රණසිංහ, උ.පො.ප. වික්‍රමසිංහ, පො.සැ. (52292) ජයන්ත, පො.කො. වරුන් වන (89114) රූපසිංහ, (79977) රාජකරුණා, (94007) ප්‍රියන්ත, (10098) මංජුල, (83391) නිශ්ශංක, පො.සැ.රි. (34508) බංඩාර යන නිලධාරි එක් වූහ.

ඩී. එස්. ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

සමෘද්ධිලාභී පවුල්වලට නිවාස ආධාර

බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමෘද්ධිලාභී පැල්පත්වාසී පවුල් සඳහා සමෘද්ධි අධිකාරිය මඟින් රුපියල් ලක්ෂ දෙක බැගින් නිවාස ආධාර දීමට පියවර ගෙන තිබේ. මේ වැඩසටහන යටතේ ඉදි කළ නව නිවාස දෙකක් නිවාසලාභී පවුල්වලට භාර දීම සහ ඉලුකපතන, නාගල, අඹගොල්ල, රදලියද්ද, කරාඩුගල සහ බොකාගොන්න යන ගම්මානවල පැල්පත්වාසී පවුල්වලට මුදල් ආධාර පිරිනැමීම පසුගියදා (28) සිදු කෙරිණි.

මේ අවස්ථාවට සහභාගි වූ අධ්‍යාපන රාජ්‍ය ඇමැති විජිත බේරුගොඩ මහතා අලුතෙන් ඉදි කළ නව නිවෙසක් විවෘත කළ අයුරුයි මේ.

සෞභාග්‍යය ළඟා කරන විදුලි පිම්ම

මිනිස් ජීවිතයේ මූලික අවශ්‍යතා ලෙස මීට වසර 30කට 40කට පෙර හඳුනා ගත්තේ ආහාර, නිවාස, ඇඳුම් පැළඳුම් ආදී මූලික සාධකයන් පමණක්ම ය. ප්‍රධාන අපනයන ආර්ථිකය රැඳී පැවතුනේ තේ, රබර්, පොල් ය. එහෙත් අද වන විට ලෝකය සේම මෙරට ද අවශ්‍යතා හා ආර්ථික වටිනාකම් වෙනස් වෙමින් පවතී. අද මුළු ලොවම මූලික අවශ්‍යතා ශ්‍රේණියේ ඉහළ දර්ශකයක් බවට පත්ව ඇත්තේ බලශක්තියයි.

ජල විදුලියෙන් දේශයේ බලශක්ති පරිවර්තනය ඇරඹෙන්නේ 1950 දීය. එවකට ජනගහනය හා කර්මාන්ත අවශ්‍යතාවන් සපුරාලීමට එය ප්‍රමාණවත් වුව ද සීඝ්‍රයෙන් සිදු වූ නාගරීකරණය හා කාර්මීකරණ අභියස දේශීය විදුලි ඉල්ලුම ක්‍රමයෙන් වැඩි විය. ලෝකයේ බලශක්තියේ ඉල්ලුම ඉහළ යන විට මෙරට බලශක්තිය අර්බුදයක් කරා ගමන් කළේය.

ජල විදුලිය මත පමණක් යැපෙමින් දිනෙන් දින වැඩිවන විදුලි ඉල්ලුමට පිළිතුරු දීමට ඓතිහාසික දේශපාලන භාවිතයේ ප්‍රායෝගික විකල්ප උත්සාහයන් වෙත යොමු වූයේ වත්මන් අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන් විසින්, මීට දශක 2කට ආසන්න කාලයක සිටය. එතුමන් හෙට දවස වෙනුවෙන් දේශීය බලශක්ති අවශ්‍යතාව මැනවින් වටහා ගෙන තිබුණ බව පැහැදිලිව දක්නට ලැබෙන්නේ ය. ඒ නිසාම දිනෙන් දින ඉහළ යන විදුලිබිල පාලනය කරමින් ජනතා සහන ලබාදීම සඳහා දේශයේ වේගවත් සංවර්ධනයට පිටිවහලක් වන බලශක්තිය පිළිබඳ නිවැරදි අවබෝධයක සිටි බව එතුමන් එදා සිට අද දක්වා ගෙන ඇති ක්‍රියාමාර්ග දෙස බැලීමේ දී හොඳින්ම අවබෝධ වේ.

නොයෙක් විරෝධතා මැද නොරොච්චෝලේ ගල්අඟුරු බලාගාරය අරඹන්නේ මේ අභියෝගයට එක් විසඳුමක් ලෙසය. එමගින් පසුගිය කාලයන් හි ඇති වූ මහා නියගයන් හමුවේ ජාතික විදුලිබල පද්ධතිය සමබර කර ගැනීමට විශාල පිටුබලයක් ලැබිණ. එහි අඩුපාඩු සකසමින් ඉදිරියට යන අතරතුර ජාතික බලශක්ති පද්ධතිය ස්ථාවර කිරීම සඳහා තව තවත් විකල්ප ව්‍යාපෘති කෙරෙහි එතුමන් අවධානය යොමු කළේය. ඒ අනුව ලංකාවේ ප්‍රථම තාප බලාගාරය ආරම්භ කිරීම, ලංකාවේ ප්‍රථම සුළං විදුලි බලාගාරය ඇරඹීම, ලංකාවේ ප්‍රථම සූර්ය ශක්ති විදුලි නිපදවීම හා ලංකාවේ ප්‍රථම ඝණ අපද්‍රව්‍ය විදුලි බලාගාරය ආරම්භ කිරීමත් මෙරට බලශක්ති ක්ෂේත්‍රයේ සුවිශේෂී ක්‍රමෝපායන් හි අග්‍රඵල ලෙස පෙන්වා දිය හැකිය.

බොහෝ නායකයින් කතාවට පමණක් සීමා වූ කෙස් පැලෙන තර්ක ඉදිරිපත් කරමින් කල් මැරීමට දේශපාලන දිවිය සුඛවිහරණයට පමණක් යොදා ගත් කල, දේශයේ මහ පොළවට දායාද කළ සැබෑ ජීවමාන ව්‍යාපෘතියන්හි විප්ලවය ඇති කළේ මහින්ද රාජපක්ෂ ශ්‍රීමතාණන් විසිනි. ඒ එතුමන් තුළ පැවති දේශපාලන, සමාජීය හා සංස්කෘතික දුර දැක්ම හේතුවෙනි.

මෙතෙක් ශ්‍රී ලාංකේය බලශක්ති ක්ෂේත්‍රයේ සිදු කළ ඉදිකිරීම් හා ව්‍යාපෘතීන් දෙස බලන විට පරිසර හිතකාමී ජාත්‍යන්තර ප්‍රමිතීන් හි ඉහළම තාක්ෂණයෙන් අද දින ඉදිකිරීම් ඇරඹෙන්නේ මෙරට විදුලි බලශක්තියේ අති දැවැන්ත පරිවර්තනයකි. කෙරවලපිටිය ඉදිකෙරෙන ස්වභාවික ද්‍රව වායු බලාගාරය වසර 03ක් ඇතුළත සම්පූර්ණයෙන් ඉදිකිරීම් අවසන් වන අතර පළමු අදියර මාස 21කදී අවසන් වේ. පළමු අදියර තුළ ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 200ක් එක්වන අතර දෙවන අදියර වසරක් තුළ පමණක් මෙගාවොට් 100ක් ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීමට නියමිතය.

ස්වභාවික ද්‍රව වායු බලාගාරය (LNG - Liquefied Natural Gas) මඟින් ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීමට අපේක්ෂිත මෙගාවොට් ප්‍රමාණය 300කි. එය මෙරට දෛනික විදුලි පරිභෝජනයේ අපේක්ෂා මල්ඵල ගන්වන ඇරඹුමකි. දේශීය ඉංජිනේරුවන් විසින් සමස්ත බලාගාරයේ ඉදිකිරීම් සිදු කිරීම මෙහි විශේෂත්වයකි. මෙරට විදුලි බලාගාරයක් තුළ සවි කෙරෙන ඉහළම කාර්යක්ෂමතාවයෙන් යුතු "එෆ් කාණ්ඩයේ ගෑස් ටර්බයිනය" මෙහි ස්ථාපනය කිරීම ද විශේෂත්වයකි. නව බලාගාරය මඟින් මෙරට වත්මන් විදුලි ඉල්ලුමෙන් 13%ක් හෙවත් ඒකක 2000ක් නිපදවෙන අතර වාර්ෂිකව රටට අත් වන වාසිය බිලියන 12කි. රටේ අනාගත සංවර්ධනය වෙනුවෙන් අඩු පිරිවැය සහිත විදුලි උත්පාදන හා නඩත්තු පිරිවැය අවම විදුලි බලාගාර ඉදිකිරීම මෙරට බලශක්ති අවශ්‍යතාව සපුරාලීමටත් ජනතා මුදල් නාස්තිය වැලකීමටත් එමඟින් සුවිශාල පිටිවහලක් අත්වන අතර පරිසර හිතකාමී වීමත් මෙහි ඇති සුවිශේෂී ලක්ෂණයකි.

වත්මන් විදුලිබල අමාත්‍යවරයා විසින් සමස්ත බලශක්තිය කළමනාකරණය සඳහා විධිමත් වැඩපිළිවෙළක් සකස් කිරීම තුළ කෙටි කාලීනව දේශයේ බලශක්ති අවශ්‍යතාව බලගැන්වීම ආරම්භ වී ඇත. කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන සැලසුම් අනුව එතුමන් තම විද්‍යාත්මක හැදෑරීම ජනගත කරමින් සිටී. ඒ අනුව මෙතෙක් ආරම්භ කර නවතා දමා තිබූ ව්‍යාපෘති වේගවත්ව අවසන් කිරීමත්, ස්වභාවික ජල විදුලි බලාගාර ක්‍රමවත් හා නවීකරණය කිරීමත්, හදිසි අවශ්‍යතා සඳහා තාප හා සූර්යශක්ති බලාගාර ග්‍රාමීය ප්‍රදේශ මුල් කරගනිමින් ස්ථාපිත කිරීමත්, පරිසර හිතකාමී දිගුකාලීන ස්වභාවික වායු සුළං, සූර්ය මුල්කරගත් බලශක්ති බලගැන්වීම ආරම්භ කිරීමත් ඉන් ප්‍රධාන අංග කීපයකි. එහි ප්‍රතිඵලයක් ලෙස මසක් ඇතුළත විදුලි බලාගාර 03ක් ජනගත කිරීමට හැකිවිය.

"සැමට විදුලිය" යන සංකල්පය යටතේ මේ වන විට අඩු ආදායම්ලාභීන් සඳහා නොමිලේ විදුලිය ලබා දීම, නොමිලේ නිවස තුළ විදුලි රැහැන් ගත කිරීමත් අනෙක් අතින් විදුලි පරිභෝජනය හරවත් ලෙස යොදා ගැනීමත්, අර පිරිමැස්ම සඳහා ජනතාව දැනුවත් කිරීමත්, ජනතා සහන සඳහා නව තාක්ෂණය මඟින් ජනහදට ලංවීම වැනි (CEB care) වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් මෙරට විදුලි පාරිභෝගිකයා දිරිගන්වමින් බලශක්ති නව ලොව දැකීමට අවැසි නව බලශක්ති ජනනය නොකඩවා ඉදිරියට ගෙනයන බවත් එමඟින් මහින්ද චින්තන ඉදිරි දැක්ම සෞභාග්‍යයේ දැක්මක් ලෙස ජනහදට ලංවීම බව විදුලිබල අමාත්‍යවරයාගේ අදහස වේ.

විශාරද සමන් දිසානායක

ඌවේ පිබිදෙන

නව ව්‍යවසායකයන් සොයා RDB ගමට

ග්‍රාමීය මට්ටමින් කාන්තා හා තරුණ ව්‍යවසායකයන් බිහි කිරීම සඳහා 2021 අයවැයෙන් රජය කළ යෝජනා බලගැන්වෙන "සෞභාග්‍ය සතිය" ජාතික වැඩසටහන මේ දිනවල ක්‍රියාවට නැංවේ. ඊට සමගාමීව ඌව පළාතේ පිබිදෙන නව ව්‍යවසායකයන් සොයා ගොස් ඔවුන්ට අවශ්‍ය මූල්‍ය ප්‍රදානයන්ට අමතරව සෙසු සේවා සැපයීමේ නිරීක්ෂණ චාරිකාවක් ඉකුත්දා සිදුවිය. ඊට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සභාපති මහින්ද සාලිය, ඌව පළාත් ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරි සුමනදාස වික්‍රමසිංහ, සහකාර සාමාන්‍යාධිකාරිවරුන්, බදුල්ල දිස්ත්‍රික් ප්‍රධාන කළමනාකරුන් රංජිත් කුමාර යන මහත්වරුන් ප්‍රමුඛ බැංකුවේ ඌව පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල දෙකෙහි බැංකු නිලධාරීන් සහ ශාඛාවන්හි කළමනාකරුවන් ප්‍රධාන නිලධාරීහු ද සහභාගී වූහ.

ශ්‍රී ලංකාවේ රමණීය කඳුරට ප්‍රදේශයේ වර්ග කිලෝමීටර් 2861ක භූමි ප්‍රදේශයක පැතිර ඇති බදුල්ල දිස්ත්‍රික්කයෙහි ජනගහනය 8,15,405කි. බදුල්ල දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාස නවයෙහිම පැතිර ඇති කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා අංශ ප්‍රධාන කොට ගත් නව ව්‍යවසායක පිරිස් හමුවීම ඉලක්ක කොට ඇත. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15 පිහිටි ග්‍රාම නිලධාරි වසම් 567 හි පදිංචිකරුවන් අතරින් නව ව්‍යවසායකයින් සහ සුළු හා මධ්‍ය පරිමාණ පමණක් නොව දිරිමත් මහා පරිමාණ ව්‍යවසායකයින් සොයා යෑමට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සැලසුම්කොට තිබේ. ඒ අනුව යමින් RDB බැංකුව දිනෙන් දින තරඟකාරී සහ නව්‍යකරණයෙන් යුතු අධිතාක්ෂණික පහසුකම්වලින් සපිරි බැංකු සේවා ජනතාවට පිරිනැමීමට කටයුතු කරන බව අප හමු වූ ගනුදෙනුකරුවෝ ප්‍රකාශ කර සිටියහ.

කෘෂිකාර්මික, කාර්මික සේවා සැපයීමක් වඩාත් ඉහළ ගුණාත්මක භාවයකින් යුක්තව එය ඉටුකිරීම ව්‍යාපාරික ලෝකයේ පමණක් නොව සාමාජීය වශයෙන් ද ජයග්‍රහණ අත්කර ගැනීමට හේතුවකි. ඌවපරණගම ප්‍රාදේශීය සංවර්ධන බැංකු කළමනාකාරිණී සමන්ති ධනපාල මහත්මිය සංවිධානය කර තිබූ ව්‍යාපාරික, ගනුදෙනුකාර හමුවක් පැවැත්විණි. ඉන් අනතුරුව නව තාක්ෂණය සහ නව කෘෂිකාර්මික ක්‍රමවේද ඔස්සේ කෘෂිකාර්මික කටයුතුවලට යොමුවී සිටින ව්‍යවසායක ගොවීන් හමුවීමට පියවර ගත්හ. බදුල්ල, අඹගස්දෝව, කුරුඳුගොල්ල, වදගොල්ල පතන, එස්. එච්. එම් දයානන්ද, කුරුඳුගොල්ල අඹගස්දෝව එස්. එච්. එම්. බී පද්මසිරි, ගොවි ව්‍යවසායක ජයසිරි ගුණතිලක, රංජිත් සමරසේකර, හරිතාගාර කෘෂිකර්මාන්තයේ නිරත ප්‍රමුඛයකු වන ලීලාරත්න තරුණ ගොවීහු ද අප සමඟ අදහස් දැක්වූහ.

ඌව පරණගම, බණ්ඩාරවෙල, හපුතලේ හරිතාගාර කෘෂිකර්මාන්තයක නිරත පිරිස අද වන විට දියුණු ආර්ථික හැකියාවක් ලබා ගත්තන් බවට පත්ව ඇත්තේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සැපයූ මූල්‍ය ආධාර සහ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පාලනය වන කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන (SAPP) හි ඌව සහ නැඟෙනහිර පළාත් උපදේශක අනිල් ජයවර්ධන මහතා ඇතුළු පිරිස ලබාදෙන ඉහළ මඟපෙන්වීම නිසාය.

දිනෙන් දින කෘෂිකර්මාන්තයෙන් ඈත්වන තරුණ ප්‍රජාව නැවත වතාවක් වාණිජ කෘෂිකර්මාන්තය කරා රැගෙන ඒමට සහ ඔවුන්ට ඒ තුළින් ඉහළ ආදායම් මාර්ග ඇතිකර ගැනීමට විවිධ වූ වැඩසටහන් ක්‍රියාත්මක කරන කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන යටතේ මේ වන විට බදුල්ල දිස්ත්‍රික්කයේ දහසක් දෙනා බලගැන්වී ඇතැයි සඳහන් කළ හැකිය.

ඌව පරණගම සපුගොල්ල ප්‍රසන්න තිලකරත්න හවානා කුඹුර යල්පත් වෙල වැලිමඩ මනෝජා ප්‍රශාන්ති යන දිරිමත් ව්‍යවසායක ප්‍රජාව ද අප හමු වී ඔවුන්ගේ සාර්ථකත්වයේ රහස් එළිදරවු කළේය. ඊට අමතරව දිරියෙන් ඉදිරියට ඒමට අවශ්‍ය උපකාර කිරීම පිළිබඳ ව ද අදහස් දැක්වූහ. ශ්‍රී ලංකාව දියර කිරෙන් ස්වයංපෝෂිත කිරීමේ අරමුණින් 2021 අයවැයෙන් රජය යෝජනා කළ කිරි ගොවීන් සඳහා අඩු පොළියට ණය ලබාදීමේ RDB කිරි ශක්ති ණය යෝජනා ක්‍රමය යටතේ මේ වන රටපුරා ක්‍රියාත්මක වේ. එහිදී විශේෂයෙන් ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ පශු සම්පත් හා සත්ත්ව පාලන ක්ෂේත්‍රයේ දියුණුවට අලුතින් පිරිස් එක්කර ගැනීමට RDB කිරි ශක්ති ණය මුදල් ප්‍රදානය කිරීම කරගස්වගුර, කැප්පිටිපොළ රිච් ඩේරිස් ආයතනය හා සම්බන්ධිත කිරි ගොවීන්ගේ සහභාගිත්වයෙන් සිදු කෙරිණි.

ජාතික ආර්ථික සංවර්ධනයට කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්ක 3 ඇතුළත් බස්නාහිර පළාතේ දායකත්වය ලැබී තිබෙනුයේ සෙසු පළාත්වලට වඩා වැඩි වශයෙනි. එනමුත් ජාතික ආර්ථික සංවර්ධනයට මෙරට පළාත් 9යෙහිම දායකත්වයක් සහ සහභාගිත්වයක් සහිත තිරසාර වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු යැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහ අගමැති හා මුදල් ඇමැති මහින්ද රාජපක්ෂ මහතා නායකත්වය දරන රජයේ අරමුණ වී තිබේ. 'සෞභාග්‍යයේ දැක්ම' ජාතික ප්‍රතිපත්ති වැඩපිළිවෙළ සම්පාදනය වී තිබෙනුයේ ද රටපුරාම එක සේ විහිදුනු ජනතා සහභාගිත්ව සංවර්ධනයක් ඔස්සේ සමාජ, ආර්ථික, දේශපාලන පිබිදීමක් ඉලක්කකොට ගෙනය. එලෙස වඩාත් ශක්තිමත් වූ පළාත්බද දායකත්වයක් තුළ රටේ දියුණුව අපේක්ෂා කරන වත්මන් රජය විශේෂයෙන් ඌව පළාතේ නවෝත්පාදන, සාම්ප්‍රදායික යැපුම් කෘෂිකාර්මික, කාර්මික සහ සේවා සැපයීම් මට්ටමින් ඉහළට ගොස් ජාතික ආර්ථිකය බලගැන්වීමට සිදුකළ යුතු මඟපෙන්වීම ලබාදීම ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කාර්යභාරය ජනතාවට පැහැදිලි කර දීම මෙම නිරීක්ෂණ චාරිකාවේ එක් අරමුණක් විය.

මෙවැනි වැඩසටහනක් ආරම්භ කරමින් ග්‍රාමීය ජනතාවගේ ආර්ථික තත්ත්වය සහ ජීවනෝපාය මාර්ග සවිබල ගැන්වීමට ක්‍රියා කරන්නැයි 'සෞභාග්‍ය සතිය' ජාතික වැඩසටහන පිළිබඳව දැනුම්වත් කිරීමේ අවස්ථාවන්ට එක්වූ ආර්ථික පුනර්ජීවනය දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධක බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතා ප්‍රකාශ කළේය.

මුළු රටම ආවරණය වන පරිදි ශක්තිමත් දෙපාර්තමේන්තුවක් ලෙස ක්‍රියාත්මක වන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා මෙන්ම මෙරට සංවර්ධන බැංකුකරණයේ 'මහගෙදර' නම්ලත් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව තුළින් අයවැය යෝජනා ගණනාවක් මේ සතිය තුළ ක්‍රියාවට නැංවෙන බව ද බැසිල් රාජපක්ෂ මහතා මෙහිදී කියා සිටියේය.

ග්‍රාමීය ආර්ථිකය සවිබලගැන්වීම තුළින් අඩු ආදායම්ලාභී, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විශාල පිරිසක් ශක්තිමත් ජීවනෝපායක් සහිත ආදායම්ලාභීන් බවට පරිවර්තනය කිරීමට ඉවහල් වන යෝජනා මේ සතිය තුළ ක්‍රියාත්මක කෙරේ. මෙහිදී ගම්මට්ටමේ කාන්තා තරුණ ව්‍යවසායකයින් බිහිකිරීමට අදාළ වන පුහුණුව, උපදේශන වැඩසටහන්, මූල්‍ය ප්‍රදානයන් ඇතුළු සම්පත් භාවිතයේ උපරිම ඵල නෙලා ගන්නා ආකාරය සහ ධනාත්මක සිතුවිලි ආකල්ප ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

සමෘද්ධි, ගෘහආර්ථික, ජීවනෝපාය සංවර්ධන, ක්ෂුද්‍ර මූල්‍ය, ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය ඇමැති ෂෙහාන් සේමසිංහ මහතා ප්‍රධාන එම අමාත්‍යාංශය හා ඊට අදාළ දෙපාර්තමේන්තු වැඩපිළිවෙළ සංවිධානය කොට මෙහෙයවනු ලබයි. මේ යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ද රට පුරාම විශේෂ වැඩපිළිවෙළ ගණනාවක් ක්‍රියාත්මක කිරීමට සූදානම් වී සිටිති.

ශ්‍රී ලංකාවේ ව්‍යවසායකයින් දිරි ගැන්වීමේ අරමුණින් RDB බැංකුව විසින් "සෞභාග්‍ය සතිය" වැඩසටහන තුළ සෑම දිස්ත්‍රික්කයකටම සංවර්ධන ණය සියයක් ලබාදීම, කිරි ශක්ති වැඩසටහන දියත් කිරීම, නව ව්‍යවසායකයින් දහදාහක් ගොඩනැඟීම, කාන්තා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් දියත් කිරීම යනාදී බොහෝ දේ ක්‍රියාත්මක කරන බව බැංකුවේ සභාපති මහින්ද සාලිය මහතා ප්‍රකාශ කළේය.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට සේවා ලබා දෙන Sailama.lk නමින් වෙබ් අඩවියක් දියත් කර සුළු ව්‍යාපාරිකයන් සඳහා ඔවුන්ගේ භාණ්ඩ අලෙවි කිරීමට ද අවස්ථාවක් සලසා දීමද මෙහි දී සිදු කෙරේ.

ඊට අමතරව ආබාධිත ව්‍යවසායකයන් බලගැන්වීමේ වැඩසටහනක් ද, සමාජ ආරක්ෂන මණ්ඩලය සමඟ දියත් කරන විශ්‍රාම වැඩසටහන, උතුරු පළාත සංවර්ධනය සඳහා විශේෂ ණය වැඩසටහනක් සහ සංවර්ධන සටනක් දියත් කිරීම ද මේ යටතේ සිදුවන අතර ඉහත කී වැඩසටහන දිවයින පුරා විහිදුනු ශාඛා 276 පුරා ක්‍රියාත්මක කිරීමට ද සියලු කටයුතු සංවිධානය කර ඇත..

ජයසිරි මුණසිංහ

ඉතිහාසයේ මුල්වරට ක්‍රීඩා දියුණුවට උපාය මාර්ග සිතියමක්

පදක්කම් දිනන වේදිකාවක් හදන්න ක්‍රීඩා සභාවෙන් දැවැන්ත සැලැස්මක්

ජාතික ක්‍රීඩා සභාවේ සභාපති හිටපු ක්‍රිකට් නායක මහේල ජයවර්ධන මහතා අදහස් දක්වමින්.

වැය ශීර්ෂයෙන් සියයට 20ක් සෘජුවම ක්‍රීඩකයන්ට

වොලිබෝල් පිටි 22ක්: ජාතික ක්‍රීඩා දත්ත පද්ධතියක්

රට පුරා අලුත් ක්‍රීඩා සංකීර්ණ: පිහිනුම් තටාක සමඟ ක්‍රීඩාංගණ

ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා ජාතික ක්‍රීඩා සභාව සකස් කළ ක්‍රීඩා උපාය මාර්ග සැලසුම පිළිබඳ පැවැති මාධ්‍ය හමුවේදී අදහස් දක්වමින්. ඡායාරූප - තුෂාර ප්‍රනාන්දු

ප්‍රින්ස් ගුණසේකර

ශ්‍රී ලාංකේය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අනාගතයේ අන්තර්ජාතික පදක්කම් දිනා ගත හැකි අයුරින් අදියර කිහිපයක් යටතේ දැවැන්ත සැලසුමක් ක්‍රියාත්මක කිරීමට ක්‍රීඩා අමාත්‍යාංශය සූදානම් වෙයි. ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතාගේ අදහසක් අනුව හිටපු ක්‍රිකට් නායක මහේල ජයවර්ධන මහතාගේ සභාපතිත්වයෙන් යුත් ජාතික ක්‍රීඩා සභාව මේ සැලසුම සකස් කර ඇති අතර, එය කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීනව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ ක්‍රීඩා ඇමැතිවරයාට උපදෙස් දීම සඳහා වූ ජාතික ක්‍රීඩා සභාවේ නිලධාරීන් මේ අනාගත සැලසුම පෙරේදා මාධ්‍ය හමුවේ එළිදැක්වූ අතර, ඒ අවස්ථාවට ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා ද සහභාගි විය. මේ මාධ්‍ය හමුව ක්‍රීඩා අමාත්‍යාංශයේ ඩන්කන් වයිට් ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

බහුවිධ අංශවල පළපුරුදු වෘත්තිකයන්ගෙන් සමන්විත නව ක්‍රීඩා සභාව සිය වෘත්තිය පුරා අත් කර ගෙන ඇති අත්දැකීම් හා දැනුම මත පදනම්ව අනාගත ක්‍රීඩාව ගොඩනැංවීමට ඉතා කැපවීමෙන් මේ වසරේ ක්‍රීඩා උපාය මාර්ග සිතියම (Sports Strategy - 2021 Road Map) සකසා ඇති බව ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා මේ මාධ්‍ය හමුවේදී පැවසීය. මේ සැලසුම අනුව මේ වසරේ ක්‍රීඩා අමාත්‍යාංශ වැය ශීර්ෂයෙන් සියයට 20ක මුදලක් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට සෘජුවම වැය කිරීමට කටයුතු යොදා ඇතැයි ද ඇමැතිවරයා පැවසීය. එය මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සංවර්ධනය වෙනුවෙන් වසරක වෙන්වූ වැඩිම මුදල් ප්‍රමාණය ලෙස ඉතිහාසගත වනු ඇත.

මේ අවස්ථාවට එක් වූ ජාතික ක්‍රීඩා සභාවේ සභාපති හිටපු ක්‍රිකට් නායක මහේල ජයවර්ධන මහතා පැවසුවේ ක්‍රීඩා අමාත්‍යාංශයට රජයෙන් වෙන්වන මුදලින් සියයට 20ක ප්‍රමාණයක් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සංවර්ධනය වෙනුවෙන් වෙන් කිරීම පෙරළිකාර තීන්දුවක් වනු ඇති බවයි.

"ක්‍රීඩා ඇමැතිවරයා සෘජුවම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සංවර්ධනයට මුදල් වෙන් කළ යුතු බවට තීරණය කිරීම අගය කළ යුතුයි. ලෝකයේ බොහෝ රටවල් ක්‍රීඩාවෙන් ඉදිරියට පැමිණ ඇත්තේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් කේන්ද්‍ර කොට මුදල් වැය කිරීමෙන්. මේ මුදල් ආයෝජනය වන්නේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පුහුණු කටයුතු, මානව සම්පත් සංවර්ධනය, පෞරුෂත්ව වර්ධනය හා පුහුණුකරුවන්ගේ සංවර්ධනය යන අංශ වෙනුවෙන්. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මේ මඟින් හොඳ අවස්ථාවක් උදා වෙනවා ඉදිරියට එන්න. ඔවුන්ගේ කැපවීම හා දක්ෂතා ප්‍රගුණ කර ගැනීම මෙහිදී වැදගත්. මොකද අවසානයේ ක්‍රීඩා පිටියට යන්නේ අපි නොවෙයි. අපි කරන්නේ ඔවුන්ට අංග සම්පූර්ණ වේදිකාවක් තනාදී මඟ පෙන්වීමක් කරන එකයි" මහේල ජයවර්ධන මහතා පැවසීය.

නව සැලසුම යටතේ ඉදිරියේ රට පුරා ජාතික ක්‍රීඩා සංකීර්ණ 4ක් ඉදිවන අතර, දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 12ක්, පාසල් පිහිනුම් තටාක සමඟ ක්‍රීඩාංගණ 8ක් හා වොලිබෝල් ක්‍රීඩා පිටි 22ක් ඉදිකිරීමට කටයුතු යෙදේ. එමෙන්ම ජාතික ඉහළ කාර්ය සාධන උපාය මාර්ග සහ ක්‍රීඩා කාණ්ඩ පද්ධතියක් සකස් කිරීම ද සැලසුම් කර ඇත.

ඉහළ ක්‍රීඩා මධ්‍යස්ථාන සංවර්ධන ආකෘතීන් අතර, දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණය ජාතික ක්‍රීඩා මධ්‍යස්ථානය ලෙස සංවර්ධනය වන අතර පළාත් 9ක පළාත් කේන්ද්‍රීය ක්‍රීඩා මධ්‍යස්ථාන ස්ථාපිත වේ. මේවා සියල්ලම සින්තටික් ධාවන පථ සහිත අංග සම්පූර්ණ ක්‍රීඩා මධ්‍යස්ථාන වනු ඇත.

ජාතික ඉහළ කාර්ය සාධන උපාය මාර්ග සහ ක්‍රීඩා කාණ්ඩ පද්ධතිය යටතේ ඔලිම්පික්, පැරාලිම්පික්, ආසියානු, පොදු රාජ්‍ය මණ්ඩලයීය, ආසියානු පැරා හා ආසියානු වෙරළ ක්‍රීඩා තරගවලදී පදක්කම් දිනාගත හැකි ක්‍රීඩා පළමු කාණ්ඩය යටතට ගෙන ඇති අතර, දෙවැනි කාණ්ඩයට එම ක්‍රීඩා උලෙළවලදී හා තරගාවලිවලදී ඉහළ දක්ෂතා ඇති ඒකළ ක්‍රීඩා 8ක් හා කණ්ඩායම් ක්‍රීඩා 6ක් තෝරා ගෙන ඇත. නැඟී එන ක්‍රීඩා යටතේ තෙවැනි කාණ්ඩය වර්ග කොට ඇති අතර ඒ සඳහා පාසල් මට්ටමේ සිට වයස් කාණ්ඩ 3ක් යටතේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඉදිරියට ගැනීමට කටයුතු යෙදේ. සිව්වැනි කාණ්ඩය යටතේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි අනෙකුත් ක්‍රීඩා ඉදිරියට ගැනීමට අවධානය යොමු කර ඇත.

ඔලිම්පික්, පැරාලිම්පික් හා ලෝක ශූරතාවලි ඉලක්ක කර ගත් ක්‍රීඩාවලදී වැඩි පදක්කම් දිනා ගැනීම උදෙසා දිරිගැන්වීම සහිත තිරසාර හා වැඩි දියුණු කළ ක්‍රියාවලියක් ඇති කිරීමටත්, ඒ අතරම ශ්‍රී ලංකාවේ ඉහළ කාර්යසාධනයක් සහිත ක්‍රීඩාවන් සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් නිර්මාණය කිරීමටත් මේ නව සැලසුමේ අපේක්ෂාවකි.

ජාතික ක්‍රීඩා දත්ත පද්ධතියක් සකස් කිරීම ද ජාතික ක්‍රීඩා සභාව සකස් කළ නව සැලසුමේ ආකර්ෂණීය අංගයකි. දෙස් විදෙස් ක්‍රීඩා තරගවලදී ක්‍රීඩක ක්‍රීඩිකාවන් සෑම ක්‍රීඩා ඉසව්වකදීම දක්වන දක්ෂතා කාර්ය සාධන දත්ත පද්ධතියට එක්වන අතර, එම කාර්ය සාධන දත්ත වරින් වර විශ්ලේෂණය කිරීම හා යාවත්කාලීන කොට අදාළ පරිශීලක කණ්ඩායම අතර බෙදා ගැනීම සිදු වේ. ජාතික ක්‍රීඩා දත්ත පද්ධතියේ රහස්‍යභාව ඉහළම ප්‍රමිතියකින් යුක්ත වන අතර, ගෝලීය දත්ත ආරක්ෂණ නීති යටතේ පරිශීලනය කිරීමට කටයුතු යොදා ඇත.

මේ මාධ්‍ය හමුවේදී ජාතික ක්‍රීඩා සභාවේ සාමාජික කුමාර් සංගක්කාර හා ජූලියන් බෝලිං යන මහත්වරුන් ද අදහස් දැක්වූ අතර, ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමයේ සභාපති මේජර් ජෙනරාල් පාලිත ප්‍රනාන්දු හා ජාතික බර ඉසිලීමේ පුහුණුකරු ආර්. බී. වික්‍රමසිංහ යන මහත්වරු ද තම වාර්ෂික වැඩ සටහන් ඉදිරිපත් කළහ. මේ මාධ්‍ය හමුවට ජාතික ක්‍රීඩා සභාවේ සාමාජිකයෝ හා ක්‍රීඩා අමාත්‍යාංශ නිලධාරීහු පිරිසක් එක්ව සිටියහ.

පොලාඩ්ගේ 6x6න් අකිලගේ කඩුලු ත්‍රිත්වය වැසී යයි

අකිල ධනංජය

කිරන් පොලාඩ්

ජගත් ක්‍රිකට් තරග බිමේ සිය මංගල කඩුලු ත්‍රිත්වය දවා ගනිමින් අකිල ධනංජය දැක්වූ දස්කම් සහ වනිඳු හසරංගගේ විශිෂ්ට පන්දු යැවීම අපතේ යවමින් සංචාරක ශ්‍රී ලංකා කණ්ඩායම සමඟ ඇන්ටිගුවාහිදී පැවැති පළමු විස්සයි20 තරගයෙන් කඩුලු 4ක පහසු ජයක් අත් කර ගැනීමට බටහිර ඉන්දීය කොදෙව් පිල සමත් විය.

මේ සමඟින් තරග 3කින් සමන්විත විස්සයි20 තරගාවලිය 1-0ක් ලෙස පෙරමුණ ගැනීමට සත්කාරකයෝ සමත් වූහ.

කාසියේ වාසිය දිනා පළමුව පන්දුවට පහර දීමට ශ්‍රී ලංකාවට අවස්ථාව දුන් ඉනිම ලකුණු 131ක සීමා කළ කොදෙව් ක්‍රීඩකයෝ පන්දු 41ක් ඉතිරිව තිබියදී ජයග්‍රාහී ඉලක්කය පසු කළේ කඩුලු 6ක් දැවී තිබියදීය.

එවින් ලුවිස් සහ ලෙන්ඩ්ල් සිමන්ස් කොදෙව් ඉනිමට සාර්ථක ආරම්භයක් දුන්නේ පන්දු 20කදී ලකුණු 52ක් රැස් කරමිනි.

මාස 18කට පමණ පසුව පිටියට පිවිසි අකිල ධනංජය සිව්වැනි ඕවරය යවමින් එම සබඳතාව නිමා කළ අතර, එහිදී දෙවැනි, තෙවැනි සහ සිව්වැනි පන්දුවලදී පිට පිට කඩුලු 3ක් ද බිඳ දැමීමට ඔහුට හැකි විය.

ධනුෂ්ක ගුණතිලක උඩ පන්දුවක් රැක ගැනීමෙන් එවින් ලුවිස් ලකුණු 28කට පිටියෙන් ඉවත් කළ අකිලගේ දෙවැනි ගොදුර බවට පත් වූයේ වසර 2කට පසු පිටියට පිවිසි සුපිරි පිතිකරු ක්‍රිස් ගේල්ය. ඔහු මුහුණ දුන් පළමු පන්දුවෙන්ම කඩුල්ල මුවා කිරීමේ වරදට හසු වූ අතර, අකිලට කඩුලු ත්‍රිත්වය හිමිකර දෙමින් නිකලස් පූරන් (0) කඩුලු රකින නිරෝෂන් දික්වැල්ල වෙත උඩ පන්දුවක් දෙමින් දැවී ගියේය.

විස්සයි20 තරග බිමේ ශ්‍රී ලාංකික ක්‍රීඩකයකු කඩුලු ත්‍රිත්වයක් වාර්තා කළ සිව්වැනි අවස්ථාව මෙය වූ අතර, තෙවැනි ශ්‍රී ලාංකිකයා ලෙස අකිල වාර්තා පොතට එක් විය. පන්දු යැවීමේ ඉරියව් සම්බන්ධයෙන් මතු වූ ගැටලුවක් හේතුවෙන් වසරක තරග තහමකින් අනතුරුව අකිල සහභාගිවූ පළමු තරගය ද මෙයයි. මින් පෙර ලසිත් මාලිංග දෙවරක් සහ තිසර පෙරේරා එක් වරක් විස්සයි20 තරගවලදී ත්‍රිත්ව කඩුලු වාර්තා කර තිබිණි.

එහෙත් අකිලට එම සතුට වැඩි වේලාවක් විඳීමට කොදෙව් නායක කිරන් පොලාඩ්ගෙන් අවස්ථාවක් නොලැබිණි. ඔහු අකිල යැවූ ඊළඟ ඕවරයට පිට පිට හයේ පහර 6ක් එල්ල කළේ එක් ඕවරයකදී හයේ පහර 6ක් එල්ල කළ ලොව තෙවැනි පිතිකරු ලෙස වාර්තා අතරට එක් වෙමිනි. මින් පෙර 2007 වසරේ විස්සයි20 ලෝක කුසලාන තරගාවලියේදී දකුණු අප්‍රිකාවේ හර්ෂල් ගිබ්ස් සහ ඉන්දියාවේ යුවරාජ් සිං මේ දස්කම පෙන්වා තිබිණි.

පන්දු 11කින් ලකුණු 38ක් රැස් කළ පොලාඩ් ඉනිමේ 5 වැනි කඩුල්ල ලෙස වනිඳු හසරංග යැවූ 7 වැනි ඕවරයේ සිව්වැනි පන්දුවෙන් දැවී ගිය අතර, ඊළඟ පන්දුවෙන් ෆෙබියන් ඇලන් (0) ද දැවී ගිය පිතිකරුවන් අතරට එක් විය.

ජේසන් හෝල්ඩර් නොදැවී ලකුණු 29ක් රැස් කළ අතර, ඔහු දවා ගැනීමට තිබූ පහසු අවස්ථාවක් ශ්‍රී ලංකා පිලට අහිමි වූයේ මේ තරගයේදී ජගත් විස්සයි20 තරග වරම් හිමිකරගත් අශේන් බණ්ඩාර අතින් උඩ පන්දුවක් ගිලිහී යෑම හේතුවෙනි.

පන්දු යැවීමේදී අකිල ධනංජය සහ වනිඳු හසරංග කඩුලු 3 බැගින් දවා ගත්හ.

සිය මංගල විස්සයි20 තරගයට ක්‍රීඩා කළ පැතුම් නිස්සංක හතරේ පහර 4ක් සහ හයේ පහරක් සමඟ පන්දු 34කින් ලකුණු 39ක් රැස් කරමින් පළමුව පන්දුවට පහර දුන් ශ්‍රී ලංකා ඉනිමේ වැඩිම ලකුණු ලාභියා විය.

ලංකා ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලියේ වැඩිම ලකුණු ලාභියා වූ ධනුෂ්ක ගුණතිලක නිරෝෂන් දික්වැල්ල සමඟින් ශ්‍රී ලංකා ඉනිම ආරම්භ කළ ද ඔහුට රැස් කළ හැකි වූයේ ලකුණු 4ක් පමණි. අනතුරුව දික්වැල්ල සමඟ එක්වූ නිස්සංක ලකුණු 51ක සබඳතාවක් ගොඩනැඟූ අතර, පන්දු 29කින් ලකුණු 33ක් රැස් කළ දික්වැල්ල දැවී යෑමත් සමඟ ශ්‍රී ලංකා ඉනිමේ කඩා වැටීම ආරම්භ විය. සෙසු පිතිකරුවන්ට සාර්ථක සබඳතාවක් ගොඩනැඟීමට කොදෙව් පන්දු යවන්නන්ගෙන් අවස්ථාවක් නොලැබිණි. නායක ඇන්ජෙලෝ මැතිව්ස් (5) දිනේෂ් චන්දිමාල් (11) සහ තිසර පෙරේරා (1) අඩු ලකුණු ගණනකට දැවී යෑමෙන් ශ්‍රී ලංකා පිලට විශාල ලකුණු සංඛ්‍යාවක් කරා යෑමට තිබූ අවස්ථාව අහිමි විය.

පන්දු යැවීමේදී ඔබෙඩ් මැකෝයි කඩුලු 2ක් දවා ගැනීමට සමත් විය.

දෙපිල අතර දෙවැනි විස්සයි20 තරගය 6 වැනිදාත්, අවසන් තරගය 8 වැනිදාත් මෙරට වේලාවෙන් අලුයම 3.30ට ආරම්භ වීමට නියමිතය.

ආනන්ද-නාලන්දා සුලෝහිත සංග්‍රාමය දඹුල්ලේදී

පාසල් ක්‍රීඩා තරග සියල්ල ආරම්භ කිරීමට අවසරය

ප්‍රින්ස් ගුණසේකර

ආනන්ද - නාලන්දා සුලෝහිත සංග්‍රාමය ඇතුළු පාසල් මහා ක්‍රිකට් තරග ප්‍රේක්ෂකයන්ගේ සහභාගිත්වයෙන් තොරව ජෛව බුබුළක ආකාරයෙන් සංවිධාන කිරීමට සූදානම් වෙයි. ඒ අනුව මෙතෙක් කොළඹදී පැවැති ආනන්ද - නාලන්දා සුලෝහිත සංග්‍රාමය දඹුල්ල අන්තර්ජාතික ක්‍රීඩාංගණයේදී මැයි මාසයේදී පැවැත්වෙන අතර, ත්‍රිත්ව - සාන්ත අන්තෝනි හා රච්මන්ඩ් - මහින්ද මහා තරග ද මේ වසරේ පැවැත්වීමට කටයුතු යොදා ඇත.

මහා ක්‍රිකට් තරග පැවැත්වීමට පාසල් කටයුතු සංවිධාන කරමින් පවතින බව කොළඹදී පැවැති මාධ්‍ය හමුවකදී ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා පැවසීය.

"පාසල් මහා තරග සෞඛ්‍යාරක්ෂිතව පවත්වන්න අවශ්‍ය ක්‍රීඩා පිටි පහසුකම් දෙන්න සූදානම්. ක්‍රිකට් පමණක් නොවෙයි සියලු පාසල් ක්‍රීඩා ඉදිරියේදී නිසි පරිදි සෞඛ්‍ය ප්‍රතිපත්ති අනුව පවත්වන්න අවශ්‍ය වාතාවරණය සකස් වී තිබෙනවා. ක්‍රිකට් පමණක් නොවෙයි පාපන්දු, රගර් ඇතුළු සියලු ක්‍රීඩා සෞඛ්‍ය නීති රීති යටතේ ආරම්භ කරන්න පාසල්වලට පුළුවන්. පාසල් ක්‍රීඩා තරග පැවැත්වීම ඉතාම වැදගත් කාරණයක් ලෙස සලකනවා" ඇමැතිවරයා පැවසීය.

කොළඹ රාජකීය - ගල්කිස්ස සාන්ත තෝමස් විදුහල් අතර, 142 වැනි නිල්මහා සටන මහා ක්‍රිකට් තරගය මෙවර හම්බන්තොට සූරියවැව මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේ පැවැත්වීමට මෙයට සති දෙකකට කලින් තීරණය විය.

පසුගිය වසරේදී කොළඹ රාජකීය - ගල්කිස්ස සාන්ත තෝමස් විදුහල් අතර 141 වැනි නිල්මහා සටන කොළඹ එස්එස්සී පිටියේදී පැවැති අතර, ඒ සමඟ කොරෝනා වයිරසය ශ්‍රී ලංකාවට පැමිණෙමින් තිබිණි. කෙසේ වුවද එම තෙදින තරගය සාර්ථකව නිමා කර ගැනීමට විදුහල් දෙකේ සංවිධායකයෝ කටයුතු කළහ. ආනන්ද - නාලන්දා මහා තරගය පැවැත්වුණද එක්දින තරගය හා විස්සයි 20 තරගය කොරෝනා හේතුවෙන් අතහැර දැමිණි. ඒ ආකාරයෙන් වාර්ෂික පාසල් මහා තරග රාශියක් පැවැත්වීමට නොහැකි විය.

ක්‍රිකට් ප්‍රවීණයෝ අද සිට ඉන්දීය පිටියේ

ඩිල්ෂාන් - ලාරා සටන හෙට

නිරෝෂාන් ප්‍රියංකර

මාර්ග ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ඉන්දියාවේ පැවැත්වෙන රෝඩ් සේෆ්ටි වර්ල්ඩ්ස් සීරීස් 'Road Safety World Series' විස්සයි20 ක්‍රිකට් තරගාවලිය අද ආරම්භ වෙයි.

ජගත් තරග බිමෙන් විශ්‍රාම ගෙන සිටින ප්‍රවීණ ක්‍රීඩකයන් එක්වන තරගාවලියට රටවල් 6ක් නියෝජනය කරමින් කණ්ඩායම් සහභාගි වෙයි.

සත්කාරක ඉන්දියාව සමඟින් ශ්‍රී ලංකාව, බංග්ලාදේශය, බටහිර ඉන්දීය කොදෙව්, දකුණු අප්‍රිකාව සහ එංගලන්තය මේ තරගාවලියට එක්වන අතර, පසුගිය වසරේ මාර්තු මස පැවැති තරගාවලියේ මූලික අදියර සඳහා ඔස්ට්‍රේලියාවෙන් ද කණ්ඩායමක් එක්ව සිටියේය.

ඔස්ට්‍රේලියානු කණ්ඩායම මෙවර තරගාවලියට එක් නොවන අතර, බංග්ලාදේශය සහ එංගලන්තය මුල් අදියරට එක්ව නොසිටියේය. ඉන්දියාවේ රායිපූර්හිදී පැවැති තරගාවලියේ මූලික වටයේ තරග 4ක් පැවැත්වීමෙන් අනතුරුව කොරෝනා වසංගතය හේතුවෙන් පසුගිය වසරේ මාර්තු මාසයේදී තරගාවලිය අත්හිටුවීමට සංවිධායකයෝ කටයුතු කළහ. ඒ අනුව එතැන් සිට අද ආරම්භ වන මේ තරගාවලියේ මූලික වටය අද සිට 16 වැනිදා දක්වා පැවැත්වේ. ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණ ගන්නා කණ්ඩායම් 4 මේ මස 17 සහ 19 දෙදින අවසන් පූර්ව තරග දෙකට එක්වන අතර, අවසන් මහා තරගය මාර්තු 21 වැනිදා පැවැත්වීමට නියමිතය.

තරගාවලිය ආරම්භ කරමින් ඉන්දියාව සහ බංග්ලාදේශය අද (5) තරග වදින අතර, ශ්‍රී ලංකා කණ්ඩායම හෙට (6) බටහිර ඉන්දීය කොදෙව් පිලට එරෙහිව තරග බිමට පිවිසෙයි. මේ සියලු තරග රාසිපූර්හිදී මෙරට වේලාවෙන් රාත්‍රී 7.00ට ආරම්භ වීමට නියමිතය. ශ්‍රී ලංකා කණ්ඩායම තිලකරත්න ඩිල්ෂාන්ගේ නායකත්වයෙන් තරග වදින අතර, සචින් තෙන්ඩුල්කාර් (ඉන්දියාව), බ්‍රයන් ලාරා (කොදෙව්), ජොන්ටි රෝඩ්ස් (දකුණු අප්‍රිකාව), කෙවින් පීටර්සන් (එංගලන්තය) සහ මොහොමඩ් රෆීක් (බංග්ලාදේශය) සෙසු කණ්ඩායම්වල නායකයන් ලෙස කටයුතු කරති.

ශ්‍රී ලංකා සංචිතය - තිලකරත්න ඩිල්ෂාන් (නායක), උපුල් තරංග, චාමර සිල්වා, චින්තක ජයසිංහ, තිලාන් තුෂාර, නුවන් කුලසේකර, රසල් ආනල්ඩ්, අජන්ත මෙන්ඩිස්, ෆර්වේස් මහරූෆ්, සනත් ජයසූරිය, රංගන හේරත්, ධම්මික ප්‍රසාද්, චාමර කපුගෙදර, දුලංජන විජේසිංහ.

එංගලන්ත පළමු ඉනිම 205යි

ඉන්දීය කණ්ඩායම සමඟ අහමදාබාද්හිදී ඊයේ ආරම්භ වූ සිව්වැනි සහ අවසන් ටෙස්ට් තරගයේ පළමු ඉනිම ක්‍රීඩා කළ එංගලන්තය ලකුණු 205කට දැවී ගියේය.

ඊයේ පළමු දිනයට ක්‍රීඩාව නතර කරන විට පිළිතුරු ඉනිම ක්‍රීඩා කරන ඉන්දීය පිල කඩුල්ලක් දැවී ලකුණු 24ක් රැස්කර තිබිණි.

බෙන් ස්ටොක්ස් ලකුණු 55ක් රැස් කරමින් එංගලන්ත ඉනිමේ වැඩිම ලකුණු ලාභියා වූ අතර, ඩෑන් රන්ස් ලකුණු 46ක් ඉනිමට එක් කළේය. නායක ජෝ රූට්ට ඊයේ රැස් කළ හැකි වූයේ ලකුණු 5ක් පමණි. පන්දු යැවීමේදී අක්සාර් පටේල් කඩුලු 4ක් දවාගත් අතර, රවිචන්ද්‍රන් අශ්වින් කඩුලු 3ක් සහ මොහොමඩ් සිරාජ් කඩුල 2ක් බිඳ දැමීමේය.

අද තරගයේ දෙවැනි දිනයයි.

දිනමිණ
2021 මාර්තු 05 සිකුරාදා
දේශවංශය
දේශයේ පාලන මාවත

මෙරට පාර්ලිමේන්තු ඉතිහාසයේ ආන්දෝලනාත්මක සිදුවීමක් 1991 අගෝස්තු මාසයේදී සිදු විය. එදා බලයේ සිටියේ දිගු කලක් මෙරට දේශපාලනයේ නිරතව සිටි ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතාය.

බලයේ සිටින ජනාධිපතිවරයකුට විරුද්ධව ඔහුගේම පක්ෂයේ මන්ත්‍රීවරුන් පිරිසක් එකතු වී දෝෂාභියෝගයක් ඉදිරිපත් කිරීම එම සුවිශේෂ සිදුවීමයි.

ප්‍රේමදාසට එරෙහිව චූජාපයෙන්ම චෝදනා 37ක්

1978 ජේ. ආර්. ජයවර්ධන ආණ්ඩුව සම්මත කර ගත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිසා බොහෝ දෙනා විශ්වාස කළේ විධායක බලය සහිත ජනාධිපතිවරයකුට එරෙහිව කිසිවකු නැගී නොසිටිනු ඇත කියාය. එනමුත් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38 (2) (අ) වගන්තියේ තැනෙක සඳහන් පරිදි සකස් කළ යෝජනාවක් 38 (2) (ආ) (ii) ට අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිරිසකගේ අත්සන් සහිතව එම යෝජනාව කථානායකවරයාට ඉදිරිපත් කෙරුණේ කිසිවකු එවැන්නක් නොසිතූ මොහොතකය.

කථානායකවරයා ද එම දෝෂාභියෝග යෝජනාව පිළි ගත්තේය. එනමුත් එය ඉදිරිපත් කිරීම සඳහා ඊට පෙර මාර්තු මාසයේ සිට අතිශය රහසිගත වැඩපිළිවෙළක් ආණ්ඩුවේම මැති ඇමැතිවරුන් අතර ක්‍රියාවට නැංවිණි.

ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතාට එරෙහිව මෙම දෝෂාභියෝග යෝජනාව ගෙන ඒමට මුල් වූයේ එවකට නුවරඑළිය පාර්ලිමේන්තු මන්ත්‍රී හිටපු ඇමැති ගාමිණී දිසානායක, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ඇමැති ලලිත් ඇතුලත්මුදලි, කම්කරු හා වෘත්තීය පුහුණු ඇමැති ජී. ඇම්. ප්‍රේමචන්ද්‍ර ප්‍රමුඛ මැති ඇමැතින් පිරිසකි.

ඔවුන්ගේ අදහස වූයේ මෙලෙස ජනපතිට එරෙහිව දෝෂාභියෝගයක් ඉදිරිපත් කරන්නේ ජනපති ප්‍රේමදාසගේ තනි කැමැත්ත මත ගෙන යන ආණ්ඩුවේ පාලනයට එරෙහිව බවයි.

පාර්ලිමේන්තුව තුළ විශ්වාසභංග යෝජනා (No-confidence) පිළිබඳව අසා තිබුණත් ඒ වනතුරුම දෝෂාභියෝගයක් (Impeachment) යන වචනය මෙරට ජනතාවගේ වචන මාලාවට ඇතුළත්ව තිබුණේ නැත.

ජනාධිපතිවරයකුට එරෙහිව ඉදිරිපත් කරන යෝජනාවකට සම්මත නමක් වශයෙන් දෝෂාභියෝගය යන්න ප්‍රචලිත වූයේ මෙකී යෝජනාවෙන් පසුවය.

මෙවැනි දෝෂාභියෝගයක් ඉදිරිපත් කිරීමට ව්‍යවස්ථාව අනුව අවස්ථාව තිබුණ ද, එවැන්නක් ක්‍රියාවට නැංවීම අතිශය දුෂ්කර කටයුත්තකි. ඊට බාධා රැසක් ඇති අතර ඒවා ජය ගත යුතු වීම ඊට හේතුවයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35 (1) වගන්තියට අනුව ජනාධිපතිවරයාගේ වරදකට එරෙහිව කිසිදු අධිකරණයක නඩු පැවරීමට නොහැකිය. පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල 78 වගන්තිය යටතේ ජනාධිපතිවරයාගේ පැවැත්ම පිළිබඳව යම් මන්ත්‍රීවරයකුට කතා කළ යුතු නම් ඒ සඳහා විශේෂ යෝජනාවක් කල් තබා ඉදිරිපත් කර ඊට වේලාවක් සහ අනුමැතියක් ලබා ගත යුතුය.

නමුත් එවැන්නක් ඉදිරිපත් වූ අවස්ථාවක ආණ්ඩු පක්ෂයට ඕනෑ නම් එම අවස්ථාව නොදී සිටීමට ද පුළුවන. එවැනි බලගතු නීතිමය රාමුවකින් ආරක්ෂිත ජනාධිපතිවරයකුට විරුද්ධව පාර්ලිමේන්තුවේ විවාද කිරීමටත්, ඔහු උසාවියක් ඉදිරියට පැමිණ වීමටත් හැකි වන්නේ ඉහත කී දෝෂාභියෝග යෝජනාවක් පාර්ලිමේන්තුවට ගෙන ඒමෙනි.

එහෙත් ඒ සඳහා බාධක රැසක් පවතී. පළමුවැන්න නම් මෙවැනි යෝජනාවකට එවකට පාර්ලිමේන්තුවේ සිටින මුළු මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාවෙන් භාගයක හෝ තුනෙන් දෙකක අනුමැතියක් අවශ්‍ය වීමය. එසේ කිරීමට නම් ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ බහුතරයක් ඊට කැමැත්ත පළ කළ යුතු වෙයි.

එහෙත් එලෙස ආණ්ඩු පක්ෂය හා විපක්ෂය අතර සන්ධානයක් තිබෙන බව ජනාධිපතිවරයාට දැන ගන්නට ලැබුණහොත් එම උත්සාහය පරාජය කිරීමටත් ජනාධිපතිවරයාට හැකියාව තිබේ. ඒ වහාම පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙනි. ඒ දෙවැනි කාරණයයි.

තුන්වැන්න නම් ඊළඟට දෝෂාභියෝගයට කැමැත්තක් දක්වන, අවශ්‍ය මන්ත්‍රීන් සංඛ්‍යාව සපිරුනත් කථානායකවරයා ඊට එකඟ නොවුණහොත් එවිට ද දෝෂාභියෝග යෝජනාවක් ගෙන ඒමට නොහැකිය.

සිව් වැන්න වූයේ දෝෂාභියෝග යෝජනාවට අත්සන් තබා ඇත්තේ මන්ත්‍රී සංඛ්‍යාවෙන් අඩකට වැඩි එහෙත් තුනෙන් දෙකකට අඩු සංඛ්‍යාවක් නම් එය කථානායකවරයාට බාර ගැනීම ප්‍රතික්ෂේප කළ හැකි වීමය.

යෝජනාවට තුනෙන් දෙකකට වැඩි සංඛ්‍යාවක් අත්සන් කර ඇත්නම් එය ප්‍රතික්ෂේප කිරීමට කථානායකවරයාට හැකි වුවත් එහි සුළු අඩුපාඩුවක් පෙන්වා එය බාර ගැනීම ප්‍රමාද කිරීමට ද පුළුවන් වීම පස්වැනි ගැටලුවයි.

ඒ ප්‍රමාදය අතරතුර කාලයේදී මේ ගැන ජනාධිපතිවරයාට දැනුම් දීමට කථානායකවරයාට අවස්ථාව තිබේ. ඒ සුළු අවසරය මත පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ද බලයක් තිබීම හයවැන්නයි.

මෙවැනි යෝජනාවක් කථානායකවරයාට ඉදිරිපත් කරන තුරු අතිශය රහසක් ලෙස තබාගත යුතුය. එය මාස පහ හයක පමණ කාලයක් තිස්සේ මෙලෙස අතිශය රහසක් ලෙස දෝෂාභියෝග පුරෝගාමීන් හා මන්ත්‍රීවරුන් රැකගෙන සිටීම ද දැඩි අභියෝගයකි. මේ සියලු බාධක ජය ගෙන එම රහස ආරක්ෂා කරගෙන කථානායකවරයාට මෙම යෝජනාව ඉදිරිපත් කිරීම ද බොහෝ දෙනාගේ පුදුමයට හේතුවක් විය.

ආණ්ඩු පක්ෂයේ ගාමිණී දිසානායක, ලලිත් ඇතුලත්මුදලි, ජී. ඇම්. ප්‍රේමචන්ද්‍ර සහ විපක්ෂයේ සිරිමා බණ්ඩාරනායක, අනුරුද්ධ රත්වත්තේ ඇතුළු පිරිස අතරේ එය රහසිගතව සැලසුම් කෙරිණි. එම දෝෂාභියෝගයේ ජනපති ආර්. ප්‍රේමදාසට එරෙහිව මූලික චෝදනා 5ක් සඳහන් විය. අතුරු චෝදනා 37ක් ඇතුළත් කර තිබිණි.

(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හිතා මතා උල්ලංඝනය කිරීම (2) රාජද්‍රෝහී වීම, (3) අල්ලස් සම්බන්ධ වරද (4) තම ධුරයේ බලතල අයුතු අන්දමින් භාවිතා කිරීම හා සම්බන්ධ විෂමාචාර හෝ දූෂණ (5) යම් නීතියක් යටතේ චරිත දූෂණය හා සම්බන්ධ වරද එම චෝදනා පහට අඩංගු විය.

ඉහත 1 සහ 2 චෝදනා සම්බන්ධයෙන් අතුරු චෝදනා 14ක් ද දෝෂාභියෝග චෝදනාවට ඇතුලත් විය.



90 දශකයේ මුල එජාප නායකයෝ

පාර්ලිමේන්තුව හා ඇමැති මණ්ඩලය සතු බලතල ජනාධිපතිවරයා විසින් පැහැර ගැනීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) වගන්තියෙන් කියැවෙන ඇමැති මණ්ඩලයේ සාමූහික වගකීම් පිළිබඳ කොන්දේසිය කඩ කිරීම, තමා පූර්ණ විධායක බව විශ්වාස කරමින් රජය මෙහෙය වීමට හා පාලනයට එක් පුද්ගලයකු ලෙස සලකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වගන්තියේ නියමයන් වැරැදි ලෙස අර්ථ නිරූපණය කිරීම හා එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 43 (1) වගන්තිය චේතනාන්විතව උල්ලංඝනය කිරීම, රජය මෙහෙයවීම හා පාලනය කිරීමේ අයිතිය ඇමැති මණ්ඩලයට අහිමි කිරීම සහ රජයේ කටයුතු පිළිබඳව ඇමැති මණ්ඩලයට ඇති කාර්යභාරය අප්‍රධාන තත්ත්වයට පත්කිරීම, ජනාධිපතිවරයා විසින් ඇමැතිවරුන්ට, ව්‍යාපෘති ඇමැතිවරුන්ට හා රාජ්‍ය ඇමැතිවරුන්ට පැවරී ඇති විෂයය හා කාර්යයන් නිශ්චය කිරීමේ දී ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති බලයට පිටින් කටයුතු කිරීම එකී අතුරු චෝදනා අතර විය.

ඉහත කී අවසන් අතුරු චෝදනාව යටතේ තවත් අනු චෝදනා තුනක් සඳහන් කර තිබිණි.

(1) එකම කටයුතු සඳහා ඇමැතිවරුන් දෙදෙනකු පත්කිරීම (2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නැති ව්‍යාපෘති ඇමැති, රාජ්‍ය ඇමැති වැනි පදවි ඇති කිරීම (3) කැබිනට් ඇමැතිවරුන්ට සහාය වීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව පත් කළ හැකි නියෝජ්‍ය ඇමැති ධුර අක්‍රීය කිරීම එම අනු චෝදනා තුනය.

එක් එක් අමාත්‍යාංශවලට එක් ලේකම්වරයකු බැගින් පත් කිරීමට ජනපතිට ඇති බලතල අයුතු ලෙස හා එම බලතලවලට බාහිරව කටයුතු කිරීම, යටතේ ද අනු චෝදනා තුනක් ඉදිරිපත් කර තිබිණි.

(1) කේ. ඇම්. අබේසිංහ මහතා ලේකම්වරයකු ලෙස පත් කිරීම, (2) ව්‍යාපෘති අමාත්‍යාංශවලට ලේකම්වරුන් 22ක් පත් කිරීම, (3) රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ලේකම්වරුන් 29ක් පත් කිරීම.

අමාත්‍යවරුන් යටතේ ඇති අමාත්‍යාංශ රහස් වාර්තා තමන්ට කෙලින්ම යොමු කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන්ට උපදෙස් දීමෙන් ලේකම්වරයා සිය ඇමැතිවරයාගේ මෙහෙයවීම හා පාලනයට යටත්ව ක්‍රියා කළ යුත්තේය යන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 (2) වගන්තිය උල්ලංඝනය කිරීම එහි ආ තවත් චෝදනාවකි.

දෙපාර්තමේන්තු ප්‍රධානීන් සම්බන්ධයෙන් ඇමැති මණ්ඩලය සතු පැවරිය නොහැකි පත් කිරීමේ, මාරු කිරීමේ හා අස් කිරීමේ බලතල ජනාධිපතිවරයා විසින් පවරා ගැනීම යන නව වැනි චෝදනාව යටතේ අතුරු චෝදනා 4ක් ඉදිරිපත් කර තිබිණි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (අ) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ ආරක්ෂාව පිළිබඳ වගකීම අන්සතු කළ නොහැකි වගකීමක් වුවත් එය උල්ලංඝනය කිරීම යන චෝදනාව යටතේ ද අතුරු චෝදනා 5ක් එල්ල කර තිබිණි.

ඊළඟ චෝදනාව වූයේ ජාත්‍යන්තර සාමය සුරක්ෂිතභාවය හා සහයෝගිතාව වර්ධනය කිරීම, ජාත්‍යන්තර නීතිය හා ගිවිස ගත් බැඳීම් කෙරෙහි ගෞරවය ඇති කිරීමට උත්සාහ කිරීම හා ධර්මිෂ්ඨ, සාධාරණ ජාත්‍යන්තර ආර්ථික හා සමාජ ක්‍රමයක් ඇති කිරීමට උත්සාහ කිරීම යන ව්‍යවස්ථාවේ 27 (15)න් රජය වෙත පැවරුන වගකීම් ජනපතිවරයා උල්ලංඝනය කිරීම යන්නයි. (මේ යටතේ ද අනු චෝදනාවක් ඉදිරිපත් කර තිබිණි)

රටේ ආරක්ෂාව අන්තරාදායක තත්ත්වයකට පත්කිරීම, මේ යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10, 11, 13, 14 යන වගන්තිවල එන ජනතා මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අපොහොසත් වීම යන චෝදනාව යටතේ අනු චෝදනා තුනක් එල්ල කර තිබිණි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වගන්තියෙන් ප්‍රකාශිත පෞද්ගලික නිදහස ආරක්ෂා කිරීමේ නියමයන් හා 28 (ඉ) ඡේදය යටතේ ඇති සෙසු අයගේ නන් වැදෑරුම් නිදහස හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ නියමයන් ජනාධිපතිවරයා විසින් උල්ලංඝනය කිරීම. (මේ යටතේ අනු චෝදනා 4 කි)

14 වැනි චෝදනාව වූයේ ජනාධිපතිවරයා අනවශ්‍ය හා නිරර්ථක කාර්යයන් සඳහා වියදම් කිරීමට නියෝග දීමෙන් හා මහජන මුදල් වියදම් කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවට සැඟවීමෙන් ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම හා ජනාධිපතිවරයා තමාගේම උපදෙස්වලට පටහැනිව ක්‍රියා කිරීම යන්නයි.

මේ යටතේ අනු චෝදනා 7ක් ඉදිරිපත් කර තිබිණි. ඒවා කෙටියෙන් මෙසේය. (1) ගම්උදා සැණකෙළියට කරන වියදම් (2) ජනපති පදවි ප්‍රාප්තිය සඳහා වාර්ෂිකව කරන වියදම් (3) ඇක්ලන්ඩ් හවුස් මන්දිරය ප්‍රතිසංස්කරණ වියදම (4) ජනාධිපති පංගම සේවාව මුවාවෙන් ඊට අදාළ නොවූ ඒවා සඳහා කළ වියදම් (5) විශ්‍රාමලත් පොලිස් නිලධාරි ඒ. සී. ලෝරන්ස් විසින් පවත්වාගෙන යන පෞද්ගලික පරීක්ෂණ අංශය (6) රාජ්‍ය සේවයට අයත් නිලධාරීන් අත්තනෝමතික ලෙස අස් කිරීම, දඬුවම් පැමිණ වීම, අයථා උසස්වීම් දීම, සේවයෙන් පහත දැමීම වැනි ක්‍රියා මඟින් පීඩනයට ලක් කිරීම (7) හිතුමතේ නියෝග කරන වෙනත් කාරණා අරබයා පැවැත්වෙන උත්සව සඳහා වියදම් කිරීම.

දෝෂාභියෝග යෝජනාවේ අල්ලස් සම්බන්ධ වරද හා ධුරයේ බලතල අයුතු ලෙස භාවිත කිරීම හා සම්බන්ධ මූලික චෝදනා දෙක යටතේ අතුරු චෝදනා 11ක් සඳහන් කර තිබිණි.

ජනාධිපතිවරයාගේ බෑණා වූ රොහාන් ජයකොඩි මහතා එයාර් ලංකා සමාගමේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීම, ජපානයේ එයාර් ලංකා නියෝජිත තනතුරට හියුබට් ජයකොඩි මහතා පත් කිරීම, ඉවන් භාණ්ඩ ප්‍රවාහනයේදී හියු ජේ සමාගමට විශේෂ සැලකිල්ලක් දැක්වීම, ජෝර්දාන් එයාර් කොන්ත්‍රාත්තුව මහරාජා සමාගමට දීම, ටෙන්ඩර් නොකැඳවා පෞද්ගලික රූපවාහිනියක් පවත්වාගෙන යාමට ටොටෑස් ඉන්ටර්නැෂනල් සහ මහරාජා ආයතනවලට ලබා දීම, රජයට අයත් වටිනා ඉඩම්, ගොඩනැඟිලි ඥාතීන්ට පවරා දීම, ටෙන්ඩර් නොකැඳවා නාරාහේන්පිට ඉන්ධන පිරවුම්හල ප්‍රේමදාස ආර්යාවගේ සොහොයුරු සී. වික්‍රමතුංග මහතාට දීම, ටෙන්ඩර් නොකැඳවා කතරගම ගම්උදාව ගොඩනැඟිලි සියල්ල එම්. එච්. මොහිදීන් මහතාට අඩු කුලියට දීම, ජනතාකරණයේ මුවාවෙන් පෞද්ගලික වාසියට රාජ්‍ය ආයතන අඩු මිලට විකිණීම, ඩෙවූ සමාගම සමඟ තෙල් කොන්ත්‍රාත්තුව ඇති කර ගැනීම, එම්. ඩී. ඒ. ඉණතිලක මහතාට ඉඩම් බදුදීම යන අතුරු චෝදනා එහි දැක්විණි.

ජනසවිය දන් ජනපති රැක ගනිමු, කැසිනෝ උවදුර මැඬලූ ජනපති රැක ගමු, ජනපතිට ජනතා සහාය වැනි වදන් සහිත පෝස්ටර් ජනපති ආර්. ප්‍රේමදාස මහතාට පක්ෂව බිත්ති පුරා ඇලවුණු අතර ආණ්ඩුවෙන් බුද්ධිය හැළේ, ජනතා සහාය ලලිත්ට වැනි වදන් සහිත පෝස්ටර් දෝෂාභියෝගයට පක්ෂව ඇලවිණ.

පස්වැනි මූලික චෝදනාව වූ යම් නීතියක් යටතේ චරිත දූෂණය හා සම්බන්ධ වරද යටතේ ජනාධිපතිවරයා මානසික දුබලතාවයකින් පෙළෙන බවට අතුරු චෝදනා 23ක් දෝෂාභියෝග යෝජනාවේ සඳහන් කර තිබිණි. මෙම දෝෂාභියෝග යෝජනාවට පක්ෂ විපක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 40 දෙනෙකු අත්සන් තබා ඇති බව පැවසිණි.

දෝෂාභියෝග යෝජනාව අගෝස්තු මාසයේදී කථානායක ඇම්. එච්. මොහොමඩ් මහතා වෙත බාර දෙන ලද අතර එය කථානායකවරයා විසින් බාර ගැනිණි. මේ අතර ජනාධිපතිවරයාට සහයෝගය පළ කරමින් විවිධ පාර්ශ්වවලින් ප්‍රකාශ නිකුත් විය.

දෝෂාභියෝගයට පක්ෂවත්, විපක්ෂවත් පෝස්ටර් සටනක් ද දියත්ව තිබිණි.

ජනසවිය දන් ජනපති රැක ගනිමු, කැසිනෝ උවදුර මැඬලූ ජනපති රැක ගමු, ජනපතිට ජනතා සහාය වැනි වදන් සහිත පෝස්ටර් ජනපති ආර්. ප්‍රේමදාස මහතාට පක්ෂව බිත්ති පුරා ඇලවුණු අතර ආණ්ඩුවෙන් බුද්ධිය හැළේ, ජනතා සහාය ලලිත්ට වැනි වදන් සහිත පෝස්ටර් දෝෂාභියෝගයට පක්ෂව ඇලවිණ.

දෝෂාභියෝගය හේතුවෙන්ම නිර්මාණය වූ ඇල්ලේ ගුණවංශ හිමි රචිත 'අත දුන්නේ කවුරු' යන ගීතය ගුවන්විදුලියෙන් නිතරම වාදනය කෙරුණේ ජනාධිපතිවරයාට පක්ෂවය. ඒ සමඟම ප්‍රෙඩ් සිල්වා ගායනා කළ 'අලුත් කලාවක් හොයාගත්ත මං දියුණු වෙන්න ඕනෑ නම්' යන ගීතය ද වරින්වර විකාශය කෙරිණි.

මේ දෝෂාභියෝග යෝජනාව විවාදයට ගන්නේ ද නැද්ද යන්න කථානායකවරයා විසින් තීරණයක් දීමට නියමිතව තිබුණේ 1991 ඔක්තෝබර් 08 වැනිදා පාර්ලිමේන්තු රැස්වීම් වාරයේදීය.

1991 සැප්තැම්බර් 18 වැනිදා තවත් මැති ඇමැතිවරුන් පිරිසක් ලලිත් ගාමිණී පිලට එක් වූහ. ආහාර හා සමුපකාර රාජ්‍ය ඇමැති රවින්ද්‍ර සමරවීර, ඛනිජ සම්පත් ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය ඇමැති ආරියරත්න ජයතිලක, වැවිලි රාජ්‍ය ඇමැති සමරවීර වීරවන්නි, කම්කරු හා වෘත්තීය පුහුණු රාජ්‍ය ඇමැති ලක්ෂ්මන් සෙනෙවිරත්න, අත්යන්ත්‍ර පේෂකර්ම ඇමැති චන්ද්‍රා ගන්කන්ද සහ ප්‍රේමරත්න ගුණසේකර, එම්. වින්සන්ට් පෙරේරා යන මන්ත්‍රීවරු ද ලලිත් - ගාමිණී පිලට එක් වූහ.

මේ අතර කථානායකවරයා සිය නිල නිවසේ තමාගේ ඉන්දීය සංචාරය පිළිබඳව දැනුම්වත් කිරීම සඳහා මාධ්‍ය සාකච්ඡාවක් පවත්වමින් සිටියදී ගුවන්විදුලියෙන් නිවේදනයක් විකාශය කෙරිණි.

එමගින් කියැවුණේ කථානායකවරයා විසින් දෝෂාභියෝග යෝජනාවට අවශ්‍ය වලංගු අත්සන් සංඛ්‍යාව නොමැති නිසා ඒ ගැන තවදුරටත් කටයුතු නොකරන බවත් එය දැනුම් දුන් සිරිමා බණ්ඩාරනායක මහත්මියට ඒ බව තමන් දන්වා ඇති බවත් කියැවෙන ප්‍රකාශයකි.

එම ප්‍රකාශය කථානායකවරයා විසින් ජනාධිපතිවරයාට යවා තිබුණේ රහසක් ලෙස තබා ගැනීමේ පොරොන්දුවක් මත වුවත් එය එසේ වී නොතිබිණි. මෙම සිද්ධිය නිසා කථානායකවරයාට මාධ්‍ය සාකච්ඡාව අතරමඟ නවත්වා දැමීමට සිදු විය. සිරිමා බණ්ඩාරනායක මහත්මියට ද ඒ වනතුරු එය දැනුම් දී නොතිබුණු බැවින් එදින සවස පක්ෂ නායක රැස්වීමට ආ බණ්ඩාරනායක මැතිනිය කථානායකවරයාගේ නායකත්වය මින් පසුවට බාර නොගන්නා බව පැවසුවාය. පක්ෂ නායක රැස්වීම ද අතරමඟ නවත්වා දැමීමට සිදු වූයේ පක්ෂ නායකයන් රැස්වීමෙන් නැඟිට යන්නට වූ නිසාය.

කෙසේ වුවත් ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතා 1991 අගෝස්තු 30 වැනිදා මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන පරිදි පාර්ලිමේන්තු සැසි වාරය සැප්තැම්බර් 24 වැනිදා පෙරවරු 10.40 දක්වා කල් තැබුවේය.

බන්ධුල ගුණරත්න

දේශවංශය

අද දක්නට නැතත් විසි වැනි සියවස මුල් කාලයේ ලංකාවේ ප්‍රධානතම ප්‍රවාහන මාධ්‍යයක් වූයේ ට්‍රෑම් රථ සේවයයි. බවුස්ටඩ් බ්‍රදර්ස් නම් සමාගම විසින් ආරම්භ කළ මේ සේවය කෙටි කලකින්ම ජනප්‍රිය සේවයක් බවට පත් විය. කෙසේ වෙතත් බවුස්ටඩ් බ්‍රදර්ස් සමාගමේ ට්‍රෑම් රථ සේවකයන්ගේ වෘත්තීය ගැටලුවලට සාධාරණ පිළිතුරක් සමාගමෙන් හිමි නොවීම මත එහි සේවකයෝ 1929දී වර්ජනයක් දියත් කළහ. පොලිස් වෙඩි තැබීම්වලින් පස් දෙනකු මියගොස් තවත් 250කට පමණ තුවාල සිදු වූ මෙම වර්ජනය ලාංකීය වෘත්තීය සමිති ඉතිහාසයේ සුවිශේෂ කඩඉමක් විය.

ගල්මුල් ප්‍රහාර හූ හඬ මැද ලෙයින් දිනූ ට්‍රෑම්කාර් සේවක විජයය



විදුලි ට්‍රෑම් රථ සේවය 1899දී ලංකාවට හඳුන්වා දෙනු ලැබිණි. ට්‍රෑම් රථ ගමනාගමනය ආරම්භ කිරීමට පෙර ඒ සඳහාම විශේෂයෙන් සැකසූ මාර්ග පද්ධතියක් අවශ්‍ය වූ අතර එම ඉදිකිරීම භාර වූයේ බවුස්ටඩ් බ්‍රදර්ස් සමාගමටය. බවුස්ටඩ් බ්‍රදර්ස් සමාගමේ ව්‍යාපාර කටයුතු ලන්ඩනයේ එක්සත් වැවිලිකරුවන්ගේ සංගමය යටතේ පැවැතිණි. ඒ වන විටත් කොළඹ නගර සභා ප්‍රදේශයෙන් වෙනත් නගර වෙත ක්‍රමානුකූලව විදුලිබලය ව්‍යාප්ත කිරීම සඳහා රජය, බවුස්ටඩ් සමාගම සමඟ ගිවිසුමකට එළැඹ සිටියහ. 1897 අවසාන වන විට නගරය තුළ විදුලි පහන් 548 ක් සවි කිරීම ද ඔවුන් අතින් සිදුවී තිබිණි. විදුලි බලයෙන් ධාවනය වන මගී ට්‍රෑම් රථ ප්‍රවාහන සේවයක් කොළඹ නගරය තුළ ස්ථාපනය කිරීම සඳහා ඔවුන් කටයුතු කළේ ඉන් පසුවය.

පළමුව කොටුවේ සිට පිටකොටුව හා ග්‍රෑන්ඩ්පාස් හරහා තොටළඟ දක්වා වූ ට්‍රෑම් රථ මාර්ගය ඉදි කළ අතර එය සැතපුම් 7ක් දිග විය. ට්‍රෑම් මාර්ගයේ වැඩ අවසන් වී 1899 ජනවාරි 12 වන දින කොටුවේ ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය අසලින් එහි මංගල ගමන ඇරඹිණි. කොළඹ ජනතාවට මෙය මහත් ආස්වාදයක් විය. කඩිනම් ප්‍රවාහන සේවයක් වශයෙන් ඔවුහු ට්‍රෑම් රථ සේවය අගය කළ අතර ට්‍රෑම් රථ ධාවනය ආරම්භ කර ගෙවී ගිය මුල් සතියේදී එහි ගමන් කළ මගීන්ගේ සංඛ්‍යාව විසිදහස ඉක්මවූ බව වාර්තාවල සඳහන්ය. මෙසේ කොළඹ ජනතාව විසින් මෙම සේවාව මහත් හරසරින් පිළිගන්නා ලදි. පසුව කොටුවේ සිට නොරිස් පාර හා මරදාන හරහා බොරැල්ල දක්වාත් ට්‍රෑම් රථ මාර්ගය තවදුරටත් ව්‍යාප්ත කෙරිණි.

මෙසේ ට්‍රෑම් රථය කොළඹ නගරයේ බහුතරයකගේ පැසසුමට ලක් වුව ද ආරම්භයේ පටන්ම ඒ කෙරෙහි විරෝධය දැක් වූ පිරිසක් වූහ. ඒ තම රැකියාව හා ආදායම අහිමිවීමෙන් උරණ වී සිටි කරත්තකරුවන් හා රික්ෂෝකරුවන්ය.

තම ජීවනෝපාය අහිමි වීම නිසා කෝපයට පත්වූ කරත්තකරුවන් හා රික්ෂෝකරුවන් තැන් තැන්හි සැඟවී සිට ධාවනය වන ට්‍රෑම් රථවලට ගල් මුල් ප්‍රහාර එල්ල කළ බව වාර්තා වේ. මේ නිසාම මුල් කාලීනව සමහර පිරිස් ට්‍රෑම් රථ භාවිත කිරීමට මැළි විය. එහෙත් මෙලෙස සැඟවී ගල් ප්‍රහාර එල්ල කර පිරිස් අත්අඩංගුවට ගැනීමට පොලිසිය කටයුතු කිරීමත් සමගම තත්ත්වය කෙමෙන් සමනය විය. තවද මෙම රැකියා අහිමි වූවන් කොළඹ අලුතෙන් ආරම්භ කළ ඩොක්යාඩ් සමාගමේ සේවයට බඳවා ගැනීම නිසා ඔවුන් ට්‍රෑම් සේවය කෙරෙහි දැක්වූ විරෝධය ක්‍රමයෙන් පහව ගියේය.

විවිධ බාධා කිරීම් මැද ට්‍රෑම් සේවය ක්‍රමයෙන් ජනප්‍රිය වුවද එය මෙහෙය වූ පාලකයන් තම සේවකයන් සම්බන්ධයෙන් දැකවූයේ යහපත් ආකල්පයක් නොවේ. එමෙන්ම ඔවුන්ගේ ක්‍රියාවන් ද යහපත් වූයේ නැත. මේ හේතුවෙන් එම පාලනයට එරෙහිව කම්කරුවන් තුළ විරෝධයක් ගොඩනැගෙමින් පැවැතිණි. විරෝධයට හේතු වූ වෘත්තීය ගැටලු රැසක් ආචාර්ය කුමාරි ජයවර්ධන "ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ නැඟීම" කෘතියේ සඳහන් කරයි. ඒ අනුව ට්‍රෑම් රථ කම්කරුවකුගේ දිනක වැටුප රුපියල් 1.20ක් විය. එය රුපියල් 2.00ක් දක්වා වැඩිවීමට වසර 7ක් ගතවූ අතර තවත් වසර 7ක් ගෙවුණු පසු වැටුප රුපියල් 2.50 ක් විය. තමන්ට අසනීප නිවාඩු හෝ අනියම් නිවාඩු නො ලැබුණු බවද, ඉතා සුළු වරදට පවා දඬුවමට ලක්වීමට සිදු වූ බව ද කම්කරුවෝ චෝදනා කළහ. විශේෂයෙන්ම රැකියාවට වාර්තා කිරීමේදී සිදුවන සෑම විනාඩියකම ප්‍රමාදයක් සඳහා ශතය බැගින් දඩ ගැසීම සිදුවිණි.

විශේෂයෙන් ලංකාව බ්‍රිතාන්‍යය යටත් විජිතයක් වූ නිසාම බවුස්ටඩ් සමාගමේ ඒකායන අරමුණ වූයේ සපයන සෑම සේවයකින්ම උපරිම ලාභ ලැබීම සහ එමගින් ස්වකීය ආර්ථිකය ශක්තිමත් කර ගැනීම බව අප මෙහිදී අමතක නොකළ යුතුය. මේ නිසා යටත් වැසියන් කෙරෙහි මානුෂික හැඟීමක් ඔවුන් කෙරෙන් දක්නට නොතිබීම පුදුමයක් ද නොවේ. ඔවුන් සැපයූ ට්‍රෑම් රථ සේවයට එය අදාළ විය.

කෙසේ වෙතත් 1893 සිට වැඩ වර්ජන රැසක අත්දැකීම් ලබා තිබූ ට්‍රෑම් රථ කම්කරුවෝ තම වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් සටන් මගට පිවිසීමට කටයුතු කළහ. එහිදී ඒ.ඊ. ගුණසිංහ මහතාගේ ලංකා කම්කරු සංගමය ඔවුන් සමඟ එක් වූහ. මේ අනුව ට්‍රෑම් රථ රියදුරෝ තම සේව්‍යයන්ට වෘත්තීය ගැටලු සම්බන්ධයෙන් සංදේශයක් ද භාරදීමට කටයුතු කරන ලදහ. 25% ක පඩි වැඩිවීමක් ද දින 14ක අසනීප නිවාඩු හා දින 14ක අනියම් නිවාඩු ද මිලේ වැහි කබා, සපත්තු හා තොප්පි ද අතිකාල වැටුප් ද, පඩි කැපීම නතර කිරීම ද ට්‍රෑම්රථ කම්කරුවෝ ඉල්ලා සිටියහ. එහෙත් නිවාඩු සහ අතිකාල පඩි සම්බන්ධයෙන් කිසියම් සහනයක් සැලසීමට එකඟ වූ සේව්‍යයෝ, පඩි වැඩි කිරීමට එකඟ නොවූහ.

පඩි වැඩි කිරීම ප්‍රතික්ෂේප කිරීමත් සමඟම ට්‍රෑම් රථ කොන්දොස්තරවරයකු සේවයෙන් ඉවත් කිරීමට ද සේව්‍ය පක්ෂය කටයුතු කරන ලදී. මෙලෙස සිදුවන අසාධාරණකම් නිසා 1929 ජනවාරි 23 වැනි දින වර්ජන ක්‍රියාමාර්ගයකට යොමුවීමට ට්‍රෑම් රථ කම්කරුවෝ කටයුතු කළහ. දින 13ක් පුරාවට පැවැති මේ වර්ජනය සඳහා කම්කරුවෝ 150 පමණ සහභාගි වී සිටියහ.

තම අරගලයට සහය ලබාදෙන ලෙස වර්ජකයෝ සාමාන්‍ය ජනතාවගෙන් ඉල්ලා සිටියහ. එහිදී ට්‍රෑම් රථවල ගමන් කිරීමෙන් වළකින ලෙස ජනතාවගෙන් කරන ලද ඉල්ලීමට සාධනීය ප්‍රතිචාර ලැබිණි. ජනතාව ද ට්‍රෑම් රථ භාවිතයෙන් ඉවත්ව තම ගමන් සඳහා වෙනත් විකල්ප භාවිත කළහ. එතැනින් නොනැවතුණු ඇතැම් පිරිස් ස්වේච්ඡාවෙන් සේවයේ යෙදුණු ට්‍රෑම් රථ රියදුරන්ට හූ කීම, සරදම් කිරීම කළහ. ඇතැම් විට ගල් ද ගැසූහ. තවද වර්ජකයන් විසින් ට්‍රෑම් රථ මාර්ග අවහිර කරන ලදී. වෙළෙඳ ලිපිකරුවන්, නීති ශිෂ්‍යයන් ඇතුළු වෙනත් වෘත්තිකයන් රැසක් ද මේ වර්ජනයට සහය ලබාදීම විශේෂ සිදුවීමක් විය.

එයින්ද නොනැවතුණු වර්ජකයන් එහි දෙවැනි වර්ජන ව්‍යාපාරයක් ඇරඹීමට කටයුතු කරන ලදී. බ්‍රවුස්ටඩ් බ්‍රදර්ස් සමාගමට විදෙස් රටවලින් භාණ්ඩ ආනයන කර වෙළෙඳාම් කිරීමේ ව්‍යාපාරයක් අයත් ව තිබිණි. වර්ජනයට සහයෝගය දක්වමින් වරායේ භාණ්ඩ ගොඩබාන කම්කරුවන් එම සමාගමේ භාණ්ඩ ගොඩ බෑමෙන් ඉවත් විය. මේ තත්ත්වය මත බ්‍රවුස්ටඩ් බ්‍රදර්ස් සමාගම උග්‍ර අර්බුදයකට මුහුණ දුන්හ.

සිදුවීම් මේ ආකාරයෙන් පෙළ ගැසෙද්දී ට්‍රෑම් රථ සේවකයන් සහ සේව්‍යයන් අතර සාකච්ඡාවක් ආරම්භ විය. පොලිසිය සහ ට්‍රෑම් රථ සේවකයන් අතර ගැටුමක් සිදුවන්නේ මේ සාකච්ඡා සිදුවන අතරය. මෙකල කොළඹ නගරයේ ජීවත්වූ සාමාන්‍ය ජනතාව තුළ පොලිසිය සම්බන්ධයෙන් යහපත් ආකල්පයක් තිබුණේ නැත. දුප්පතුන් සිරභාරයට ගැනීමේ බලය තිබීම, නිතරම අල්ලස් ගැනීම වැනි අත්දැකීම් පොදු ජනතාවට පොලිසිය සම්බන්ධයෙන් අප්‍රසන්න පරිසරයක් ගොඩ නගා තිබිණි. විශේෂයෙන්ම 1915 සිංහල - මුස්ලිම් ගැටුමේදී පොලිසියේ ක්‍රියාකලාපය ජනතාව පිළිකුල් කර තිබිණි. මේ නිසා විශේෂයෙන්ම කම්කරුවන් හා දිළින්දන් අතර පොලිසිය පිළිබඳ පැහැදීමක් තිබුණේ නැත. එමෙන්ම පොලිසිය ද කම්කරුවන් සහ දිළින්දන් පිළිබඳ යහපත් ආකල්පයක් තිබුණු බවක් නොපෙනේ. මේ සියල්ල පොලිසිය සහ කම්කරුවන් අතර ගැටුමක් දක්වා වර්ධනය වෙමින් තිබිණි.

මෙහිදී ගුණසිංහ මහතා මෙන්ම කම්කරු සමිතියේ සෙසු සාමාජිකයෝ ද කම්කරුවන්ට එරෙහිව කටයුතු කිරීම සම්බන්ධයෙන් පොලිසියට චෝදනා නැගූහ. ප්‍රසිද්ධ රැස්වීම්වලදී පවා පොලිස් නිලධාරීන්ව යක්ෂයන්, මිනීමරුවන් ලෙස හැඳින්වීමට කම්කරුවන් යොමු විය.

ට්‍රෑම් රථ වර්ජනය කෙරිගෙන යන අතරතුර ට්‍රෑම් රථ සමාගම පොලිසියේ ආරක්ෂාව ඉල්ලා සිටියේය. මෙහිදී බවුස්ටඩ් සමාගම විසින් ස්වේච්ඡා සේවකයන් යොදා සිටීමත් ඔවුන්ට විරෝධතාකරුවන්ගේ ගල්, බෝතල්, යකඩ ආදියෙන් දමා ගැසීම නිසාත් පොලිසිය කැඳවීමට බලපා තිබිණි. මෙහිදී පොලිසිය විසින් පහරදීම්, කලබල කිරීම්, අනිසි හැසිරීම්, නිකරුණේ ගැවසීම, අසභ්‍ය වචන පාවිච්චි කිරීම වැනි හේතු නිසා කම්කරුවන් රැසක් අත්අඩංගුවට ගන්නා ලදී. ඇතිවෙමින් තිබූ තත්ත්වය මත පොලිසිය අනියමින් ට්‍රෑම් රථ සමාගමට සහය දෙන ආකාරයේ කටයුතු රැසක් සිදුකළේය. මෙය කම්කරුවන්ගේ කෝපය තවදුරටත් තීව්‍ර කළ අතර මේ සමඟම පොලිසිය සමඟ සෘජු ගැටුම් ඇරඹිණි.

1929 පෙබරවාරි 5 වන විට තත්ත්වය උපරිමය කරා ළඟා විය. එදින සාකච්ඡාවක් සඳහා ගුණසිංහ මහතා කැඳවනු ලැබූ අතර සාකච්ඡාවට යමින් සිටින අතරතුර පොලිසිය සහ ඔහු අතර බහින්බස් වීමක් සිදු විය. එය ගැටුමක් දක්වා දුරදිග ගිය අතර එහිදී ගුණසිංහ මහතාට දැඩිලෙස අඩන්තේට්ටම් සිදු වූ බව ප්‍රචාරය විය. මේ ප්‍රචාරයත් සමඟම කම්කරුවෝ දහස් ගණනින් කොළඹ නගරයට පැමිණියහ. ඇතැම් සංඛ්‍යාලේඛන අනුව කම්කරුවන් 20,000ක් පමණ රැස්වූහ. ක්‍රමයෙන් තත්ත්වය නරක අතට හැරුණු අතර "මුළු පොලිසියම මරමු" යැයි රැස්ව සිටි පිරිස් අතරින් කිහිප දෙනක් කෑ ගසන්නට වූහ. තවත් මොහොතකින් රැස්ව සිටි පිරිස අතර සිටි පිරිසෙන් ගල්, බෝතල් ප්‍රහාර මරදාන පොලිසිය වෙත යොමු වන්නට විණි. අසල පිහිටි ගොඩනැගිලිවලටද පහරදීම සිදු විණි. විදුලි ලාම්පු රැසක් ද කුඩු කරන ලද අතර අවසානයේ තත්ත්වය පාලනය කිරීමට පොලිසිය වෙඩි තබන්නට සිදු විය.

ඉබාගාතයේ කළ වෙඩි තැබීමක් වූ මෙයින් 5ක් මියගියහ. තවත් 250කට පමණ තුවාල සිදු විය. එදිනට තත්ත්වය සමනය වුවත් පසුදින උද්ඝෝෂකයෝ නැවැතත් පොලිස් ස්ථානය වැටලූහ. පොලිසියට පහරදුන්හ. බැණ වැදුණහ. තත්ත්වය සමනය කෙරුණේ ගුණසිංහ මහතා පැමිණ ජනතාවට ආපසු නිවෙස් කරා යන ලෙස කරන ලද ඉල්ලීමෙන් පසුවය. මේ වැඩ වර්ජනය එතෙක් පැවැති වැඩවර්ජන මාලාවේ උච්චතම අවස්ථාව විය. එමෙන්ම කම්කරු සංගමය සහ ඒ.ඊ. ගුණසිංහයන් මෙහෙයවනු ලැබූ කම්කරු අරගලවල තීරණාත්මක අවස්ථාව ද විය.

වැඩ වර්ජන මාලාවක උග්‍ර අවස්ථාව වූ මේ අවස්ථාවෙන් පසුව සේව්‍යයෝ සහ ආණ්ඩුව තමන්ගේ ප්‍රතිපත්ති වෙනස් කරගැනීමට කටයුතු කළහ. ඒ අනුව වෘත්තීය සමිතිවලට පිළි ගැනීමක් දීමට කටයුතු කෙරිණි. එමෙන්ම වෘත්තීය සමිති මර්දනය කිරීමට ද නීති කෙටුම් පත් කළහ. පෙබරවාරි මාසයේදී ලංකා ආණ්ඩුව වෘත්තීය සමිති, කම්කරු ආරවුල්, ආරවුල් බේරුම් කිරීම හා අවම වැටුප් යනාදි විෂය සම්බන්ධයෙන් නීති පැනවිණි. ඒ අනුව සේව්‍යයන් සහ කම්කරුවන් අතර සාමූහික ගිවිසුමක් අස්සන් කළහ. 1929 ජූනි මාසයේදී එලෙස සේව්‍යයන්ගේ සම්මේලනයත්, සමස්ත ලංකා කම්කරු සම්මේලනයත් අතර පළමු සාමූහික ගිවිසුම අස්සන් කෙරිණි. මෙහිදී සේව්‍යයන් සමඟ කතාකොට පළමුවෙන්ම එකඟත්වයකට පැමිණීමට උත්සාහ නොකර වැඩ වර්ජන නොකිරීමටත්, සාකච්ඡා අසාර්ථක වුවහොත් ලියවිල්ලක් මගින් දින හතකට පෙර සේව්‍යයන් දැනුවත් නොකර වර්ජන නොකරන බවටත් කම්කරු සම්මේලනය එකඟ විය. මේ අනුව මෙතැනින් පසුව ලංකා කම්කරු ඉතිහාසයේ සුවිශේෂ යුගයක අරඹුමක් සටහන් විය.

◣ **මලික් චමින්ද ධර්මවර්ධන**

දේශපාලන පිටියේ පෙරළි කළ සුව ඇමැතිවරු

සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ ලංකාවේ ස්ථාපිත ප්‍රථම පාර්ලිමේන්තුවේ සෞඛ්‍ය හා පළාත් පාලන අමාත්‍යවරයා ලෙස පත් කරනු ලැබූයේ අත්තනගල්ල මහජන මන්ත්‍රී එස්.ඩබ්ලිව්. ආර්.ඩී.බණ්ඩාරනායක මහතා වන අතර, ඔහු 1947 වසරේදී තේරී පත් වූයේ එවකට ඩී.එස්.සේනානායක මහතා අගමැති පදවිය දරමින් නායකත්වය දැරූ එක්සත් ජාතික පක්ෂයේ නියෝජිතයෙකු වශයෙනි. 1951 ජූලි මාසයේදී ඩී.එස්. සේනානායක රජයේ සියලු තනතුරු මෙන්ම පාර්ලිමේන්තුවේ සභානායක පදවියෙන් ද ඉල්ලා අස් වූ බණ්ඩාරනායක මහතා, ඔහුගේ නායකත්වයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවා ගන්නා ලදී. අනතුරුව 1952 වසරේ පැවති දෙවන පාර්ලිමේන්තු මැතිවරණයේදී බණ්ඩාරනායක මහතා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක තනතුරට පත් වූ අතර, බලයට පත් වූ එ.ජා.ප. රජයේ අග්‍රාමාත්‍ය ඩඩ්ලි සේනානායක මහතා විසින් කඩුගන්නාව පළමුවන මන්ත්‍රී එ.ජා.ප. යේ ඊ.ඒ. නුගවෙල මහතාට සෞඛ්‍ය අමාත්‍ය ධුරය පිරිනමන ලදී.

කෙසේ වුව ද 1956 මහා මැතිවරණයේදී හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයකු වූ බණ්ඩාරනායක මහතා නායකත්වය දුන් මහජන එක්සත් පෙරමුණ නමැති පක්ෂ කිහිපයකින් සමන්විත සන්ධානය විශිෂ්ට ජයක් වාර්තා කරමින් බලයට පත් වූයේ එවක පැවැති එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීධුර සංඛ්‍යාව අටකට සීමා කරවමිනි. මේ අනුව ලංකාවේ තෙවන පාර්ලිමේන්තුවේ අග්‍රාමාත්‍යවරයා වූයේ පළමු පාර්ලිමේන්තුවේ සෞඛ්‍ය අමාත්‍ය ධුරය හෙබවූ එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක මහතායි. 1956 පිහිටු වූ මහජන එක්සත් පෙරමුණු රජයේ සෞඛ්‍ය අමාත්‍ය ධුරය මිරිගම ආසනය දිනා සිටි විමලා විජයවර්ධන මන්ත්‍රීවරියට හිමි වූ අතර, ඇය ලංකාවේ එතෙක් අමාත්‍ය ධුරයකට පත් වූ පළමු කාන්තාව වූවාය. කෙසේ වුව ද 1959 සැප්තැම්බර් මාසයේදී සිදු වූ බණ්ඩාරනායක අගමැතිවරයාගේ ඝාතන සිද්ධියෙන් පසුව උද්ගත වූ තත්ත්වයන් හමුවේ ලංකාවේ පළමුවන කැබිනට් ඇමැතිවරිය ප්‍රසිද්ධ දේශපාලනයෙන් සමුගත් බැව් කියැ වේ.

1960 මාර්තු මාසයේදී බලයට පත් වූ කෙටි කාලීන එක්සත් ජාතික පක්ෂ රජයේ සෞඛ්‍ය හා සමාජ සේවා අමාත්‍ය පදවිය හිමි වී ඇත්තේ උත්තර මන්ත්‍රී ඇම්.වී.පී.පීරිස් මහතාට වන අතර, අනතුරුව 1960 ජූලි මාසයේදී බලයට පත් වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එහි ජ්‍යෙෂ්ඨයකු වූ ඒ.පී.ජයසූරිය මහතාට සෞඛ්‍ය අමාත්‍ය ධුරය පිරිනමන ලදී.

එක්සත් ජාතික පක්ෂයේ නායක ඩඩ්ලි සේනානායක මහතා 1965 බලයට පත් වූ තම රජයේ මුල් සෞඛ්‍ය ඇමැතිවරයා ලෙස පත් කරනු ලැබූයේ පක්ෂයේ ප්‍රබලයකු වූ කොට්ටාව මහජන මන්ත්‍රී ඇම්.ඩී.එච්.ජයවර්ධන මහතාය. පසු කාලීනව එක්සත් ජාතික පක්ෂ නායකත්වයට පත් වූ ජේ.ආර්.ජයවර්ධන මහතා සමඟ එක්දහස් නවසිය අසූ ගණන්වලදී ඇති වූ මතභේදයක් හේතුවෙන් ඔහු දේශපාලනයෙන් ද ඈත් වනු දැකිය හැකි විය. අනතුරුව 1968 වසරේදී ඩඩ්ලි සේනානායක අගමැතිවරයා විසින් සිදු කළ කැබිනට් මණ්ඩල සශෝධනයේදී සෞඛ්‍ය විෂය මධ්‍යම පළාතේ මහනුවර අසුන හෙබවූ ඊ.එල්. සේනානායක අමාත්‍යවරයාට පැවරූ අතර, 1970 මැයි මස පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය අන්ත පරාජයකට පත් වූ නමුත් සෞඛ්‍ය අමාත්‍යවරයා වූ ඊ.එල්.සේනානායක මහතා වැඩි ඡන්ද 1029 කින් ජයගනිමින් මන්ත්‍රී ආසන රැකගැනීමට සමත් වූ ඇමැතිවරු පස් හය දෙනා අතරට පැමිණීමට සමත් විය. 1970 මැතිවරණයෙන් ජයගත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සමඟි පෙරමුණ තම රජයේ සෞඛ්‍ය අමාත්‍ය ධුරය පිරිනමන ලද්දේ හපුතලේ මන්ත්‍රීධුරය දැරූ ඩබ්ලිව්.පී.ජී. ආරියදාස මන්ත්‍රීවරයාට වූ අතර, 1970 මැයි මැතිවරණයේදී ආරියදාස මන්ත්‍රීවරයා අතින් පරාජයට පත් වූයේ එක්සත් ජාතික පක්ෂයේ බළකනුවක් වූ හිටපු රජයේ වැඩ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍ය මොන්ටේගු ජයවික්‍රම මහතායි. 1970 -1977යුගයේදී පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ ඇති වූයේ යැයි කියන ආරිය - සූරිය ගුටිබැට හුවමාරුව ගැන ආරියදාස ඇමැතිවරයාගේ ද නම ඇඳුන බැව් පැවසෙන අතර, ඔහු 1977 පැවැති මැතිවරණයට තරග නොකරම දේශපාලනයෙන් සමුගන්නා සෙයක් දක්නට ලැබුණි. 1975 වසරේදී සමඟි රජයේ පාර්ශවකරුවකු වූ ලංකා සමසමාජ පක්ෂය රජය සමඟ අසමගිවීම නිසා එම පක්ෂය රජයෙන් ඉවත් කළ අතර, ඒ සමඟ ඇති කළ කැබිනට් මණ්ඩල සංශෝධනයේදී සෞඛ්‍ය හා ධීවර අමාත්‍ය ධුරය පිරිනමන ලද්දේ ජාතික රාජ්‍ය සභාවේ මුල්කිරිගල අසුන නියෝජනය කළ ජෝර්ජ් රාජපක්ෂ මහතාටය. රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේදී දකුණු පළාතෙන් බිහි වූ කීර්තිමත් දේශපාලනඥයකු වූ ඩී.ඇම්.රාජපක්ෂ මහතාගේ පුත්‍රයකු වූ ජෝර්ජ් රාජපක්ෂ මහතා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වූ ලක්ෂ්මන් රාජපක්ෂ මහතාගේ ද සොහොයුරෙකි. 1960 මාර්තු මැතිවරණයේ පටන් නොකඩවා මුල්කිරිගල අසුන රැකගැනීමට සමත් වූ ජෝර්ජ් රාජපක්ෂ මහතා, 1976 දී හදිසියේම අභාවප්‍රාප්ත විය. එවිට ඔහු දරමින් සෞඛ්‍ය අමාත්‍ය ධුරය මිරිගම ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රීවරිය හා සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යවරිය ලෙස කටයුතු කළ ශිවා ඔබේසේකර මහත්මියට හිමි විය. ඒ අනුව ලංකාවේ පළමුවන සෞඛ්‍ය අමාත්‍යවරිය මෙන්ම ලංකාවේ දෙවන සෞඛ්‍ය අමාත්‍යවරිය ද නියෝජනය කරන ලද්දේ මිරිගම මැතිවරණ කොට්ඨාසය වීම විශේෂත්වයක් වන අතර, ඇමැතිවරියන් දෙදෙනාම සෞඛ්‍ය අමාත්‍ය ධුර දැරීමෙන් අනතුරුව දේශපාලනයෙන් සමුගත් බැව් ද සඳහන් වේ.

1977 ජූලි මහා මැතිවරණයේදී එවකට ජාතික රාජ්‍ය සභාවේ හයෙන් පහක බලයක් ලබා ගනිමින් පිහිටු වූ එක්සත් ජාතික පක්ෂ රජයේ අග්‍රාමාත්‍ය ජේ.ආර්.ජයවර්ධන මහතා තම සෞඛ්‍ය අමාත්‍යවරයා ලෙස මුලින්ම පත් කරනු ලැබූයේ වරෙක පක්ෂයේ සම ලේකම්වරයකු ලෙස පවා සේවය කොට තිබූ එවකට හෝමාගම එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයා වූ ගාමනී ජයසූරිය මහතාවය. ඔහු අනගාරික ධර්මපාලතුමාට ළඟ ඥාතීත්වයක් තිබූ අවංක, පක්ෂයේ ජ්‍යෙෂ්ඨයකු ලෙස පක්ෂයේ පිළිගැනීමට ලක් වූ දේශපාලනඥයෙකි. 1987 වසරේදී ජනාධිපති හා එක්සත් ජාතික පක්ෂ නායක ජේ.ආර්.ජයවර්ධන මහතා විසින් අති විශාල ජනතා විරෝධයක් හමුවේ අස්සන් කළ ඉන්දු - ලංකා ගිවිසුමට ප්‍රසිද්ධියේ විරෝධය පාමින් තමන් දැරූ සියලු තනතුරුවලින් පමණක් නොව දේශපාලනයෙන් ද සමුගත් ගාමනී ජයසූරිය මහතා, අනතුරුව ආගමික සේවාවන් සඳහා යොමුවනු දක්නට ලැබිණ. ජයසූරිය මහතා තමා අවසාන වශයෙන් වගකීම් ඉසිලූ කෘෂිකර්ම සංවර්ධන ,පර්යේෂණ අමාත්‍ය ධුරයට පත් කරනු ලබන අවස්ථාවේදී සෞඛ්‍ය විෂය පැවරූ අමාත්‍යවරයා වූයේ දොස්තර රංජිත් අතපත්තු මහතා වන අතර, ඔහු නියෝජනය කරමින් තිබුණේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ආසනයයි. 1977 මහ මැතිවරණයේදී මෙන්ම 1982 පැවති අතුරු මැතිවරණයේදීත් ශ්‍රී ලංකාවේ දෙවරක් විධායක ජනාධිපති ධුරය දැරූ මහින්ද රාජපක්ෂ මහතා බෙලිඅත්ත ආසනයෙන් දොස්තර රංජිත් අතපත්තු මහතා අතින් පරාජය වීම විශේෂ සිදුවීමකි.

1989 බලයට පත් වූ ආර්.ප්‍රේමදාස ජනාධිපතිවරයා නායකත්වය දුන් එක්සත් ජාතික පක්ෂ රජයේ සෞඛ්‍ය ඇමැතිවරිය වූයේ නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රිනි රේණුකා හේරත් මහත්මියයි. අවුරුදු දාහතක් පමණ දික් වූ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පෙරළා බලයට පත් වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිනියගේ පොදුජන එක්සත් පෙරමුණු රජයේ මුල්ම සෞඛ්‍ය හා සමාජ සේවා අමාත්‍ය ධුරය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨයකු වූ කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඒ.එච්.එම්. ෆවුසි මහතාට හිමි වූ අතර, 2000 වසරේදී සෞඛ්‍ය අමාත්‍යවරයා වූයේ රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඩබ්ලිව්. ඩී.ජේ. සෙනවිරත්න මහතාය. 2001 වසරේදී පාර්ලිමේන්තු බහුතරය එක්සත් ජාතික පක්ෂයට ලැබීමෙන් අනතුරුව පිහිටු වූ රජයේ සෞඛ්‍ය, පෝෂණ හා සුබසාධන අමාත්‍ය ධුරයට පත් කෙරුණේ දිගාමඩුල්ල දිස්ත්‍රික් එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රී පී.දයාරත්න මහතායි. අනතුරුව එක්සත් ජනතා සන්ධානය 2004 දී බලයට පත්වීමෙන් පසු සෞඛ්‍ය, ආරක්ෂණ පෝෂණ අමාත්‍ය ධුරය පිරිනමන ලද්දේ බදුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නිමල් සිරිපාල ද සිල්වා මහතාටය.

2010 වසරේ ජනපති මහින්ද රාජපක්ෂ මහතා යටතේ පිහිටුවූ එක්සත් ජනතා නිදහස් සන්ධාන රජයේ සෞඛ්‍ය අමාත්‍ය ධුරය පිරිනැමුණේ පොලොන්නරුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මෙන්ම මෛත්‍රීපාල සිරිසේන මහතාටය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම්වරයා ද වූ ඔහු 2014 නොවැම්බර් අගදී තම අමාත්‍ය පදවියෙන් ඉල්ලා අස්වී 2015 ජනාධිපති මැතිවරණ තරග බිමට පිවිසුණේ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ පක්ෂ හා සංවිධාන කිහිපයක පොදු අපේක්ෂක ලෙසටය. එහිදී ශ්‍රී ලාංකීය මැතිවරණ ඉතිහාසයේ ප්‍රථම වතාවට හිටපු ජනාධිපතිවරයකු පරදවා ශ්‍රී ලංකාවේ හයවන විධායක ජනාධිපතිවරයා වන්නට හිටපු සෞඛ්‍ය අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන මහතා සමත් විය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා තමා දැරූ සෞඛ්‍ය අමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස්වෙද්දී ඒ ඇබෑර්තුව පුරවන්නට එවකට එක්සත් ජාතික පක්ෂයේ මහලේකම් තනතුර දරමින් සිටි තිස්ස අත්තනායක මහතා තෝරා ගැනුන අතර, ඔහු එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් තනතුරින් හා පක්ෂයෙන් ඉවත්ව එක්සත් ජනතා සංධාන රජයේ සෞඛ්‍ය අමාත්‍ය ධුරය ඉතා කෙටි කලක් දැරූ අතර ඔහු 2015 අගෝස්තු මහ මැතිවරණයට ද ඉදිරිපත් නොවීය. වත්මන් පාර්ලිමේන්තුවේ තිස්ස අත්තනායක මහතා සමගි ජන බලවේගයේ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙක් ලෙස විපක්

මේ වසර අවසන් වන විට කිරි නිෂ්පාදනය දෙගුණයකින් ඉහළ දමනවා

මිල්කෝ පුද්ගලික සමාගමේ සභාපති ලසන්ත වික්‍රමසිංහ

රටේ ආර්ථිකයට සෘජුවම දායකත්වය ලබාදෙමින් කිරි ගොවියන්ගේ ජීවනෝපාය සවිමත් කිරීම සඳහා මිල්කෝ පුද්ගලික සමාගම ඉහළ දායකත්වයක් ලබාදෙයි. ඒ අනුව අද වනවිට රටේ පවතින තත්ත්වය සැලකිල්ලට ගෙන දේශීය කිරි කර්මාන්තය දියුණු කිරීම සඳහා ගෙන තිබෙන ක්‍රියාමාර්ග, කිරි ගොවියන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා ගෙන තිබෙන වැඩපිළිවෙල මෙන්ම ඉදිරි සැලසුම් සම්බන්ධයෙන් මිල්කෝ පුද්ගලික සමාගමේ සභාපති ලසන්ත වික්‍රමසිංහ, සාමාන්‍යාධිකාරී ඉන්ද්‍රජිත් ඕ. ප්‍රනාන්දු, කළමණාකාර (තත්ත්ව ආරක්ෂණ පරියේෂණ හා සංවර්ධන) කුමාර ජයරත්න මහත්වරුන් සමඟ කළ සාකච්ඡාවකි.

කෘෂිකාර්මික රටක් වන ශ්‍රී ලංකාවට මිල්කෝ ආයතනයේ ඇති වැදගත්කම කුමක් ද?

ආයතනයක් විදියට ගත්තම අනෙකුත් ආයතනවලට සාපේක්ෂව අපේ ක්‍රියාදාමය වෙනස් එකක්. කිරි එකතුකර නිෂ්පාදන කර විකිණීම පමණක් නොවෙයි අපේ වැඩපිළිවෙළ. අපේ කිරි කර්මාන්තය සම්බන්ධයෙන් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරනවා. අද වනවිට අපේ රටේ අවශ්‍යතාවයට කිරි ප්‍රමාණවත් නැහැ. නමුත් කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම වෙනුවෙන් කිසිවෙකු ප්‍රමාණවත් දායකත්වයක් ලබාදෙන්නේ නැහැ. තිබෙන කිරි ටික එකතුකර ගැනීම වෙනුවෙන් නොයෙකුත් දේ කළත් කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම වෙනුවෙන් කිසිවක් කරන්නේ නැහැ. ඒ නිසා කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම වෙනුවෙන් අවධානය යොමු කළයුතු වෙනවා. කර්මාන්තයේ ඵලදායිතාවය ඉහළින් පවත්වාගෙන යමින් දියුණුවක් ළඟා කර ගත යුතු වෙනවා.

තරඟයක් තිබෙන අවස්ථාවක තිබෙන කිරිවලට තරඟ කිරීමෙන් විවිධ අහිතකර තත්ත්වයන්ට මුහුණ දෙන්න සිදුවෙනවා. ඇතැම් ආයතනවල සම්මත ප්‍රමිතීන්ට පිටින් කිරි ගන්නවා. නමුත් අපි අවශ්‍ය ප්‍රමිතියට නොමැති කිරි ප්‍රතික්ෂේප කරනවා. ප්‍රමිතියකින් තොරව රැස්කරන කිරිවලින් පාරිභෝගිකයාට ප්‍රමිතියක් ඇති නිෂ්පාදන ලබාදිය නොහැකි වෙනවා. අපි සාමාන්‍යයෙන් කිරි ලීටරයක සම්මත මිල ගොවියන් වෙනුවෙන් ගෙවනවා. පාරිභෝගිකයා පැත්තෙන් ද අපි අපේ අවධානය යොමු කරනවා. යම්කිසි නිෂ්පාදනයක් වෙනුවෙන් පාරිභෝගිකයාටත් දරාගත හැකි මිලක් තිබෙනවා. ඒ මට්ටමින් ඉහළ යන්නේ නම් එය ඉල්ලුම කෙරෙහි අහිතකර ලෙස බලපානවා. අපේ කර්මාන්තයේ තිබෙන්නේ සාමාන්‍යයෙන් මහජනතාවට අවශ්‍ය දේවල්. ඒවා යම්කිසි මිල මට්ටමක පවත්වාගෙන යායුතු වෙනවා.

රටේ අවශ්‍යතාවය සියයට 100ක් ම ඉටුකරන්න මේ සමාගමට හැකියාව තිබෙනවා ද?

දියුණු රටවල තිබෙන පරිභෝජන රටාවට අපේ රට මේ වනවිට යොමු වෙමින් තිබෙනවා. ඒ අනුව ඊට සරිලන ආකාරයෙන් නිෂ්පාදනය ඉහළ නංවා ගැනීමට අවධානය යොමු කළයුතු වෙනවා. ලංකාව පුරාම කිරි එකතු කිරීමේ ජාලයක් අපේ තිබෙනවා. ලංකාව පුරාම එකතු කිරීමේ මධ්‍යස්ථාන තිබෙනවා. ගම් මට්ටමින් ස්වයං පාලිත කිරිගොවි සමිති තිබෙනවා. රටපුරා මෙම කිරිගොවි සමිති 3000ක් පමණ තිබෙනවා. ක්ෂේත්‍රයේ වැඩ කරන්නේ ඉතාම දක්ෂ, සුදුසුකම් තිබෙන පිරිසක්. කිරි ශීත කිරීමේ මධ්‍යස්ථාන 97ක් තිබෙනවා. අපි මේ වනවිට අලුත් නිෂ්පාදන කිහිපයක් ද හඳුන්වාදෙන්න පියවර ගෙන තිබෙනවා. අලුත් නිෂ්පාදන කිහිපයක් එළඹෙන සිංහල අලුත් අවුරුද්දට පෙර වෙළඳපොළට ඇතුළත් කරන්න බලාපොරොත්තු වෙනවා. අයිස් ක්‍රීම් ඇතුළු නිෂ්පාදන ඊට අයත් වෙනවා. මැතක දී අපි තවත් නිෂ්පාදන ඉදිරිපත් කළා. අපේ නිෂ්පාදන සියල්ලක්ම නිපදවන්නේ දේශීය තැවුම් කිරි යොදාගෙන. අපට කිරි සකස් කිරීම සඳහා කර්මාන්ත ශාලා හතරක් තියෙනවා. මීට අමතරව බඩල්ගම අති නවීන කර්මාසන්ත ශාලාවක් ඉදිවෙමින් පවතිනවා. ඇති තරම් කිරි තිබේ නම් වෙළඳපළට අවශ්‍ය නිෂ්පාදන සැපයීමට ධාරිතාවය අප සතුව තිබෙනවා.

පී ඉන්ද්‍රජිත් ඕ ප්‍රනාන්දු - සාමාන්‍යාධිකාරී

කිරි ගොවියන් මුහුණදෙන ගැටලුවලට විසඳුම් ලබාදෙන්නේ කෙසේ ද?

ඇතැම් අවස්ථාවල මේ කර්මාන්තයට යම්කිසි බලපෑමක් එල්ල කරන්න ඇතැමුන් විවිධ ක්‍රියාදාමයන් සිදුකරනවා. ඒ තත්ත්වය තුළ කිරි ගොවියන්ට පාඩු සිදුවෙනවා. සමහර ආයතන ගොවියාට තාවකාලික ලාභ ප්‍රයෝජන ලබාදෙමින් ගොවීන් තමන් වෙතට නතුකර ගැනීමට උත්සාහ කරනවා. මෙම තාවකාලික ලාභ ප්‍රයෝජන පසුපස යන ගොවීන්ට තම ව්‍යාපාරයේ ඵලදායිතාවය පිළිබඳ අවධානය ගිලිහී යනවා. එවිට ඔවුන්ටත් නොදැනීම ඔවුන්ගේ නිෂ්පාදන පිරිවැය ඉහළ යනවා. මෙවැනි තත්ත්වයන් නිසා කර්මාන්තය විනාශ වෙනවා. යම්කිසි ආකාරයකින් අපි අපේ වියදම් වැඩිකර ගන්නේ නම් ඒ තත්ත්වයට මුහුණ දෙන්න සිදුවෙනවා. වියදම් ඉහළ ගියත් ආදායම් ඊට සාපේක්ෂව ඉහළ යන්නේ නැහැ. ඒ අනුව පිරිවැය ඉහළ යන තත්ත්වයක ඊට පුරුදු වන්නේ නම් ලාභය අහිමිවන තත්ත්වයක් ඇති වෙනවා. එහිදී ණය වෙන්න වෙනවා. මේ තත්ත්වය තුළ රජයේ ආයතනයක් වශයෙන් මිල්කෝ ආයතනය හැමවිටම උත්සාහ කරන්නේ රටේ නිෂ්පාදනය ඉහළ නැංවීමටයි.

ක්‍රමානුකූලව ගවපාලනය සිදුකරමින් සතුන්ට නිසි පෝෂණයක් ලබාදීමෙන් නිෂ්පාදනය වැඩිකළ හැකියි. එමගින් ගොවියාට ද වැඩි ලාභයක් ලබාගැනීමට හැකි වෙනවා. ඒ සඳහා ඉලක්ක කළ වැඩසටහන් අපි ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක කරනවා. සාමාන්‍යයෙන් අපේ රටේ කිරි නිෂ්පාදන අවශ්‍යතාවයෙන් සියයට 40ක් විතර තමයි රටේ නිෂ්පාදනය කරන්නේ. සියයට 60ක ප්‍රමාණයක් ආනයනය කරනවා. කිරිපිටි පාරිභෝජනය අපේ රටේ ඉහළයි. මේ තත්ත්වය තුළ අපේ රටට දරා ගන්නත් බැහැ. රුපියල් බිලියන 50ට වඩා විශාල මුදලක් විදේශ රටවලට වැය වෙනවා. පරිභෝජන රටාව ගත්විට අද වනවිට වෙනස් වී තිබෙනවා. නිෂ්පාදනයට වඩා වැඩි ප්‍රමාණයකින් පරිභෝජනය ඉහළ යාම හොඳ තත්ත්වයක් නොවෙයි. ඒ අනුව ඉල්ලුමට සරිලන නිෂ්පාදනයක් සිදුකළ යුතු වෙනවා. 1500ක් පමණ අපේ සේවකයන් ඉන්නවා. සාමාන්‍යයෙන් අපි මාසයකට රුපියල් මිලියන 1000 ට වැඩි අලෙවියක් තිබෙනවා.

පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ කිරි කර්මාන්තයට එල්ල වී තිබෙන අභියෝග මොනවා ද?

කොවිඩ් වසංගතය කිරි කර්මාන්තයට විශාල වශයෙන් බලපෑමක් කළේ නැහැ. මෙය ආහාර නිෂ්පාදනයක්. ඒ නිසා මිනිසුන්ට ආහාර අවශ්‍යතාවය තිබෙනවා. කොවිඩ් නිසා අපි එක් දිනෙක් හෝ කිරි එකතු කිරීම නතර කළේ නැහැ. අපේ ක්ෂේත්‍ර නිලධාරීන් දිනපතා වැඩකළා. එසේ නොවුනා නම් කිරි ගොවියන් විශාල වශයෙන් පීඩාවට පත් වෙනවා. කිරි බවුසර්වලට ඒ ඒ ප්‍රදේශවලට යන්න අපි විශේෂ අවසර ලබාගත්තා. දිගටම කිරි එකතු කළා. සෞඛ්‍ය උපදේශන අනුව මේ කටයුතු කළා.

කිරි නිෂ්පාදනය අඩාල වූයේ නැහැ. ගොවියන්ට කිරි විකුණා ගන්න බැරි ප්‍රශ්නයකුත් නැහැ. අපිට නිෂ්පාදන විකුණා ගන්න නොහැකි ප්‍රශ්නයකුත් නැහැ. ඇත්තටම ඉල්ලුම ඉහළ ගොස් තිබෙනවා. කිරි එකතු කිරීමේ ජාලයට කිසිඳු බලපෑමක් වුණේ නැහැ. රජයේ සහ ආරක්ෂක අංශවල සහාය ද අපිට ලැබුණා. අපේ වාහනවලට අවසරය ලැබුණා. අඹේවෙල අපේ සේවකයින් ඉන්නේ ගමක් වගේම අපේම නැන්වලයි. ඒ නිසා ඒ අය දිගටම සේවය ලබාදුන්නා.

මේ වනවිට රටපුරාම සිටින කිරි ගොවියන් ප්‍රමාණය කීය ද ? දිනකට කිරි ලීටර් කොපමණ සංඛ්‍යාවක් මිල්කෝ ආයතනයට ලැබෙනවා ද?

මේ අවුරුද්දේ කිරි දුන් එළදෙනුන්ගෙන් කිරි ප්‍රමාණය බෙදූ විට දිනකට කිරි ලීටර් තුනක වැනි සාමාන්‍යයක් තමයි ලැබෙන්නේ. සාමාන්‍යයෙන් කිරිදෙන එළදෙනුන් ලක්ෂ පහක් පමණ ශ්‍රී ලංකාවේ ඉන්නවා. නමුත් 250,000ක් පමණ තමයි කිරි දී තිබෙන්නේ. විවිධ හේතුන් මත මේ තත්ත්වයට පහත වැටී තිබෙනවා. මේක නිරීක්ෂණය කරන විට අපේ කිරි එළදෙනුන්ට වර්ෂය පුරා නිසි පෝෂණයක් ලැබෙන්නේ නැහැ. ඒ නිසාම නිසිපරිදි කිරි ලැබෙන්නේ නැහැ. සියයට 99ක්ම අපිට ඉන්නේ කුඩා කිරි ගොවියන්. අද වනවිට ඉතාම හොඳ කිරි මිලක් තිබෙනවා. මේ තත්ත්වය තුළ කිරි කර්මාන්තයට යොමුව පිරිසේ යම්කිසි වැඩිවීමක් දකිනවා. ක්‍රමානුකූලව කිරි කර්මාන්තයේ නිරත වන්නේ නම් වෙනත් කිසිවක් කිරීමේ අවශ්‍යතාවයක් නැහැ. මේ වනවිට කිරි ගොවීන් 40,000ක් පමණ අප ආයතනයට කිරි සපයනවා. ඔවුන්ගෙන් දිනකට කිරිලීටර් 150,000 පමණ මිල දී ගන්නවා.

රටපුරා විසිරී සිටින කිරි ගොවියන් සඳහා සහන සැලසීමේ වැඩපිළිවෙළ කුමක් ද?

කිරි ගොවියන්ගේ සුබ සාධනය වෙනුවෙන් මිල්කෝ ආයතනය විශේෂ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර තිබෙනවා. කිරි ගොවි සමාජ ආරක්ෂණ අරමුදලක් අපිට තිබෙනවා. 2005 වසරේදී එය ආරම්භ කළා. ඒ මගින් මේ වනවිට ප්‍රතිලාභ 25ක් පමණ ගෙවනවා. මේ සඳහා හැම කිරි ලීටරයකින්ම ශත 25ක් කිරිගොවියා දායක වෙනවා. තවත් ශත 25ක් මිල්කෝ සමාගමෙන් දායකත්වය ලබාදෙනවා. මේ අරමුදල කළමනාකරණය වෙනුවෙන් වෙනම අධ්‍යක්ෂ මණ්ඩලයක් ඉන්නවා. ගොවියන් 10 දෙනෙකු ද මෙහි ඉන්නවා. මිල්කෝ එක පැත්තෙන් පස් දෙනෙක් ඉන්නවා. ඒ අරමුදලින් ප්‍රතිලාභ ලබාදීලත් අතිරික්තය මහ බැංකුවේ බැඳුම්කරවල රුපියල් මිලියන 100 ක් පමණ ආයෝජනය කර තිබෙනවා. මේ අරමුදලින් කිරි ගොවියාට විශ්‍රාම වැටුපක් ලබාදෙන්න ද අපි කටයුතු කර තිබෙනවා. ගොවියන් වෙනුවෙන් විශ්‍රාම වැටුපක් ලබාදෙන එකම ආයතනය මිල්කෝ ආයතනයයි. කිරි ගොවියෙකුට දරුවෙකු ලැබුණාම ප්‍රතිලාභ හිමිවෙනවා.

පාසලට යනවිට ප්‍රතිලාභ ලැබෙනවා. ශිෂ්‍යත්වයට ඉගෙනුම ලබන දරුවන් වෙනුවෙන් පොත් කට්ටලයක් ලබාදෙන්න පියවර ගෙන තිබෙනවා. මේක ලබාදෙන්න පියවර ගන්නවාත් සමඟ ඒ වෙනුවෙන් ලැබුණු ඉල්ලීම් ඉහළ ගියා. මේ තත්ත්වය තුළ වැඩිදෙනෙක් විභාගවලින් සමත් වෙනවා. ඇතැම්විට පාසලක එක් පන්තියක කිරි ගොවියන්ගේ දරුවන් එක් අයෙකු හෝ දෙදෙනෙකු ඉන්නවා. ඒ අයට ලබාදෙන පොත් අරගෙන අනෙකුත් ළමුන්ට ද උගන්වනවා. මේක හොඳ තත්ත්වයක්. ඒ සම්බන්ධයෙන් සතුටු වෙන්න පුළුවන්. සාමාන්‍ය පෙළ විභාගය සඳහා සූදානම් වන දරුවන්ට ද එවැනි පොත් කට්ටලයක් ලබාදෙනවා. ළමයෙක් පළමු වසරට පාසල් යනවිට

කුමාර ජයරත්න - තත්ත්ව පාලන පර්යේෂණ හා සංවර්ධන කලමනාකරු

අපි පොත් කට්ටලයක්, බෑගයක්, සපත්තු ලබාගැනීම සඳහා වවුචරයක් ලබාදෙනවා. ඒ වගේම විශ්ව විද්‍යාල සුදුසුකම් ලබන දරුවන්ට ශිෂ්‍යත්ව පිරිනමනවා. කිරි ගොවියා මියගිය විට මුදලක් ලබාදෙනවා. කිරි ගොවියන්ට විශ්‍රාම වැටුපක් ලබාදෙන්න පියවර ගෙන තිබෙනවා. ඒක කිරි ගොවියන්ට විශාල ශක්තියක් වෙනවා. අද වනවිට අපේ රටේ කිරි ගොවියාට හොඳ පිළිගැනීමක් ඇතිව තිබෙනවා.

රට කිරිවලින් ස්වයංපෝෂිත කිරීමට යන ගමනේ දී පවතින අභියෝග සහ මිල්කෝ සමාගමේ දායකත්වය කෙසේ ද?

කිරි ගොවියන් වෙනුවෙන් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට මිල්කෝ සමාගම පියවර ගෙන තිබෙනවා. කිරි ගවයන් මිලදී ගැනීම සඳහා ණය පහසුකම් ලබාදීමේ කටයුතු සම්බන්ධීකරණය කරනවා. බැංකු හරහා එම ණය ලබාගන්නවා. ඊට අමතරව උපදේශන සේවා ලබාදෙනවා. සහන මිලට ගොවියන් සඳහා පුන්තක්කු ලබාදෙන්න පියවර ගෙන තිබෙනවා. අපේ ජාලය හරහා ප්‍රවාහනය කරමින් ඔවුන්ගේ ගමටම ලබාදෙන්න පියවර ගෙන තිබෙනවා. ඒ වගේම කැබලි කළ තණකොළ කිරි එළදෙනුන් සඳහා ලබාදෙන්න අපි මේ වනවිට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා. එය මේ වනවිට හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියමු ව්‍යාපෘතියක් විදියට ආරම්භ කර තිබෙනවා. එය හැම කලාපයකටම ව්‍යාප්ත කරන්න අපි පියවර ගන්නවා. තණකොළ කුඩා කොටස්වලට කපා ගවයන්ට එය ලබාදීම තුළින් වැඩිපුර කිරි ලබාගත හැකි බව ගොවියන් අවබෝධ කරගෙන සිටිනවා. එය මිල්කෝ සමාගම විතරයි කරන්නේ.

ඒ වගේම කෘත්‍රිම සිංචන කිරීමේ වැඩපිළිවෙළක් ද කරගෙන යනවා. සෑම මසකම අප සමාගම කිරි මුදල් ලෙස රුපියල් මිලියන 500ක් පමණ කිරිගොවීන් අතට ලබාදෙනවා. මෙය අප රටේ ග්‍රාමීය ආර්ථිකයට විශාල දායකත්වයක් සපයනවා. අපිට අනෙකුත් ආයතනවලින් තරඟයක් නැහැ. අපි අපේ ගමන යනවා.

විදේශ රටවලින් කිරි ආයනය කිරීම අපේ රට කිරිවලින් ස්වංයපෝෂිත කිරීමට යන ගමනට බාධාවක් නේද?

දේශීය කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වසරකට සියයට 5ක් හෝ 10ක් බැගින් විදේශ රටවලින් ආයනයනය කිරීම අඩු කළයුතු වෙනවා. කිරිපිටි ආනයනය වෙනුවෙන් වසරකට රුපියල් බිලියන ගණනක් වැය වෙනවා. ළදරු කිරි තම් අවශ්‍ය වෙනවා. අනෙකුත් කිරි එතරම් අවශ්‍ය වන්නේ නැහැ. කිරිපිටි මිල පාලනයක් අවශ්‍ය වන්නේ නැහැ. අනවශ්‍ය විදියට මිල ඉහළ නංවන්නේ නම් පාරිභෝගිකයා තීරණය කරයි. ඇත්තටම දියර කිරි පැත්තට තමයි අපි යොමු වන්න අවශ්‍යයි. කිරිවල අඩංගු පෝෂ්‍ය ගුණය එලෙසම සුරැකෙන්නේ දියර කිරිවල පමණයි. වෙන රටකින් එන පිටි එකේ තිබෙන්නේ කුමක් ද කියා පරීක්ෂා කරන්නේ කොහොම ද ? අපි එකතු කරන කිරි එක කිරිපිටි ලෙස සනියක් තුළ වෙළෙඳපළට එනවා. ඉතා ඉක්මණින් ඒ ක්‍රියාදාමය සිදුවෙනවා.

ආයතනයක් ලෙස ඉදිරියට ගමන් කිරීම සඳහා වන සැලසුම් මොනවා ද?

අපි මේ වසර අවසන් වනවිට අලෙවිය දෙගුණයකින් ඉහළ නංවන්න තමයි බලාපොරොත්තු වෙන්නේ. මේ වසර අවසන් වනවිට රුපියල් බිලියන දෙකක පමණ මාසික අලෙවියක් කළ යුතු වෙනවා. මේ වනවිට රුපියල් බිලියන 1.2ක පමණ මාසික අලෙවියක් කරනවා. කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට ද අපි විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනවා.

සංවාදය
මහින්ද අලුත්ගෙදර

ප්‍රසම්පාදන දැන්වීමයි

ආබාධ සහිත තැනැත්තන් සඳහා උපකරණ මිලදී ගැනීම - 2021

ඌව පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව

ඌව පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ආබාධ සහිත පුද්ගලයින් සඳහා පහත සඳහන් උපකරණ මිලදී ගැනීම පිණිස දේශීය නිෂ්පාදකයින්ගෙන්, සැපයුම්කරුවන්ගෙන් හා ආනයනකරුවන්ගෙන් ලංසු මෙයින් කැඳවනු ලැබේ.

අනු අංකය	වර්ගය	මිලදී ගැනීමට අපේක්ෂිත ප්‍රමාණය	ආපසු ගෙවන ඇප මුදල		ආපසු නොගෙවන ආකෘති පත්‍ර ගාස්තු
			මුදලින් (1%)	බැංකු (2%)	
01	සාමාන්‍ය රෝදපුටු	325	91,000.00	181,000.00	3,500.00
02	කොමඩ් සහිත රෝදපුටු	225			
03	ඇක්ටිව් රෝදපුටු	ඉල්ලීම අනුව			
04	ළමා රෝදපුටු	20			
05	ත්‍රෛසිකල්	15			
06	ඇස් කණ්ණාඩි	2000	110,000.00	220,000.00	3,500.00
07	ශ්‍රවණ උපකරණ	150			
08	කිහිලිකරු / අත්වාරු	625	50,000.00	100,000.00	3,500.00
09	ඇවිදීමේ ආධාරක / හැරමිටි	250			
10	නැමිය හැකි රොලිටර්	ඉල්ලීම අනුව			
11	කෘත්‍රිම අත්පා සහ විදුලියෙන් ක්‍රියා කරන අත්පා	ඉල්ලීම අනුව			
12	වායු මෙට්ට	90			

02. ලංසු ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ඉහත උපලේඛනයේ සඳහන් ගාස්තු ඌව පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ වෙත ගෙවා ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් පසු ලබාගත හැකිය. (සියලුම ගාස්තු භාර ගනු ලබන්නේ ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් පමණි)

ලංසු නිකුත් කිරීම, භාර ගැනීම සහ විවෘත කිරීම පහත පරිදි සිදු කරනු ලැබේ.

ලංසු නිකුත් කිරීම : 2021.03.08 දින සිට බදුල්ල, ආර්. එච්. ගුණවර්ධන මාවතේ පිහිටි ඌව පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ දී,

ලංසු භාර ගැනීම : 2021.03.29 දින හෝ එදිනට පෙර ලැබෙන පරිදි ඌව පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ 2021.03.29 දින ප.ව. 2.00 දක්වා දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය.

ලංසු විවෘත කිරීම : 2021.03.29 දින ලංසු භාරගෙන අවසන් වූ වහාම, ඌඑ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ දී,

තවද මේ පිළිබඳ වැඩි විස්තර ඌව පළාතේ සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත පැමිණ හෝ දුරකථන අංක 055-2230787 හා 055-4934905 මගින් විමසා ලබාගත හැකිය. ආබාධ සහිත තැනැත්තන් සඳහා උපකරණ මිලදී ගැනීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

2021.03.05 දින
බදුල්ල ආර්.එච්. ගුණවර්ධන මාවතේ,
ඌව පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ දීය.

බී.එම්.කේ.ජී. බණ්ඩාර
සමාජ සේවා පළාත් අධ්‍යක්ෂ,
ප්‍රසම්පාදන කමිටුවේ සභාපති.

ප්‍රසම්පාදන දැන්වීමයි

කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය විශ්වවිද්‍යාලය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පමහත දක්වෙන කාර්යය සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍ර, තැබූ ලංසු සඳහා ආරාධනය කෙරේ.

අයිතම අංකය	කොන්ත්‍රාත් අංකය	නම	ඇස්තමේන්තුගත කාර්යය වටිනාකම	පූර්ව ලංසු ඇපකර වටිනාකම	CIDA ලියාපදිංචිය
01	UK/GA/GA3/ AHEAD/32	Developing Fully Equipped Smart Class Rooms in S2 Block	Rs. 1,550,000.00	Rs. 15,500.00	C9&C8

2. ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රියාපටිපාටිය අනුකූලව සිදු වේ. මෙම ප්‍රසම්පාදනය යටතේ සිදුකළ යුතු ඇස්තමේන්තුගත වැඩ වටිනාකම (වැට් බදු සහ වෙනත් බදු හැර) රු. මිලියන 50 ට අඩු වීම නිසා රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක04/2016(iii) හි දක්වා ඇති පරිදි කලාපීය මතාපයන් සහ CIDA මතාපයන් සළකා බලනු ලැබේ.
3. කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලැබීමට නම් ඉල්ලුම්කරුවන් අපලේඛනගත කොන්ත්‍රාත්කරුවන් නොවිය යුතු අතර, ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (CIDA) ලියාපදිංචි විය යුතු අතර, යෝග්‍යතාව ඉහත දක්වා ඇති ආකාරයට ඔවුන් විසින් සපුරාලිය යුතුය.
4. ඉහත අයිතමයන් සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු වැඩ ඉංජිනේරු (0112903164) වැඩ අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය වෙතින්ද ලංසු කැඳවීමේ ලේඛන පරීක්ෂා කිරීම සහකාර ලේඛකාධිකාරී / සාමාන්‍ය පාලන, කැලණිය විශ්වවිද්‍යාලය වෙතින් ද 2021 මාර්තු මස 05 වන දින සිට 2021 මාර්තු මස 24 වන දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට පෙ.ව. 11.30 දක්වා සහ ප.ව. 1.30 සිට ප.ව. 2.30 දක්වා කළ හැකි වේ.
5. ලංසුකරුවන් ආපසු නොගෙවනු ලබන රුපියල් 1,000.00 ක ගාස්තුවක් විශ්වවිද්‍යාලය වෙත ගෙවා ලිඛිත ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමෙන් පසුව 2021 මාර්තු මස 05 වන දින සිට 2021 මාර්තු මස 24 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව.9.00 සිට පෙ.ව. 11.30 දක්වා සහ ප.ව. 1.30 සිට ප.ව. 2.30 දක්වා ලංසු කැඳවීමේ ලේඛනවල සම්පූර්ණ ඉංග්‍රීසි භාෂාමය පිටපතක් සහකාර ලේඛකාධිකාරී / සාමාන්‍ය පාලන, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය වෙතින් ලබාගත හැකි වේ. අදළ ගෙවීම් මුදලින් කළයුතු වේ.
6. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ලංසු මුද්‍ර, තබා 2021 මාර්තු මස 25 වන දින පස්වරු 2.30 ට පෙර විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ආරක්ෂක නිලධාරී කාර්යාලය අසල තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. 2021 මාර්තු මස 25 වන දින පස්වරු 2.30 ට ලංසු විවෘත කරනු ලබන අතර, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට මෙම අවස්ථාවට සහභාගි විය හැකිය.
7. සියලුම ලංසු සමග සේවා නියුක්තිකයාට පිළිගත හැකි ලංසු සුරක්ෂණ ආකෘතියට අනුව (මේ සඳහා ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය (Instituite for Construction, Training & Development ICTAD) මගින් ප්‍රකාශයට පත් කරනු ලබන සම්මත ලංසු තැබීමේ ලේඛනයෙහි අඩංගු කාණ්ඩ අංක09 (Standared Bidding Document - Section 09) අන්තර්ගත වන ලංසු සුරක්ෂණ ආකෘතිය යොදගත යුතු වේ. ශ්‍රී ලංකාවේ බලපවත්වන බැංකුවකින් (ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි) ලබාගත් හෝ රක්ෂණ ආයතනයකින් හෝ ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලින් ලබාගත් ලංසු සුරක්ෂණයක් හෝ අදළ ලංසු සුරක්ෂණය සඳහා නියමිත මුදල විශ්වවිද්‍යාලයේ සරප් වෙත තැන්පත් කර එම රසිදිපත ඉදිරිපත් කළ යුතුය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
කැලණිය විශ්වවිද්‍යාලය,
දළුගම, කැලණිය.

2021.03.05

දිනමිණ The Dinamina

ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

වාහන වෙන්දේසි කිරීම සඳහා මිල ගණන් කැඳවීම

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව - දකුණු පළාත

දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සතු භාවිතයෙන් ඉවත් කරන ලද පහත විස්තර සඳහන් වාහන වෙන්දේසි කිරීම සඳහා සීල් තැබූ ටෙන්ඩර් මා විසින් කැඳවනු ලැබේ.

අනු අංක	වාහන අංකය	වර්ගය	නිෂ්පාදිත වර්ෂය	වාහනය නවතා ඇති ස්ථානය	චැසි අංකය හා එන්ජින් අංකය	ආපසු ගෙවන ලංසු ඇප තැන්පත් මුදල
01	52-2935	Mitsubishi L - 200 කැබ් රථය	1991	සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය, රුහුණු මාගම් පුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට.	CINK340MP -00736 4D56DR6991	රු. 10,000/-
02	51-0674 (ලියාපදිංචිය අවලංගු කර ඇත)	ISUZU TFR54-OPEN		ද.ප. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, නො. 211, වත්වැල්ල පාර, ගාල්ල.	අබලි වාහනයකි	රු. 2,000/-

මේ පිළිබඳව වැඩි විස්තර සඳහා දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ www.landsp.lk වෙබ් අඩවියට (නවතම පුවත්) හා දෙපාර්තමේන්තුවේ නම සඳහන් මුහුණුපොතට පිවිසීමෙන් ලබාගත හැක.

ටී.ජී. සරත් කුමාර - ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව - දකුණු පළාත.
2021.03.02 දින
දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව.
අංක 211, වත්වැල්ල පාර, ගාල්ල.

නැගෙනහිර පළාත් සාහිත්‍ය කලා මහෝත්සවය - 2021

පෙර'ඹර ප්‍රතිභා සම්මාන ප්‍රදානය, පෙර'ඹර යොවුන් සම්මාන ප්‍රදානය
පෙර'ඹර කෙටි චිත්‍රපටි තරගාවලිය හා පෙර'ඹර ලේඛක අත්වැල වැඩසටහන

නැගෙනහිර පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් 2021 වර්ෂයේ දී පැවැත්වීමට නියමිත පළාත් සාහිත්‍ය කලා මහෝත්සවයට සමගාමීව පහත සඳහන් වැඩසටහන් හා සම්මාන ප්‍රදානයන් වෙනුවෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. නැගෙනහිර පළාතේ අවම වශයෙන් අවුරුදු 05 කට වඩා වැඩි කාලයක් පදිංචි පුද්ගලයින් මේ සඳහා සුදුසුකම් ලබයි.

01. පෙර'ඹර ප්‍රතිභා සම්මාන ප්‍රදානය - 2021

නැගෙනහිර පළාත් සාහිත්‍ය උළෙලට සමගාමීව පෙර'ඹර ප්‍රතිභා සම්මාන ප්‍රදානය මෙවර ද ක්‍රියාත්මක කිරීමට නියමිතය.

සාහිත්‍ය, කලා හෝ සංස්කෘතිය ට අදාළ විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ දස්කම් දැක්වූ ප්‍රවීනයන්, විශිෂ්ඨයන් ඇගයීම මෙහි මූලික අරමුණ වන අතර, අයදුම්කරුවන් වයස අවුරුදු 50 ට වැඩි විය යුතු අතර ම නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන් ද විය යුතුය.

මේ සඳහා අයදුම් කරන කලාකරුවන් තම අයදුම්පත සමග පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූප 02 ක් හා ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති සහතික පිටපත් සියල්ල 2021 අප්‍රේල් 01 දිනට පෙර අදාළ කොට්ඨාසයේ සංස්කෘතික නිලධාරි මගින් ප්‍රාදේශීය ලේකම්වරයාට භාර දිය යුතුය.

02. පෙර'ඹර යොවුන් සම්මාන ප්‍රදානය - 2021

නැගෙනහිර පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තෙමේන්තුව සංවිධානය කරන මෙම පෙර'ඹර යොවුන් සම්මාන ප්‍රදානය මගින් පළාතේ ස්ථිර පදිංචි යොවුන් කලාකරුවන්, සාහිත්‍ය නිර්මාණකරුවන්, සංස්කෘතික ක්ෂේත්‍රයට අදාළ විවිධ ක්ෂේත්‍රයන්ගේ ප්‍රවීනත්වයට පත් යොවුන් කලාකරුවන් ඇගයීමට භාජනය කෙරේ. මෙහි මූලික අරමුණ වනුයේ සාහිත්‍ය කලා සංස්කෘතික ක්ෂේත්‍රයට පිවිසි අංකුර යොවුන් කලාකරුවන් යම් ඇගයීමකට හා සමාජීය පිළිගැනීමකට ලක් කිරීමයි.

අයදුම්කරුවන් වයස අවුරුදු 50 ට අඩු විය යුතු අතර, ඉදිරිපත් කරන අයදුම්පත්‍රය සමග අදාළ ක්ෂේත්‍රයේ දැනට ලබා ඇති සහතිකයන්හි සහතික කළ ඡායාස්ථ පිටපත් සියල්ල හා පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූප 02 ක් ද සමග 2021 අප්‍රේල් 01 දිනට පෙර අදාළ කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ට හෝ සංස්කෘතික නිලධාරි වෙත භාරදීම කළ හැකිය.

03. පෙර'ඹර ලේඛක අත්වැල වැඩසටහන - 2021 (මුද්‍රිත ග්‍රන්ථ මිලදී ගැනීම)

නැගෙනහිර පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව සිදුකරනු ලබන පෙර'ඹර ලේඛක අත්වැල වැඩසටහන යටතේ **'නැගෙනහිර පළාත් ලේඛකයින් ගේ ග්‍රන්ථ මිලදී ගැනීමේ වැඩසටහන'** මෙම වසරේදී ද ක්‍රියාත්මක කිරීමට නියමිතය. 2021.01.01 දින සිට 2020.12.31 දින දක්වා නැගෙනහිර පළාත් ලේඛකයින් විසින් මුද්‍රණය කරන ලදුව එළිදක්වනලද ග්‍රන්ථ අප දෙපාර්තමේන්තුවේ ග්‍රන්ථ මිලදී ගැනීමේ වැඩසටහන යටතේ ලබාදීමට ඔබ කැමැතිනම් නියමිත අයදුම්පත සම්පූර්ණ කර ග්‍රන්ථයෙහි පිටපත් දෙකක් සමග එවිය හැකිය.

විශේෂයෙන් අධ්‍යාපනික වටිනාකමින් යුත් ග්‍රන්ථ මිලදී ගැනීමට තීරණය කර ඇති හෙයින් ඒ සඳහා වඩා ප්‍රමුඛතාවකින් යුතුව කටයුතු කරන බව අවධාරණය කරමි.

එවනු ලබන නිර්මාණ සියල්ලම මිලදී ගනු ලබන බවට සහතික විය නොහැකි අතර, සුදුසු නිර්මාණ තේරීම් කමිටුවක් මගින් තෝරාගෙන මිලදී ගැනීමට පියවර ගනු ලැබේ. සියලු ග්‍රන්ථ 2021 අප්‍රේල් 01 දිනට පෙර අප දෙපාර්තමේන්තු ලිපිනයට එවිය යුතුය. අදාළ දිනට පසුව ලැබෙන අයදුම්පත් හා ග්‍රන්ථ ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව කාරුණිකව දන්වමි.

04. පෙර'ඹර ලේඛක අත්වැල වැඩසටහන - 2021 (ග්‍රන්ථ මුද්‍රණය කිරීමේ වැඩසටහන)

නැගෙනහිර පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් තම අත්පිටපත් ග්‍රන්ථ ලෙස එළිදැක්වීමට අපේක්ෂා කරන නැගෙනහිර පළාතේ නිර්මාණකරුවන්ගේ නිර්මාණ මුද්‍රණය කර එළිදැක්වීමට මෙම වසරේදී තීරණය කර ඇත. ගවේෂණාත්මක නිර්මාණ, ප්‍රදේශය හා කලාවන් පිළිබඳ පර්යේෂණමය නිර්මාණ, දැනුම හා තාක්ෂණය, ගිලිහී යන කලාවන් පිළිබඳ ලිපි සාහිත්‍ය, ඉතිහාසය, නාට්‍ය, කාව්‍ය, ළමා සාහිත්‍ය, කෙටිකතා, නවකතා ආදිය අත්පිටපත් ලෙස තබාගෙන සිටින අය මෙයට අයදුම්කළ හැකිය. තම නිර්මාණ (A4 ප්‍රමාණයේ) පිටු 300 කට වඩා අඩුවෙන් හා පිටු 50 ට වඩා වැඩි වන සේ ඇතුළත් වන පරිදි පරිගණකයෙන් යතුරු ලියනය කර (Font Size 12/ FM Bindumathi හෝ FM abaya විය යුතු අතර Word document) දෘඩ පිටපත හා එහි මෘදු පිටපත ආරක්ෂිතව අපවෙත එවිය යුතුය.

එවනු ලබන නිර්මාණ සියල්ලම මුද්‍රණය කරනු ලබන බවට සහතික විය නොහැකිය. සුදුසු නිර්මාණ තේරීම් කමිටුවක් මගින් තෝරාගෙන මුද්‍රණය කර එළිදැක්වීමට පියවර ගනු ලැබේ. සියලු නිර්මාණ 2021 අප්‍රේල් 01 දිනට පෙර අප දෙපාර්තමේන්තුව වෙත යොමුකළ යුතුය.

මීට ඉහත වර්ෂවලදී දෙපාර්තමේන්තුව මගින් මෙවැනි ග්‍රන්ථ මුද්‍රණය කළ කතුවරුන්ගේ ග්‍රන්ථ මුද්‍රණය නොකිරීමට දෙපාර්තමේන්තුව පොදු තීරණයක් ගෙන ඇත.

05. පෙර'ඹර කෙටි චිත්‍රපටි තරගාවලිය - 2021

සුවිශේෂී අරමුණු

- පළාතේ විවිධ දක්ෂතා ඇති නිර්මාණ ශිල්පීන් අතරින් කෙටි චිත්‍රපටි නිර්මාණකරණයේ යෙදෙන ශිල්පීන් හඳුනා ගැනීම.
- ඔවුන්ගේ දක්ෂතා ජාතික තලයට ඔසවා තැබීම හා පළාත් වශයෙන් ඇගයීමට ලක් කිරීම
- ජාතික ඒකාබද්ධතාවයට කෙටි චිත්‍රපට තුළින් ලබා දෙන දායකත්වය ඉහළ දැමීම හා ඒ පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම.
- ශ්‍රී ලාංකීය ඇසි දිසි කලාවේ තවත් එක් මානයක දෙරටු නැගෙනහිර පළාතේ විවෘත කිරීම
- උසස් රසවින්දනයකට මෙම පළාතේ රසික සහෘදයන්ට අවස්ථා ලබා දීම
- කෙටි චිත්‍රපට කලාවේ දේශීය මෙන්ම විදේශීය ප්‍රවනතා පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීම හා අප පළාත තුළ එය ප්‍රවර්ධනය කිරීම, බෙදා හැරීම.

01. පසුගිය වසර 02 (2019 / 2020) තුල නිෂ්පාදනය කරන ලද කෙටි චිත්‍රපට මේ සඳහා ඉදිරිපත් කළ හැකිය.
02. ජාතික සමගිය, සහයෝගිතාවය, සාමය, සහජීවනය, පරිසර ආරක්ෂණය, සමාජ ආරක්ෂණය, සමාජ සාරධර්ම ප්‍රවර්ධනය, ළමා ආරක්ෂණය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, අධ්‍යාපනික දියුණුව හා ආර්ථික සංවර්ධනය ආදිය පිළිබිඹු කරන ආකාරයෙන් මෙම කෙටි චිත්‍රපටවල තේමාව සකස් වී තිබිය යුතුයි.
03. අදාළ නිර්මාණ තුළින් ශ්‍රී ලංකාවේ ස්වෛරී භාවයට හෝ යම් ජන කොටසකට හෝ ආගමකට හානියක් ඇති නොවීමට අධ්‍යක්ෂවරයා හා නිෂ්පාදකවරයා මෙන්ම ශිල්පීන්ද වගබලා ගත යුතුයි.
04. කෙටි චිත්‍රපට දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන විට සංයුක්ත තැටියක් (CD) හෝ Mp 4 ප්‍රමාණයෙන් Pen drive එකක් මගින් ඉදිරිපත් කළ හැකිය.
05. 2021.04.01 දින දක්වා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සංස්කෘතික නිලධාරි වෙත හෝ සෘජු ලෙසම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව වෙත ඔබගේ නිර්මාණ ඉදිරිපත් කළහැකිය.

සියලු අයදුම්පත්‍ර සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් http://www.ep.gov.lk/ දරන වෙබ් අඩවිය මගින් ලබාගත හැක. වැඩිදුර තොරතුරු සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සිටින සංස්කෘතික නිලධාරීන් මගින් හෝ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 026-2220036 දරන දුරකථන අංකය ඇමතීමෙන් ලබාගත හැක.

සියලු අයදුම්පත් හා ග්‍රන්ථ පහත ලිපිනයට යොමු කරන්න.

එස්. නවනීදන්,
අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත.
2021.02.10

පළාත් අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව (නැ.ප.),
ඇතුල් වරාය පාර, ත්‍රිකුණාමලය.

ධීවර අමාත්‍යාංශය

විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය

NAQDA

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

ලංසු සඳහා ඇරයුම

ප්‍රසම්පාදන දැන්වීම

01. ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (විශාල) හී සභාපති විසින් පහත ප්‍රසම්පාදනය සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසුපත් කැඳවනු ලැබේ.

කොන්ත්‍රාත් අංකය හා නම	ලංසු ආරක්ෂණය (ශ්‍රී. රු.)	නැවත නොගෙවන ලංසු පත් වටිනාකම (ශ්‍රී.රු)	ලංසුපත් නිකුත් කිරීමේ අවසන් දිනය හා වේලාව	ලංසුපත් භාරගන්නා අවසන් දිනය හා වේලාව
NQ/DPC/2021/NCB/G/06 ඇසිත්තත් ඇඟිලිලත් දක්වා වර්ධනය කිරීම සඳහා මත්ස්‍ය කුඩු ප්‍රම්පාදනය	250,000.00 දින 121 (24.07.2021 දක්වා)	5,000.00	25.03.2021 දින ප.ව. 3.00	26.03.2021 දින ප.ව. 2.00
NQ/DPC/2021/NCB/G/07 මත්ස්‍ය ආහාර අමුද්‍රව්‍ය ප්‍රසම්පාදනය	ලංසු ආරක්ෂණයේ වටිනාකම ලංසු ලේඛනයේ දක්වා ඇත දින 121 (24.07.2021 දක්වා)	5,000.00	25.03.2021 දින ප.ව. 3.00	26.03.2021 දින ප.ව. 2.00
NQ/DPC/2021/NCB/G/09 Artemia (Brine Shrimp) ප්‍රසම්පාදනය	250,000.00 දින 121 (24.07.2021) දක්වා	5,000.00	25.03.2021 දින ප.ව. 3.00	26.03.2021 දින ප.ව. 2.00

02. සුදුසුකම්ලත් ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු ප්‍රසම්පාදන නිලධාරී වෙතින් (දු.අ. 071-7724430, 011 2786544 / 6495, ෆැක්ස් : 011 2786493 / 6575, විද්‍යුත් තැපැල po@naqda.gov.lk) ලබා ගතහැකි අතර, වෙබ් අඩවිය www.naqda.gov.lk මගින් සහ **2021.03.05 දින සිට 2021.03.25 දින දක්වා පෙ. ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා** වූ කාර්යාල වේලාවන් තුළදී ලංසුපත් නොමිලේ පරීක්ෂා කළ හැක.
03. සුදුසුකම් ඇති ලංසුකරුවන් හට ඉහත කාලසීමාව තුළදී ඉහත දක්වා ඇති නැවත නොගෙවනු ලබන ලංසුපත් වටිනාකම මුදලින් ගෙවා ලිඛිතව ඉල්ලුම් කිරීමෙන් සම්පූර්ණ ලංසුපත පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.
04. ලංසුපත් වලංගු කාල සීමාව ලංසුපත් භාරගන්නා අවසන් දින සිට දින අනූ එකක් (91) (2021.06.24 දක්වා) විය යුතුය.
05. ශ්‍රී ලංකා මහබැංකුව විසින් අනුමත වාණිජ බැංකුවක් මගින් ලබාගත් ලංසු ආරක්ෂණයක් සමග ලංසුපත් පොදු කොන්දේසි වලට අනුගතව ඉහත සඳහන් ලංසුපත් භාරගන්නා අවසන් දින හෝ පෙර පහතින් දක්වා ඇති ලිපිනයට භාර දිය යුතුය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව - (විශාල)
ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය,
41/1, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

ලංසු සඳහා ආරාධනයයි (IFB)

සෞඛ්‍ය අමාත්‍යාංශය

දකුණු කොළඹ ශික්ෂණ රෝහල

කළුබෝවිල

කළුබෝවිල දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂක වෙනුවෙන් **කළුබෝවිල දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති** විසින් පහත සඳහන් යෝග්‍යතා අවශ්‍යතාවයන් හා සුදුසුකම් සපුරාලන ප්‍රභවයන් වෙතින් පහත සඳහන් කාර්ය කර්මාන්ත ඉටුකිරීම සඳහා යෝග්‍යතා / නිපුණතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

අංකය	කාර්යය විස්තරය	ලංසු අංකය	යෝග්‍යතා අවශ්‍යතා	ලංසු සුරක්ෂණ ඇපකරය (රුපියල්)	ආපසු ගෙවනු නොලබන ගාස්තු (රුපියල්)	ලංසු භාරගන්නා අවසාන දිනය හා වේලාව
01.	යෝජිත DSA ඒකකයට වෛනයිල් බිම් අතුරණ සැපයීම හා ඇතිරීම	4/2021	වෛනයිල් බිම් අතුරණ සැපයීම හා ඇතිරීම පිළිබඳ **වසර තුනක (03) පළපුරුද්ද**	14,000.00	2,000.00	2021.03.24 පැය 10.00 දක්වා
02.	අධ්‍යක්ෂක කාර්යාලය ව්‍යාප්ත / දීර්ඝ කිරීම	5/2021	CIDA ප්‍රවර්ගයහි **C 08** හෝ ඉහළ (ගොඩනැගිලි) ක්ෂේත්‍රය	72,000.00	1,000.00	- එම -
03.	වාට්ටු අංක 24 සඳහා වෛනයිල් තහඩු සැපයීම හා ස්ථාපනය කිරීම	6/2021	CIDA ප්‍රවර්ගය **C 08** හෝ ඉහළ (ගොඩනැගිලි) ක්ෂේත්‍රය	43,000.00	1,000.00	- එම -

01. ලංසුකරණය, ජාතික තරගකාරී ලංසුකරණ (NCB) පටිපාටිය යටතේ සිදුකරනු ලැබේ.
02. අභිලාෂී ලංසුකරුවන්හට වැඩිදුර තොරතුරු කළුබෝවිල, දකුණු කොළඹ ශික්ෂණ රෝහලෙ හි පරිපාලන ශාඛාව වෙතින් විමසා ලබාගත හැකිවන අතර, ලංසු ලිපිලේඛන පැය 9.00 සිට පැය 14.00 දක්වා අතරතුර පරීක්ෂාකර බැලිය හැකිය.
03. අභිලාෂී ලංසුකරුවන්හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටයලක් කළුබෝවිල, දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂක වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ඉහත වගුවේ සඳහන් පරිදි වන ආපසු ගෙවනු නොලබන අදාළ ගාස්තු ගෙවීමෙන් අනතුරුව **2021.03.08 වන දින සිට 2021.03.23 වන දින දක්වා** (සෙනසුරාද, ඉරිදා සහ රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හිදී හැර) රාජකාරී දිනවලදී **පැය 09.00 සිට පැය 15.00 දක්වා** අතරතුර මිලදී ගත හැකිය.
04. සම්පූර්ණ කරනල ද ලංසු, අතින් ගෙනැවිත් භාරදීම හෝ පහත ලිපිනයට ලේඛනගත තැපෑලෙන් එවීම හෝ **කළුබෝවිල දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂක කාර්යාලය** වෙත ලැබෙන සේ **2021.03.24 වන දින පැය 10.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ** සිදුකළ යුතු වන්නේය.
05. ලංසු පැමිණ සිටින ලංසුකරුවන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේදී එම ලංසු භාරගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම විවෘත කරනු ලැබේ.

සභාපති,
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
දකුණු කොළඹ ශික්ෂණ රෝහල,
කළුබෝවිල.

විමසුම් : 0112-763064, 0112-763762

ප්‍රවාහන වෛද්‍ය ආයතනයට එන රියැදුරන්ට අවයව දායකත්ව හිමිකම් කාඩ්පතක්

ජාතික අවයව බද්ධ කිරීමේ වැඩසටහන හා ප්‍රවාහන අමාත්‍යාංශය ඒකාබද්ධව ක්‍රියාත්මක කරන වැඩසටහන ආරම්භ කරමින් අදාළ කාඩ්පත ඇමැති දිළුම් අමුණුගම මහතාට දුන් අයුරු.

අසේල කුරුළුවංශ

රියැදුරු බලපත් අලුත් කර ගැනීමට අලුතින් ගැනීමට අවශ්‍යය වෛද්‍ය සහතික ලබා ගැනීමට ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය යටතේ ඇති පළාත් දිස්ත්‍රික් මධ්‍යස්ථාන වෙත පැමිණෙන අයගේ කැමැත්ත මත ඔවුන්ට අවයව දායකත්ව කාඩ්පතක් නිකුත් කිරීමට පියවර ගෙන තිබේ.

ප්‍රවාහන අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අවයව බද්ධ කිරීමේ ජාතික ව්‍යාපාරය ඒකාබද්ධව මේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරයි. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ මහනුවර ශාඛාව පසුගියදා (02) විවෘත කළ අවස්ථාවේ අදාළ සාමාජික කාඩ්පත ප්‍රවාහන රාජ්‍ය ඇමැති දිළුම් අමුණුගම මහතාට පිරිනමනු ලැබිය.

අවයව දීමට කැමැත්ත ප්‍රකාශ කළ පුද්ගලයන්ට වෛද්‍ය සහතිකය ලබා ගන්නා අවස්ථාවේදීම විශේෂ කාඩ්පතක් නිකුත් කරන බවත් එම පුද්ගලයන්ගේ රියැදුරු බලපත්‍රයේද ඒ බව සංකේතයක් මගින් සටහන් කරන බවත් නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සෞඛ්‍ය සේවා) විශේෂඥ වෛද්‍ය ලාල් පනාපිටිය මහතා කීය.

හදිසි අනතුරකට ලක්ව රෝහලක දැඩි සත්කාර ඒකකයක ප්‍රතිකාර ලබමින් සිටින පුද්ගලයකුගේ ජීවිතය බේරා ගැනීමට නොහැකි බවට වෛද්‍යවරු තීරණය කරන අවස්ථාවක ඔහුගේ ශරීර අවයව වෙනත් පුද්ගලයකුට බද්ධ කිරීමට ලබා ගැනීම අසීරු බවත් නව වැඩපිළිවෙළ යටතේ එවැනි පුද්ගලයකුගේ අවයව ලබා ගැනීමට ඇති ගැටලු මඟ හැරෙන බවත් පනාපිටිය මහතා පැවසීය.

වසරකට 5000ක පමණ පිරිසක් ශරීරයේ අවයව අකරමණ්‍ය වීමෙන් මරණයට පත්වන බවත් මේ වනවිට අවයව සොයා ගැනීමට ඇති අපහසුතා නිසා ඉන් ජීවත් කිරීමට හැකියාව ලැබී තිබෙන්නේ 400 ක පමණ පිරිසක් පමණක් බවත් නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රකාශ කළේය.

'පන්සලෙන් ගමට' ප්‍රජා සත්කාරයෙන් දිළිඳු පවුලකට නව නිවෙසක්

රත්නසිරි පතිරණ

දොම්පේ, මිල්ලකඩේ විවේකාරාමාධිපති කොටපොල සුධම්ම හිමියන්ගේ සංකල්පයක් වන 'පන්සලෙන් ගමට' වැඩසටහන යටතේ අහිංසක පවුලක් වෙත ඉඩම් කොටසක් පරිත්‍යාග කිරීම පසුගියදා සුධම්ම හිමියන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරුණි. එහිදී එම ඉඩමේ නව නිවෙසක් තනාදීමට ද පියවර ගනු ලැබිණි. කොළඹ 'කළම්බු රෝයල්ට්' සිංහ සමාජයේ හිටපු සභාපතිනී සිංහ යමුනා සෙනෙවිරත්න මහත්මිය ඒ සඳහා මූල්‍ය පරිත්‍යාගයක් ද සිදු කළාය. එසේ නිම කළ නව නිවෙස විදරු මවක වන චාලට් මැණිකේ මහත්මියට බාරදීම සිදු කළ අතර, ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික් 306 සී 1 සිංහාධිපති චේතිය එස්. පරණතන්ත්‍රී මහතා සහ එම මහත්මිය අතින් සිදුවිය.

නිවාසලාභී චාලට් මැණිකේ, සිංහ ශ්‍රේස් පෙරේරා, සිංහ ෂෙරින් පොන්සේකා, සිංහ මාලා පරණතන්ත්‍රී, සිංහ යමුනා සෙනවිරත්න, සිංහාධිපති චේතිය එස්. පරණතන්ත්‍රී, කොටපොළ සුධම්ම හිමි විශේෂ ආරාධිතයකු වූ විද්‍යාකීර්ති අනුර සී. පෙරේරා, සිංහ ඇන්ටන් ජයමාන්න මහත්ම මහත්මීහු මෙහි වෙති.

මහසඟරුවනේ සමඟිය සමස්ත ජාතියේම ඉදිරි පැවැත්මට හේතු වෙනවා

ආචාර්ය ඕමල්පේ සෝහිත නාහිමි

උපාලි කරුණාරත්න

ධර්ම විකෘතියට එරෙහිව ධාර්මික මඟ පෙන්වා දෙනු වස් ' සද්ධර්ම කතිකාවත ' රාජගිරිය ජයසේකරාරාමයේදී පෙරේදා(02) ආරම්භ විය.

මේ ධර්ම සභාවේ මුලසුන හෙබවූයේ අග්ගමහා පණ්ඩිත ගන්තුනේ අස්සජි මහ නාහිමි, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඉත්තදෙමලියේ ඉන්දසර නාහිමි, ආචාර්ය ඕමල්පේ සෝහිත නාහිමිවරුන්ය.

මහාචාර්ය අගලකඩ සිරිසුමන හිමියන් මෙහිදී අවධාරණය කළේ, ඇතැම් භික්ෂූන්ගේ ධර්ම දේශනා පිළිවෙළක් නැති බවයි. මේ නිසා ධර්ම දේශනය ශ්‍රවණයට පැමිණි දායකයන් විශාල අපහසුතාවකට පත්වන බවත් උන් වහන්සේ ප්‍රකාශ කළහ. ආචාර්ය ඕමල්පේ සෝහිත නාහිමියන්, වත්මන් ලාංකීය සංඝ සමාජය තීව්‍ර ලෙස විභේදනය වී තිබීම ධර්ම විකෘතියේ පැවැත්මට හා වර්ධනයට මහත් රුකුලක් වී ඇති බවත් පැවසූහ.මහා සංඝරත්නයේ සමඟිය සමස්ත ජාතියේම ඉදිරි පැවැත්මට හේතු වන්නක්යැයිද නාහිමියෝ ප්‍රකාශ කළහ. මහාචාර්ය මැදගොඩ අභයතිස්ස නාහිමියෝ මේ අවස්ථාවට සහභාගි වෙමින් ප්‍රකාශ කළේ, වාදබේද අමතක කර ධර්ම විකෘතියට පිළිතුරු සෙවිය යුතු බවයි. ඒ සඳහා මහ නාහිමිවරුන් වැඩි අවධානයක් යොමු කළයුතුයැයිද උන් වහන්සේ පැවසූහ. රජවත්තේ වජිර නාහිමියෝ, සම්බුද්ධ ශාසනයට අභියෝග එල්ල වූ අවස්ථාවේදී ගැටලු විසඳීමට ඒකරාශී වී කටයුතු කිරීම යුගයේ අවශ්‍යතාවක් බව පැවසූහ.

මහ නාහිමිවරුන්,මහා සංඝරත්නය ඇතුළු විද්වතුන් පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ. මේ අවස්ථාවට එක් වූ මහා සංඝරත්නයෙන් උපදේශක මණ්ඩලයක්ද, ලේඛක මණ්ඩලයක්ද, සංවිධායක මණ්ඩලයක්ද පත්විය. මේ මණ්ඩල මේ මස 22 වැනිදින නැවත රැස්වීමට තීරණය කෙරිණි. ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථයක් සකස් කිරීමටද මෙහිදී තීරණය විය.

සමාජ යටිතල පහසුකම් ජාතික අනු කමිටුවේ පළමු රැස්වීම අධ්‍යාපන අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී

සමාජ යටිතල පහසුකම් ජාතික අනු කමිටුවේ පළමු රැස්වීම අධ්‍යාපන අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පෙරේදා (3) පැවැත්විණි. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සංවර්ධනයට නව මුහුණුවරක් එක් කරමින් අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් හා ජනාධිපති කාර්ය සාධන බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතාගේ මෙහෙයවීමෙන් කැබිනට් හා රාජ්‍ය අමාත්‍යවරුන්ගෙන් සැදුම්ලත් කෘෂිකාර්මික, ජීවනෝපාය, යටිතල පහසුකම්, සමාජ යටිතල පහසුකම් සහ මහජන ආරක්ෂාව හා සමාජ සංවර්ධන ක්ෂේත්‍ර යටතේ ජාතික සම්බන්ධීකරණ අනු කමිටු 5ක් පිහිටු වූ අතර, ඒ අතරින් සමාජ යටිතල පහසුකම් ජාතික අනු කමිටුවේ පළමු රැස්වීම මෙදින පැවැත්විණි.

අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා සභාපති ලෙසත්, දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් එස්.එච්. හරිස්චන්ද්‍ර මහතා ලේකම්වරයා ලෙසත් කටයුතු කරන මේ අනු කමිටුවේ පළමු රැස්වීමට ඇමැතිවරුන් වන කෙහෙලිය රඹුක්වැල්ල, නිමල් සිරිපාල ද සිල්වා, ගාමිණී ලොකුගේ මහත්වරු ද, රාජ්‍ය ඇමැතිවරුන් වන සුසිල් ප්‍රේමජයන්ත්, විජිත බේරුගොඩ, විදුර වික්‍රමනායක, විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දු පුල්ලේ, සිසිර ජයකොඩි, ලසන්ත අලගියවන්න, විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොළ, දිලුම් අමුණුගම මහත්වරු ද, රාජ්‍ය නිලධාරිහු පිරිසක් ද සහභාගි වූහ.

මේ ජාතික අනු කමිටුවේදී ගුරු පුරප්පාඩු පිරවීමේ ක්‍රමවේදය පිළිබඳ සාකච්ඡා කිරීමට රාජ්‍ය ඇමැති සුසිල් ප්‍රේමජයන්ත්, රාජ්‍ය ඇමැතිනී සීතා අරඹේපොළ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල සී.කේ. පෙරේරා මහත්ම මහත්මීන්ගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් පත් කෙරිණි. මේ ජාතික අනු කමිටුව සෑම මසකට වරක් රැස්ව එම අනු කමිටුවේ විෂය පථයට අදාළ සෞඛ්‍ය, මාතෘ සායන, අධ්‍යාපනය (පාසල්), ග්‍රාමීය පාසල්, සමූපකාර, පාරිභෝගික සේවා, කලා හා සංස්කෘතික ගැටලු ආදිය පිළිබඳ සාකච්ඡා කර ජාතික මට්ටමේ විසඳුම් ලබාදීමට කටයුතු කෙරේ.

සමාජ යටිතල පහසුකම් ජාතික අනු කමිටුවට අධ්‍යාපන, කම්කරු, සෞඛ්‍ය , වෙළෙඳ , ප්‍රවාහන හා ජනමාධ්‍ය යන අමාත්‍යාංශ හය සහ රාජ්‍ය අමාත්‍යාංශ 11ක් ඇතුළත් වන අතර, එම අමාත්‍යාංශවල අයවැය යෝජනා සහ මේ වසරේ ප්‍රධාන සංවර්ධන ඉලක්කවල ප්‍රගතිය සෑම ජාතික අනු කමිටු රැස්වීමකටම ඉදිරිපත් කළ යුතු බවද මෙහිදී තීරණය විය.

ශ්‍රී ලංකාවේ ජපාන තානාපති විදේශ ඇමැති හමුවෙයි

ශ්‍රී ලංකාවේ ජපාන තානාපති අකිරා සුගියාමා මහතා පෙරේදා (03) විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී විදේශ කටයුතු ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා හමුවිය. ආර්ථික, සමාජ,දේශපාලන හා අන්‍යෝන්‍ය සහයෝගිතාවන් වර්ධනය කර ගැනීමත් කොවිඩ්-19 වසංගතයට මුහුණ දී සිටින ශ්‍රී ලංකාව ඉන් මුදාගෙන ශක්තිමත් ආර්ථිකයක් ගොඩනඟා ගැනීමට මේ රටවලින් ගත හැකි සහයෝගය පිළිබඳවත් මේ හමුවේ දී දෙපාර්ශ්වයම වැඩි අවධානයක් යොමු කළේය.

පාස්කු කොමිසම් වාර්තාව ගැන අපට කිසිම ප්‍රසාදයක් නෑ

රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා

ක්‍රිසන්ති විතාරණ

පාස්කු ප්‍රහාරය පිළිබඳ සෙවීමේ කොමිෂන් වාර්තාව පදනම් කරගෙන මේ රටේ සිංහල බෞද්ධ ජනතාව හා කතෝලික ජනතාව අතර ප්‍රශ්න ඇති කිරීමට කිසිවකු උත්සාහ දරන්නේ නම් ඒ පිළිබඳ කනගාටු වන බව ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා මහතා පැවසීය.

රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා මහතා මේ අදහස් පළ කළේ පසුගියදා මාතර, දෙයියන්දර මාර්ග සංවර්ධන කටයුතු ආරම්භ කිරීමේ අවස්ථාවට සහභාගි වෙමිනි.

එහිදී වැඩිදුරටත් රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා මහතා මෙසේද කීය.

පාස්කු දින ප්‍රහාරය සිදුවුණේ යහපාලන කාලයේ. ඒ නිසා එහි වගකීම වෙන කාටවත් පවරන්න බැහැ. ආරක්ෂක කටයුතු නිසියාකාරව සිදු නොකිරීම, බුද්ධි අංශ නිලධාරීන් අත්අඩංගුවට ගැනීම, දේශපාලන පලි ගැනීම් නිසා ආරක්ෂාව බින්දුවට වැටුණා. ඒ නිසා තමා පාස්කු දින ප්‍රහාරය සිදුවුණේ.

දෙවැනි කාරණය පාස්කු දින ප්‍රහාරය පිළිබඳ සෙවීමට මේ කොමිසම පත් කළේ යහපාලන ආණ්ඩුවේ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා. මේ කොමිසම ඒ ආණ්ඩුව කාලේ පත් කළ එකක් නිසා එහි වගකීම අපිට බාර ගන්න බැහැ කියා කියන්න ඕනෑ. මොකද සමහර තීන්දු තීරණ ගැන සමාජයේ මත ගැටුමක් ඇවිල්ලා තිබෙනවා.

කතෝලික ජනතාව නියෝජනය කරන කෙනෙක් හැටියට මේ කොමිෂන් වාර්තාව නිසා මේ රටේ කිසියම් සිංහල බෞද්ධ සංවිධානයකට සිත් රිදවීමක් වෙලා තියෙනවානම් අපගේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඒ වගේම කියන්න ඕනෑ කොයිම වෙලාවකවත් සිංහල බෞද්ධ සංවිධාන ගැන හොයන්න කියා කතෝලික ජනතාව නියෝජනය කරන අපි හෝ කතෝලික සභාව කීවේ නැහැ.

පාස්කු දින ප්‍රහාරය සිදු වුණාම කතෝලික ජනතාවට විශාල සහයෝගයක් දුන්නේ ගරුතර ස්වාමීන් වහන්සේ, බෞද්ධ නායකයෝ, බෞද්ධ ජනතාව. මේ රට සිංහල බෞද්ධ රටක්. මේ රටේ වැඩිපුර ඉන්නේ සිංහල බෞද්ධ ජනතාව. බෞද්ධ සංස්කෘතිය අනුව ඒ නායකයෝ දෙන අනුශාසනා අපි පිළිගන්නවා.

පාස්කු දා ප්‍රහාරය එල්ල කළේ මේ රටේ බෞද්ධ ජනතාව නෙමෙයි. ස්වාමීන් වහන්සේ නෙමෙයි. මේ ප්‍රහාරය එල්ල කළේ ත්‍රස්තවාදීන්. ඒ ත්‍රස්තවාදීන්ට උදව් කළේ කවුද? අනුබල දුන්නේ කවුද? කියන එක අපි බලාගෙන හිටියේ. ඒක මේ කොමිසම් වාර්තාවේ නැහැ. ඒ නිසා මේ කොමිසම් වාර්තාව පිළිබඳ අපට අප්‍රසාදයක් තියෙනවා කියා කියන්න ඕනෑයැයි ද කීය.

පාර්ලිමේන්තු මන්ත්‍රී නිපුණ රණවක, දකුණු පළාත් හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන් වන පසඳ යාපා අබේවර්ධන, සරත් යාපා අබේවර්ධන, ප්‍රාදේශීය දේශපාලන නායකයන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ.

හමුදාවෙන් පැනගිය අය සොයා, මෙහෙයුම් අත්අඩංගුවට ගැනීම් දිගටම

යුද හමුදා මාධ්‍ය ප්‍රකාශක බ්‍රිගේඩියර් නිලන්ත ප්‍රේමරත්න

රත්නසිරි පතිරණ

යුද හමුදාවෙන් පැනගොස් සිටින පුද්ගලයන් සොයා නිරතුරුවම අත්අඩංගුවට ගැනීමේ කටයුතු සිදු කරන බවත්, එවන් නීති විරෝධීව පැන ගොස් සිටින පුද්ගලයන් පිළිබඳ යුද හමුදා පොලිසියට, ආගමන විගමන දෙපාර්තමේන්තුවට හා පොලිසියට සියලු තොරතුරු ලබාදී තිබෙන බවත්, යුද හමුදා මාධ්‍ය ප්‍රකාශක බ්‍රිගේඩියර් නිලන්ත ප්‍රේමරත්න මහතා සඳහන් කළේය.

කෝටි 45ක පමණ වටිනාකමකින් යුතු මත්ද්‍රව්‍ය තොගයක් සමඟ පසුගියදා හමුදා සෙබළෙකු, හමුදා සේවයෙන් පැන ගිය පුද්ගලයකු සහ යුද හමුදා අංක තහඩු සහිත සුඛෝපභෝගී වෑන් රථයක් පොලිසිය මගින් අත්අඩංගුවට ගැනීම සම්බන්ධව අදහස් දැක්වූ බ්‍රිගේඩියර්වරයා මෙසේද පැවසීය.

දැනට මේ සිද්ධියට සම්බන්ධ සැකකරුවන් දෙදෙනාගෙන් රැඳවුම් නියෝග මත ප්‍රශ්න කරනවා. ඒ අනුව ඔවුන්ට නීති මගින් කටයුතු කරාවි. ඒ වගේම යුද හමුදාපතිගේ උපදෙස් පරිදි යුද හමුදා පොලිසිය මගිනුත් විශේෂ පරීක්ෂණයක් සිදු කරමින් පවතිනවා. විශේෂයෙන්ම යුද හමුදාව සතු වාහන මෙන්ම යුද හමුදාවට පිටතින් ලබාගෙන ඇති වාහන වල ගමන් බිමන් පිළිබඳව යුද හමුදාව නිරතුරුවම විමර්ශන කටයුතු සිදු කරනවා. යුද හමුදාවේ නම භාවිතා කරමින් කිසිදු නීති විරෝධී ක්‍රියාවන්වල යෙදීමට කිසිවකුට ඉඩක් නැහැ. එවැනි පුද්ගලයන්ට විරුද්ධව දැඩි ක්‍රියාමාර්ග ගැනීමට යුද හමුදාව පසුබට නොවන බව ද බ්‍රිගේඩියර් ප්‍රේමරත්න මහතා සඳහන් කළේය.

මේ මත්ද්‍රව්‍ය තොගය ප්‍රවාහනය කළ යුද හමුදා සෙබළා පොලොන්නරුව ප්‍රදේශයේ පදිංචි 45 හැවිරිදි පුද්ගලයකු වන අතර, ඔහු මීට පෙරද දෙවතාවක් මෙලෙස මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කර ඇති බවට පරීක්ෂණවලින් හෙළි වී ඇත. පාණදුර වලාන දූෂණ මර්දන ඒකකයට ලැබුණු තොරතුරක් මත සැකකරුවන් සහ වෑන් රථය අත්අඩංගුවට ගෙන තිබුණි.

"වයිට් වෝටර් රාෆ්ටින්" ජල ක්‍රීඩාව කැලණි ගඟේ කිතුල්ගල ආශ්‍රිතව ඉදිරියටත් කිරීමට පියවර ගන්නවා

රාජ්‍ය ඇමැති කනක හේරත්

ක්‍රිසන්ති විතාරණ

කිතුල්ගල ආශ්‍රිත කැලණි ගඟේ පවත්වාගෙන යන "වයිට් වෝටර් රාෆ්ටින්" (White Water Rafting) ජල ක්‍රීඩාව බාධාවකින් තොරව ඉදිරියටත් පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ග විදුලි බල අමාත්‍යාංශය හා එක්ව ගන්නා බව සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ සහ රබර් වතු ආශ්‍රිත භෝග වගා හා කර්මාන්තශාලා නවීකරණය සහ තේ සහ රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති කනක හේරත් මහතා ප්‍රකාශ කළේය.

රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ප්‍රකාශ කළේ කැලණි ගඟේ කිතුල්ගල ආශ්‍රිත ප්‍රදේශයේ වයිට් වෝටර් රාෆ්ටින් ක්‍රීඩාවෙන් ජීවනෝපාය සලසා ගන්නා පිරිසක් සමඟ විදුලි බල ඇමැති ඩලස් අලහප්පෙරුම මහතා සමඟ විදුලි බල අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවකදීය. බ්‍රෝඩ්ලන්ඩ් ජලවිදුලි ව්‍යාපෘතිය කිතුල්ගල ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමට යෝජිත අතර එමගින් වයිට් වෝටර් රාෆ්ටින් ක්‍රීඩාවට බාධා එල්ල විය හැකි බව මේ පිරිස පෙන්වා දුන්හ.

වයිට් වෝටර් රාෆ්ටින් ක්‍රීඩාවට ගැටලු මතු නොවන ලෙස යෝජිත බ්‍රෝඩ්ලන්ඩ් ජලවිදුලි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස රාජ්‍ය ඇමැති හේරත් මහතා විදුලි බල ඇමැති අලහප්පෙරුම මහතාගෙන් ඉල්ලා සිටියේය.

ජල විදුලි ව්‍යාපෘතිය මෙන්ම ජල ක්‍රීඩාවද එකසේ වැදගත් වන බැවින්, මේ දෙඅංශයටම ගැටලු මතු නොවන ලෙස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන බව විදුලිබල ඇමැතිවරයා අවධාරණය කළේය.

සාකච්ඡාවට එක්වෙමින් වයිට් වෝටර් රාෆ්ටින් සංගමය පෙන්වා දුන්නේ ජල විදුලි ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුවහොත් විශේෂයෙන් දිවා කාලයේ ලැබෙන ජල පරිමාව අදාළ ක්‍රීඩාව නිසියාකාරව කරගෙන යාමට ප්‍රමාණවත් නොවන බවත් ජල ඝනත්වය අවම වශයෙන් සෙන්ටිමීටර් 50 මට්ටමේ පවත්වාගත යුතු බවත්ය.මේ පිළිබඳ අවධානය යොමු කළ රාජ්‍ය ඇමැතිවරයා අදාළ ජල විදුලි ව්‍යාපෘතියට හානියක් නොවන පරිදි සහ ජල ක්‍රීඩාවට බලපෑම අවම වන ලෙස කටයුතු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කළ අතර ඒ අනුව දිවා කාලයේදී ජල ක්‍රීඩාව බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ජල ප්‍රමාණය මුදාහැරීමටත් රාත්‍රී කාලයේ විදුලි බල නිෂ්පාදනයට ප්‍රමුඛතාව දීමට කටයුතු කරන ලෙසත් දැක්විය.

මේ යෝජනාවකට දෙපාර්ශ්වයම එකඟතාවට පැමිණි අතර ඒ අනුව 2014 වර්ෂයේ ඇතිකර ගන්නා ලද අවබෝධතා ගිවිසුමට නව යෝජනා ඇතුළත් කොට එළඹෙන මාර්තු 06 වැනිදින අවසන් කෙටුම්පත සකස් කිරීමටත් එකඟතාවක් ඇතිකර ගනු ලැබීය.

සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ කළමනාකරණ සහකාර, සහකාර තාක්ෂණ ඛණ්ඩ 2 (MT 2-2016) සේවා ගණයේ III ශ්‍රේණිය ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

සබරගමුව පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවෙහි ක්‍රීඩා නිලධාරී III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා 2021.04.10 දිනට වයස අවුරුදු 18 ට වැඩි සහ 35 ට නොවැඩි සුදුසුකම් ලත් සබගරමුව පළාතේ පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය 2021 අප්‍රේල් මාසයේදී පමණ පැවැත්වීමට අපේක්ෂිතය.

01. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය : 2021.04.10

02. බඳවා ගැනීමේ සුදුසුකම් :

අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්

(අ) I. මවුබස (සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව), ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරක දී විෂයයන් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික (උසස් පෙළ) විභාගයේ සියලුම විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාගෙන තිබීම. (සාමාන්‍ය ඉංග්‍රීසි හා සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

සහ

III. ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ පළාත් මට්ටමින් (දිස්ත්‍රික් අතර) පැවැත්වෙන තරගයන්හි දී 1 හෝ 2 ස්ථානයන් ලබා තිබීම, ජාතික මහා ක්‍රීඩා උළෙලේ 1, 2 හෝ 3 ස්ථාන ලබා තිබීම, ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ජාතික ශූරතා තරගවල 1,2 හෝ 3 ස්ථාන ලබා තිබීම

හෝ

(ආ) I. මවුබස (සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව), ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරක දී විෂයයන් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම

සහ

II. දකුණු ආසියාතික තරග, ආසියාතික තරග, පොදු රාජ්‍ය මණ්ඩලීය තරග, ලෝක ශූරතා තරග හෝ ඔලිම්පික් තරග සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර තිබීම.

04. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය.

05. **මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය :**

අංක 3/2016 හා 2016.02.25 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ 2 (MT 2-2016) වැටුප් කාණ්ඩය MT - 02-2016 වන අතර, මාසික වැටුප් පරිමාණය රු. 30,140-10x350-11x370-10x560-10x660 - රු. 49,910/- වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

06. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇති විට ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත විෂයයන් දෙකම සමත් අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 විධිවිධාන පරිදි ඉහළම කුසලතා අනුපිළිවෙළ අනුව දිස්ත්‍රික් ජන අනුපාතය මත හා දිස්ත්‍රික් කුසලතා පදනම් කරගනිමින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40% කි.

වෘත්තීය පරීක්ෂණය සඳහා යොමු කළ අයදුම්කරුවන් සියලු දෙනා මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම අයදුම්කරුවන් විසින් ලිඛිත තරඟ විභාගයේ සහ වෘත්තීය පරීක්ෂණයේ ලබා ගන්නා ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙළ මත පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

07. මෙම බඳවා ගැනීමේ සම්පූර්ණ නිවේදනය සහ ආදර්ශ අයදුම්පත්‍රය www.sg.gov.lk හා www.psc.sg.gov.lk වෙබ් අඩවිවල පළකර ඇත.

පී.එස්.ආර්.එම්. විජයරාජ
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
සබරගමුව පළාත.
2021.02.22

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

මහියංගණය දිසා අධිකරණයේ දීය

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 53 පරිච්ඡේදය යටතේ කරනු ලබන ඉල්ලීමයි.

මාරස්සන හේවාවිස්ස අංක 130/6 දරන ස්ථානයේ පදිංචි දෙහිපාගොඩ ගෙදර ප්‍රියංගිකා කුමාරි වික්‍රමසිංහ යන ස්වකීය ඇටෝර්නි බලකාරිය මගින් පෙනී සිටින කුලසේකර මුදියන්සේලාගේ නිශාන්ත මේනක බණ්ඩාර කුලසේකර

පැමිණිලිකරු

නඩු අංකය	:	එම්.එස් 99/18
ස්වභාවය	:	මුදල්
වටිනාකම	:	රු. 700,000/-
කාර්ය පටිපාටිය	:	ලඝු

එදිරිව

01. රත්නායක මුදියන්සේලාගේ අජිත් කුමාර
අංක 198/1, උල්හිටිය, ගිරාඳුරුකෝට්ටේ.

02. හතරකෝරල මුදියන්සේලාගේ රංජනී කුසුමලතා
අංක 198/1, උල්හිටිය, ගිරාඳුරුකෝට්ටේ.

විත්තිකරුවන්

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2018 ක් වූ සැප්තැම්බර් මස 28 වන දින දරන තීන්දුව අනුව ඉහත කී විත්තිකරුවන්ගෙන් පැමිණිලිකරුට අයවීමට ඇති රුපියල් ලක්ෂ හත (රු. 700,000.00) ක මුදලින් විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවා ඇති සහ අධිකරණයේ තැම්පත් කර ඇති රු. 235,000.00 ක මුදල අඩු කිරීමෙන් අනතුරුව තවදුරටත් පැමිණිලිකරුට අයවිය යුතුව ඇති රු. 465,000.00 ක මුදල අයකර ගැනීම සඳහා වර්ෂ 2019 ක්වූ මැයි මස 22 වන දින මා විසින් තහනමට ගන්නා ලද පහත සඳහන් භාණ්ඩ වර්ෂ 2021 ක්වූ 04 මස 07 වන දින පෙ.ව. 10.30 ට එකී දේපළ පිහිටි අංක 198/1 උල්හිටිය ගිරාඳුරුකෝට්ටේ දරන ලිපිනයේ පිහිටි ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01.	ලී පුටු සෙට්	01	
02.	සෝෆා සෙට්	01	(දුඹුරු පැහැති)
03.	සෝෆා සෙට්	01	(කළු පැහැති)
04.	පහන්	01	(පිත්තල)
05.	මල් පෝච්චි	02	(පිත්තල)
06.	ලැප්ටොප්	01	(Dy)
07.	ඉලක්ට්‍රොනික්	03	
08.	ලී මේස	01	
09.	කැබිනෙට්ටුව	01	
10.	ශීතකරණ	01	(Samsun)
11.	කම්පියුටර් පුටු	01	
12.	මහන මැෂින්	01	
13.	පාපැදි	01	
14.	කබඩ් එක සහිත අයන් බෝඩ්	01	
15.	කණ්ණාඩි මේස	01	
16.	ප්ලාස්ටික් පුටු	12	
17.	පොත් කබඩ්	01	
18.	UP - QT 8541 ත්‍රි / රථය		

අධිකරණයේ අණ පරිදි,
රෙජිස්ට්‍රාර් / නියෝජ්‍ය පිස්කල් මහියංගණය.

2021.02.22 වන දින,
මහියංගණය දිසා මහේස්ත්‍රාත් අධිකරණයේ දීය.

NLDB

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

ප්‍රසම්පාදන දැන්වීමයි

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ පූර්ණ (100%) පරිපාලිත සමාගමක් වන සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම සහ සී/ස මහවැලි සත්ව ව්‍යාපාරික සමාගම සඳහා ඈවරකරුවෙකු පත් කර ගැනීම සඳහා මිල ගණන් කැඳවීම

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ පූර්ණ (100%) පරිපාලිත සමාගමක් වන සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම සහ අර්ධ පරිපාලිත සමාගමක් වන සී/ස මහවැලි සත්ව ව්‍යාපාරික (පුද්ගලික) සමාගම් වෙනුවෙන් ඈවරකරුවෙකු පත්කර ගැනීම සඳහා ඒ සම්බන්ධ කටයුතු වල නියැලෙන ආයතනවලින් මුද්‍ර, තබන ලද ලංසු කැඳවනු ලැබේ.

ඉහත මිල ගණන් කැඳවීමට අදාළ ලංසු භාරගැනීම 2021 මාර්තු මස 31 වෙනි දින ප.ව. 2.30 ට අවසන් කරනු ලැබේ. එකී වේලාව ඉක්මවූ වහාම කොළඹ 05, නාරාහේන්පිට, නාවල පාරේ, අංක 40 හි පිහිටි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේදී ලංසු විවෘත කරනු ලැබේ.

01. සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම සම්බන්ධයෙන් අවශ්‍ය කරන වැඩි විස්තර දුරකථන අංක 011-2501701/2 යටතේ දිගුව 135 ඔස්සේ, පෞද්ගලික සහකාරිනි ඇමතීමෙන් ලබාගත හැක.

02. සී/ස මහවැලි සත්ව ව්‍යාපාරික (පුද්ගලික) සමාගම සම්බන්ධයෙන් අවශ්‍ය කරන වැඩි විස්තර දුරකථන අංක 011-2501701/2 යටතේ දිගුව 109 ඔස්සේ, සහකාර සාමාන්‍යාධිකාරිනි - මානව සම්පත් හා පරිපාලන ඇමතීමෙන් ලබාගත හැක.

සභාපති,
ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය,
අංක 40, නාවල පාර,
නාරාහේන්පිට, කොළඹ 05.

මහජන බැංකුව

මලියදේව - 226 ශාඛාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 27/11/2020 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් නිලිකා හර්ෂනී වීරකෝන් මහත්මිය විසින් සහතික කරන ලද 2017.06.12 දිනැති අංක 5944 දරන උකස්කරය හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් පෝල් හිත්තිගේ ලක්සිරි ජයතිලක මහතා විසින් සහතික කරන ලද 2018.03.28 දිනැති අංක 800 දරන උකස්කරයන් මත මුහම්මදු රාසික් මුහම්මඩ් ඉර්ෆාන් සහ මොහම්මදු අබුල් හසන් පාතිමා මහබූබා යන අය විසින් ගෙවීම පැහැර හැර ඇති බැවින් ද එකී උකස්කරයන් යටතේ පිළිවෙලින් රුපියල් පනස් ලක්ෂයක් (රු. 5,000,000/=) සහ රුපියල් පනස් ලක්ෂයක් (රු. 5,000,000/=) දැනට මහජන බැංකුවට අයවීමට ඇති බැවින්ද, පිළිවෙලින් රුපියල් පනස් ලක්ෂයක (රු. 5,000,000/=) මුදලක් සඳහා 2019.10.03 දින සිට සියයට දහනවයයි දශම පහ (19.5%) බැගින්ද, රුපියල් පනස් ලක්ෂයක (රු. 5,000,000/-) මුදලක් සඳහා 2019.10.03 දින සිට සියයට විස්සයි දශම පහ (20.5%) බැගින් සහ වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදාළ මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් එවා අඩු කර පිළිවෙලින් රුපියල් පනස් ලක්ෂයක් (රු. 5,000,000/=) සහ රුපියල් පනස් ලක්ෂයක (රු. 5,000,000/=) මුදල අයකර ගැනීම සඳහා කුරුණෑගල බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් එකී අංක 5944 සහ 800 දරන යන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය අනුව තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ, ඕතර පත්තුවේ, බෙලිගල් කෝරලේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වරකාපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ, අංක 345, මංගෙදර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මංගෙදර ගමේ පිහිටි "**පාලම ගාව අස්වැද්දුමේකුඹුර දැනට වත්ත**" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. බී. දිසානායක මහතා විසින් 2016.06.28 දින මැන සකස් කරන ලද අංක 7789 දරන පිඹුරේ ලොට් අංක 02 දරන ඉඩමට මායිම් :

උතුරට	-	අංක 7789 දරන පිඹුරේ කැබලි අංක 01 දරන කොටස
නැගෙනහිරට	-	අඹේපුස්ස - කුරුණෑගල මහා මාර්ගය
දකුණට	-	අංක 7789 දරන පිඹුරේ කැබලි අංක 03 දරන කොටස
බටහිරට	-	නාන්ගල්ල ඇළ

යන මායිම් තුළ පිහිටි, පර්චස් විසි පහයි දශම පහ (අක්: 00 රූඩ් : 00 පර් : 25.5) ක් හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි හයයි හතරයි පහ (හෙක්. 0.0645) ක් විශාලැති ඉඩම හා ඒ තුළ පිහිටි ගහකොළ, පලතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේද සමග එකී පිඹුරේ සඳහන් මාර්ග පොදුවේ පාවිච්චි කිරීමේ හා නඩත්තු කිරීමේ අයිතියද සමග වේ.

(ලියාපදිංචිය K54/138 - කෑගල්ල)

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ, ඕතර පත්තුවේ, බෙලිගල් කෝරලේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වරකාපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ, අංක 345, මංගෙදර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මංගෙදර ගමේ පිහිටි "**පාලම ගාව අස්වැද්දුමේකුඹුර දැනට වත්ත**" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. බී. දිසානායක මහතා විසින් 2016.06.28 දින මැන සකස් කරන ලද අංක 7789 දරන පිඹුරේ ලොට් අංක 03 දරන ඉඩමට මායිම් :

උතුරට	-	අංක 7789 දරන පිඹුරේ කැබලි අංක 02 දරන කොටස
නැගෙනහිරට	-	අඹේපුස්ස - කුරුණෑගල මහා මාර්ගය
දකුණට	-	අංක 7789 දරන පිඹුරේ කැබලි අංක 04 දරන කොටස
බටහිරට	-	නාන්ගල්ල ඇළ

යන මායිම් තුළ පිහිටි, පර්චස් විසි පහයි දශම පහ (අක්: 00 රූඩ් : 00 පර් : 25.5) ක් හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි හයයි හතරයි පහ (හෙක්. 0.0645) ක් විශාලැති ඉඩම හා ඒ තුළ පිහිටි ගහකොළ, පලතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේද සමග එකී පිඹුරේ සඳහන් මාර්ග පොදුවේ පාවිච්චි කිරීමේ හා නඩත්තු කිරීමේ අයිතියද සමග වේ.

(ලියාපදිංචිය **K202/100** - කෑගල්ල)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

ප්‍රාදේශීය කළමනාකාර
(කුරුණෑගල), මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
වත්හිමි පාර, කුරුණෑගල.

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk

පත්‍රය බාරේ පළවන දැන්වීම් සඳහා එවන පිළිතුරු සාමාන්‍ය තැපෑලෙන් එවිය යුතුයි

ලියාපදිංචි තැපෑලෙන් එවන ලියුම් බාරගනු නොලැබේ

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ලංසු සඳහා ආරාධනයයි (IFB)

1. ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත දක්වා ඇති අයිතමයන් සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍ර, තැබූ ලංසු කැඳවනු ලැබේ.

ටෙන්ඩර් අංකය	ටෙන්ඩරයේ නම	ලංසු සුරක්ෂණයේ වටිනාකම (රු.)	ලිපිලේඛන ගාස්තුව (VAT ඇතුළුව)	අවසාන දිනය හා වේලාව
CMS/LP/21/PT/02/051	Wire Rope for Mitsui RTG Cranes at JCT III/IV	48,000.00	1,000.00	19-03-2021 13.30 hrs
CMS/LP/21/PT/02/052	Main Hoist wire Ropes for 41T ZPMC Container Cranes at JCT 06 Nos	48,000.00	1,000.00	19-03-2021 13.30 hrs

2. රුපියල් මිලියන 5 ඉක්මවන ටෙන්ඩර් සඳහා 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ විධිවිධාන අදාළ වන බව ලංසුකරුවන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. ඒ අනුව, ඉහත සඳහන් එක් එක් ටෙන්ඩරයට සම්බන්ධ වන සියලුම පාර්ශ්වයන්ට, කොන්ත්‍රාත් කාලසීමාව පුරාම එකී පනත හා සමග බැඳී කටයුතු කිරීම අවශ්‍ය වේ. ඒජන්තවරයකු / උප ඒජන්තවරයකු, නියෝජිතවරයකු වෙනුවෙන් හෝ ඒජන්තවරයකු / උප ඒජන්තවරයකු, නියෝජිතයකු හෝ නම්කළ අයකු ලෙස කටයුතු කිරීමට බලාපොරොත්තු වන ඕනෑම ලංසුකරුවකු පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් සමග ලියාපදිංචි විය යුතු අතර, යථාපරිදි සම්පූර්ණ කළ ලියාපදිංචි සහතිකය තම ලංසු ලිපිලේඛන සමග ඉදිරිපත් කළ යුතුය.
3. ලංසුකරුවන් ඉහත දී ඇති භාණ්ඩවලට සමාන භාණ්ඩ සැපයීමේ ව්‍යාපාරයක අඩුතරමින් පසුගිය වසර 3 ක නියැලී සිටිය අය විය යුතුවේ.
4. අභිලාෂී ලංසුකරුවන්ට පහත සඳහන් ලිපිනයේදී කාර්යාලීය වේලාවන් තුළ ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ) වෙතින් වැඩිමනත් තොරතුරු ලබාගැනීමටත්, ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් පිළිවන.
5. පහත සඳහන් ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා වගුවේ 4 වන තීරුවේ දක්වා ඇති ආපසු නොගෙවන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව, 2021 මාර්තු 05 දින සිට ලංසු භාරගැනීමේ අවසාන දිනට පෙර දින තෙක් කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 ත් ප.ව. 3.00 ත් අතර අභිලාෂී ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදීගත හැකිය. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.
6. ලංසු භාරගැනීමේ අවසාන දිනයට හා වේලාවට හෝ ඊට පෙර ලංසු පහත ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසු භාරගන්නා අවසාන වේලාවේදී පහත ලිපිනයේදී, එම අවස්ථාවට පෞද්ගලිකව පැමිණ සිටීමට බලාපොරොත්තු වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කෙරේ. සියලුම ලංසු සමග ඉහත සඳහන් කළ වටිනාකමට ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.

ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ),
සැපයුම් අංශය,
ශ්‍රී ලංකා වරාය අධිකාරිය,
නො. 45, ලේඩින් බැස්ටියන් පාර, කොළඹ - 01.

දුරකථන අංක : 2482231, 2483338, 2482499, 2482832, 2482409, 2482652, 2482638, 2483024
ෆැක්ස් අංක : 2381652, 2470443

1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011) 2 242 9491

LAKE HOUSE



අඩසිය වසක් තුළ පිවිසෙ සෙදුම් හැටි

1935 දී ලංකාවේ ප්‍රථම දේශපාලන පක්ෂය ලෙස ලංකා සමසමාජ පක්ෂය ආරම්භ විය .එය ලියාපදිංචි වමේ පක්ෂයක ආරම්භයද විය. එතැන් පටන් විවිධ වමේ ධාරාවන් මෙන්ම දක්ෂිණාංශික නැඟුරුවීම්වලින්ද සමන්විතව වමේ පක්ෂ කැඩී වෙන් වෙමින් වර්ගීකරණය වන්නට විය. ඒ අනුව ජනතා විමුක්ති පෙරමුණ ඉතිහාසයේ අවස්ථා කිහිපයකදී බොහෝ පිරිසක් පක්ෂය හැරගොස් තිබේ.

1971 කැරැල්ලට පෙරම ජනතා විමුක්ති පෙරමුණෙන් ඉවත් වූ ඩී.අයි.ජී. ධර්මසේකර "මාතෘභූමි ආරක්ෂක පෙරමුණ" නමින් දේශපාලන ව්‍යාපාරයක් ආරම්භ කළේය. 1969 කාලයේ සිට පැවති එම කණ්ඩායම්වාදය තේරුම්ගත යුත්තේ පක්ෂය තුළ කණ්ඩායම් බිහිවීමක් ලෙස නොවේ. පක්ෂයට කණ්ඩායම් ලෙස සම්බන්ධ වී එම කණ්ඩායම්වාදි ස්වභාවය දිගටම පවත්වාගෙන යාමට උත්සාහ දැරීමක් ලෙසය.

ආරම්භයේදී විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ මහ ශිෂ්‍ය සංගම් සභාපති වූ කොමියුනිස්ට් පක්ෂයේ මොස්කව් පිලට සම්බන්ධ ලංකා ජාතික ශිෂ්‍ය සංගමයේ සාමාජිකයකු වූ ධර්මසේකර ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වූයේ කණ්ඩායමක් ලෙසය. එමෙන්ම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිටි සරත් විජේසිංහ සහ කෝට්ටේ ඩී. ගුණසේකර යන අයද ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වූයේ කණ්ඩායම් ලෙසය. මේ වන විට ජනතා විමුක්ති පෙරමුණ ජනතාව අතර වේගයෙන් ප්‍රචාරණය වීම නිසා හා ඊට අවශ්‍ය සංවිධායකයන් හා නායකයන් නිර්මාණය කර ගැනීමේ අවශ්‍යතාව නිසා දක්ෂකම් හා නායකත්ව හැකියාවන් පෙන්වූ මෙම පුද්ගලයන් පක්ෂයට බඳවා ගැනීමට රෝහණ විජේවීරට සිදුවිය.

එහෙත් ඔවුන් පක්ෂය තුළ කණ්ඩායම්වාදී මානසිකත්වයෙන් මිදී කටයුතු කළ යුතු වුවත් එසේ සිදු නොකර කණ්ඩායම් ලෙසම කටයුතු කරන්නට විය. මෙම කණ්ඩායම් ප්‍රශ්නයේදී සරත් විජේසිංහ පසුව කණ්ඩායම්වාදී හැඟීම පසෙකලා පක්ෂය තුළ ක්‍රියාත්මක වූ අතර කෝට්ටේ ඩී. ගුණසේකරගේ කණ්ඩායම යම් පමණකින් අවම ගැටලු සහිතව මෙහෙයවා ගැනීමට පක්ෂයට හැකිවිය. ධර්මසේකරගේ කණ්ඩායම පක්ෂයට මෙහෙයවා ගත නොහැකි ලෙස පක්ෂයට එරෙහිව සහ රෝහණ විජේවීරට එරෙහිව කුමන්ත්‍රණ හා පාවාදීම් සිදු කළේය. මේ හේතුවෙන් ධර්මසේකර කණ්ඩායම පක්ෂයෙන් නෙරපා හැරිණි.

ධර්මසේකර මෙහෙයවන ලද අන්ත වාමාංශික කණ්ඩායම විසින් 1971 මාර්තු 06 වැනිදා අමෙරිකානු තානාපති කාර්යාලය ඉදිරිපිට උද්ඝෝෂණයක් පවත්වන ලදි .එහිදී ඇති වූ ගැටුමේදී පොලිස් නිලධාරියකු වූ පොලිස් පරීක්ෂක කරුණාරත්න මරණයට පත්විය. ජනතා විමුක්ති පෙරමුණ මෙයට කිසි සම්බන්ධයක් නොතිබූ අතර ධර්මසේකර කණ්ඩායම අනුගමනය කළ නොමේරූ උපක්‍රමය පක්ෂය විසින් වහාම හෙළා දුටුවේය. නමුත් මාර්තු 16 වැනිදා මෙම සිද්ධිය පදනම් කරගෙන රජය හදිසි නීතිය පැනවූයේ ආණ්ඩුව පෙරළා දැමීමට උපක්‍රමයක් අනාවරණය වූ බව ප්‍රකාශයට පත් කරමිනි. මෙම තත්ත්වය ජනතා විමුක්ති පෙරමුණට අතිශය හානිදායක අයුරින් බලපෑ බව විචාරක මතය විය.

1970 ඔක්තෝබර් 29 වැනි දින රෝහණ විජේවීර පැවැත්වීමට සූදානම් කළ හයිඩ්පාක් රැස්වීමට අතුල නිමලසිරි ජයසිංහ හෙවත් ලොකු අතුල ,කරුණාරත්න සහ සනත් ඇතුළු අය විරුද්ධ වූහ. මේ වන විට විජේවීරත් සමග මේ අය පක්ෂ නායක මට්ටමේ සිටි පිරිසකි. එහෙත් නිතරම කටයුතු කළේ මතභේද සමගය. හයිඩ්පාක් රැස්වීමට ලොකු අතුල, කරුණාරත්න හා සනත් විරුද්ධ වෙද්දි රෝහණ විජේවිර සඳහන් කළේ "ඔවුන් තිදෙනාට තමාට තරම් කථිකත්වයක් නැති හෙයින් තමා ගැන ඊර්ෂයාවෙන් ඔවුන් එසේ රැස්වීමට විරුද්ධ" වූ බවය. අනෙක් තිදෙනා කටකතා පතුරවා හැරියේ විජේවීර පාර්ලිමේන්තුවාදය තුළ ගිලී කටයුතු කරන බවය. මේ අවස්ථාව වන විට ඇතැමුන්ට තිබුණේ විප්ලවය දිනා රජවෙන්නේ කවුද යන්න දැන ගැනීමේ ආසාවය. 1971 ජනවාරි මාසයේ විජේවීර විසින් ටී. සිල්වා කොළඹ දිස්ත්‍රික් ලේකම්කමින් ඉවත් කර ඔහු සතු බලතල පියතිලකට පවරන ලදී. ලොකු අතුල සමග ඇතිවූ බල අරගලය පුපුරා ගියේ එසේය.මේ හේතුවෙන් ලොකු අතුල ඇතුලු පිරිස හදිසි පහරදීමකින් බලය අල්ලා ගත යුතුය යන මතයෙන් 1971 අප්‍රේල් මස 02 වන දින විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ දී පහරදීමේ සාකච්ඡාවට පෙර පහරදීමේ සැලසුම් සකස් කර තිබුණි. මේ අනුව ලොකු අතුල ප්‍රමුඛ පිරිස කලින් ගෙන තිබූ තීරණය වූයේ අප්‍රේල් 05 දින අලුයම පහරදීමටය.

විශ්වවිද්‍යාලයේදී ගනු ලැබූ බහුතර තීරණය වූයේ අප්‍රේල් 05 වැනි දින රාත්‍රියේ පහර දීමටය. ලොකු අතුලට තමා කලින් එවැනි තීරණයක් ගත් බව පැවසීමට නොහැකි නිසා රාත්‍රි පහරදීමට කිසිවක් නොකියාම එකඟ වීමට සිදුවිය. (ඉන්පසු ඔහුට සිදුවූයේ වේලාව වෙනස්වූ බව පවසා නව වේලාව තම කණ්ඩායමට හිතවත් සාමාජිකයන් සිටි දිස්ත්‍රික්කවලට දන්වා යැවීමටය) නමුත් එදා පැවති සන්නිවේදන පහසුකම්වල දුර්වලතාව හේතුවෙන් වේලාව වෙනස්වූ තීරණය මොනරාගලට ලැබී තිබුණේ නැත. අප්‍රේල් 05 වන දින අලුයම වැල්ලවාය පොලිස් ස්ථානයට ප්‍රථම ප්‍රහාරය එල්ල වන්නේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි.

1977 වන විට මහින්ද විජේසේකර ප්‍රමුඛ කණ්ඩායමක් ජනතා විමුක්ති පෙරමුණෙන් ඉවත් වී "මහජන විමුක්ති පක්ෂය"ට මුල පිරිය. එමෙන්ම වසන්ත දිසානායක හා පැට්‍රික් ප්‍රනාන්දු විසින් "ජනතා සංගමය" ආරම්භ කරන ලදී.

1983 ජූනි මස 01 වැනිදා තංගල්ලේ විජිත රණවීරගේ නිවසේදී ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභා රැස්වීම පැවැත්වුණි. රෝහණ විජේවීර, උපතිස්ස ගමනායක, ලයනල් බෝපගේ, බණ්ඩාර තෙන්නකෝන් ධර්මදාස ජයසිංහ, සුමිත් අතුකෝරල, පොඩිරත්න රත්නායක, සෝමරත්න කළුආරච්චි සහ දයා වන්නිආරච්චි යන මධ්‍යම කාරක සභිකයෝ මීට සහභාගි වූහ. මෙහිදී දේශපාලන මණ්ඩල සභිකයෙක් වූ පොඩිරත්න රත්නායක හා එවකට ප්‍රධාන ලේකම් ලයනල් බෝපගේ වෙනත් ස්ථාවරයක් දරමින් දෙමළ සන්නද්ධ ව්‍යාපාරය හා එකට කටයුතු කළ යුතුය යන අදහස සහිත මතයක් ඉදිරිපත් කළේය. ඒ අනුව ජැෆ්න ජයා හෙවත් අශෝක ජයතිලක යාපනයේ සිට එවා තිබූ යෝජනාවක් ලයනල් බෝපගේ විසින් සාකච්ඡා සභාවට ඉදිරිපත් කළ අතර "උතුරේ දේශපාලන කණ්ඩායම් සමග සාකච්ඡා කොට ඒ අය සමග ඉක්මන් සහජීවනයක් ඇතිකර ගත යුතුය. ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වය යටතේ යන සමාජවාදී ගමනේදී ධනේශ්වර පංති වර්ධනය අත්විඳීමට ඉදිරියේදිත් සිදුවනු ඇත. එසේ වුවහොත් අපට ඒ අයගේ ආරක්ෂාව ලබා ගත හැකිය. එහෙයින් යාපනය සහ මඩකලපුව අපේ ආරක්ෂක කලාප ලෙස යොදා ගන්නා බවට නම් කළ යුතුය."

කෙසේ වෙතත් දෙමළ ඊළමක් සඳහා වන බෙදුම්වාදී සන්නද්ධ ව්‍යාපාරය ප්‍රගතිශීලි වාමාංශික ව්‍යාපාරයක් නොවන බවත් එය පංතියේ සමගියට බාධාකරන නිර්මාක්ස්වාදි හා ප්‍රතිගාමී ව්‍යාපාරයක් බවත් රෝහණ

> ජනතා විමුක්ති පෙරමුණු ඉතිහාසයේ 2011 වසරේ සිදුවූ බණ්ඩනය පෙර ඒවාට වඩා විශාල හා පැතිරුණු එකක් බව දැක්විය හැකිය. පක්ෂයේ මධ්‍යම කාරක සභාවෙන් හරි අඩකට ආසන්නවද ඇතැම් දිස්ත්‍රික්කවල බහුතරය ලෙසින්ද මෙම බෙදීම සිදුවිය.

විජේවීර කරුණු පැහැදිලි කළ අතර එය පක්ෂයේ බහුතර මතයද එය විය. මෙම මධ්‍යම කාරක සභා සැසිවාරයෙන් පසු සිදුවූ සිදුවීම වූයේ ලයනල් බෝපගේ පක්ෂය හැර යාමය. මෙම සිදුවීමෙන් ටික දිනකදී 83 කළු ජූලිය ඇති විය. එය මුල් කොට ගෙන පක්ෂය තහනම් විය. ඒ කාලයේදීම ලයනල් බෝපගේ ඉල්ලා අස්වීමේ ලිපිය පක්ෂයට බාර දුන්නේය.

1989 ජනතා විමුක්ති පෙරමුණේ සන්නද්ධ අරගලය යුදමය වශයෙන් සැලකිය යුතු පරාජයකට පත්ව තිබූ අතර පක්ෂය තුළ අවිශ්වාසය සහ අපේක්ෂාභංගත්වය මෙන්ම භීතියද ගොඩනැඟී පැවතුණි. ආණ්ඩුවේ මෙම මර්දනකාරී ක්‍රියාවලියේදී දේශපාලන මණ්ඩලයේ සෝමවංශ අමරසිංහ මහතා පමණක් ජීවිතය බේරා ගැනීමට සමත් විය. ඒ අනුව සෝමවංශ අමරසිංහ 1990 පෙබරවාරි මාසයේ විදේශගත විය.සෝමවංශ අමරසිංහ විදේශගතව සිටිමින් ලංකාවේ පක්ෂ ක්‍රියාධරයින් සමග සම්බන්ධතා ගොඩනගා ගැනීමට කටයුතු කළ අතර මෙම තත්ත්වයෙන් පක්ෂයේ ප්‍රතිසංවිධාන කටයුතු සඳහා යම් පිටුබලයක් ලැබුණි. ඒ අනුව 1991 වසර වනවිට පක්ෂය විසිරුණු පිරිස් ලෙස පැවතුණු අතර ඔවුන් සමග සම්බන්ධතා ගොඩනගා ගැනීමට සෝමවංශ අමරසිංහ කටයුතු කළේය. ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයක් ලෙස විධිමත්ව ගොඩනැගුණේ ඉන් අනතුරුවය.

එසේ ගොඩනැගුණු ජනතා විමුක්ති පෙරමුණ 2000 මහමැතිවරණයෙන් ආසන 10ක් දිනා ගත් අතර 2001 දී එය 16 දක්වා වර්ධනය කර ගැනීමට සමත් විය. උතුරු නැගෙනහිර අර්බුදය සම්බන්ධයෙන් දැරූ මතය හේතුවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමග එක්ව 2004 වර්ෂයේදී සන්ධානය ගොඩනගමින් එක්සත් ජාතික පක්ෂය පරාජය කිරීමට ජනතා විමුක්ති පෙරමුණ සමත් වූ අතර 2004 මහමැතිවරණයෙන් මන්ත්‍රීධුර 39ක් දිනා ගැනීමට සමත්වන ජනතා විමුක්ති පෙරමුණ 2005 ජනාධිපතිවරණයේදී එවක ජනාධිපතිධුර අපේක්ෂක මහින්ද රාජපක්ෂ මහතාට සහාය ලබා දෙමින් එම මැතිවරණ කාර්ය සඳහා සැලකිය යුතු මෙහෙවරක් ඉටු කළෝය. 1994 දී ජනතා විමුක්ති පෙරමුණ නැවත ප්‍රති සංවිධානය වීමේ දී විශාල වැඩකොටසක් කළ සාමාජිකයකු ලෙස නන්දන ගුණතිලක හැඳින්විය හැකිය. 1999 දී ඔහු ජනතා විමුක්ති පෙරමුණේ ජනාධිපතිධුර අපේක්ෂකයා විය. 2000 හා 2001 මැතිවරණවලින් ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් හෙතෙම පාර්ලිමේන්තුවට තේරි පත්විය. එසේම 2004 වසරේදී ජනතා විමුක්ති පෙරමුණට ආසන 39ක් හිමිවූ අවස්ථාවේ නන්දන ගුණතිලක නැවත පාර්ලිමේන්තු වරම් ලැබිය. නමුත් 2005 දී නන්දන ගුණතිලක ද ජනතා විමුක්ති පෙරමුණෙන් ඉවත් විය.

ජනතා විමුක්ති පෙරමුණ 2001 සිට ප්‍රතිපත්තිමය වශයෙන් පිරිහෙන්නට පටන් ගැනුණි. වාමාංශික පක්ෂයක් වූ ජනතා විමුක්ති පෙරමුණ දක්ෂිණාංශික ආණ්ඩුවක් හා දීග යැම ගැන බිම් මට්ටමින් විවේචන එල්ල විය. ඒ හේතුවෙන් පක්ෂය ගත් තීන්දුව වූයේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් ඉවත් වීමය. නමුත් යුද්ධයක් පැවැත්වෙන මෙවැනි අවස්ථාවක ආණ්ඩුවෙන් ඉවත් නොවිය යුතුය යන තර්කය විමල් වීරවංශ ඉදිරිපත් කළ අතර විමල් වීරවංශගේ මතය අනුමත කරමින් ජනතා විමුක්ති පෙරමුණෙන් කණ්ඩායමක් ආණ්ඩුවෙන් ඉවත් නොවිය යුතුය යන ස්ථාවරය පිළිගත්හ. බරපතළ ලෙස ජනතා විමුක්ති පෙරමුණ පක්ෂ අභ්‍යන්තරයේ ඇති වූ මේ මතවාදීමය භේදය කෙලවර වූයේ පක්ෂය දෙකඩ වීමෙනි. ඒ අනුව විමල් වීරවංශ ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 11 දෙනෙක් ජනතා විමුක්ති පෙරමුණ හැරගොස් ජාතික නිදහස් පෙරමුණ පිහිටුවා ගත්හ.

ජනතා විමුක්ති පෙරමුණු ඉතිහාසයේ 2011 වසරේ සිදුවූ බණ්ඩනය පෙර ඒවාට වඩා විශාල හා පැතිරුණු එකක් බව දැක්විය හැකිය. හරි අඩකට ආසන්නවද ඇතැම් දිස්ත්‍රික්කවල බහුතරය ලෙසින්ද මෙම බෙදීම සිදුවිය. මෙකී බෙදීයාමට පාදක වී ඇති බව සඳහන් කරුණු දෙකක් ලෙස දැක්විය හැකිය. එනම් පරිවාසයේ සිට ජනතා විමුක්ති පෙරමුණ භාවිතයට නැඟූ සහාගවාදී දේශපාලනය සහ ජාතික ගැටලුව සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රවේශය යන කරුණු දෙකය. මෙම කරුණු දෙක පාදක කරගෙන කාලයක් තිස්සේ ජනතා විමුක්ති පෙරමුණ තුළ මතවාදී අරගලයක් පැවතුනි. බණ්ඩනය හට ගන්නේ කෙමෙන් කෙමෙන් වැඩී ගිය මෙම අරගලය මෝරා යාමේ ප්‍රතිඵලයක් වශයෙනි. විශේෂයෙන් 2009 අගභාගයේ රාජපක්ෂ පාලනය විසින් කැඳවූ ජනාධිපතිවරණය නිසා නැවත වරක් සහාග දේශපාලනය පිළිබඳ සංවාදය මතු විය. සහාග දේශපාලනය වෙනුවෙන් ගත් අත්තනෝමතික තීරණ සම්බන්ධව පැන නැඟි අදහස් සමස්ත පක්ෂය තුළ සැලකිය යුතු සංවාදයක් දක්වා වර්ධනය විය.

මෙහිදී 1994 සිට ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනය පිළිබඳ ආපසු හැරී බැලීමක් සිදුවූ අතර පක්ෂය සහාගවාදයට, ප්‍රතිසංස්කරණවාදයට හා ජාතිවාදයට ගොදුරු වූ බව බහුතර සාමාජිකයින්ගේ පිළිගැනීම. විය. ඒ අනුව 2010න් පසුව පක්ෂය නව ගමන්මඟකට ගැනීම සඳහා වැඩපිළිවෙළක් සම්මත වූ අතර ඒ සඳහා නව මධ්‍යම කාරක සභාවක්ද පත් කෙරිණි. එහෙත් තත්වයන් වර්ධනය වූයේ පක්ෂය පක්ෂ සම්මේලනය විසින් සම්මත කළ ගමන් මඟෙහි ගමන් කළ හැකි ආකාරයට නොවේ. ජනතා විමුක්ති පෙරමුණේ දැනට සිටින ප්‍රමුඛ පෙළේ නායකයන් එම වැඩපිළිවෙළ ක්‍රියාවට නැඟීමට බාධා කළහ. නව වැඩපිළිවෙළ තහවුරු වුවහොත් එය සිදුවන්නේ මෙතෙක් සහාග දේශපාලනයෙන් ජනප්‍රියවාදි ලෙස තහවුරු කෙරුණු සිය ආධිපත්‍ය උදුරාගනිමින් බව ඔවුහු අවබෝධ කර ගත්හ. ඒ නිසාම විවිධ පාර්ශ්වික හේතු දක්වමින් නව මධ්‍යම කමිටුවට සාමාජිකයින් විසින් නායකයන් පිරිසක් නෙරපා හරිමින් පැරණි දේශපාලන මණ්ඩලයේ සුපිරි බලයක් හැසිරවූ කණ්ඩායම බලය තහවුරු කර ගත්හ. 2005 සිට ඇරඹුණු මෙම මතවාදී ගැටුම අවසානයේ ජනතා විමුක්ති පෙරමුණ බණ්ඩනය වෙමින් කුමාර් ගුණරත්නම්ගේ නායකත්වයෙන් පෙරටුගාමී සමාජවාදි පක්ෂය බිහිවීමට බලපෑවේය.

සෝමවංශ අමරසිංහ මහතා, 1994 ජනතා විමුක්ති පෙරමුණ නැවත ගොඩනැගීමෙන් පසු විදේශයේ සිට පක්ෂය මෙහෙය වීය. නැවත ලංකාවට පැමිණීමෙන් පසුව එහි නායකයා ලෙසින්ද කටයුතු කරනු ලැබුවේ සෝමවංශ අමරසිංහය. 2014 පෙබරවාරි දක්වා ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වය දැරූ ඔහු එම මස දෙවැනිදා පැවති පක්ෂයේ හත් වැනි සම්මේලනයේදී නායකත්වයෙන් ඉවත් වූ අතර නව නායකත්වයට අනුර කුමාර දිසානායක පත් කෙරිණ. ඒ අනුව පසුව සෝමවංශ අමරසිංහ ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික ධුරයටත් අන්තර් ජාතික කටයුතු ලේකම් ලෙසටත් පත් කෙරිණ. කෙසේ වුවද 2015 ජූනි මස දී ඔහු ජනතා විමුක්ති පෙරමුණෙන් ඉවත්ව ජනතා සේවක පක්ෂය නමින් නව පක්ෂයක් පිහිටුවා ගනිමින් 2016 ජූනි මස 15 වන දින ඔහුගේ මරණය තෙක් එහි නායකත්ව ධූරයේ කටයුතු කළේය.

වර්තමාන ජනතා විමුක්ති පෙරමුණ දෘෂ්ටිමය දේශපාලනමය හා සංවිධානමය වැරදි හඳුනා නොගෙන හැඟීම්බර ආයාචනයන්ගෙන් හා භක්තිවාදය කුළු ගැන්වීමෙන් වැරදි වලට නිසි හේතු ග්‍රහණය කර ගන්නට නොහැකිය. ඒ සඳහා ගැඹුරු න්‍යායික දේශපාලනික සංවාදයකට පිවිසිය යුතුමය.

මේ අනුව ජනතා විමුක්ති පෙරමුණෙහි බෙදීයාමේ දේශපාලන ප්‍රතිවිපාක පාර්ලිමේන්තු මැතිවරණ හෝ ජනාධිපතිවරණ ප්‍රතිඵල කෙරෙහි පමණක් නොව එම පක්ෂය විසින් අතීතයේ නායකත්වය දෙන ලද කම්කරු පංති ව්‍යාපාරය කෙරෙහිද බලපා ඇති අන්දම අද ඒවා පවතින දුර්වල ස්ථානය තුළ දැක ගත හැකිය.

එම්. තාරික්

කවිය අවිය කරගත් දඹුල්ලේ ඇමැති

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ඉතිහාසය විමර්ශනය කරන විට නීති වෘත්තිකයන්, ඉඩම් හිමි වැවිලිකරුවන් මෙන්ම සමාජයේ ගෞරවය දිනාගත් ප්‍රමුඛයන් වැඩිදෙනෙකු මැතිසබයට පිවිසීමේ වරම හිමිකරගත් ආකාරය පෙනී යනු ඇත. එහෙත් 1956 තුන්වැනි පාර්ලිමේන්තු මහ මැතිවරණයේ ප්‍රතිඵල නිකුත් වීමෙන් පසු එතෙක් පැවති පාර්ලිමේන්තුවේ සංයුතිය උඩුයටිකුරු කරමින් සාමාන්‍ය පංතියේ රාජ්‍ය සේවකයන්, කවියන්, ලේඛකයන් මෙන්ම පුවත්පත් කලාවේදීන් ද මන්ත්‍රීවරුන් ලෙස දිවුරුම් දුන් ආකාරය දැකගත හැකිය. ඒ අනුව ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ඉතිහාසයේ ප්‍රථම වරට අමාත්‍ය පදවියකින් සම්මාන ලැබූ කවියා වන දඹුල්ල හිටපු මන්ත්‍රී ටී.බී. තෙන්නකෝන් මහතා හැඳින්විය හැකිය.

කන්ද උඩරට ගුන්නෑපානේ පිලවල නම් ගමෙහි 1912 මාර්තු මස 16 වන දින ඉපදුණු ටිකිරි බණ්ඩාර තෙන්නකෝන් දරුවා තම මූලික අධ්‍යාපනය ගුන්නෑපාන ප්‍රාථමික විදුහලෙන්ද, පසුව මහනුවර පුෂ්පදාන විදුහලෙන්ද අක්ෂර වින්‍යාසය කළ අතර කාව්‍යකරණයට, ලේඛන කලාවට හා නර්තනයට සමතෙකු විය. ළමා වියෙහිදීම තම මව්පියන්ගේ වියෝව හේතුවෙන් අසරණභාවයට පත් ටී. බී. තෙන්නකෝන් හට අධ්‍යාපන කටයුතු ඉදිරියට කරගෙන යාමට අවස්ථාව නොලැබුණි. එසේ හෙයින් රැකියාවක් සොයාගෙන මහනුවර නගරයට පැමිණියේය. ඔහුගේ මුල්ම ජීවන වෘත්තිය වූයේ දුම්රිය දෙපාර්තමේන්තුවේ අඟුරු මඩුවෙහි රාජකාරිය කිරීමය. ඉතා දුෂ්කර රැකියාවක් වූ එයින් දෛනිකව ශත 63 ක වේතනයක් හිමිවිය.

පසුව මහනුවර පිහිටි සිරිසර මුද්‍රණාලයට බැඳී මසකට රුපියල් 15ක වැටුපකට සේවය කළ අතර එහිදී තම කාව්‍යකරණ දක්ෂතාවය ආත්මය කර ගත්තේය. කවි කොළ, කවි පොත් ලියා පළකරමින් ජනාකීර්ණ ස්ථානවල හඬනඟා ගයමින් ඔහු තම දිව්‍ය සුන්දර කර ගත්තේය. වැඩිකල් නොයාම ඉතා මිහිරි අන්දමින් කවි ගායනය කිරීමද නිසා ගැමි ජනතාව තුළ රසෝත්පාදනය වී කෙටි කලකින්ම ඉතා ජනප්‍රිය කවියකු බවට පත්විය. මේ අවධියේ මහා කවි ආනන්ද රාජකරුණාගේ මූලිකත්වයෙන් සමස්ත ලංකා සිංහල කවි සම්මේලනය පණගැන්වෙන විට ටී.බී. තෙන්නකෝන් ගේ මූලිකත්වයෙන් "මහනුවර තරුණ කවි සමාජය" බිහි විය.

දේශීය දේ අගය කළ එතුමන්ගේ එකම තර්කය වූයේ විදේශීය අධිරාජ්‍යගැති සිරිත් විරිත් අත්හළ යුතු බවය. ඒ අනුව ඔහු එය ක්‍රියාවෙන්ම ඉටු කර පෙන්වීය. එතුමන්ගේ ඇඳුම වූයේ ආරිය සිංහල ඇඳුමය. විශේෂයෙන් බණ්ඩාරනායක මහතාගේ නායකත්වයෙන් ආරම්භ කරන ලද සිංහල මහා සභාවේ මහනුවර ශාඛාවේ ලේකම්වරයා වූයේ ටී.බී. තෙන්නකෝන් මහතාය. එම තත්වය පසුකාලීව ඔහු ජාතික දේශපාලනයේ අවතීර්ණවීමට පෙලඹවූ හේතුව බව සඳහන් කිරීම වැදගත් වේ. සෑම අවස්ථාවකම අරපිරිමැස්මෙන් හා ඉතාම නිහතමානී ලෙස කටයුතු කළ එතුමන් දයාබර සැමියෙක් මෙන්ම දරුවන්ට ඉතා ඇල්ම දැක්වූ ආදරබර පියෙකුද විය.

ටී.බී. තෙන්නකෝන් පුවත්පත් කලාවේදියකු ලෙස කටයුතු කරන අවධියේ මහනුවර නගර සභාවේදී ඇති වූ සිදුවීමක් සම්බන්ධයෙන් පළකරනු ලැබූ වාර්තාව ව්‍යාජ තොරතුරු මත පදනම් වූ බව මන්ත්‍රීවරයෙකු චෝදනා නගනු ලැබීය. මේ චෝදනාව මත ඇතිවූ වාචික ආරවුල මත ටී.බී. තෙන්නකෝන් "මං කවදා හරි නාගරික මන්ත්‍රීවරයෙක් වෙලා මෙහාටම ඇවිත් උත්තර දෙනවා" යැයි අභියෝගාත්මකව පවසා ශාලාවෙන් පිටව ගියේය. ඒ අනුව 1946 වර්ෂයේ මහනුවර මහ නගර සභාවේ දෙයියන්නෙවෙල අසුන නියෝජනය කරමින් දේශපාලනයට පිවිසි ටී.බී. තෙන්නකෝන් මහතා පාර්ලිමේන්තුවට තේරීපත්වන තුරුම එහි මන්ත්‍රීවරයා විය. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා 1951 වසරේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවීමේදී එහි කැඳවුම්කරු වූයේ ටී.බී. තෙන්නකෝන් මහතාය.

1956 මහ මැතිවරණ ආසන්න වන විට මාතලේ දිස්ත්‍රික්කයේ අපේක්ෂකයෙකු වූ එච්.බී. තැන්නේ මහතා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉවත් වී එක්සත් ජාතික පක්ෂයට එකතු විය. මේ හේතුවෙන් ඒ මහතා එම මැතිවරණයේදී දඹුල්ල ආසනයට තරග කළේ එක්සත් ජාතික පක්ෂයෙනි. මේ අතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉදිරිපත් කළේ ආසනයට ආගන්තුක වූ මහනුවර නගර සභා මන්ත්‍රීවරයකු ලෙස සිටි සුප්‍රකට කවින්ද්‍රයන් වූ ටී.බී. තෙන්නකෝන් මහතාවය. තරගයට සිටියේ මේ දෙදෙනා පමණය. ඒ අනුව මෙහිදී ඡන්ද 14688ක් ගත් ටී.බී. තෙන්නකෝන් මහතා, එච්.ඩබ්. තැන්නේ මහතා පරදවා වැඩි ඡන්ද 9155 කින් "දඹුල්ල මන්ත්‍රී" ලෙස ජයග්‍රහණය කළේය. 1959 වර්ෂයේ අගභාගය වනවිට ටී.බී. තෙන්නකෝන් මහතා සංස්කෘතික හා සමාජ සේවා උප ඇමැතිධුරයටද පත්විය. එහි මංගල අයවැය විවාදයේදී පැවැත්වූ කවි කතාවේ අඩංගු කවි දෙකක් මෙලෙස දැක්විය හැකිය.

අපේ කම්කරු පිරිස වෙනුවෙන් අර්ථසාධක මුදල ඇති කර
වහල් බැම්මෙන් මුදා අරගෙන සුදුසු විදියට පඩි ද වැඩි කර
එපමණක් නොව තවත් දේවල් එමට ඇත මේ රජය ඉටු කර
එහෙත් තව කෙළවරක් වී නැත එන්ට එන්ටම වැඩියි කරදර

බස් සමාගම් හා වරායත් ගතිමු මහජන රජය යටතට
ලස්ස ගණනින් පාඩු සිදුවෙයි ඒක හිටියා රටේ කරුමෙට
උස් අසුන් මත ඉන්න දුන්නොත් තවත් ජනසතු විරෝදීන් හට
හිස් අනාගතයක විපත්තිය අපට පුළුවනි සිතා ගන්නට

ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු බවට පත්වූ මෙතුමා 1960 දී ප්‍රවාහන හා රජයේ වැඩ උප ඇමති වශයෙන්ද, 1963 දී අධ්‍යාපන උප ඇමති වශයෙන්ද, සේවය කළේය. ශිෂ්‍ය ගුරු තනතුරු ඇති කොට විශාල පිරිසකට රැකියා අවස්ථා ලබා දීමට හැකි වූයේද මේ කාලයේදීය. 1964 සහාග රජයේ අභ්‍යන්තර හා බාහිර වෙළඳාම හා සැපයීම් පිළිබඳ උප ඇමති ලෙස හා 1970 සමගි පෙරමුණ රජයේ සමාජ සේවා හා සංස්කෘතික ඇමති වශයෙන්ද අගනා සේවයක් කළේය. මහලු නිවාස වැඩිහිටි නිවාස බවට පත් කරන ලද්දේද මෙතුමා විසිනි. එමෙන්ම සංස්කෘතික උප ඇමතිධුරයේ සිටින කාලපරිච්ඡේදයේ යම්කිසි මුග්ධ පිරිසක් විසින් ලෝක ප්‍රකට සීගිරි බිතුසිතුවම් සූරා තීන්ත පලුදු කොට විකෘති කරන ලදි. මෙසේ විකෘති කරන ලද චිත්‍ර යළිත් ප්‍රකෘති තත්වයට පත් කිරීම සඳහා ටී.බී. තෙන්නකෝන් මහතාගේ මැදිහත්වීම යටතේ රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිණි. ඒ අනුව ඉතාලියේ අතිදක්ෂ චිත්‍ර ශිල්පි ලුසියානෝ මරෙන්සි ශ්‍රී ලංකාවට ගෙන්වා එම චිත්‍ර පැරණි කාලයේ තිබූ තත්වයටම පත් කිරීමට කටයුතු කරන ලදි. මේ කරුණ තුළින් ටී.බී. තෙන්නකෝන් මහතා කලාවට දැක්වූ විශේෂ ලැදියාව මනාව විද්‍යමාන කෙරේ.

විවිධ අමාත්‍යධුර දැරූ ටී.බී. තෙන්නකෝන් කතානායකවරයාගේ අණ නොතකා අයවැය විවාදවලදී කවි කතා පවත්වා ඇත. ඒ අනුව දඹුල්ලේ ගොවියන්ගේ ජල අර්බුදය හා එයට පිළියම කවියකින් අනාවැකියක් ලෙස කිවේය.

කටුගස්තොටදී මහවැලි ගං මනමාලි
පහළට යානොදී හරහට බැඳ වේලි
උතුරට යොමු කරන තීරණයකි පෝලි
රජරට එයින් නංවනු ඇත ජය කේලි

1977 මැතිවරණයේදී ටී.බී. තෙන්නකෝන් මහතා හය වන වතාවටත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් දඹුල්ල ආසනයට ඉදිරිපත් විය. ඔහුගේ ප්‍රතිවාදියා වූයේ එක්සත් ජාතික පක්ෂයේ කේ.ඩබ්.ආර්. එම්. ඒකනායක මහතාය. මෙම මැතිවරණයෙන් වැඩි ඡන්ද 24,793ක් ගත් කේ.ඩබ්.ආර්.එම්. ඒකනායක මහතා ටී.බී. තෙන්නකෝන් මහතා පරදවා වැඩි ඡන්ද 8829 කින් දඹුල්ල ආසනය ජය ගත්තේය. මේ අනුව පස් වතාවක්ම දඹුල්ල ආසනය ජයගත් 1956 සිට දඹුල්ල මන්ත්‍රීධුරය දැරූ ටී.බී. තෙන්නකෝන් මහතාගේ

දේශවංශය

දසක හතරක් නොවෙනස් වූ විධායක ක්‍රමයේ හොඳ නරක



"ගැහැණියකු පිරිමියකු කිරීමටත් පිරිමියකු ගැහැණියකු කිරීමටත් හැර අන් සියල්ල විධායක ජනාධිපතිවරයාට කළ හැකි" බැව් 1978 ව්‍යවස්ථාව රටට හඳුන්වා දෙමින් විධායක ජනාධිපති තනතුර පිළිබඳ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා පවසා තිබේ. එහි සත්‍යාසත්‍යතාව කෙසේ වෙතත් එය ඇසූ සැණින් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අදහසක් ඇති ඕනෑම පුද්ගලයකුගේ රෝම කූප කෙළින් වීම නොවැලැක්විය හැකිය. එය ඒකාධිපති පාලනයක්ය යන්න අප මනසට ඇතුල්වන්නේ ඉබේටමය. ඒකාධිපති යනු සියලු ම බලය එක් පුද්ගලයෙක් යටතේ තබා ගන්නා ක්‍රමයක් නොඑසේ නම් ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ සියලු බලතල එක් අයෙකුට හිමිවීමකි. අතීත රාජාණ්ඩු පාලනය පිළිබඳ කියවා, අසා ඇති ඔබට සහ අපට ඒකාධිපති පාලනය කුමක් දැයි අමුතුවෙන් කිව යුතු නොවේ.

කෙසේ වෙතත් විධායක බලය සියතට ලැබුණු එක් එක් ජනාධිපතිවරුන් 06දෙනෙක් ම ක්‍රියා කළේ සය ආකාරයකටය. ජේ.ආර්. ජයවර්ධන ජනපතිවරයා එම බලතල තමන්ට අවශ්‍ය ලෙස ද ඉන් අනතුරු ව පත්වුණු ජනපතිවරුන් වන රණසිංහ ප්‍රේමදාස, ඩී.බී.විජේතුංග, චන්ද්‍රිකා කුමාරතුංග, මහින්ද රාජපක්ෂ, මෛත්‍රිපාල සිරිසේන ක්‍රියා කළ ආකාරය සිහිපත් කළ හැකි ය. සිරිසේන ජනපතිවරයාගේ මැදිහත්වීම මත සිදු කෙරුණු 19වන සංශෝධනයෙන් පසු ජනපති පුටුවට පැමිණියේ වර්තමාන ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතාය. යථෝක්ත ජනපතිවරුන් 06 දෙනා සහ වර්තමාන ජනාධිපතිවරයාට ලැබුණු බලතල පිළිබඳ සලකා බැලීමේදී පෙර සිටි 06දෙනාට වඩා සීමා සහිත බලයක් වර්තමාන ජනපතිවරයාට හිමි බැව් බැලූ බැල්මට පෙනේ. නමුත් බලය භාවිත කරන ආකාරය අනුව එය ද පුද්ගලබද්ධ විය හැකි බැව් ද පෙනේ.

"බලය හසුරුවන අය තමන්ට කැමති ආකාරයට බලයට යටත්වන අය පාලනය කිරීමට ඇති හැකියාව සහ තම කැමැත්තට අවනත නොවන විට බල කිරීම මඟින් අවනතභාවය ලබා ගැනීම 'බලය' ලෙස අපි හඳුනා ගනිමු. මෙම බලය විමධ්‍යගත කර ඇති ස්වරූපයක් බැලූ බැල්මට පෙනෙන්නට තිබේ. පළාත් සභාව, ප්‍රාදේශීය සභාව, මහ නගර සභාව සහ නගර සභාව ආදී ආයතන වෙත එම බලය බෙදා හැර තිබේ. විධායක ජනාධිපතික්‍රමය මෙරටට හඳුන්වා දෙන්නේ ප්‍රංශ ව්‍යවස්ථාව දෙස බැලීමෙන් බැව් තතු දත්තෝ දනිති.

ලංකාවට නිදහස ලැබෙන විට ජනපතිවරයෙක් නොසිටියේය. ඒ වනවිට සිටියේ ආණ්ඩුකාරවරයෙකි. ඊට අවුරුදු 40කට පසුව ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිවරයා මෙම ක්‍රමය අප රටට හඳුන්වා දුන්නේ ය. 1972 ජනරජ ව්‍යවස්ථාව යටතේ පළමු වතාවට ජනාධිපතිවරයෙක් ව්‍යවස්ථාවට හඳුන්වා දුන්නේය. මෙරට පළමු ජනපතිවරයා වූයේ විලියම් ගොපල්ලව මහතාය. නමුත් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව පරාජය කරන ජේ.ආර්. ජයවර්ධන මහතා ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂය 5/6ක බලයක් ලබා ගනිමින් බලයට පත් වන අතර එකී ජනමතය යොදා ගනිමින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සැකසුවේය. විධායක ජනාධිපතිවරයා හඳුන්වා දෙන්නේ එකී ව්‍යවස්ථාව මඟිනි.

ඒකීය රජයක් ලෙස ක්‍රියාත්මක වන අප රටට අතිශයින් සමාන ව්‍යවස්ථා පවතින්නේ මහා බ්‍රිතාන්‍ය, ප්‍රංශය වැනි රටවල ය. නමුත් ප්‍රංශයේ ජනාධිපතිවරයාට ද වඩා බලවත් ජනපතිවරයෙක් 78 ව්‍යවස්ථාව මඟින් බිහි කළේ ය. ඒ අනුව ශ්‍රී ලංකා ජනරජයේ රාජ්‍ය ප්‍රධානියා ජනාධිපති වේ. එසේම ජනාධිපති විධායකයේ ප්‍රධානියා, රජයේ ප්‍රධානියා සහ හමුදා සේනාවන්ට අණ දෙන ප්‍රධානියා ද වේ. ජනාධිපති තෝරාගනු ලබන්නේ ජනතාව වන අතර ඒ අවුරුදු 06ක ධුර කාලයකටය. ජනාධිපතිවරයාට ඕනෑම අවස්ථාවක පාර්ලිමේන්තුවට සහභාගි වීමට, ඇමතීමට සහ පණිවිඩ යැවීමට අයිතියක් ඇත. එසේම ජනාධිපතිවරයාට සියලු ම වරප්‍රසාද සඳහා හිමිකම් ඇත, ඡන්දය පාවිච්චි කිරීම අයිතියට අමතරව නිර්මුක්තිය සහ පාර්ලිමේන්තු සාමාජික ලෙස බලය, පාර්ලිමේන්තුවේ හෝ එහි සාමාජිකයෙක් ලෙස ඕනෑම වරප්‍රසාද කඩවීමක් සම්බන්ධව වගකිය යුතු නොවේ. ජනාධිපතිවරයා කැබිනට් අමාත්‍යවරුන්ගේ ප්‍රධානියා වේ, කැබිනට් රැස්වීමේ මුලසුන දැරීම සහ පාර්ලිමේන්තුවට තෝරා පත් කර ඇති සාමාජිකයන් අතරින් අග්‍රාමාත්‍යවරයා පත් කිරීමේ බලය ද හිමි වේ. ජනාධිපතිවරයාගේ බලය යටතේ ව්‍යවස්ථාවට ඇතුළත්ව තිබෙන නිතීයට එකඟව අදාළ කැඳවීම සිදු කිරීමට, සභාව විසුරුවා හැරීමට, පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට සහ ජනමත විචාරණයක් කැඳවීම සිදු කළ හැකිය. ඡන්දයෙන් පත් කළ ජනාධිපතිවරයාට ව්‍යවස්ථාදායකය විසින් පවරන බලය මත සියලු ම පාර්ලිමේන්තු සැසිවාරයන් ආරම්භයට රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව පාර්ලිමේන්තුවට ප්‍රකාශ නිකුත් කළ හැකිය, පාර්ලිමේන්තුවේ චාරිත්‍රානුකූල ව සභා වාරයේ මුලසුන දැරීම,මහ කොමසාරිස් , පූර්ණ බලතල සහිත තානාපති සහ අනෙකුත් තානාපති නියෝජිතයන් භාර ගැනීම සහ පිළිගැනීම, පත් කිරීම සහ තානාපති බලතල පැවරීම,රාජ්‍ය ලාංඡනය ලඟ තබා ගැනීම, අග්‍රාමාත්‍යවරයා, අමාත්‍යවරුන් සහ කැබිනට් අමාත්‍යවරුන් පත් කිරීම, ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකරු සහ අනෙකුත් විනිශ්චයකරුවන් පත් කිරීම වැනි ප්‍රතිපාදනයන් පිළිබඳ කෙටුම්පත් සඳහා භාවිතා කිරීම සහ ඉඩම් පවරා දීම සහ මහජනයා වෙත පවරා දී ඇති නිශ්චල දේපළ ඇතුළු ඕනෑම දෙයක් මුදා තැබීම සඳහා රාජ්‍ය ලාංඡනය භාවිතා කිරීමට ජනාධිපතිවරයා ලෙස නීත්‍යනුකූල අවශ්‍ය වීම හෝ බලය පවරා ඇත, යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ ලිඛිත නීතියට පටහැනි නොවන ලෙස, අන්තර්ජාතික නීතියට අනුව ජනාධිපතිවරයා කළ යුතු හෝ කිරීමට අවසර එවන් සියලු ම දෑ සහ ක්‍රියා ක්‍රියාවට නැංවීම, කමා කිරීම, දඬුවමක් කල් දැමීම, ලබා දුන් දඬුවමක් වෙනුවට ලිහිල් දඬුවමක් ලබා දීම සහ සම්පූර්ණ දඬුවම හෝ කොටසක් අවලංගු කිරීම ව්‍යවස්ථානුකූල ව එතුමාට පැවරී තිබුණි. 78 ව්‍යවස්ථාවේ බලතල ප්‍රකාර ව ජනපතිවරයාට පාර්ලිමේන්තුව තම අභිමතය පරිදි විසුරුවා හැරීමට හැකියාව පැවතුණි. ඒ නිසාම විධායක ජනපතිවරයාට ව්‍යස්ථාදායකය මෙන්ම අධිකරණයට ද බලපෑම් කිරීමේ හැකියාව පැවතුණි. එමෙන්ම එතුමාට එරෙහි ව සිවිල් හෝ අපරාධ පැවරිය නොහැකි ලෙස වූ මුක්තියක් ද 78න් ලැබී තිබුණි.

විධායක ජනාධිපතික්‍රමය ඉවත් කිරීම ස්වකීය මැතිවරණ පාඨ බවට පත් කර ගනිමින් ද ආණ්ඩු පත් වූ අයුරු දුටුවෙමු. ඒ සඳහා වමේ පක්ෂ එක ම සන්ධානයකට පැමිණි අයුරු ද දුටුවෙමු. ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩු බලය පොදුජන එක්සත් පෙරමුණ සමඟ බෙදා ගන්නට ද මෙම ජනාධිපති ක්‍රමය උපකාරී වූ බව ද සිහිපත් කළ හැකිය. ඉන් පසුව විධායකය සතු මෙම බලතල වරින් වර අඩු කිරීමටත් තවත් වරෙක එය අහෝසි කිරීමට ත් යෝජනා ඉදිරිපත් විය. මතවාද ඉදිරිපත් විය. 18 වන සංශෝධනයෙන් ජනපතිගේ බලතල තව තවත් වඩා වර්ධනය වූ අයුරු දුටුවෙමු. මීට පෙර දෙවරක් පමණක් පදවියට පත්විය හැකි ව තිබුණු තත්ත්වය සීමාවක් නොමැතිව පත් විය හැකි යැයි සම්මත විය. නමුත් ඉන් එහා ගිය විසඳුමක් ලබාදීමට තවත් සංශෝධනයක් පැමිණියේය. ඒ අනුව 19 වන සංශෝධනය ඉදිරිපත් විය. ඉන් අනතුරු ව දැන් අපට සිටින්නේ ජනතාව විසින් සෘජු ඡන්දයෙන් තෝරා පත්කරගන්නා ජනාධිපතිවරයෙකි. ඔහුගේ ධුර කාලය අවුරුදු 5 කි. එසේ වෙතත්, පළමු වරට එම ධුරය දරණ කෙනෙකුට තමන්ගේ අවුරුදු 5 අවසන් වීමට මාස 6 කට කලින් නැවත ජනාධිපතිවරණයක් කැඳවිය හැක්කේය. එක පුද්ගලයෙකුට ජනාධිපති ධුරයට පත්විය හැක්කේ දෙවරක් පමණි. ඡන්දයකින් තෝරා පත්කර ගැනෙන, මුළු රටෙන්ම ලැබෙන පුද්ගල වරමක් සහිත එකම පුද්ගලයා ජනාධිපතිවරයාය. ඒ නිසාම, ස්වකීය ව්‍යවස්ථාමය කර්තව්‍යයන් ඉෂ්ට කිරීමේදී ස්වකීය බලතල සහ සුජාතකත්වයට අදාළ විශාල හයියක් එම තැනැත්තාට ලැබේ. ජනාධිපතිවරයා රාජ්‍යයේ නායකයාය. ආණ්ඩුවේ නායකයාය. ත්‍රිවිධ හමුදාවේ අණදෙන නිලධාරියාය. මේවා හුදෙක් නාමික දේවල් නොවේ. මන්ද යත්, විධායකයේ සහ ආණ්ඩුවේ ප්‍රධානියා වශයෙන් ජනාධිපතිවරයා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙකු සහ එහි ප්‍රධානියා ද වන බැවිනි. ශ්‍රී ලංකාවේ ආරක්ෂාව පිළිබඳ කාරණය, ජනාධිපතිවරයා හොබවන ස්වෛරී විධායක බලයේ කොටසක් වන බව විශේෂයෙන් සඳහන් කොට ඇති නිසාම, ආරක්ෂාව පිළිබඳව, හමුදාව පිළිබඳව, බුද්ධි සේවාවන් පිළිබඳව මෙන්ම, නීතිය ක්‍රියාත්මක කිරීමේ කර්තව්‍යයන් පිළිබඳවත් සෑහෙන අධිකාරයක් එම ජනාධිපතිවරයාට ලැබෙන්නේය. තවදුරටත් අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා පත්කරන්නේ ජනාධිපතිවරයා විසිනි. අගමැතිවරයාගේ ලේකම්වරයා සහ සියලු අමාත්‍යාංශ ලේකම්වරුන් පත්කරන්නේ ජනාධිපතිවරයා විසිනි. අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා හැරුණු කොට ඉහත කී සියලු පරිපාලන නිලධාරීන් කටයුතු කළ යුත්තේ අගමැතිවරයාගේ හෝ ඒ ඒ අමාත්‍යාංශ භාර අමාත්‍යවරුන්ගේ මග පෙන්වීම යටතේ වුවත්, එම නිලධාරීන් සියලු දෙනා පත්කිරීමට ජනාධිපතිවරයාට ඇති බලය සෑහෙන වැදගත්කමකින් යුක්ත වෙයි.එමෙන් ම අති විශාල සම්පත් ප්‍රමාණයක් සහ ආයතනික ව්‍යුහයක් සහිත ජනාධිපති ලේකම් කාර්යාලය පවතින්නේ මුළුමණින්ම ජනාධිපතිවරයා යටතේය. නමුත් පාර්ලිමේන්තුව තමාගේ අභිමතය පරිදි විසුරුවා හැරීමට දැන් ජනපතිවරයාට නොහැකිය. එමෙන් ම 19වන සංශෝධනයට අනුව නීතිපතිවරයා වග උත්තරකරු කරමින්, මූලික අයිතිවාසිකම් නඩු ජනපතිවරයාට එරෙහිව පැවරීමට අවස්ථාව උදා වී තිබේ. එමෙන් ම ඉහත සඳහන්කළ පත්කිරීම්වල දී ජනපතිවරයාට තිබුණු තනි බලතල කිසියම් ලෙසකින් අඩු කිරීමක් ද මෙම සංශෝධනයෙන් සිදු විය.

ජනපතිවරයා සතු බලතල දෙස විමසුම් ව බලන්නේ නම් එහි ඇති ඒකාධිකාරී ස්වරූපය අවබෝධ කරගත හැකිය. නමුත් එසේ බලතල නොමැති ජනාධිපතිවරයෙක් යටතේ රටක් දේශපාලනික වශයෙන් අස්ථාවර වීමට ඇති හැකියාව පිළිබඳ අමුතුවෙන් කිව යුතු ද නොවේ. විධායක ජනපතිවරයෙක් බලයේ සිටිය දී පවා ඔහු බලය භාවිත කරන ආකාරය අනුව ඔහුට ද යම් යම් සීමාවන් මතු වේ. ගැටලු පැන නඟී. ඒ පිළිබඳ නිදසුනක් ලෙස 2001-2004 වකවානුවේ දී විධායක ජනපතිවරිය ලෙස සිටි චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට විධායක බලය තිබිය දී වුව ද සිතැඟි ඉටු කරගන්නට නොහැකි විය. පාර්ලිමේන්තුවේ බලය එක්සත් ජාතික පක්ෂය සතුව පැවතිණි. එමෙන්ම 2015 සිට 2019 දක්වා කාලය තුළ මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිවරයා විධායක ජනපතිවරයාව සිටිය දී අග්‍රාමාත්‍යවරයාව සිටි රනිල් වික්‍රමසිංහ මහතා රට පාලනය කළ අයුරු ද දුටුවෙමු. ජනාධිපතිවරයාට විධායක බලතල භාවිත කරන්නට අවැසි ඉඩ කඩ මෙන් ම ජාතික අවශ්‍යතාවන්හි දී තීන්දු තීරණ ගැනීමට පවා නොහැකි ව අසරණ වුණු අයුරු ද අපි දුටුවෙමු. එපමණක් ද නොව ඉතිහාසයේ පළමු වතාවට ජනාධිපතිවරයෙකුගේ තීන්දුවක් ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් නිෂ්ප්‍රභා විය. විධායක ජනාධිපතිවරයෙක් ලැබූ ඉතිහාසයේ දැවැන්තම පරාජයක් ලෙස කෙනෙක් මෙය හඳුන්වන අතර සංවරණ හා තුළන මූලධර්ම අනුව ද එය විග්‍රහ කරනු පෙනේ.

වත්මන් ජනාධිපතිවරයාට තිබෙන බලතල 78 ජනපති බලතලවලට වඩා සීමා සහිත වුව ද ඊට ද එක්කොට තිබෙන බලතල සුලු පටු නොවන බැව් අපට ඉහතින් කියවා ගත හැකිය. විශේෂයෙන්ම ආණ්ඩු බලය මෙන් ම ස්වකීය තනතුරේ බලය ද එක් වූ කල ජනපතිවරයාට අසීමිත බලයක් තිබෙන බැව් පෙනෙන්නට තිබේ.ඔහු පත්වන්නේ සෘජුවම මහජන ඡන්දයෙනි. ජනතා පරමාධිපත්‍ය බලයෙන් ඔහු පත්වීම ද ජනපතිවරයකුගේ චිත්ත ශක්තිය වර්ධනය අනියම් ආකාරයෙන් ද හේතු සාධකයක් වේ.

විධායක ජනපති ක්‍රමය නිසා සෘජු රාජ්‍ය පාලන බලයක් ඔහුට හිමිවේ. කෙලින් ම රාජ්‍ය පාලන වරම ලැබීම නිසා ජනතාවගේ ද ආණ්ඩුවේ ද නායකයා ද ව්‍යවස්ථාදායක නියෝජිතයන් ද කැමැත්ත අනුව තෝරා ගැනීමේ ඉඩකඩ ඔහුට ලැබේ. එසේ ම විධායකයට වගවීමේ යාන්ත්‍රණයක් ද එයින් ඇතිවේ. එමෙන්ම පාර්ලිමේන්තු ක්‍රමයට වඩා ජනපති ක්‍රමය මඟින් ප්‍රතිපත්ති හැදීමේ ක්‍රියාවලියේ ස්ථාවරභාවයක් ඇත. ඉදිරියේ සිදුවන දේ දැකිය හැකි ය.

නමුත් 'ජයග්‍රාහකයා සියල්ල අත්පත් කර ගනී' යන කියමන අනුව සුළු ඡන්දයකින් ජයග්‍රහණය කළ ද ඔහු ජාතියේ ම නායකයා බවට පත් වේ. සියලු දේශපාලන බලතල සහිත පාලනය ඔහු සතු වේ. ඔහු විපක්ෂය සමඟ විරසකයකින් පසුවන්නේ නම් බලය අයුතු ලෙස යෙදවීමට ද පසුබට නොවේ. නැවත ඡන්දය දිනා ගැනීමට ත් බලය රැක ගැනීමට ත් උත්සාහ ගනු ඇත. ඇතැම්විට ව්‍යවස්ථාදායකය විසින් ජනපතිගේ අණ පණත් සම්මත නොකළ හොත් අස්ථාවරත්වයක් ඇති වන්නට පිළිවන. චන්ද්‍රිකා මැතිනියගේ සමයේ මෙන්ම මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාගේ කාලයේ ද එම තත්ත්වය දැක ගන්නට හැකි විය.

කෙසේ වෙතත් රටේ ප්‍රධාන මාතෘකාව විධායක ජනාධිපතික්‍රමය නොවන බව නම් අවසන් වශයෙන් සඳහන් කිරීම වටී.

ගයාන් පීරිස්

සියවස්තාව තරඟය කළ කාන්තා මන්ත්‍රීවරු

කාන්තා දේශපාලනය හතලිහ දශකයේ සිට මෙරට මුල් බැස තිබුණද වයඹ පළාතෙන් පළමුවරට පාර්ලිමේන්තුවට පිවිසි කාන්තාව අමරා පියසීලි රත්නායක මහත්මියයි. ඇය 1977 වර්ෂයේ ජූලි මස 11 වෙනි දින පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයේ දී කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොළ මැතිවරණ කොට්ඨාසයට එක්සත් ජාතික පක්ෂයෙන් තරග කර ජය ලැබුවාය. එදා සිට 2010 දක්වා අඛණ්ඩව වසර 33ක් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට ඇය සමත් වූවාය..

වාරියපොළ එක්සත් ජාතික පක්ෂ ප්‍රධාන සංවිධායකව සිටි විමලරත්න බණ්ඩාර මහතා විරුද්ධවාදීන් විසින් 1975 වර්ෂයේදී සාහසික ලෙස එල්ල කළ වෙඩි පහරින් ජීවිතක්ෂයට පත්විය. එම වෙඩි පහරින් තුවාල ලබා අමරා පියසීලි රත්නායක මහත්මියට ද රෝහල්ගත කෙරුණි.

එවකට එක්සත් ජාතික පක්ෂ නායක ජේ. ආර්. ජයවර්ධන මහතාගේ සහ වාරියපොළ ජනතාවගේ ඉල්ලීම මත 1977 පාර්ලිමේන්තු මහ මැතිවරණයට තරග කළාය. එම මැතිවරණයේ දී ප්‍රතිවාදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂ අපේක්ෂක පියදාස විජේසිංහ මහතාට වඩා වැඩි ඡන්ද හාරදහසක් ලබා ගැනීමට ඇය සමත් වූවාය. 1977 සිට පැවැත් වූ සෑම පාර්ලිමේන්තු මහ මැතිවරණයකදීම ජය ලබා ගැනීමට අමරා පියසීලි රත්නායක මහත්මියට හැකිවූවාය.

1988 වර්ෂයේ ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍ය පදවියෙන්ද 1989 ස්වදේශ කටයුතු රාජ්‍ය ඇමැති පදවියෙන්ද 1990 රාජ්‍ය සේවා ඇමැති පදවියෙන්ද පිදුම් ලැබීය. 2001 – 2004 වනිතා කටයුතු කැබිනට් අමාත්‍ය ලෙස කටයුතු කළාය.

2010 වර්ෂයේදී පාර්ලිමේන්තු මහ මැතිවරණයට ඉදිරිපත් නොවී සිටීමට සිය කැමැත්තෙන්ම තීරණය කළාය. පසුව 2015 වර්ෂයේදී වයඹ ආණ්ඩුකාර ධුරයට පත්වූවාය.

වාරියපොළ නගර මධ්‍යයේ පිහිටි දැවැන්ත කළුගල ඉවත් කර පොදු බස් නැවතුම්පල ඉදිකිරීම, පොදු වෙළෙඳපොළ ඉදිකිරීම, නගර ශාලාව, තැපැල් කාර්යාලය, ලංගම ඩිපෝව, කාර්මික විද්‍යාලය, ආයුර්වේද රෝහල ඉදිකිරීම, යොවුන් සේනාංක මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම ඇයගේ පාලන සමයේ සිදු කර ඇත. අලුතින් කටුපොත ප්‍රාදේශීය කාර්යාලය සහ පොලිසිය ආරම්භ කර ඇත.

අමරා පියසීලි

මේරි ලැරින්

මන්ජුලා දිසානායක

සෝමා කුමාරි

ශ්‍රියානි ප්‍රනාන්දු

සුජාතා ධර්මවර්ධන

දහස් ගණනකට රජයේ රැකියා ලබාදී ඇත. ප්‍රදේශයේ මාර්ග පහසුකම් දියුණු කිරීම, විදුලිය, පානීය ජල පහසුකම් ලබාදීම, ඇඟලුම් කර්මාන්ත ශාලා හතරක් වාරියපොළ, අවුලේගම, කටුපොත ස්ථාපිත කර ප්‍රදේශයේ තරුණ තරුණියන්ට රැකියා ලබාදීම.

කුරණවගම, වැදඩගම, මඟුලාගම, විමලගම, අමරුදාගම, සුරගම, ශක්තිගම, හල්මිල්ලෑවගම ඇතුළු ගම්මාන 18ක් ඉදිකර, ජනතාවගේ නිවාස ප්‍රශ්නයට විසඳුම් ලබා දුන්නාය.

අඛණ්ඩව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වසර 33ක් නියෝජනය කළ කාන්තාවක් පාර්ලිමේන්තු ඉතිහාසයේ නැත.

2000 වර්ෂයේදී පොදු ජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක ලෙස ජයග්‍රහණය කිරීමට සෝමා කුමාරි තෙන්නකෝන් මහත්මිය සමත් වූවාය. 2001 වර්ෂයේ පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී ජය ලැබීමට ඇය සමත් වූවාය. 2004 පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී පරාජයට පත්විය. 2009 වර්ෂයේදී ඇය අභාවප්‍රාප්ත වූවාය.

වන්නියේ පොඩි පුතා නමින් විරුදාවලිය ලත් මුදියන්සේ තෙන්නකෝන් මහතා සෝමා කුමාරි තෙන්නකෝන් මහත්මියගේ පියාය. ඔහු 1956 නිකවැරටියෙන් පාර්ලිමේන්තුවට පිවිස නියෝජ්‍ය මුදල් ඇමැති ලෙසද කටයුතු කර ඇත.

දැනට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරන වයඹ පළාතේ සිටින එකම කාන්තා මන්ත්‍රීවරිය මංජුලා දිසානායක මහත්මියයි. 2020 පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරියක ලෙස පත් කර ඇත. ඇය හිටපු නියෝජ්‍ය ඇමතිවරයකු වන අභාවප්‍රාප්ත සාලින්ද දිසානායක මහතාගේ බිරිඳ වේ.

පුත්තලම දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත්වූ ප්‍රථම කාන්තාව සුජාතා ධර්මවර්ධන මහත්මියයි. ඇය එක්සත් ජාතික පක්ෂයෙන් තරග කර පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක ලෙස තේරී පත්වූවාය. 1989 සිට 1994 දක්වා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක ලෙස කටයුතු කළාය.

ඉන් අනතුරුව පාර්ලිමේන්තුවට තේරී පත්වූ කාන්තාව වනුයේ මේරි ලැරින් පෙරේරා මහත්මියයි. ඇයද තරග කළේ එක්සත් ජාතික පක්ෂයෙනි. 2021 සිට 2010 දක්වා අඛණ්ඩව පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක ලෙස කටයුතු කළාය.

ඇය පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු මෙන්ම එක්සත් ජාතික පක්ෂ පාලන සමයේ ධීවර, රාජ්‍ය පාරිපාලන පළාත් සභා සහ ස්වදේශ කටයුතු, විදුලිබල සහ බලශක්ති ආදී ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ධුර රැසක් දැරූ අභාවප්‍රාප්ත පෙස්ටක ලෙස තේරී පත්වූවාය. 1989 සිට 1994 දක්වා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක ලෙස කටයුතු කළාය.

ඉන් අනතුරුව පාර්ලිමේන්තුවට තේරී පත්වූ කාන්තාව වනුයේ මේරි ලැරින් පෙරේරා මහත්මියයි. ඇයද තරග කළේ එක්සත් ජාතික පක්ෂයෙනි. 2021 සිට 2010 දක්වා අඛණ්ඩව පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක ලෙස කටයුතු කළාය.

ඇය පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු මෙන්ම එක්සත් ජාතික පක්ෂ පාලන සමයේ ධීවර, රාජ්‍ය පාරිපාලන පළාත් සභා සහ ස්වදේශ කටයුතු, විදුලිබල සහ බලශක්ති ආදී ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ධුර රැසක් දැරූ අභාවප්‍රාප්ත පෙස්ටස් පෙරේරා මහතාගේ බිරිඳ වන්නීය.

වත්මන් පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන නිරෝෂන් පෙරේරා මහතාගේ මවවේ. ලැරින් පෙරේරා මහත්මිය 2020 අගභාගයේදී අභාවප්‍රාප්ත වූවාය.

පොදු ජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් පුත්තලම දිස්ත්‍රික්කයට තේරී පත්වූ කාන්තාව වනුයේ නීතිඥ ශ්‍රියානි ප්‍රනාන්දු මහත්මියයි. ඇය 2000 සිට 2001 දක්වා පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක ලෙස කටයුතු කළාය.

පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කළ අභාවප්‍රාප්ත ගොඩ්ප්‍රි ප්‍රනාන්දු මහතාගේ බිරිඳ වේ.

මාදම්පේ - ඒ. පී. ගුණරත්න

දේශවංශය
සංස්කරණය - උදිත ගුණවර්ධන
මෙම සියලු ලිපි සංවාදයට විවෘත බව සලකන්න.
දේශපාලනය හා සම්බන්ධ ඔබේ ලිපි අපට එවන්න.
'දේශවංශය', දිනමිණ, අංක 35, ලේක්හවුස්, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
deshawanshaya@lakehouse.lk
2021 මාර්තු 05 සිකුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

රන් භාණ්ඩ වෙන්දේසියක්

මහජන බැංකුවේ නියෝජිතයන් වන සී/ස කුණ්ඩසාලේ විවිධ සේවා සමුපකාර සමිතියේ පහත සඳහන් ශාඛාව වන

දිගන	නා/අමුණුගම
සිරිමල්වත්ත	බලගොල්ල
හුරි / මධ්‍යම	නාරම්පනාව
නත්තරම්පොත	ගල්පිහිල්ල
වාවින්න	පොල්ගොල්ලවත්ත
අඹකොටේ	මහවත්ත

යන ග්‍රාමීය බැංකු ශාඛාවල 2019.07.01 සිට 2019.12.31 දින දක්වා උකස් කරන ලද 2021.03.12 දක්වා බේරා නොගත් රන් භාණ්ඩ වෙන්දේසිය.

2021. මාර්තු 13 හා 14 යන දිනවල පෙ.ව. 9.30 සිට පස්වරු 4.30 දක්වා

සී/ස කුණ්ඩසාලේ විවිධ සේවා සමුපකාර සමිතියේ සංස්කෘතික ශාලාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

සාමාන්‍යාධිකාරී,
සී/ස කුණ්ඩසාලේ විවිධ සේවා සමුපකාර සමිතිය,
මැණික්හින්න.
දුරකථන අංකය - 0812374224

සත මෙත සිරිසෙත සලසන සතිපත

දෝ සතර වෙද සතර දත් නොදත් කාටත් මහඟු මිණකි

සුබසෙත
සත මෙත සිරිසෙත සලසන සතිපත

ඇබෑර්තු

කාර්මික තාක්ෂණ ආයතනය

තාක්ෂණ අමාත්‍යාංශය

අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල් - පරිපාලන හා මෙහෙයුම්
ප්‍රධාන පර්යේෂණ විද්‍යඥ
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යඥ
පර්යේෂණ විද්‍යඥ
පර්යේෂණ ඉංජිනේරු
ප්‍රධාන ගබඩා නිලධාරී,
පරිගණක පද්ධති සහකාර

තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය - 2021-03-19
වැඩි විස්තර සඳහා 2021-03-05
Daily News පුවත්පත බලන්න.

අධ්‍යක්ෂ ජනරාල් / ප්‍ර.වි.නි.
කාර්මික තාක්ෂණ ආයතනය

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දකුණු පළාත් රාජ්‍ය සේවයේ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ පේෂ/ මැටි/ ලෝහ කර්මාන්ත උපදේශක III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත හා සීමිත තරග විභාගය - 2020 (2021)

දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩුව පවතින පේෂ/ මැටි/ ලෝහ කර්මාන්ත උපදේශක තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

(දකුණු පළාත් රාජ්‍ය සේවයේ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ පේෂ/ මැටි/ ලෝහ කර්මාන්ත උපදේශක III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත හා සීමිත තරග විභාගය - 2020 සඳහා දැනටමත් අයදුම්කර ඇති අයදුම්කරුවන් නැවත මේ සඳහා අයදුම් කිරීම අවශ්‍ය නොවේ.)

ඉල්ලුම් කිරීමේ ක්‍රමය

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ (www.psc.sp.gov.lk) පළකර ඇති දකුණු පළාත් රාජ්‍ය සේවයේ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ පේෂ/ මැටි/ ලෝහ කර්මාන්ත උපදේශක III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත හා සීමිත තරග විභාගය - 2020 (2021) විභාග නිවේදනය ප්‍රකාරව ඔබේ අයදුම්පත 2021-03-22 දිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමු කරන්න.

ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
6 වන මහල,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය, ගාල්ල.

ගාමිණී වීරවික්‍රම,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
දකුණු පළාත.
2021-03-03

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංසු දැන්වීමයි

BID FOR THE TRANSPORTATION OF BITUMEN/LUBRICANT DRUMS AND PALLETIZED LUBRICANT CANS AND OTHER FCL CONTAINERS OF CPC FOR THE YEAR 2021/2022

B/23/2021

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ඉහත සඳහන් කාර්ය සඳහා පහත දැක්වෙන අවශ්‍යතාවයන් සපුරාලන පිළිගත් ප්‍රවාහන කොන්ත්‍රාත්කරුවන් වෙතින් මිල ගණන් කැඳවනු ලැබේ.

අ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මගින් ඇණවුම් කරන බිටුමෙන්/ ලුබ්රිකන්ට්/ බැරල් සහ පැලටයිස්ඩ් ලුබ්රිකන්ට් කෑන් හා වෙනත් අයිතම වලින් සමන්විත බර මෙ. ටොන් 24 නොඉක්මවන අඩි 20 බහාලුම් ප්‍රවාහනය සඳහා එක් වරකට බහාලුම් ලොරි 50 ක් හෝ වැඩි ප්‍රමාණයක් සැපයීමට හැකියාව ඇති අවම වශයෙන් අඩි 20 FCL බහාලුම් ලොරි 15 ක වාහන පද්ධතියක් තමන් සතු වීම.

ආ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මගින් ඇණවුම් කරන බිටුමෙන්/ ලුබ්රිකන්ට් බැරල් හා පැලටයිස්ඩ් ලුබ්රිකන්ට් කෑන් හා වෙනත් අයිතම වලින් සමන්විත බර මෙ.ටොන් 35 නොඉක්මවන අඩි 40 බහාලුම් ප්‍රවාහනය සඳහා එක්වරකට බහාලුම් ලොරි 05 ක් හෝ වැඩි ප්‍රමාණයක් සැපයීමට හැකියාව ඇති අවම වශයෙන් අඩි 40 FCL බහාලුම් ලොරි 02 ක වාහන පද්ධතියක් තමන් සතු වීම.

ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රු. 2,000.00 ක (එනම් රු. 1,851.85+8%VAT) බැගින් ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2021-03-24 දින තෙක් 0900 පැය සිට 1500 පැය දක්වා, කොළඹ 09, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, නො.609, පළමු මහල, ප්‍රසම්පාදන හා ගබඩා අංශයේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ, කළමනාකරු (ප්‍රසම්පාදන හා ගබඩා) වෙතින් ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කොට බලා ලබාගත හැකිය.

2021-03-24 දින 1400 පැයට ලංසු භාර ගැනීම අවසන් කෙරෙන අතර, ඒ වහාම ඉහත ලිපිනයේ කළමනාකරු (ප්‍රසම්පාදන හා ගබඩා) කාර්යාලයේදී ලංසු විවෘත කෙරේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගිවීමට අවසරය ඇත.

ලංසු ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ඉහත ලිපිනයේ කළමනාකරු (ප්‍රසම්පාදන හා ගබඩා) කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ කළ හැකිය.

යම් පැහැදිලි කිරීම් (වෙතොත්) පහත සඳහන් දුරකථන හා ෆැක්ස් අංක මගින් කළමණාකරු (ප්‍රසම්පාදන හා ගබඩා) වෙතින් ලබාගත හැකිය.

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ලංසුකරුවන්ට ලංසුකරණ ලිපිලේඛන ලං.ඛ.නි. සංස්ථාවේ වෙබ් අඩවියෙන් www.ceypetco.gov.lk බාගත කර ගත හැකි අතර, සියලුම ගෙවීම්, මහජන බැංකුවේ (ප්‍රධාන කාර්යාලයේ) ගිණුම් අංක 004100110208633 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගිණුමට ගෙවිය හැකිය. කරුණාකර බැංකු ලදුපතේ මුල් පිටපත ලංසු සමග ඉදිරිපත් කරන්න.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
කළමනාකරු (ප්‍රසම්පාදන හා ගබඩා) භාරේ,
ප්‍රසම්පාදන හා ගබඩා අංශය,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
නො.609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 09.

දුරකථනය : 011-5455331, ෆැක්ස් : 011-5455424

කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
පුරප්පාඩු

පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් 2021.03.22 වෙනි දින දක්වා මා විසින් භාරගනු ලැබේ.

- ❖ **ශාරීරික අධ්‍යාපන අංශය**
  - ■ ***ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ***
- ❖ **ලේඛකාධිකාරී කාර්යාලය**
  - ■ ***පද්ධති විශ්ලේෂක ප්‍රකමණකරු II ශ්‍රේණිය***

අයදුම් කරන පිළියෙල

මෙම තනතුරු සඳහා අදාළ අයදුම්පත් හා විස්තර කාර්යාල වේලාවන් තුළදී නියෝජ්‍ය ලේඛකාධිකාරී / ආයතන අධ්‍යක්ෂ වෙතින් ලබාගත හැක. එසේම අන්තර්ජාලයේ www.news.kln.ac.lk විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිස අදාළ අයදුම්පත සහ තොරතුරු ලබාගත හැකිය. අයදුම්පත් හා විස්තර තැපෑලෙන් ලබාගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා ඉල්ලීමක් සහිතව ලිපිනය ලියූ මුද්දර සහිත සෙ. මී. 23X10 ප්‍රමාණයේ කවරයක් එවිය යුතුය. අයදුම්කරුවන් විසින් එක් එක් තනතුරු සඳහා වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතු අතර, අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමග 2021.03.22 දින හෝ ඊට ප්‍රථම **නියෝජ්‍ය ලේඛකාධිකාරී/ ආයතන අධ්‍යක්ෂ, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස උඩ කෙළවරෙහි ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ, අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුවේ. අවශ්‍ය නම් යෝග්‍යතාවයට අනුව තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට විශ්වවිද්‍යාලයට කටයුතු කළ හැකිය.

ලේඛකාධිකාරී,
කැලණිය විශ්වවිද්‍යාලය,
කැලණිය.

2021.03.02

මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුරු : **නේවාසික ව්‍යාපාර කළමනාකාර**
සේවා ගණය : ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM 1-1 සේවා ගණය)
වැටුප් පරිමාණය : රු. 81,670-15x2,270 = 115,720/-

සුදුසුකම් (පහත 1 හෝ 2)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම

සමග

කළමනාකරණ / කෘෂිකර්ම / සැලසුම් / සංවර්ධන / සමාජීය විද්‍යා / තාක්ෂණ / ජල කළමනාකරණ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම / තනතුරුට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර" මට්ටමේ තනතුරක අවම වශයෙන් පරිපාලන / වාරිමාර්ග / ජල කළමනාකරණ / කෘෂිකර්ම / ඉඩම් / සංවර්ධන හා ආයතන සංවර්ධන ක්ෂේත්‍රයේ වසර පහළොව (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර" මට්ටමේ තනතුරක අවම වශයෙන් පරිපාලන / වාරිමාර්ග / ජල කළමනාකරණ / කෘෂිකර්ම / ඉඩම් / සංවර්ධන හා ආයතන සංවර්ධන ක්ෂේත්‍රයේ වසර පහළොව (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

වයස : අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුය.
බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

තනතුර : **භෞතික සැලසුම්කරු (II වන ශ්‍රේණිය)**
සේවා ගණය : කනිෂ්ඨ කළමනාකාර (JM 1-1 සේවා ගණය)
වැටුප් පරිමාණය : රු. 42,600-10x755-18x1,135 = 70,580/-

සුදුසුකම් (පහත 1 හෝ 2)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නගර හා ග්‍රාම නිර්මාණය / දේපළ කළමනාකරණය විෂය ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම.
02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම.

වයස : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය.
බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරග විභාගයක් හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

තමා විසින් සකස් කර ගත් ජීවදත්ත පත්‍රිකාවක් 2021.03.19 වන දිනට හෝ එදිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුව ඇත.

අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු අතර, නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බවද දන්වමි. අයදුම්පත සමග අධ්‍යාපන / වෘත්තීය සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, එම සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම කටයුතු සම්බන්ධව අවසන් තීරණය ගැනීම අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු බවද දන්වමි.

සැ. යු : අයදුම්පත් භාර ගන්නා අවසන් වන දිනය වන විට තනතුරට අදාළ සුදුසුකම් සපුරා තිබිය යුතු බව කාරුණිකව සලකන්න.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

උතුරු පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් රෝහල්වල පවතින වෛද්‍ය නිලධාරීන් සඳහා වූ තනතුරට කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීම - 2021

උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් රෝහල්වල පවතින වෛද්‍ය නිලධාරීන් සඳහා වූ තනතුරු පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ පත් කිරීමට අයදුම්පත්‍ර කැඳවනු ලැබේ. අයදුම්කිරීමට මනාප සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් 25.03.2021 වන දිනට ප්‍රථම **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි.

01. බඳවාගැනීමේ සේවා කොන්දේසි

- ➢ වෛද්‍ය නිලධාරී තනතුරේ සේවය කිරීම සඳහා ශාරීරික හා මානසික යෝග්‍යතාවය පිළිබඳ සහතිකය මගින් සනාථ කළ යුතුයි.
- ➢ අයදුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනට අවුරුදු 65 ක් අතර වයසේ පසුවන අය විය යුතුයි.
- ➢ උතුරු පළාත තුළ පවතින වෛද්‍ය නිලධාරී පුරප්පාඩු වලට යටත්ව ලේකම්, උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යංශය, විසින් නියම කරන ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදනම් විය යුතුයි.
- ➢ රජයේ වෛද්‍ය නිලධාරී සේවයේ නිලධාරියකු ලෙස සේවය කර විධිමත් පරිදි විශ්‍රාම ගැන්වූ නිලධාරියෙකු විය යුතුයි.
- ➢ වෛද්‍ය නිලධාරී සේවයේ සේවය අත්හැර ගියාසේ (VOP) හෝ විනයානුකූල හේතුන් මත විශ්‍රාම ගැන්වූ නිලධාරියෙකු නොවිය යුතුයි.

02. වැටුප්

ක්‍රියාත්මකව පවතින චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව වැටුප් ගෙවනු ලැබේ.

සටහන :

අනුමත සේවක සංඛ්‍යාවත් පිළිබඳ විස්තර හා ආදර්ශ අයදුම්පත්‍රය යනාදී කරුණු www.np.gov.lk → Recruitment and Exam → Advertisement යන උතුරු පළාත් සභාවේ අන්තර්ජාලය මගින් ලබාගත හැකිය.

S. **තිරුවාකරන්**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
05.03.2021

BE BETTER INFORMED!

News you can trust now free on your mobile phone.

Dinamina Daily News Thinakaran

VISIT
apps.lakehouse.lk

DOWNLOAD TODAY!

AVAILABLE AT

LAKE HOUSE

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - උතුරු මැද පළාත

උතුරු මැද පළාත් සභාවේ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ

වඩු කර්මාන්ත හා පේෂ කර්මාන්ත උපදේශක III ශ්‍රේණියට බඳවා ගැනීම (විවෘත) - 2021

උතුරු මැද පළාත් සභාවේ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ වඩු කර්මාන්ත හා පේෂ කර්මාන්ත යන ක්ෂේත්‍රවල උපදේශක III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2021.04.05 දින වේ. මෙම තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2021 මැයි මස අනුරාධපුර නගරයේදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. පුරප්පාඩු ප්‍රමාණය

i. **පේෂ කර්මාන්ත උපදේශක තනතුරු 09**

ii. **වඩු කර්මාන්ත උපදේශක තනතුරු 02**

02. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් වඩු කර්මාන්ත හා පේෂ කර්මාන්ත යන ක්ෂේත්‍රවල උපදේශක III ශ්‍රේණියේ තනතුරු සඳහා තෝරා ගනු ලැබේ.

03. වැටුප් පරිමාණය : -

අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව අදළ මාසික වැටුප් පරිමාණය (MN -1 -2016) රු.27,140 -10 X 300 – 11 X 350 – 10 X 495 – 10 X 660 - 45,540/= වේ. මීට අමතරව අනුමත ජීවන වියදම් දීමනාව රු. 7,800/= හා රජය විසින් අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.

04. සුදුසුකම් :

4.1 අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

අ) දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල / දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළුව සම්මාන තුනක් (03) සහිතව අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයන් 6 කින් සමත්ව තිබීම

හා

පහත සඳහන් පරිදි තනතුර සඳහා අදළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම.

i. **වඩු කර්මාන්ත උපදේශක තනතුර සඳහා**

කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වඩු පුහුණු ආයතනයක එක් අවුරුදු වඩු කර්මාන්ත පුහුණු පාඨමාලාව හදරා සියලුම විෂයයන්ගෙන් සමත් වී අවසාන සහතිකය ලබා තිබීම හා එක් අවුරුදු වඩු කර්මාන්ත උසස් පාඨමාලාව හදරා සියලුම විෂයයන්ගෙන් සමත් වූ බවට සහතිකයක් ලබා තිබීම.

ii. **පේෂ කර්මාන්ත උපදේශක තනතුර සඳහා**

රජයේ ලලිත කලා ආයතනයක උසස් පාඨමාලාව හෝ තුන් අවුරුදු සහතිකය හෝ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන තුන් අවුරුදු සහතිකය හෝ දෑ අවුරුදු සහතිකය හෝ පේෂ කර්මාන්ත අවසාන සහතිකපත්‍ර පාඨමාලා සහතිකය (මාස 13) ලබා තිබීම.

4.2 පොදු සුදුසුකම් :

i. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ii. සෑම අපේක්ෂකයෙකුම උතුරු මැද පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

iii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට (2021.04.05) වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

iv. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් නොලබයි.

v. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

vi. අයදුම්ත් කැඳවන අවසන් දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් උතුරු මැද පළාත් බල ප්‍රදේශය තුළ ස්ථිරව සහ අඛණ්ඩව පදිංචි අයෙකු විය යුතුය. සුදුසුකම් සහිත ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් උතුරු මැද පළාත තුළින් තෝරා ගැනීමට නොහැකි වුවහොත් පමණක්, උතුරු මැද පළාතේ අවම වශයෙන් අවුරුදු 05 ක් සේවය කිරීමට යටත්ව දීප ව්‍යාප්ත මට්ටමින් අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන් සම්බන්ධයෙන් සුදුසුකම් සලකා බලනු ඇත.

සැ.යු. – සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදළ සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දින වනවිට එනම් 2021.04.05 වැනි දින හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් විටින් විට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට පත්වීම්ලාභීන් යටත් විය යුතුය.

ii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට පත්වීමෙන් වසර 03ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

iii. තෝරා ගනු ලබන අයදුම්කරුවන් එම අවස්ථාව වන විට රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කර නොසිටියේ නම් ඔවුන් තුන් අවුරුදු පරිවාස කාලයකින් පසුව නියමිත කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අදළ තනතුරෙහි ස්ථිර කෙරෙනු ඇත.

06. තෝරා ගැනීමේ ක්‍රමය :

මෙම තනතුර සඳහා ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල අනුව සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකින් සුදුසුකම් ලැබීම මත බඳවා ගනු ලැබේ.

07. විභාග ක්‍රමය :

i. ලිඛිත පරීක්ෂණය වෘත්තියට අදළව ගණිතය, යාන්ත්‍රික ජ්‍යාමිතිය, සාමාන්‍ය දැනීම, මෝස්තර නිර්මාණය යන විෂයයන් ආවරණය වන පරිදි සැකසූ ප්‍රශ්න පත්‍රයකි.

ii. ලිඛිත විභාගය සඳහා කාලය පැය 03කි. ලකුණු 100 යි. සමත්වීම සඳහා අවම ලකුණු 40 ක් ලබා ගත යුතුය.

08. අයදුම්පත් යොමු කිරීම:

i. අයදුම්පත්‍රය ඒ 4 (සෙ.මී.21 X 29) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින් අංක 01 සිට 03 ඡේදයන් පළමු පිටුවටද, අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙළ කළ යුතුවේ.

ii. නියමිත ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ඇති, කුවිතාන්සියේ මුල් පිටපත අමුණා නොමැති , නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ අයදුම්පත්‍ර හා සුදුසුකම් ලබා නොමැති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තිසි පරිදි අයදුම්පත්‍රය සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව සඳහා මෙම කොමිෂන් සභාව වගකියනු නොලැබේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

iii. අයදුම්පත්‍රය යොමු කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙනි.

iv. දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුක්ත අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයද සහිතව තම ආයතනය මඟින් යොමු කළ යුතුවේ.

v. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ.

vi. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021.04.05 දිනට පෙර **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය, අනුරාධපුර"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **පේෂ කර්මාන්ත හා වඩු කර්මාන්ත උපදේශක තනතුරු සඳහා බඳවා ගැනීම – 2021** යන්න සඳහන් කරන්න.

vii. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු,සාමදාන විනිශ්චයකාරවරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු,පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

09. විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු.600.00 කි. එම ගාස්තුව උතුරු මැද පළාත් සභාවේ අය ශීර්ෂ අංක 2003.02.13 ගිණුමට බැර වන පරිදි උතුරු මැද පළාත තුළ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලකට 2021.04.05 දිනට පෙර මුදල් ගෙවා ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සියේ මුල් පිටපත (NC 100) අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. ගෙවනු ලබන විභාග ගාස්තුව කවර හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ. පිට පළාත් අයදුම්කරුවන් සඳහා පමණක් ලංකාවේ ඕනෑම ස්ථානයක පිහිටි ලංකා බැංකු ශාඛාවකින් , **ලේකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු මැද පළාත, ගිණුම් අංක 1472199 දරන ගිණුමට අදළ විභාග ගාස්තු මුදලින් බැර කර ලබා ගන්නා ලද තැන්පතු පත අයදුම්පත්‍රයේ අදළ ස්ථානයේ නොගැලවෙනසේ අලවන්න.** මුදල් ගෙවා ලබාගන්නා කුවිතාන්සියේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා අයදුම්කරු විසින් ළඟ තබා ගත යුතුවේ. තැපැල් කාර්යාලයකට , උප තැපැල් කාර්යාලයකට හෝ වෙනත් ආයතනයකට (ලංකා බැංකුව හැර) මුදල් බැර කරනු ලබන කුවිතාන්සි අලවා ඇති ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. සාවද්‍ය තොරතුරු සැපයීම:

අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිළිමත්ව ඉතා නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් තෝරා පත්කර ගැනීමෙන් පසුව සේවයේ යෙදී සිටියදී වුවද ඕනෑම අවස්ථාවක අසත්‍ය බව තහවුරු වුවහොත් හෝ ඔහු/ ඇය සේවයෙන් පහකිරීමට යටත්වනු ඇත.

11. විභාගයට පෙනී සිටීම:

අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දන්වා සිටිය යුතුය. එහිදී අයදුම්කරු වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා අයදුම්පත්‍රය තැපෑලෙන් යොමු කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සමඟින් **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව** වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන සෑම අයදුම්කරුවෙකුටම විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

12. **මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට ද බැඳී සිටිනු ඇත.**

13. **මෙහි සිංහල හා දෙමළ මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් , සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.**

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.
2021.03.05 දින
වෙබ් අඩවිය : www.psc.nc.gov.lk

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ආදර්ශ අයදුම්පත්‍රය

උතුරු මැද පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ වඩු කර්මාන්ත හා පේෂ කර්මාන්ත යන ක්ෂේත්‍රවල උපදේශක 111 ශ්‍රේණියට බඳවා ගැනීම (විවෘත) - 2021

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය

සිංහල - 2

දෙමළ - 3

(අදළ අංකය කොටුව තුළ පැහැදිලිව සඳහන් කරන්න. භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

1. 1-1 මූලකුරු අගට යොදා මූලකුරු සමඟ නම .....

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: PERERA, A.B.

1-2 සම්පූර්ණ නම .....

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1-3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) .....

1-4 ජාතික හැඳුනුම්පත් අංකය:

2. 2-1 ස්ථිර ලිපිනය .....

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2-2 ස්ථිර ලිපිනය .....

(සිංහලෙන්/දෙමළෙන්)

2-3 ප්‍රවේශපත්‍රය එවිය යුතු ලිපිනය .....

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3. 3-1 ස්ත්‍රී/පුරුෂ භාවය - ස්ත්‍රී - 1, පුරුෂ - 0

(අදළ අංකය කොටුව තුළ ලියන්න)

3-2 උපත් දිනය: වර්ෂය මාසය දිනය

3-3 අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස (2021.04.05):

අවුරුදු: මාස දින

3-4 දුරකථන අංකය:

3-5 අයදුම්කරු පදිංචි දිස්ත්‍රික්කය .....

4. අධ්‍යාපන සුදුසුකම්:

4-1 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය පිළිබඳ විස්තර: (සහතිකවල ඡායා පිටපත් ඇමිණිය යුතුය)

(i) විභාගයේ වර්ෂය හා මාසය .....

(ii) විභාග අංකය : .....

(i) විභාගයේ වර්ෂය හා මාසය .....

(ii) විභාග අංකය : .....

පළමුවර

විෂය	සාමාර්ථය
1	
2	
3	
4	
5	
6	
7	
8	
9	
10	

දෙවනවර

විෂය	සාමාර්ථය
1	
2	
3	
4	
5	
6	
7	
8	
9	
10	

5. අදළ වෘත්තීය සුදුසුකම් : (සහතිකවල ඡායා පිටපත් ඇමිණිය යුතුය)

i. පාඨමාලාවේ නම : .....

: .....

ii. ආයතනය : .....

iii. කාල සීමාව : .....

iv. ප්‍රතිඵල වලංගු දිනය : .....

6. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් මත උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? අදළ කොටුවේ (V) ලකුණ යොදන්න.පිළිතුරු ඔව් නම් විස්තර සඳහන් කරන්න.

ඔව් නැත

.....

7. විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සිය පිළිබඳ විස්තර:

i. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය : .....

ii. කුවිතාන්සියේ අංකය හා දිනය : .....

iii. ගෙවූ මුදල : .....

කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න
(කුවිතාන්සියේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)

8. **අයදුම්කරුගේ සහතිකය:**

මෙම අයදුම්පතේ මවිසින් සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. තවද මෙම විභාගයේ නීතිරීති වලට අනුකූලව ක්‍රියා කිරීමටත් මෙම විභාග කොන්දේසි අනුව මා මෙම තනතුරට නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයන් පිළිගැනීමට මා එකඟ වෙමි.

දිනය ....

අයදුම්කරුගේ අත්සන

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:-

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය..... වන දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

දිනය:..... .....

සහතික කරන්නාගේ අත්සන

සහතික කරන අයගේ නම : .....

තනතුර : .....

ලිපිනය : .....

(නිල මුද්‍රාව තබන්න)

10. ආයතන ප්‍රධානියාගේ /දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (දැනට රාජ්‍ය සේවයේ නියුක්ත අය සඳහා පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..... මයා / මිය / මෙනවිය ..... කාර්යාලයේ /ආයතනයේ ..... දින සිට ..... තනතුරක සේවය කරන බවද, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක වන බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවද, ඇය/ඔහු මෙතෙක් මොනයම් ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බවද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

දිනය: ....

ආයතන ප්‍රධානියා/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

ආයතන ප්‍රධානියා/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම : .....

තනතුර : .....

ලිපිනය: (නිල මුද්‍රාව තබන්න) : .....

1950 සිට
දිනපතා සහ සතිපතා පත්‍රවල
පළවූ හා පළනොව ඡායාරූපවල දළ
සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත.
ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය
නම් පුවත්පතේ නම, දිනය සහ
ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා
හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011)2 242 9491

LAKE HOUSE

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
21, මීරානියා පාර, කොළඹ 12.

හඳුත්කුරු නිෂ්පාදනය සඳහා යොදාගතහැකි සුවඳ නොගල්වන ලද කුරු 969,090 ක තොගයක් සහ එම නිෂ්පාදනයට අදාළ වෙනත් අමුද්‍රව්‍ය තොගයක් විකිණීම සඳහා 2021.03.18 දිනට පෙර මුදු තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

වැඩි විස්තර සහ නියැදි පරීක්ෂාව සඳහා සහකාර කළමනාකරු - (අලෙවි)
0115921464 / 0115882494

සභාපති,
ප්‍රසම්පාදන මණ්ඩලය,
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,
21, මීරානියා පාර, කොළඹ 12.

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව
ප්‍රසම්පාදන දැන්වීම දින දීර්ඝ කිරීම

2021/02/12 දින
DNCWS/PRO/2021/ Nano Filter/01
පළකරනු ලැබූ ප්‍රසම්පාදන දැන්වීමෙහි
ලංසු භාර ගැනීමේ දිනය
2021/03/10 දක්වා දීර්ඝ කරන ලදී.
අනෙකුත් කොන්දේසි හා නියමයන් නොවෙනස්ව පවතී.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව,
නො. 1114, පන්නිපිටිය පාර, තලවතුගොඩ,
03/03/2021

බලපිටිය ප්‍රාදේශීය සභාව
ලංසු කැඳවීම

බලපිටිය සතිපොළ භූමියේ ස්ථාපිත මාළු කඩකාමර අංක05, 06 සහ 07 බදු දීම සඳහා 2021.03.05 දින සිට 2021.03.26 දින දක්වා ලංසු කැඳවනු ලැබේ.

- ප්‍රසම්පාදන ලියවිලි ගාස්තු - රු. 1,000/-
- ලංසු ඇප (ආපසු ගෙවන) - රු. 3,000/-

ලංසු ලියවිලි හා කඩ කාමර පරීක්ෂාව රාජකාරී දිනවල 0912258738 දුරකථන අංකය ඇමතීමෙන් ලබාගත හැක.

එන්. සමන් ද සිල්වා
සභාපති,
බලපිටිය ප්‍රාදේශීය සභාව.

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

විදුලි පාරිභෝගිකයින්ට අනර්ඝ සැපයුමක් හා සේවාවක් ලබාදීමේ අරමුණ සපුරා ගනු වස්, ලංකා විදුලිබල මණ්ඩලය පහත සඳහන් ප්‍රදේශවල විදුලි පද්ධතියේ නඩත්තු, පුනරුත්ථාපන හෝ තැනීම් කටයුතු කිරීමට අදහස් කරයි. මේ නිසාවෙන්, එම ප්‍රදේශවල විදුලිබල සැපයුම, පහත ඇති දිනයන් හි / වේලාවන් හිදී තාවකාලිකව අත්හිටුවීමට සිදුවේ. මේ නිසා විදුලි පාරිභෝගිකයින්ට සිදුවන අපහසුතාවයට අපගේ කණගාටුව ප්‍රකාශ කරන අතරම, සැලසුම් කරන ලද වැඩ අවසන් වූ වහාම නැවත විදුලි සැපයුම යථා තත්ත්වයට පත් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් පියවර ගනු ලැබේ.

මධ්‍යම පළාත - 01 - 2021 මාර්තු මාසය

කුණ්ඩසාලේ විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

දුම්බර පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021.03.14 පෙ.ව. 08.00 සිට ප.ව. 17:00 දක්වා

ආයෝජන ප්‍රවර්ධන කලාපය - ඉන්ඩෝ සේමි කර්මාන්ත (පුද්.) සමාගම, කා.ස.ම කැන්ඩි ප්ලාස්ටික්, ආ.ප්‍ර.ම (ප්ලාස්ටිසෙල්), කා.ස.ම (ජල පිරිපහදු කිරීම බලගොල්ල), කා.ස.ම ඩයිනමික් , ආ.ප්‍ර.ම (BOI i), , නන්සේන මහතා, ආ.ප්‍ර.ම (ප්ලාස්ටිසෙල්), ආ.ප්‍ර.ම (සැඩෝලයින්), කා.ස.ම -ජල පොම්පය (කෝල්ඩ්) IDB, ආ.ප්‍ර.ම. - වර්ල්ඩ් වයිඩ් එන්ටර්ප්‍රයිසස්, කැන්ඩියන් මැච් (පුද්.) සමාගම, කා.ස.ම. (ලංකා ෆුඩ් පැකින්), කා.ස.ම පොලිෆිල්මිස් IDB- ii, රිවඩ් පීරිස්, ආ.ප්‍ර.ම. - (BOI ii), ආ.ප්‍ර.ම. (සෙන්ට්‍රල් ප්ලෙක්සි පැක්) , කා.ස.ම (කුවුත් මෙටල් කර්මාන්තය), රෝයල් පැක් ඉන්ඩස්ට්‍රිස් පැස්ටේට්, ආ.ප්‍ර.ම (ජේ.සී.), කා.ස.ම. (ට්‍රිනිටි ගොවිපල), කා.ස.ම (AMW කර්මාන්ත ශාලාව), ආ.ප්‍ර.ම (එස්කිමෝ), ආ.ප්‍ර.ම (ටැන්ඩන් -i), ආ.ප්‍ර.ම (පොලිසැක්), ක්‍රිකට් ක්‍රීඩාංගනය (බිම් මහල), ආ.ප්‍ර.ම (තොබල්ස් වෙයාර්), ජා.ජ.ස. හා ජ.ප. ම. පොම්පාගාරය, ආ.ප්‍ර.ම (ලීතියා ක්ලෝතින්), කා.ස.ම (IDB - iii), ආ.ප්‍ර.ම (ඉසබෙලා), ඔටෝ සර්විස් කුණ්ඩසාලේ BOI, ක්‍රිකට් ක්‍රීඩාංගනය (මාධ්‍ය අංශය), ආ.ප්‍ර.ම (මැග් ඔටෝ)

හසලක පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021.03.13 පෙ.ව.10.00 සිට ප.ව. 16:00 දක්වා

දමිත් ගල්මෝල - ගුරුවෙල යාය, අබේනායක ගල් මෝල, මල්ගම්මන, දේවගිරිය එගොඩගම, දුනුවලපිටිය ගඟේයාය, මාරක, දේවගිරිය, කුඹුකන්දන, රදුන්නේවැව යෝජනා ක්‍රමය, ජල පිව්සුම - දුණුවලපිටිය, බෝගස්වැව අංක 02 යෝජනා ක්‍රමය, ගුරුවෙලයාය යෝජනා ක්‍රමය, මාරක, ගඟේයාය, මැදකන්ද

උඩුදුම්බර පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021.03.12 පෙ.ව.08.30 සිට ප.ව. 17:00 දක්වා

මහවෙල, මැදිවක ගංගොඩ, ගලපිටගම මීනුවන්ගමුව, පල්ලෙ පිටවල, කලල්ගමුව, කළුන්තැන්න, දේවහන්දිය, හපුකන්ද, උඩපිටවල, කලවල, උඩදුම්බර - කලවැල්ල, එයාර් ටෙල් කුලුන ගලපිටමඩ - මඩුගල්ල, මඩුගල්ල, නව මඩුගල්ල, මැටිවලතැන්න

කරලියද්ද පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021.03.15 පෙ.ව.08.00 සිට ප.ව. 17:00 දක්වා

මකුල්දෙනිය, මකුල්දෙනිය බෝබැබිල

දඹුල්ල විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

දඹුල්ල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021.03.12 පෙ.ව.08.00 සිට ප.ව. 17:00 දක්වා

ගුවන් හමුදු කඳවුර, අප්සරා හෝටලය, ඇහැලගල ලේක් රිසෝට්, එලිෆන්ට් කොරිඩො හෝටලය, ෆලවර් ගාර්ඩන්, ෆොන්ටයින් බ්ලු සීගිරිය (පුද්) සමාගම, ප්‍රේස්කෝ වෝටර් විලා, හොටෙල් ව්‍යාපෘතිය - නව (කාශ්‍යපගම), සීගිරිය ඩයලොග් කුලුන - කායංවල, සීගිරිය තානායම, සීගිරිය තානායම - නව, සීගිරිය විලේජ් හෝටලය, ටෙලිකොම් සීගිරිය, විල්උයන (රෝයල් හෙරිටේජ්), දියකැපිල්ල, එගොඩවැව දඹුල්ල, ගල්කොටුව, ගොවි ගම්මානය, සීගිරිය හෝටලය, කාශ්‍යපගම , කායම්වල දුවන්ගල, කැගල්ලයාය -2 මයිලත්තාව, කිඹිස්ස 2, කිඹිස්ස, ලේනව නිකවටවත්ත, මහසෙන්ගම, මයිලත්තාව/ කලාපුරයාය සීගිරිය, මයිලත්තව අලුත්යාය, නිකව තවාන, පලුටාව, රන්ගිරිගම, සීගිරිමුල්ල, සීගිරිය (නව නගරය), සීගිරිය නව කෞතුකාගාර යෝජනා ක්‍රමය, සීගිරිය තෙන්නකෝන් මාවත එලගල පාර, තල්කොටේ යෝජනා ක්‍රමය, වැව අද්දර - කායන්වල

2021.03.12 පෙ.ව.10.00 සිට ප.ව. 16:00 දක්වා

අප්සරා හෝටලය, හොටෙල් ව්‍යාපෘතිය - නව (කාශ්‍යපගම), දියකැපිල්ල, සීගිරිය හෝටලය, කාශ්‍යපගම, මහසෙන්ගම, තල්කොටේ යෝජනා ක්‍රමය

කටුගස්තොට විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

මඩොල්කැළේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021.03.13 පෙ.ව.09.00 සිට ප.ව. 17:00 දක්වා

පෙන්ගුයින් (කුන්ඩන්මාල්ස්) ගාමන්ට්, හාතලේ තේ කම්හල, බැද්දේගම තේ කම්හල, රාක්ෂාව තේ කම්හල, උනතගල තේ කම්හල, මවුන්ට් හුන්නස්ගිරිය ගවතැන්න, අරත්තන පොම්පාගාරය, මොරහෙල, අරත්තන, හාතලේ ඉහල කොටස, පන්විල අංගම්මන ගල්පිහිල්ල වත්ත, මේරිලැන්ඩ් කොලනිය, හාතලේ ඉහල කොටස (කොලනි), පන්විල, උනතගල (මඩොල්කැළේ), අප්පලාබැද්ද, මඩොල්කැළේ බසාර්

වත්තේගම පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021.03.13 පෙ.ව.09.00 සිට ප.ව. 17:00 දක්වා

ගල්පිහිල්ල උපපොල, මක්කානිගම, පිටවල හන්දිය, ගල්පිහිල්ලගම, උඩුගොඩ කර්මාන්තපුරය, අංගම්මන, උඩුගොඩ

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මධ්‍යම පළාත - 01)
ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 04, අස්ගිරිය පාර, මහනුවර
දුරකථන : 081-2234000

විදුලි බලයෙන් සැසිරීමත් දිවියක්

ඔබගේ මාසික විදුලි බිල www.ceb.lk වෙබ් අඩවිය මගින් ගෙවිය හැක

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

විදුලි පාරිභෝගිකයින්ට අනර්ඝ සැපයුමක් හා සේවාවක් ලබාදීමේ අරමුණ සපුරා ගනු වස්, ලංකා විදුලිබල මණ්ඩලය පහත සඳහන් ප්‍රදේශවල විදුලි පද්ධතියේ නඩත්තු, පුනරුත්ථාපන හෝ තැනීම් කටයුතු කිරීමට අදහස් කරයි. මේ නිසාවෙන්, එම ප්‍රදේශවල විදුලිබල සැපයුම, පහත ඇති දිනයන් හි / වේලාවන් හිදී තාවකාලිකව අත්හිටුවීමට සිදුවේ. මේ නිසා විදුලි පාරිභෝගිකයින්ට සිදුවන අපහසුතාවයට අපගේ කණගාටුව ප්‍රකාශ කරන අතරම, සැලසුම් කරන ලද වැඩ අවසන් වූ වහාම නැවත විදුලි සැපයුම යථා තත්ත්වයට පත් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් පියවර ගනු ලැබේ.

මධ්‍යම පළාත - 02 - 2021 මාර්තු මාසය

නුවරඑළිය විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

නුවරඑළිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021.03.14 පෙ.ව. 09.00 සිට ප.ව. 17:00 දක්වා

බාස්කම් පෙලෙක්ස් AACL, සාප්පු සංකීර්ණය අබන් ඩිවලොප්මන්ට්, මහනගර සභාව, නුවරඑළිය පොලිසිය, කාර්මික විද්‍යාලය -2, පොදු නිවස, හිල් සමාජ ශාලාව, වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, උසාවි සංකීර්ණය, මහබැංකුව, ශ්‍රී ලංකා, ග්‍රෑන්ඩ් හෝටලය, කාර්මික විද්‍යාලය -1, කව්චේරි උපපොල, අග්‍රාමාත්‍ය නිල නිවස, බාලේ කඩවීදිය, ලේඩ් මැකලම් පාර 2, බස් නැවතුම්පොල

මාවනැල්ල විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

මාවනැල්ල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021.03.12 පෙ.ව. 09.00 සිට ප.ව. 17:00 දක්වා

දනාගම කොලනිය, අතාවුද ගල් වැඩපොල - මාවනැල්ල, ඉලුක්ගොඩ ii (නව), ඉලුක්ගොඩ i, රැනකෙටුගම, මැල්ලකැළේ

ගිනිගත්හේන විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

නෝර්ටන් පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021.03.12 පෙ.ව. 09.00 සිට ප.ව. 17:00 දක්වා

මොරහේනගම ඇඟළුම්, හිටිගේගම, පොල්පිටිය විදුලි බලාගාරය, ගෝවල වත්ත, මාදෙනිය, මිනුවන්දෙනියගම

2021.03.15 පෙ.ව. 09.00 සිට ප.ව. 17:00 දක්වා

මවුන්ට් ජීන්වත්ත, ගලබොඩ 1, ගලබොඩ -11

හැටන් පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021.03.13 පෙ.ව. 09.00 සිට ප.ව. 17:00 දක්වා

ලෙදන්ට් වත්ත, ඔස්බන් තේ කම්හල කාෆෙක්ස්, ෆෝඩයිස්වත්ත, ඇබෝස්ලි, ෆෝඩයිස් තේ කම්හල, රොබිහිල් තේ කම්හල, බිලිත්කිබෝනි, ඇන්ෆීල්ඩ්, ඉන්ජෙස්ට්‍රි, ටිලරි, බණ්ඩාරනායක පුර, හොන්සි නගරය, මෙන්ඩිස් මාවත හැටන්, ජල පොම්පාගාරය දුඹුරුගිරිය, රොස්ක්රි තේ කම්හල, පැන්මූර්, තරුණ බෞද්ධ සංගමය, ෆෝඩයිස් අක්කර 30, ඇබෝස්ලි නව මොන්ට් ෆෙයාර්, ෆෝඩයිස් N.C. කොටස, බිරෝඩොක්ස් කොටස, මාල්බිරො කොටස, ලං.වී.ම. සංචාරක බංගලාව

මස්කෙළිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021.03.13 පෙ.ව. 09.00 සිට ප.ව. 17:00 දක්වා

කර්කස්වල්ඩ් කම්හල, කර්කස්වල්ඩ් මැද කොටස, කර්කස්වල්ඩ් පහළ කොටස

2021.03.15 පෙ.ව. 09.00 සිට ප.ව. 17:00 දක්වා

නෝර්වුඩ්වත්ත - 2

නාවලපිටිය විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

ගම්පොල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021.03.12 පෙ.ව. 09.00 සිට ප.ව. 17:00 දක්වා

උදලාගම්දෙණිය

කෑගල්ල විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

තුල්හිරිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021.03.12 පෙ.ව. 09.00 සිට ප.ව. 17:00 දක්වා

කන්දේගම

මොරොන්තොට පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021.03.13 පෙ.ව. 09.00 සිට ප.ව. 17:00 දක්වා

පාරඹේ රබර් කර්මාන්තශාලාව, ආරගම නව, පාරඹේගම දන්දෙනිය, හිග්ගොඩ නිකපිටිය, උල්කඩ, බොස්සැල්ල, ගන්තුන පල්ලේගම, ගන්තුන උතත්කන්ද, දෙගල්තිරිය, හිග්ගොඩ මාබෝපිටිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මධ්‍යම පළාත - 02)
ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 04, අස්ගිරිය පාර, මහනුවර
දුරකථන : 081-2234000

විදුලි බලයෙන් සැසිරීමත් දිවියක්

ඔබගේ මාසික විදුලි බිල www.ceb.lk වෙබ් අඩවිය මගින් ගෙවිය හැක

ප්‍රසිද්ධ වෙන්දේසිය

ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී ආයතනයට අයත් සියලුම රන් ණය සේවා මධ්‍යස්ථාන වෙතින් ලබාගත් රන් ණය හා සම්බන්ධ 2021/01/31 දිනට කල් ඉකුත් වූ දැනට බේරා නොගත් සියලුම රන් භාණ්ඩ 2021/03/25 හා 2021/03/26 යන දින වල පෙ.ව. 10.00ට පහත සඳහන් ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී
(PB1079/PQ)
නො.19, දුම්රියපළ පටුමග, නුගේගොඩ.
දුරකථනය: 0117 444 222
Orient Finance
skills

විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

ගාල්ල රිච්මන්ඩ් කන්ද පාර, අංක 123 හි පදිංචි ගල්කැටිය ගමගේ මලින්ද යන අය විසින් ගාල්ල, ගොඩකන්ද, ඔබවත්තෙහි පදිංචි ගල්කැටිය ගමගේ අනුර යන මා හට බලය පවරා 2015.10.31 වන දින ගාල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් දිලන් ප්‍රියංග ගොඩකන්ද මහතා ලියා සහතික කළ අංක 118 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය 2021.03.03 දින සිට අවලංගු කරන බව සියලු දෙනාගේම දැන ගැනීම පිණිස පළ කරමි.

ගල්කැටිය ගමගේ අනුර,
ඔබවත්ත, ගොඩකන්ද, ගාල්ල.

එල් බී ෆිනෑන්ස් පීඑල්සී
(ලියාපදිංචි අංකය පීක්‍යූ 156)
අංක 275/75, මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර මාවත, කොළඹ 07

2007 අංක 07 දරන සමාගම් පනතේ 127 වගන්තිය ප්‍රකාරව එල් බී ෆිනෑන්ස් පීඑල්සී සමාගමෙහි කොටස් ලේඛනය, 2021 මාර්තු මස 12 වැනි සිකුරාදා දින සිට 2021 මාර්තු මස 16 වැනි අඟහරුවාදා දින වන තෙක් (එම දින දෙක ද ඇතුලුව) වසා තැබීමට නියමිත බව අප විසින් මෙලෙස නිවේදනය කර සිටිමු.

එල් බී ෆිනෑන්ස් පීඑල්සී සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.
2021 පෙබරවාරි 19

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය
ලංසු කැඳවීම

01. මාර්ග සංවර්ධන අධිකාරියේ මහනුවර ප්‍රධාන ඉංජිනේරු කාර්යාලීය ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත දැක්වෙන ව්‍යාපෘති සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

අනු අංකය	කොන්ත්‍රාත් අංකය	කොන්ත්‍රාත්තුවේ නම	ඉංජිනේරු ඇස්තමේන්තුව (අවිනිශ්චිත වියදම් රහිතව) රුපියල්	ICTAD ශ්‍රේණිය	ලංසු ආරක්ෂණය (රුපියල්)	කොන්ත්‍රාත් කාලය (කැලැන්ඩර් දින)
01	RDA/CP/ PD/CE/ KDY/2021/02	ගලගෙදර -රඹුක්කන මාර්ගයේ කි. මී. CH 16+905 සිට CH16+942 දක්වා මාර්ග කොටසේ දකුණු පස ආරක්ෂිත බැම්මක් ඉදිකිරීම.	8,136,657.84	C 7, C 6	145,500.00	210
02	RDA/CP/ PD/CE/ KDY/2021/03	ගලගෙදර - රඹුක්කන මාර්ගයේ කි. මී. CH 16+787 සිට CH16+817 දක්වා මාර්ග කොටසේ දකුණු පස ආරක්ෂිත බැම්මක් ඉදිකිරීම.	7,613,600.00	C 7, C 6	136,500.00	210
03	RDA/CP/ PD/CE/ KDY/2021/04	අඹතැන්න - බොක්කාවල අරඹේකඩේ මාර්ගයේ බෝක්කු අංක 1/6 හා CH 1+000 කිමී. අතර ආරක්ෂිත බැම්මක් ඉදිකිරීම පියවර 111	6,924,220.02	C 7, C 6	130,000.00	210
04	RDA/CP/ PD/CE/ KDY/2021/05	අඹතැන්න - බොක්කාවල අරඹේකඩේ මාර්ගයේ බෝක්කු අංක 1/2 හා 1/3 අතර ආරක්ෂිත බැම්මක් ඉදිකිරීම .	5,292,276.67	C 7, C 6	100,000.00	210
05	RDA/CP/ PD/CE/ KDY/2021/06	අඹතැන්න - බොක්කාවල අරඹේකඩේ මාර්ගයේ බෝක්කු අංක 1/1 හා 1/2 අතර ආරක්ෂිත බැම්මක් ඉදිකිරීම. (දකුණු පස)	4,271,544.11	C 7, C 6	79,500.00	210
06	RDA/CP/ PD/CE/ KDY/2021/07	ගම්පොළ ගම්පොළවත්ත බෝධිමලුව ආරාමය සඳහා පිවිසුම් මාර්ග පාලමක් ඉදිකිරීම.	6,276,015.34	C 7, C 6	115,000.00	210
07	RDA/CP/PD/ CE/KDY/EE/ KDY/2021/01	අලවතුගොඩ - අංකුඹුර කැප්පෙට්ටිගල මාර්ගයේ බෝක්කු අංක 14/5 - 14/6 අතර හා 15/8 - 15/9 අතර පැතිකාණු ඉදිකිරීම හා ආරක්ෂිත බැම්මක් ඉදිකිරීම.	1,919,535.47	C 8, C 7	34,500.00	105

වගුව 01

02. පොදු මුදල් චක්‍රලේඛ අංක (04/2016 ii) අනුකූලව ලංසු කැඳවීම ජාතික කොන්ත්‍රාත්කරුවන් අතර තරගකාරී ලංසුකරණ පටිපාටියට අනුව සිදු කරනු ලැබේ. (මධ්‍යම පළාත තුළ ලියාපදිංචි ලංසුකරුවන්ගේ ලංසුව සඳහා 5% ක අභිරුචියක් ලබාදෙනු ඇත.)

03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, ලංසුකරුවන්, මහාමාර්ග ක්ෂේත්‍රයේ විශේෂ නිපුණතාවය සහිතව ඉහත වගුවේ සඳහන් කුමන හෝ ශ්‍රේණියක් යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) දැනට ලියාපදිංචි වී සිටිය යුතුය.

04. ලංසුව ඉහත වගුව 01 හි දැක්වෙන වටිනාකමින් යුත් ලංසු ආරක්ෂණයකින් සමන්විත විය යුතු අතර, 2021.07.16 දින දක්වා එකී ලංසු ආරක්ෂණය වලංගු විය යුතුය.

05. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වගුව 02 හි සඳහන් කාර්යාල වලින් වැඩිදුර තොරතුරු ලබා ගැනීම ලංසු ලේඛන කාර්යාලීය වේලාව තුළදී කිසිදු ගාස්තුවකින් තොරව පරීක්ෂා කළ හැක. 2021.03.09 දින සිට 2021.03.18 දින දක්වා පෙ.ව. 9.00 පැය සිට ප.ව. 15.00 පැය කාලය තුළ පහත පරිදි ආපසු නොගෙවනු ලබන ගාස්තුවක් සමග ලිඛිත අයදුම්පතක් වගුව 02 හි සඳහන් කාර්යාලය වෙත යොමු කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත සම්පූර්ණ ලංසු අයදුම්පත් කට්ටලයක් ලබාගත හැකිය.

06. සම්පූර්ණ කළ ලංසු පිටපත් දෙකකින් යුක්තව පොදු කොන්ත්‍රාත්තු පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලැබූ ලියාපදිංචි සහතිකයේ පිටපතක් සමග ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදළ කොන්ත්‍රාත්තුව සහ අංකය සඳහන් කර 2021.03.19 දින 1400 පැයට හෝ ඊට පෙර වගුව 02 හි සඳහන් ආකාරයට පිළියෙළ කර ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් බාරදිය යුතුය. ප්‍රමාද ලංසු විවෘත කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එදිනම ප.ව. 14.30 ට ලංසුකරුවන් හෝ ඔවුන් විසින් තෝරා එවූ නියෝජිතයන් ඉදිරියේ එක් ලංසු විවෘත කරනු ලැබේ.

තොරතුරු ලබාගැනීම හා ලංසු අයදුම්පත ලබාගත හැකි කාර්යාලය	කොන්ත්‍රාත් අංකය	දුරකථන අංකය ෆැක්ස් අංකය	ආපසු නොගෙවනු ලබන ගාස්තුව වැට් බදු සහිතව රුපියල්	වෙනත්	ලංසු ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාරදිය යුතු කාර්යාලීය ලිපිනය
ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය මාර්ග සංවර්ධන අධිකාරිය, අස්ගිරිය, මහනුවර.	RDA/VCP/ PD/CE/ KDY/2021/ 02/03, 04, 05, 06 & 07	081-2222005 081-2222005	2,700.00 බැගින්	පොදු කොන්ත්‍රාත් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලැබූ ලියාපදිංචි සහතිකයේ පිටපතක් සමග අයදුම්පත ඉදිරිපත් කරන්න.	සභාපති ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය අස්ගිරිය මහනුවර.
විධායක ඉංජිනේරු විධායක ඉංජිනේරු කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, මහනුවර.	RDACP/ PD/CE/ KDY/ EE/KDY 2021/01	081-2223429 081-2223429	2160.00		සභාපති ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, විධායක ඉංජිනේරු කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, මහනුවර.

වගුව 02

සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව (මධ්‍යම පළාත),
ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය,
මාර්ග සංවර්ධන අධිකාරිය,
අස්ගිරිය, මහනුවර.

ලංසු කැඳවීමේ ආරාධනාවයි

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලයේ හා ඇල්බට් චන්ද්‍රවංකයේ අංක 16/7 කාර්යාල පරිශ්‍රය සඳහා පිරිසිදු කිරීමේ හා සනීපාරක්ෂක සේවා හා උද්‍යාන නඩත්තු සේවා ලබාගැනීමේ ප්‍රසම්පාදනය

කොන්ත්‍රාත් අංකය : DCS/AC/PRO/04/01/2021

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් 2021/22 වර්ෂය සඳහා පහත පරිදි පිරිසිදු කිරීමේ හා සනීපාරක්ෂක සේවා හා උද්‍යාන නඩත්තු සේවා ලබාගැනීමට යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

කොන්ත්‍රාත්තු අංකය	ප්‍රසම්පාදනයේ නම	ලංසු සුරක්ෂණ වටිනාකම	පූර්ව ලංසු රැස්වීම සහ පරිශ්‍රය පරීක්ෂාව	අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය සහ ලංසු විවෘත කිරීම
DCS/AC/ PRO/04/ 01/2021	ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ බත්තරමුල්ල හා 16/7 කාර්යාල පරිශ්‍රය සඳහා පිරිසිදු කිරීමේ හා සනීපාරක්ෂක සේවා හා උද්‍යාන නඩත්තු සේවා ලබාගැනීමේ ප්‍රසම්පාදනය	රු. 100,000/=	2021.03.18 දින පෙ.ව. 10.00 ට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 4 වන මහල, රැස්වීම් ශාලාව, 306/71, පොල්දූව පාර, බත්තරමුල්ල.	2021.03.29 දින පෙ.ව. 10.00 ට ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2 වන මහල, ප්‍රසම්පාදන අංශය, අංක, 306/71, පොල්දූව පාර, බත්තරමුල්ල.

1. ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසු ක්‍රමය (NCB) මගින් සිදුකරනු ලැබේ.
2. උනන්දුවක් දක්වන සුදුසුකම් සහිත ලංසුකරුවන්ට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී (මුදල් -I) මගින් (011-2147007) වැඩි විස්තර ලබාගත හැකි අතර, පහත දැක්වෙන ලිපිනයේදී 2021 මාර්තු 05 දින සිට 2021 මාර්තු 28 දින දක්වා සතියේ රාජකාරි දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ ලංසු කැඳවීමේ ලේඛන පරීක්ෂාකර බැලිය හැක.
3. ලිඛිත ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රු. 4,000/= ක මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ සරප වෙත මුදලින් පමණක් ගෙවීමෙන් ලංසු කැඳවීමේ ලේඛන කට්ටලයක් ලබාගත හැක.
4. නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන පහත සඳහන් ලිපිනයට 2021.03.29 දින පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම කළ යුතුය. ලංසු භාරගැනීම අවසන් වූ විගස ලංසුකරුවන් ඉදිරියේ ලංසු විවෘත කිරීම සිදු කරනු ලබන අතර, ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
"සංඛ්‍යාන මන්දිරය",
අංක. 306/71, පොල්දූව පාර,
බත්තරමුල්ල.

දුර. 011-2147007

2021.03.02

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
මහාමාර්ග අමාත්‍යාංශය
මාර්ග සංවර්ධන අධිකාරිය (RDA)
ලංසු සඳහා ආරාධනයයි (IFB)

ශ්‍රී ලංකාවේ, අධිවේගී මාර්ගවල ආදායම් මාර්ගයෙන් අරමුදල් සම්පාදනය කෙරේ.

ජාතික තරගකාරී ලංසුකරණය (NCB)

තණකොළ කපන යන්ත්‍ර තල, වයර් සහ ට්‍රිමර් හෙඩ්,
අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශය
(EOM & M Division) සඳහා සැපයීම සඳහා ලංසු ආරාධනය.

කොන්ත්‍රාත් අංකය : RDA/EOM & M/PRC/2021/MNT/04

01. මාර්ග සංවර්ධන අධිකාරිය (RDA), වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ, ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත වගුවේ දැක්වෙන පරිදි එහි විස්තර කර ඇති අයිතම / භාණ්ඩ සැපයීම සඳහා ඉහත සඳහන් කොන්ත්‍රාත්තුව වන "RDA/EOM & M/ PRC/2021/MNT/04" යන කොන්ත්‍රාත්තු අංකය යටතේ මුද්‍රා තබන ලද ලංසු මිල ගණන් දැන් කැඳවනු ලැබේ. ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර තොරතුරු ලංසු ලිපිලේඛනවල සපයා ඇත. සියලුම ලංසු සමග රුපියල් 100,000.00 (ලක්ෂයක්) වන වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණ ඇපකරයක්ද ඉදිරිපත් කළ යුතුය.

විස්තරය	ඒකකය	ප්‍රමාණය
තණකොළ කපන යන්ත්‍ර	ගණනින්	370
තණකොළ කපන යන්ත්‍ර වයර් කම්බි	මීටර්	190,000
තණකොළ කපන යන්ත්‍ර බ්ලේඩ් තල	ගණනින්	2,100
ට්‍රිමර් හෙඩ් (Trimmer Heads)	ගණනින්	1,300

02. ලංසුකරණය, ජාතික තරගකාරී ලංසුකරණ (NCB) පටිපාටිය යටතේ සිදු කරනු ලබේ.
03. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට වැඩිදුර තොරතුරු බණ්ඩාරගම, වල්ගම, කහටගහහේන, මාර්ග සංවර්ධන අධිකාරියේ, අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශයේ, ප්‍රසම්පාදන කාර්යාංශය වෙතින් (දුරකථන අංක 038-2289122, ෆැක්ස් : 038-2289560) මගින් විමසීමෙන් අනතුරුව ලබාගත හැකි වන අතර, ලංසු ලිපිලේඛන ගාස්තු ගෙවීමකින් තොරව කාර්යාල වේලාවන් තුළදී පරීක්ෂා කර බැලිය හැකිය.
04. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරනලද අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් ආපසු ගෙවනු නොලබන රුපියල් 2,500.00 ක් සහ වැට් බදු 200.00 ක් වන ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් හා බණ්ඩාරගම, වල්ගම, කහටගහහේන, මාර්ග සංවර්ධන අධිකාරියේ (RDA) හි, අධ්‍යක්ෂ (අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශය) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2021/03/05 වන දින සිට 2021/03/26 වන දින දක්වා පැය 09.00 සිට පැය 14.30 දක්වා අතරතුර, මිලදී ලබා ගත හැකිය. 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත්තු පනතේ (PCA3) විධිවිධාන ප්‍රකාරව, සාර්ථක ජයග්‍රාහී ටෙන්ඩර්කරු සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටිය යුතුය.
05. ලංසු, 2021/03/26 වනදින පැය 14.30 ට හෝ ඉන් පෙර ලැබෙන සේ බණ්ඩාරගම, වල්ගම. කහටගහහේන, මාර්ග සංවර්ධන අධිකාරියේ, අධ්‍යක්ෂක (අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශය) වෙත ගෙනැවිත් භාර දිය යුතුය. ප්‍රමාද ලංසු භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාර ගැනීමට නියමිත අවසාන වේලාව ඉක්මවූ වහාම පැමිණ සිටින ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේදී (පැමිණ සිටීමට කැමැති) එම ලංසු විවෘත කරනු ලැබේ.
07. ලංසු වලංගු කාල සීමාව 2021/06/27 වන දින දක්වා විය යුතුය.
08. එක් එක් ලංසුව සමග ලංසු සුරක්ෂණ ඇපකරයක් ඉදිරිපත් කළ යුතු අතර එම ලංසු සුරක්ෂණ ඇපකරය 2021/07/25 වන දින දක්වා වලංගු විය යුතුය.

සභාපති,
මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව,
බාරේ / අධ්‍යක්ෂක (අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශය),
මාර්ග සංවර්ධන අධිකාරිය, කහටගහහේන,
වල්ගම, බණ්ඩාරගම.

BE BETTER INFORMED! News you can trust now free on your mobile phone.
Dinamina Daily News Thinakaran
AVAILABLE AT
Visit - apps.lakehouse.lk
DOWNLOAD TODAY!
LAKE HOUSE

ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)
1964 අංක 28 දරන ඉඩම් අත්කරගැනීමේ (සංග්‍රාහ) පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වන වගන්තිය යටතේ දැන්වීම

ප්‍රාදේශීය ලේකම් යොමු අංකය : **Vada/sw/la.Acq/179**
ඉඩම් අමාත්‍යාංශය අංක : **4-3/15/2015/ve/287**

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉඩම පරවශ්‍යතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කර සිටින බව මෙයින් දැනුම් දී සිටිමි.

අවශ්‍ය විස්තර සඳහා 2020.10.30 වැනි දින ප්‍රකාශිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අංක 2199/26 හා 2021.02.10 වැනි දින ප්‍රකාශිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අංක 2214/53 බලන්න.

පළාත	:	උතුරු
දිස්ත්‍රික්කය	:	යාපනය
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	:	වඩමාරච්චි දකුණ හා බටහිර, කරවෙඩ්ඩි
ග්‍රාම නිලධාරි කාර්යාලය	:	තුන්තාලයි දකුණ J/370
ගමේ නම	:	තුන්තාලයි දකුණ
මූලික පිඹුරු අංකය	:	යා 2904
කැබලි අංකය	:	1-32
ප්‍රමාණය	:	හෙක් 1.0843

ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කරවෙඩ්ඩි

නිකවැරටිය දිසා අධිකරණයේදීය
පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

31ඒ, හිලෝගම පාර, නිකවැරටිය
නිවිලංකා ජුවලර්ස් හි
ඇත්දත් වඩුගේ
ප්‍රියන්ත උදය කුමාර
(පැමිණිලිකරු)

නිකවැරටිය දිසා අධිකරණ නඩු අංක 1415/එම්
ඇස්කිසි අංක : ලිට් 22

35A, දණ්ඩුවාව, නිකවැරටිය පදිංචි
පස්යාල ආරච්චිගේ
නාමල් අසංක සංජීව
(විත්තිකරු)

මෙහි පහත විස්තර වන දේපළ වලින් ඉහත විත්තිකරුට තිබෙන අයිතිවාසිකම් හා ප්‍රයෝජන වර්ෂ 2021 ක් වූ මාර්තු මස 31 දින පෙ.ව. 10.00 ට එකී දේපළ පිහිටි 35ඒ, දණ්ඩුවාව, නිකවැරටිය යන ස්ථානයේදී පිස්කල් වෙන්දේසියේදී විකිණෙන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

වර්ෂ 2019 ක් වූ ජූලි මස 30 දින දරන තීන්දුව ප්‍රකාර ඉහත විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතුව ඇති රු. ලක්ෂ අටක 800,000/- ක මුදල නොගෙවා පැහැර ඇති බැවින් මා විසින් වර්ෂ 2019.12.24 දින තහනම් කරන ලද විත්තිකරුට අයත් වංචල දේපළ තබා ඇති ස්ථානයේදී පහත සඳහන් පරිදි මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලබන බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී උපලේඛනය

01.	සෝපා සෙට්	01
02.	ලී පුටු සෙට්	03
03.	සිංගර් ශීතකරණ (දෙර 2)	01
04.	සිලින්ඩරය සහිත ගෑස් ලිප්	01
05.	වානේ අල්මාරි (6X4)	01
06.	වෙලින් ස්ටැන්ඩ් පෑන්	01
07.	සිංගර් රූපවාහිනී යන්ත්‍ර (එල්.ඊ.ඩී.)	01
08.	ප්ලාස්ටික් පුටු	03
09.	(2X4) දිග අඩි 10 ලී	15
10.	(3X5) දිග අඩි 07 උළුවහු	03
11.	(1X12) දිග අඩි 07 ලෑලි	10

සැ.යු. : මෙම දේපළ වෙන්දේසි කරන වැඩිම ලංසුව මත අළෙවි කරන අතර, අදළ මුදලට එම ස්ථානයේදී ඉල්ලුම්කරුවන් විසින් මුදල් ගෙවා භාණ්ඩ ඉවත්කරගත යුතුය.

අධිකරණ රෙජිස්ට්‍රාර්,
සාම විනිසුරු / නියෝජ්‍ය පිස්කල්,
ඊ.ඒ. සුලෝචනා එදිරිසිංහ,
දිසා අධිකරණය / නිකවැරටිය.

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වන නිවේදනය) 7 වන වගන්තිය යටතේ දැන්වීමයි.

මගේ අංකය :- 4/1/1/29

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:4-3/7/2016/එච්ඩබ්ලිව්/125

මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම රජයට අත්කර ගැනීමට බලාපොරොත්තු වේ. වැඩි විස්තර සඳහා අංක.2204/26 දරන 2020.12.04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය බලන්න.

උපලේඛනය

පළාත	:	වයඹ
දිස්ත්‍රික්කය	:	කුරුණෑගල
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	:	කුරුණෑගල
ග්‍රාම නිලධාරි වසම	:	අංක.833, ගැට්ටුවාන, අංක.834, කුරුණෑගල ඊසාන, අංක.835, කුරුණෑගල නගරය නැගෙනහිර, අංක.840 කුරුණෑගල නගරය කඩවීදිය. අංක.806, වැහැර බටහිර, අංක.841, කුරුණෑගල නගරය දකුණ, අංක.839, කුරුණෑගල නගරය මධ්‍යම සහ අංක.837, කුරුණෑගල නගරය බටහිර. අංක.839, කුරුණෑගල නගරය මධ්‍යම, අංක.840, කුරුණෑගල කඩ වීදිය සහ අංක.841, කුරුණෑගල නගරය දකුණ,
ගමේ නම	:	කුරුණෑගල නගරය, කොට්ඨාස අංක.2, වැව, කොට්ඨාස අංක 3, මධ්‍යම, කොට්ඨාස අංක.5, පොල් අත්තාපිටිය, කොට්ඨාස අංක.6, ගැට්ටුවාන. මඩමේගම, උඩවල්පොල, වැහැර(කොටසක්), කොට්ඨාස අංක.11, මඩමේගම (කුරුණෑගල මහ නගර සභා සීමාව තුළ) සහ වැහැර. මඩමේගම, උඩවල්පොල, කොට්ඨාස අංක.4, රජපිහිල්ල, කොට්ඨාස අංක.8, උඩවල්පොල, කොට්ඨාස අංක.11 සහ මඩමේගම (කුරුණෑගල මහ නගර සභා සීමාව තුළ)
මූලික පිඹුරු අංකය	:	මූලික පිඹුරු අංක.කු2430 මූලික පිඹුරු අංක.කු2433 මූලික පිඹුරු අංක.කු2439
කැබලි අංක	:	01 සිට 248 දක්වා (කැබලි 248) 01 සිට 228 දක්වා (කැබලි 228) 01 සිට 68 දක්වා (කැබලි 68)
ප්‍රමාණය	:	හෙක්ටයාර් 1.5753 හෙක්ටයාර් 5.3944 හෙක්ටයාර් 1.3491

ඊ.එම්.එම්.එස්.ඒකනායක
ප්‍රාදේශීය ලේකම්,
කුරුණෑගල.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කුරුණෑගල.
2021.02.24

මධ්‍යම පරිසර අධිකාරිය

ජාතික පාරිසරික පනතේ 23 ආ ආ වගන්තියේ දෙවන උපලේඛනය යටතේ දැනුම් දීමයි

කැලණිවැලි දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීමේ වැඩසටහන - පළමු අදියර මරදාන සිට අංගම්පිටිය දක්වා (38 + 380km) ව්‍යාපෘතිය පිළිබඳ පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ අංක 23 ආ ආ (1) වගන්තිය යටතේ පනවා ඇති නියමවලට අනුකූලව ප්‍රවාහන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇති ඉහත යෝජිත ව්‍යාපෘතිය පිළිබඳ පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව, මෙම දැන්වීම පුවත්පතේ පළවන දින සිට (සති අන්ත දිනවල සහ රජයේ නිවාඩු දිනවල හැර) දින 30 ක කාලසීමාවක් තුළ පෙ.ව. 08.30 සිට ප.ව. 04.15 දක්වා මහජනතාවගේ පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල තබනු ලැබේ.

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොළඹ / තිඹිරිගස්යාය / ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ / මහරගම / හෝමාගම / පාදුක්ක / සීතාවක
- මහ නගර සභාව, කොළඹ / ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ
- නගර සභාව, මහරගම
- ප්‍රාදේශීය සභාව, හෝමාගම / සීතාවක
- පුස්තකාලය, මධ්‍යම පරිසර අධිකාරිය, නො. 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
- වෙබ් අඩවිය - www.cea.lk

මෙම දැන්වීම පුවත්පතේ පළවන දින සිට දින 30 ක කාල සීමාවක් ඇතුළත මහජනතාව විසින් ඒ පිළිබඳ අදහස් ඇතොත් ඒවා ලිඛිතව මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැන්විය හැකිය.

අධ්‍යක්ෂ ජනරාල්,
මධ්‍යම පරිසර අධිකාරිය,
"පරිසර පියස",
අංක 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

(සිය සිවිල් අධිකරණ බලය) කොළඹදී ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දීය

කොළඹ 08, කාසල් වීදිය, අංක 34/1 හි PV අංකය : 19191 දරන ඇරිස්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ගණන් බේරා වසා දැමීම පිළිබඳ කාරණය සම්බන්ධයෙනි.

2007 අංක 7 දරන සමාගම් පනතේ 270(e) දරන වගන්තිය යටතේ අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීම පිළිබඳ අයදුම්පත සම්බන්ධයෙන් වූ කාරණය සම්බන්ධයෙනි.

කොළඹ 08, කාසල් වීදිය, අංක 34/1, ඩබ් හවුස් හි සීක්වාර්ට්ස් එම් බී අයි (ප්‍රයිවට්) ලිමිටඩ්

පෙත්සම්කරු

නඩු අංකය	:	WP/HC(Civil) 15/21/CO
ස්වභාවය	:	ගණන් බේරා වසා දැමීම
කාර්ය පටිපාටිය	:	විශේෂ
වටිනාකම	:	රු. 5,000,000/-

කොළඹ දී පවත්වනු ලබන (සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන) බස්නාහිර පළාත් මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ඇවර කිරීම පිණිස පෙත්සමක්, 2021 ක්වූ පෙබරවාරි මස 09 වන දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් ඩී.එල් සහ එෆ් ද සේරම් මහතුන් විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම 2021 ක්වූ මැයි මස 25 වන දින අධිකරණය ඉදිරියෙහි විභාග කරනු ලැබීමට නියම කර ඇති බවද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට හෝ කැමති, එකී සමාගමේ කිසියම් ණය හිමියකු හෝ සහදයකයකු වේ නම් ඒ තැනැත්තාට තත් කාර්ය සඳහා එය විභාග කරන අවස්ථාවෙහි පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණය හිමියකුට හෝ සහදයකයෙකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බව ද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී.එල්. සහ එෆ් ද සේරම් මහත්වරු,
නීතිඥවරු,
අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස,
කොළඹ 07.

සටහන : එකී පෙත්සම විභාග කෙරෙන අවස්ථාවෙහි පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් ඩී.එල්. සහ එෆ් ද සේරම් මහතුන් වෙත භාරදිය යුතුය. නැතහොත් තැපෑලෙන් එවිය යුතුය. එම දැන්වීමෙහි එම තැනැත්තාගේ නම සහ ලිපිනයද, ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනයද, සඳහන් කළ යුතු අතර, එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම 2021 ක්වූ මැයි මස 24 වන දින සවස 6.00 ට පෙර ලැබෙන ලෙස භාරදිය යුතුය. නැතහොත් තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව තැපැල් කළ යුතුය.

ලංසු සඳහා ආරාධනයයි (IFB)

දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය
අධ්‍යාපන අමාත්‍යාංශය

පිරිවෙන් සඳහා ශිෂ්‍ය ලියන මේස (ඩෙස්ක්) හා පුටු ප්‍රසම්පාදනය

කොන්ත්‍රාත් අංකය : ED/ST/BUD/04/03/21/G-10

දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන්, රාජ්‍ය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, පිරිවෙන් සඳහා **ශිෂ්‍ය ලියන මේස (ඩෙස්ක්) හා පුටු ප්‍රසම්පාදනය** සඳහා, සුදුසුකම්ලත් හා නිපුණතා පූර්ණ ලංසුකරුවන් වෙතින්, මුදු, තැබූ ලංසු කැඳවනු ලැබේ. මේ සම්බන්ධව සම්පූර්ණ විස්තර, ලංසු ලේඛනයන්හි සඳහන්ව ඇත. අදළ භාණ්ඩ ගෙනැවිත් භාරදීම, පිළිගත් බවට දත්වනු ලබන ලිපියෙහි සඳහන් දිනයේ සිට සති 10 - 12 අතර කාලය තුළ සිදු කළ යුතුය. සියලුම ලංසු සමග පහත වගුවේ සඳහන් පරිදි වූ ලංසු ඇපකරය බැගින් තිබිය යුතුය.

අයිතම විස්තරය	ලංසු ඇපකරය - රුපියල් -
ශිෂ්‍ය ලියන මේස (ඩෙස්ක්) 5,000 සහ ශිෂ්‍ය පුටු 5,000	300,000.00

02. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය (NCB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

03. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, බත්තරමුල්ල, "ඉසුරුපායේ", 4 වන මහලේ, දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේදී ලබාගත හැකි අතර, 2021 මාර්තු 25 වන දින දක්වා, රාජකාරී දිනවල, පෙරවරු 9.00 හා පස්වරු 3.00 අතර කාලය තුළ අදළ ලංසු ලේඛන නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැක. (දුරකථනය : 011-2787578)

04. ආපසු ගෙවනු නොලබන ගාස්තු රුපියල් 5,000/- එක් ලේඛනයක් සඳහා ගෙවීමෙන්, දහම් පාසැල් පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙතින්, උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. (ගෙවීම් මුදලින්ම කළ යුතු වේ)

05. සම්පූර්ණ කළ ලංසු, **ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය, දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය, 4 වන මහල, "ඉසුරුපාය", බත්තරමුල්ල** යන ලිපිනයට 2021 මාර්තු 26 වනදින පෙරවරු 10.30 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු, විවෘත නොකරම ආපසු යවනු ලැබේ. ලැබී ඇති ලංසු, අදළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම, ඉහත සඳහන් ලිපිනයේදී, පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ විවෘත කරනු ලැබේ.

ලේකම්,
දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය,
"ඉසුරුපාය", බත්තරමුල්ල.

ෂැන්බි ජින්ස් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට අදාළ ඇවර කිරීමේ නියෝගය සම්බන්ධවයි.

සමාගම් ලියාපදිංචි අංකය : PV 13051

වාණිජ මහාධිකරණය - බස්නාහිර පළාත (කොළඹ - සිවිල්) නඩු අංක CHC/58/2018/Co

ණය හිමියන් වෙත කෙරෙන නිවේදනය

1939 ඇවර කිරීමේ නීති මාලාවේ 68 වන නීතියට අනුව

අදළ ඉල්ලීම් සනාථ කිරීමේ සහ ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ අවසාන දිනය

1939 ඇවර කිරීමේ නීති මාලාව හා 2007 අංක 7 දරන සමාගම් පනතට අනුව අදළ ඉල්ලීම් දිවුරුම් පෙත්සමක් මගින් 2021 අප්‍රේල් 16 දට හෝ ඊට ප්‍රථම ඉහත සඳහන් නඩුවේ තීන්දුවට අනුව පත්කළ පහත නම් සඳහන් නිලධාර ගැනුම්කරු / ඇවරකරු වෙත යොමු කරන ලෙස ෂැන්බි ජින්ස් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ණය හිමියන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

අදළ සමාගමේ කිසියම් වත්කම් වෙතොත්, ඒවා උපලබ්ධිකර මුදල් බෙද දීමේදී 2021 අප්‍රේල් 16 පසුව ලැබෙන ඉල්ලීම් සලකා නොබැලෙන බවත්, ණය හිමියන් දැනුවත් විය යුතුය.

ණය පියවීමේදී එය සිදු කරනුයේ 2007 අංක 7 දරන සමාගම් පනතට හා 1939 ඇවර කිරීමේ නීති මාලාවට යටත්ව, අදළ සමාගමේ වත්කම් උපලබ්ධි වී මූල්‍ය ප්‍රතිපාදන ඇත්නම් පමණි.

ණය ගැතියන් වෙත කෙරෙන නිවේදනය

1939 ඇවර කිරීමේ නීති මාලාවේ 44 නීතිය සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ වගන්ති ප්‍රකාරව, සියලුම ණය ගැතියන් හෝ ණයගැති සමාගම් සතුව, ඉහත නම සඳහන් සමාගමට අයිති කිසියම් දේපළක් හෝ මුදලක් වෙතොත්,

1. එම සමාගමට අයිති මුළු මුදලම ෂැන්බි ජින්ස් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමගමේ නමට බැර කිරීමට එවන ලෙසත්,
2. එම සමාගමට අයිති දේපළ අපට භාරදුන් බවට සහතිකයක් ලබා ගන්නා ලෙසත් මෙයින් දන්වමු.

නිලධාර ගැනුම්කරු / ඇවරකරු,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
නො. 400, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.

